322 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 322 - இல. 07
Volume 322 - No. 07

2025 නොවැම්බර් 14වන සිකුරාදා
2025 நவம்பர் 14, வெள்ளிக்கிழமை
Friday, 14th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
සභා ගර්භය තුළ නුසුදුසු වචන භාවිත කිරීම [තීරුව 1167]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1168]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1168]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1171-1178]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
වඩමාරච්චි නැඟෙනහිර ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම [තීරුව 1179]

**ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතාගේ පෞද්ගලික පැහැදිලි කිරීම** [තීරුව 1182]

**ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1186]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [හයවන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය අවසන් කරන ලදී
පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී [තීරු 1187-1328]

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபா மண்டபத்தில் பொருத்தமற்ற வார்த்தைகளைப் பிரயோகித்தல் [ப: 1167]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1168]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1168]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1171-1178]

**தனி அறிவித்தல் மூல வினா:**
வடமராட்சி கிழக்குப் பிரதேச பாதையைப் புனரமைத்தல் [ப: 1179]

**மாண்புமிகு அர்ஜுன சுஜீவ சேனசிங்ஹவினது சொந்த விளக்கம்** [ப: 1182]

**செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1186]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட ஆறாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் முடிவுற்றது
சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது [ப: 1187-1328]

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Use of Unparliamentary Language in the Chamber [Col. 1167]

AUDITOR-GENERAL’S REPORT [Col. 1168]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1168]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1171-1178]

QUESTION BY PRIVATE NOTICE:
Reconstruction of Roads in Vadamarachchi East [Col. 1179]

PERSONAL EXPLANATION BY HON. ARJUNA SUJEEWA SENASINGHE [Col. 1182]

STRATEGIC DEVELOPMENT PROJECTS (AMENDMENT) BILL:
Read the First Time [Col.1186]

APPROPRIATION BILL, 2026 – [Sixth Allotted Day]:
Second Reading – Debate Concluded
Bill Committed to a Committee of the Whole Parliament [Cols. 1187-1328]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 14වන සිකුරාදා***
*2025 நவம்பர் 14, வெள்ளிக்கிழமை*
*Friday, 14th November, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### සභා ගර්භය තුළ නුසුදුසු වචන භාවිත කිරීම
### சபா மண்டபத்தில் பொருத்தமற்ற வார்த்தைகளைப் பிரயோகித்தல்
### USE OF UNPARLIAMENTARY LANGUAGE IN THE CHAMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු සභා ගර්භය තුළ වැඩකටයුතු කරගෙන යාමේදී පාර්ලිමේන්තුවේ ගරුත්වයට නොගැළපෙන, නුසුදුසු හා අශෝභන වචන ඇතැම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් නිරන්තරයෙන් භාවිත කරනු ලබන අවස්ථා පිළිබඳව මාහට නිරීක්ෂණය වී ඇති බවත්, එවැනි වචන භාවිත කිරීම මෙම ගරු සභාවේ ගරුත්වයට හානිකර වන අතර මෙය ඉතාම අසතුටුදායක හා කනගාටුදායක තත්ත්වයක් බවත් මෙම ගරු සභාවේ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් තවත් මන්ත්‍රීවරයකු ඉලක්ක කරමින් බොහෝවිට සිදු කරනු ලබන මෙවැනි නුසුදුසු වචනවලින් කරනු ලබන ආමන්ත්‍රණය කිරීම් සහ දෝෂාරෝපණය කිරීම්වලින් මින් ඉදිරියට වැළකී සිටිය යුතු බව දැඩිව අවධාරණය කරමි.

ඒ අනුව, මෙම කරුණු කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කොට රටේ උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුවේ කටයුතු වඩා විනයානුකූලව හා ආදර්ශවත් ලෙස පවත්වාගෙන යාම සඳහා මහජන නියෝජිතයන් ලෙස ඔබගේ සහයෝගය මා උදක්ම බලාපොරොත්තු වෙමි.



## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LII කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVII, XXVIII හා XXIX කොටස්, තෙවැනි කාණ්ඩයේ XIX හා XX කොටස් සහ නවවැනි කාණ්ඩයේ XV හා XVI කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the Appropriation Bill for the Financial Year 2026 in terms of Standing Order No. 121 (5)(i) of Parliament, on the fiscal, financial and economic assumptions used as the basis in arriving at total estimated expenditure and revenue of the Budget, only in the English language with special leave of the House and the copies in the Sinhala and Tamil languages will be presented as soon as possible.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I am not going to go into the details of this 70-page Report that our Committee compiled.

First of all, I must thank all the Members of our Committee, immaterial of their political party. We worked together to prepare this Report. Also, I extend our appreciation to all the staff who helped us, including the four young consultants. Sir, we have been looking to get these people recruited for a year. We only got them last month and the team is led by Mr. Thilina Panduwawala.

However, Sir, I must say here that the Budget has only provided Rs. 8 million for the Parliamentary Budget Office and Rs. 3 million for Capital Expenditure. That is absolutely insufficient. As you know, the objective of the Committee on Public Finance is as per Article 148 of the Constitution, that we - Parliament - have full control over Public Finance. The Treasury Operations Department, other government institutions and also the Central Bank tell us various things and present various reports and analyses. So, Parliament must have the wherewithal, the capacity to be able to critically evaluate those reports. Unfortunately, we are unable to do that. With Rs. 8 million, what can we do, Sir?

The Parliamentary Budget Office Act was passed in 2023. Sir, I would like to **table*** here the documentations that have already been prepared on the Parliamentary Budget Office: the Organizational Design, the Parliamentary Budget Office Financial Year 2024 Action Plan and the Excel sheet on what our expenses are going to be.

If you are serious about having the Committee on Public Finance and its back office, then, you must actually do it. There is no point in having rhetoric. We have to physically allocate funds to run that office. So, I humbly request you, Sir, and also the Hon. Leader of the House to, during the Committee Stage, relook at the expenditure you have allocated and provide appropriate funds for the Parliamentary Budget Office.

Sir, for the first time, we have actually been able to provide a colour copy of this Report because, then, it is easier to digest what is in it. Essentially, we are looking at assumptions and forecasts. Everything depends on what our assumptions are for the next year. For instance, this year, the assumption was that the nominal GDP will grow by 10.4 per cent and that was supposed to be Rs. 33 trillion. Based on that, various ratios were calculated, but we are going to end up with only Rs. 32 trillion, which means as supposed to the projection of 10.4 per cent, we are only going to have a 7 per cent nominal growth. Inflation was expected to be 5.7 per cent, but it is going to be only 2.4 per cent. So, going into the assumptions for 2025, we noticed that there have been massive discrepancies. Therefore, what we need to do is to ensure that these variations become less and less in future. I am not going to go through most of it, but what we are showing here is that there is an unexpected revenue that the Treasury has collected. No one expected that, even when the Ministry of Finance, Plannning and Economic Development presented the Budget, that they would collect so much revenue from taxes on vehicle imports. So, that is really what has happened. We have also shown here the Treasury surpluses. There has been quite a bit of discussion on media about the buffer in cash availability of the Treasury.

Therefore, this is a fairly comprehensive, yet summarized version of what we - the Committee - believe to be the situation with respect to the assumptions and forecast made in preparing the Budget for 2026.

And, I expect all Members of this Committee to peruse this Report and perhaps, during the course of the Debate going forward, provide the Committee with any of their observations so that we could incorporate those.

Thank you, Sir.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, සාලියවැව හන්දිය, නිවාස යෝජනා ක්‍රමය, අංක 27 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී.එන්. තුසිත රත්නසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මැදවච්චිය, විහාර පෙදෙස, අංක 100/32 යන ලිපිනයෙහි පදිංචි සී.පී. චන්ද්‍රපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ඇත්කඳුරත, තණබද්දේගම, පාලුවත්ත යන ලිපිනයෙහි පදිංචි ඥාණවති ගුරුසිංහ මහත්මියගෙන් ලබුණු පෙත්සම; සහ

(2) ගෝනගල පුර, ගල්තුඩුව, අංක 353 එෆ් යන ලිපිනයෙහි පදිංචි පී.කේ. ලීලාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

---

***** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -1451/2025- (1), ගරු කේ. ඉලංකුමාරන් මහතා.

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -1463/2025- (1), ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය.

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල: විස්තර
## கம்பஹா மாவட்ட பொது வைத்தியசாலை: விபரம்
## DISTRICT GENERAL HOSPITAL, GAMPAHA: DETAILS

1474/2025

**3. ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ සේවය කරනු ලබන මුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද;
(ii) එම රෝහලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත රෝහලේ ප්‍රමිතිගත තත්ත්ව පාලන ඖෂධ ගබඩාවක් නොමැති බව දන්නේද;
(ii) එසේ නම්, ප්‍රමිතිගත තත්ත්ව පාලන ඖෂධ ගබඩාවක් පිහිටුවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;
(iii) එම රෝහලෙන් දෛනිකව සහ මාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාවේ සාමාන්‍ය අගය වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iv) එම රෝහල සඳහා ප්‍රධාන සැලැස්මක් - master plan - සකස් කර ඇති බව දන්නේද;
(v) ඒ අනුව, රෝහලේ උපරිම කාර්යක්ෂමතාවයේදී සේවා ලබා දිය හැකි රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கம்பஹா மாவட்ட பொது வைத்தியசாலையில் பணிபுரியும் மொத்த ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;
(ii) மேற்படி வைத்தியசாலையில் ஒவ்வொரு பதவி வாரியாக நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;
(iii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வைத்தியசாலையில் தரநிலைப்படுத்தப் பட்ட தரக் கட்டுப்பாட்டுடனான மருந்துக் களஞ்சியசாலை ஒன்று இல்லாமையை அறிவாரா என்பதையும்;
(ii) ஆமெனில், தரநிலைப்படுத்தப்பட்ட தரக் கட்டுப்பாட்டுடனான மருந்துக் களஞ்சியசாலை ஒன்றைத் தாபிப்பதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;
(iii) மேற்படி வைத்தியசாலையில் நாளாந்தம் மற்றும் மாதாந்தம் சிகிச்சை பெறும் நோயாளிகளின் எண்ணிக்கையின் சராசரிப் பெறுமானம் வெவ்வேறாக யாது என்பதையும்;
(iv) மேற்படி வைத்தியசாலைக்கென முதன்மைத் திட்டமொன்று (Master plan) தயாரிக்கப் பட்டுள்ளதை அவர் அறிவாரா என்பதையும்;
(v) அதற்கமைவாக, வைத்தியசாலை உச்ச வினைத்திறனுடன் இயங்கும் பட்சத்தில், எத்தனை நோயாளிகளுக்கு சேவை வழங்க முடியும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -
(i) total number of employees currently serving at the District General Hospital in Gampaha;

[ගරු ලසිත් භාෂණ ගමගේ මහතා]

(ii) number of existing vacancies at that hospital, specified separately for each post; and

(iii) steps that have been taken to fill those vacancies;

(b) Will he also inform this House -

(i) whether he is aware that the said hospital does not have a standardized quality controlled drug store;

(ii) if so, the measures that have been taken to establish a standardized quality controlled drug store;

(iii) the average number of patients who receive treatment at the hospital daily and monthly, separately;

(iv) whether he is aware that a master plan has been prepared for that hospital; and

(v) accordingly, the number of patients who could be treated at the hospital's maximum efficiency?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ මේ වන විට සේවය කරනු ලබන සේවකයින් සංඛ්‍යාව 1,034කි.

(ii) එම තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

**District General Hospital - Gampaha - Cadre Review 2025.09.30**

**District General Hospital - Gampaha - Cadre Review 2025.09.30**

| Serial Number | Designation | DMS Approved cadre | Existing cadre | Vacancy | Contract |
|---|---|---|---|---|---|
| 1 | Director | 1 | 1 | 0 | |
| 2 | Deputy Director | 1 | 0 | 1 | Cov-erup |
| 3 | Medical Consultant | 34 | 33 | 1 | |
| 4 | Consultant Dental Surgeon | 2 | 1 | 1 | |
| 5 | Accountant | 1 | 0 | 1 | |
| 6 | Medical Officer | 247 | 244 | 3 | |
| 7 | Dental Surgeon | 12 | 7 | 5 | |
| 8 | AMO/RMO* | 6 | 4 | 2 | |
| 9 | Administrative Officer | 1 | 1 | 0 | |
| 10 | Matron | 4 | 2 | 2 | |
| 11 | Chief Pharmacist | 2 | 0 | 2 | |
| 12 | Chief Medical Laboratory Technologist | 1 | 0 | 1 | |
| 13 | Chief Radiographer | 1 | 0 | 1 | |
| 14 | Chief Physiotherapist | 1 | 0 | 1 | |
| 15 | Chief ECG Recordist | 1 | 0 | 1 | |
| 16 | Chief Dispenser | 1 | 0 | 1 | |
| 17 | Psychiatric Social Worker* | 1 | 0 | 1 | |
| 18 | Ward Sister | 20 | 7 | 13 | 02 Contract Basis |
| 19 | Nursing Officer | 437 | 403 | 34 | 09 Contract Basis |
| 20 | Public Health Nursing Officer | 1 | 1 | 0 | |
| 21 | Pharmacist | 25 | 24 | 1 | |
| 22 | Medical Laboratory Technologist | 23 | 20 | 3 | |
| 23 | Radiographer | 9 | 6 | 3 | |
| 24 | Physiotherapist | 7 | 3 | 4 | 03 Contract Basis |
| 25 | Occupational Therapist | 1 | 1 | 0 | |
| 26 | Ophthalmic Technologist | 5 | 5 | 0 | |
| 27 | Public Health Midwife | 29 | 19 | 10 | |
| 28 | Speech Therapist | 1 | 1 | 0 | |
| 29 | ECG Recordist | 7 | 4 | 3 | |
| 30 | EEG Recordist | 1 | 1 | 0 | |
| 31 | PHLT | 3 | 2 | 1 | 01 Contract Basis |
| 32 | Planning & Programming Assistant | 1 | 1 | 0 | |
| 33 | Development Officer | 6 | 11 | | |
| 34 | Dispenser | 4 | 5 | | |
| 35 | Management Assistant | 17 | 15 | 2 | |
| 36 | Diet Stewards | 3 | 2 | 1 | |
| 37 | House Warden | 1 | 0 | 1 | |
| 38 | Ward Clerk | 4 | 4 | 0 | |
| 39 | Health Driver | 6 | 6 | 0 | |
| 40 | Electrician | 1 | 0 | 1 | |
| 41 | Attendant | 47 | 30 | 17 | |
| 42 | Carpenter | 1 | 1 | 0 | |
| 43 | Cook | 5 | 4 | 1 | |
| 44 | Hospital Overseer | 4 | 2 | 2 | |
| 45 | Lab Orderly | 4 | 2 | 2 | |
| 46 | Mason | 1 | 1 | 0 | |
| 47 | Plant Operator (Generator) | 2 | 0 | 2 | |
| 48 | Plumber | 1 | 1 | 0 | |
| 49 | Seamstress | 1 | 1 | 0 | |
| 50 | Dental Technician | 1 | 0 | 1 | |
| 51 | Telephone Operator | 5 | 4 | 1 | |
| 52 | Spray Machine Operator | 0 | 1 | | |
| 53 | Lift Operator | 8 | 1 | 7 | |

| District General Hospital - Gampaha - Cadre Review 2025.09.30 | | | | | |
|---|---|---|---|---|---|
| Serial Number | Designation | DMS Approved cadre | Existing cadre | Vacancy | Contract |
| 54 | Generator Operator | 0 | 2 | | |
| 55 | Saukya Karya Sahayaka (Ordinary) | 30 | 23 | 7 | |
| 56 | Saukya Karya Sahayaka (Junior) | 168 | 127 | 41 | |
| | Grand Total | 1207 | 1034 | 173 | 15 |

ගරු මන්ත්‍රීතුමනි, මීට අමතරව ward sister සඳහා දැන් පුහුණුවීම් ආරම්භ කර තිබෙන නිසා පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කරන්න පුළුවන්. Attendant පුරප්පාඩු 17ක් තිබෙනවා. අපි ළඟදී සේවකයින් promote කරනකොට මේ ප්‍රශ්නයත් නැති වෙනවා.

(iii)
- ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ දැනට සීමිත වෛද්‍ය නිලධාරි පුරප්පාඩු ප්‍රමාණයක් පවතින අතර, ඉදිරි බඳවා ගැනීම් සිදු කිරීමේදී සේවා අවශ්‍යතාව සලකා අදාළ අනුක්ත කිරීම් සිදු කරනු ලැබේ.

  මම කලිනුත් කිව්වා, එතැන දැනට තිබෙන්නේ වෛද්‍ය නිලධාරින්ගේ පුරප්පාඩු 3ක් පමණයි කියලා. ඒක සම්පූර්ණ කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ සංඛ්‍යාව තිබුණේ 2017, 2018 cadre එකට. අපි දැන් ඒ cadre එක revise කරගෙන යනවා.

- දැනට සිසු හෙද පුහුණුවේ නිරත, ඉදිරියේදී පුහුණුව අවසන් කිරීමට නියමිත හෙද ඩිප්ලෝමාධාරි කණ්ඩායම් හා මාස 6ක හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුව සඳහා බඳවා ගෙන පත්වීම් ලබා දීමට නියමිත හෙද උපාධිධාරින් සඳහා පත්වීම් ලබා දීමේදී මෙම රෝහලටත් ඔවුන් අනුයුක්ත කිරීමට කටයුතු කරනවා.

  සමහර Teaching Hospitals සහ රේඛීය අමාත්‍යාංශයට අයත් තෘතීයික රෝහල්වලට අපි අමතර වශයෙන් හෙද උපාධිධාරින් ප්‍රමාණයක් - ඔවුන්ගේ පුහුණුවට - ලබා දුන්නා. නමුත්, මෙම රෝහල පළාත් සභාවට අයිති එකක් නිසා හෙද උපාධිධාරින් ලබා දීමට හැකියාවක් තිබුණේ නැහැ.

- වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ - MLT, භෞත චිකිත්සක - physiotherapist, විකිරණ ශිල්පී, වාග් චිකිත්සක සහ ශ්‍රවණවේදී කාර්මික ශිල්පී යන තනතුරු සඳහා ඉදිරි බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ලැබී ඇති අතර, ඒ සඳහා අදාළ කටයුතු කරමින් පවතී.

  ඒ අනුව බඳවා ගැනීම් සිදු කිරීමේදී රෝහල්වල පවතින පුරප්පාඩු අනුව එම පුරප්පාඩුවලට ඔවුන්ව යොමු කරන්න බලාපොරොත්තු වනවා.

- අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය හා සුළු සේවක පුරප්පාඩු පළාත් සභාව මගින් ඉදිරි බඳවා ගැනීම් සිදු කිරීමේදී බඳවාගෙන සේවා අවශ්‍යතාව අනුව රෝහල් වෙත අනුයුක්ත කිරීම් සිදු කරනු ලැබේ.

(ආ) (i) රෝහලේ යෝග්‍ය ස්ථානවල ඖෂධ ගබඩා සඳහා අවශ්‍ය ආකාරයට සකස් කර ගත් කාමර තුළ නියමිත ප්‍රමිතියට අනුකූලව ඖෂධ ගබඩා පිහිටුවා ඖෂධ ගබඩා කර ඇත.

ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන්නේ ප්‍රමිතිගත ඖෂධ ගබඩාවක් නොවෙයි එතැන තිබෙන්නේ. නමුත් අපි ඒ අනෙකුත් තැන්වලත් අවශ්‍ය ප්‍රමිතිය පවත්වාගෙන යනවා. නමුත් ප්‍රමිතිගත ඖෂධ ගබඩාවක අවශ්‍යතාව මේ රෝහලට පවතිනවා.

(ii) ප්‍රධාන සැලැස්ම - Master Plan එක - අනුව ඖෂධ ගබඩාවක් පිහිටිය යුතු ස්ථානය මේ වන විට හඳුනාගෙන ඇති අතර, රෝහල් පරිපාලනය මඟින් ඊට අදාළ සැලැස්ම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මඟින් මේ වන විටත් අමාත්‍යාංශයේ සැලසුම් අංශය වෙත ඉදිරිපත් කර ඇත.

ඒ අනුව 2026 වසර සඳහා ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ ඉදි කළ යුතු නව ගොඩනැඟිලි පිළිබඳ සැලැස්මට ඖෂධ ගබඩාව ඇතුළත් කර ඇති අතර, ඊට අවශ්‍ය ප්‍රතිපාදන ඉදිරියේදී පළාත් සභාව වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන මඟින් කළමනාකරණය කර ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(iii)

| | ලබා ගන්නා සේවය | දෛනික සාමාන්‍ය අගය | මාසික සාමාන්‍ය අගය |
|---|---|---|---|
| 2024 | බාහිර රෝගී අංශය | 586 | 17,847 |
| | සායන | 1,116 | 33,944 |
| | වාට්ටු සඳහා ඇතුළත්වීම් | 295 | 8,808 |
| 2025 | බාහිර රෝගී අංශය | 674 | 20,303 |
| | සායන | 1,137 | 34,121 |
| | වාට්ටු සඳහා ඇතුළත්වීම් | 244 | 7,363 |

(iv) ඔව්.

(v) ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක වුණොත් දැනට 773ක් වන රෝහලේ රෝගී ඇඳන් ධාරිතාව 1,570 දක්වා වැඩි වනු ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
**(மாண்புமிகு லசித் பாஷண கமகே)**
(The Hon. Lasith Bhashana Gamage)

ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කිරීමකුත් එක්ක මට එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ඇමතිතුමාගේ අනුදැනුම මත රෝහල් කමිටු පත් කිරීම සිද්ධ කරනු ලැබුවා. එතකොට ගම්පහ දිස්ත්‍රික් රෝහල් කමිටුවත් අනුකමිටු 7ක් ඔස්සේ යමින්, ඒ රෝහල ගැන අධ්‍යයනය කරමින්, රෝහලේ තිබෙන අඩුපාඩු සහ ගැටලු හඳුනා ගනිමින් වාර්තාවකුත් සකස් කරලා තිබෙනවා. ඒ අනුව විශාල ගැටලු, අඩුපාඩු ප්‍රමාණයක් එම රෝහල තුළ තිබෙන බව හඳුනාගෙන තිබෙනවා. අපි මේ රෝහලේ cadre එක සම්බන්ධයෙන් කථා කරපු අඩුපාඩුවලට අමතරව operating tables 10න් 5ක්ම වැඩ නැහැ. Centrifuges තුනෙන් එකයි වැඩ කරන්නේ. Labs තුනටම centrifuge එකයි තිබෙන්නේ. ඒ විධියට භෞතික සම්පත්වලත් විශාල හිඟයක් තිබෙනවා.

[ගරු ලසිත් භාෂණ ගමගේ මහතා]

මේ රෝහල ගත්තොත්, කාර්තුවකට රෝගීන් 80,000ක් විතර මෙතැනට එනවා. ශල්‍යකර්ම සඳහා කාර්තුවකට රෝගීන් 2,500ක් විතර එනවා. ඒ වාගේම ළමා රෝගීන් වෙනම තව 1,000ක් විතර එනවා. මේ විධියට විශාල සේවාවක් මේ දිස්ත්‍රික් රෝහලෙන් සිද්ධ වෙනවා. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා. රෝගීන් තුළ මේ ගම්පහ රෝහල සම්බන්ධයෙන් අවුරුදු ගණනාවක් තිස්සේ වැරදි චිත්‍රයක්, කළු පැල්ලමක් තිබෙනවා. ඒ වාගේම කාර්ය මණ්ඩලය ගත්තත්, ඔවුන් රෝහල තුළ අකෘප්තිමත්ව සේවය කරන හැඟීමක් තිබෙනවා. ඒ වාගේම දිස්ත්‍රික් රෝහලක් වශයෙන් අවශ්‍ය ධාරිතාවට යන්නේ නැහැ කියන හැඟීමත් දිස්ත්‍රික්කයේ සිටින ජනතාව තුළ තිබෙනවා.

මේක අධ්‍යයනය කරගෙන යද්දී අපිට මතු වුණු ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරය අනුව, පළාත් සභාවට වෙන් කරන මුදලෙන් තමයි එතැනින් එහාට මෙය ගොඩනැඟීමක් සිද්ධ කළ හැකි වන්නේ. නමුත්, ඒකේ යම් ගැටලුකාරී තත්ත්වයන් ටිකක් තිබෙනවා. දිස්ත්‍රික් රෝහලට අදාළ මූලික අවශ්‍යතාවන්වත් සපුරා ගැනීමට නොහැකි වෙලා තිබෙනවා. අපට දැනගන්න ඕනෑ, මේක මධ්‍යම රජයට පවරා ගැනීම සඳහා කටයුතු සූදානම් කරමින් තිබෙනවාද, ඒක කරන්න නොහැකි නම් ඒකට හේතුව මොකක්ද කියන එක.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, දැනට අපේ තෘතීයික සත්කාර සපයන රෝහල් අතරින් ලංකාවේම රෝහල් 7ක් පමණයි රේඛීය අමාත්‍යාංශයට අයිති නැත්තේ. එයින් 4ක් තිබෙන්නේ උතුරු පළාත ආශ්‍රිතව. ඒ, මන්නාරම, මුලතිව්, කිලිනොච්චිය සහ වව්නියාව කියන දිස්ත්‍රික් මහ රෝහල්. ඊට අමතරව, බස්නාහිර පළාතේ පවතින අවිස්සාවේල්ල, ගම්පහ සහ හොරණ කියන දිස්ත්‍රික් මහ රෝහල් පවතින්නේ රේඛීය අමාත්‍යාංශය යටතේ නොවෙයි. ඒවා පවතින්නේ පළාත් සභාව යටතේයි. සැලසුමක් අනුව කටයුතු කිරීමේදී ඇත්තටම මේ තෘතීයික සත්කාර ඒකක සියල්ලම රේඛීය අමාත්‍යාංශය යටතේ මධ්‍යම ආණ්ඩුවේ පවතිනවා නම් පහසුයි. උදාහරණයක් හැටියට මේ තිබෙන හෙද හිඟය ගත්තොත්, අපි මේ වසරේ පමණක් හෙද පත්වීම් 4,114ක් ලබා දී තිබෙනවා. හැබැයි, පළාත් සභාව යටතේ තිබෙන රෝහල්වලත් මේ හෙද හිඟය පවතිනවා. අපි පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතට මේ හෙද හෙදියන් යොමු කළත්, ඒගොල්ලන්ගේ පවතින cadre එක ගොඩක් තැන්වල දැන් පිරිලා තිබෙන්නේ. බස්නාහිර පළාතෙත් ඒ වාගේම තමයි. ඒ නිසා පළාත් සභාවේ අනුමැතිය ලැබෙනවා නම් උතුරු පළාතේ තිබෙන මේ රෝහල් 4ත්, බස්නාහිර පළාතේ තිබෙන රෝහල් 3ත් මධ්‍යම ආණ්ඩුවට පවරා ගැනීමට රේඛීය අමාත්‍යාංශයේ කැමැත්තක් පවතිනවා. ඇත්තටම අපි දැන් ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කර තිබෙනවා. පළාත් සභාවේ අනුමැතිය ඒකට ලැබිය යුතුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1493/2025- (1), ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය.

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -1497/2025- (1), ගරු බී. ආරියවංශ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 5 -1497/2025- (1), ගරු බී. ආරියවංශ මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
rose.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Hon. Speaker, this is under the Standing Order No. 91(k). It states, I quote:

> "The Member moving a Bill, Regulation, Resolution or Motion shall have the right to reply at the conclusion of the debate;"

Sir, yesterday, there was an incident. I do not want to explain it now, but could you make a decision on that? Yesterday, when I asked for a chance to make my concluding remarks, it was refused and later, it was given. I just want to make sure-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, we will discuss it at the Committee on Parliamentary Business.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### වඩමාරච්චි නැගෙනහිර ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම
### வடமராட்சி கிழக்குப் பிரதேச பாதையைப் புனரமைத்தல்
### RECONSTRUCTION OF ROADS IN VADAMARACHCHI EAST

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே! நிலையியற் கட்டளை 27(2) இன்கீழ் போக்குரவத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வருமான கௌரவ பிமல் ரத்நாயக்க அவர்களிடம் எனது கேள்வியைக் கேட்கிறேன்.

யாழ்ப்பாண மாவட்டத்தின் போக்குவரத்து நடவடிக்கைகளில் மிகவும் பின்தங்கிய பிரதேசமாகவுள்ள வடமராட்சி கிழக்குக்கான தரைவழிப் பாதைப் போக்குவரத்து மிகவும் சீர்கெட்ட நிலையிலுள்ளது. பருவமழைக் காலமும் தொடங்கியுள்ள இந்நேரம் பருத்தித்துறை, நாகர்கோவில், குடத்தனை, செம்பியன்பற்று, மருதங்கேணி, தாளையடி, உடுத்துறை, கட்டைக்காடு, வெற்றிலைக்கேணி, புல்லாவெளி, மண்டலாய்ப் பிள்ளையார் ஆலயம் வரையிலான பிரதான வீதி மிகவும் பாழடைந்துள்ளது. 2015-2019ஆம் ஆண்டு காலப்பகுதியில் இவ்வீதிக்காக நிதி ஒதுக்கப்பட்டு, carpet வீதியாகச் செப்பனிடப்பட்டது. வீதி அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான இவ்வீதி, அதிகாரிகளின் நேர்த்தியான திட்டமிடல், மேர்பார்வை இல்லாமல் செப்பனிடப்பட்டு, ஐந்து வருடங்களுக்குள்ளேயே பாவிக்கப்பட முடியாத நிலையில் உள்ளது என்பதை அமைச்சர் அறிவாரா?

1. இவ்வீதியின் மொத்த நீளம் எத்தனை கிலோமீற்றர்? இவ்வீதிக்கு ஒதுக்கப்பட்ட நிதி எவ்வளவு?
2. ஐந்து ஆண்டுகளுக்குள் இவ்வீதி இவ்வாறு சீர்கெட்டதற்கான காரணம் என்ன? இதற்குப் பின்னாலுள்ள பிழை விட்டவர்கள் தொடர்பான நடவடிக்கை என்ன?
3. இந்த வீதி தொடர்பில் நடைபெற்ற ஊழல் தொடர்பாகப் பூரண விசாரணை ஒன்று நடாத்தப்படுமா?
4. இவ்வீதி மக்கள் பாவிக்கக்கூடிய வகையில் carpet வீதியாக எப்போது திருத்தம் செய்து தரப்படும்?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

- වඩමාරච්චි නැගෙනහිර ප්‍රදේශයේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග දෙකක් පවතින අතර, දැනට අබලන් තත්ත්වයක පවතින්නේ පේදුරු තුඩුව-මරුතන්කර්නි B 371 මාර්ගයේ කොටසක් පමණි.
- මෙම මාර්ගයේ දැනට අබලන්ව පවතින කිලෝමීටර 15 සිට කිලෝමීටර 31.435 දක්වා කොටස වසර 2016-2019 කාලය තුළ මහ නැඟුම සමාගම මඟින් වැඩ පැවරීම - work order - මත සංවර්ධනය කර තිබේ. එම මාර්ගයේ බොහෝ ස්ථාන දැනට අබලන්ව පවතී.

1. 
   - දැනට අබලන් තත්ත්වයක පවතින පේදුරුතුඩුව-මරුතන්කර්නි B371 මාර්ගයේ මුළු දිග කිලෝමීටර 31.435කි.
   - මෙම මාර්ගය සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොමැත. මාර්ග සංවර්ධනය අධිකාරියට අයත් මාර්ග සඳහා පොදුවේ වැඩ පැවරීම - work order - මත සංවර්ධනය කර ඇත.
2. 
   - මාර්ගයේ පාදමෙහි පවතින දූර්වල පස් තට්ටු හේතුවෙන් මාර්ගය අබලන් වී ඇති බව නිරීක්ෂණය වේ.

     මෙම තත්ත්වය ඇතිවීම පිළිබඳ පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අභ්‍යන්තර විගණන අංශය විසින් දැනට මූලික පරීක්ෂණයක් සිදු කරමින් පවතී. එහි අවසන් වාර්තාව ලැබීමෙන් පසු වැරදිකරුවන් වේ නම් එම අය සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.
3. අභ්‍යන්තර විගණන අංශයේ අවසන් වාර්තාව ලද පසු ඒ අනුව පූර්ණ පරීක්ෂණයක් සිදු කරනු ලැබේ.
4. මෙම මාර්ග කොටසේ අබලන් ස්ථාන ප්‍රතිසංස්කරණය කර වැඩිදියුණු කිරීම සඳහා ඇස්තමේන්තුවක් පිළියෙළ කර ඇති අතර, එහි වටිනාකම රුපියල් මිලියන 398කි. එම ඇස්තමේන්තුවට අනුව 2026 වසරේදී වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබේ.

ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර තමයි මම ඉදිරිපත් කළේ. එම මාර්ගය අබලන් වෙලා තිබෙනවා. මම කිහිප වතාවක්ම ඒ මාර්ගය බලන්න ගියා. එම නිසා ඒ මාර්ගය වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. ලබන අවුරුද්දේ ජනවාරි සිට එහි වැඩ කටයුතු ආරම්භ කරනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே! அந்தப் பாதை யாழ்ப்பாணம் மாவட்டத்தில் மிகப் பின்தங்கிய கடற்கரையோரப் பிரதேசங்களுக்கானது. நீங்களும் அதனை

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

நேரடியாகப் பார்வையிட்டிருக்கின்றீர்கள். அந்தப் பகுதிகள் உங்களுக்குப் பரிச்சயமாக இருக்குமென நான் கருதுகின்றேன். மிக முக்கியமாக, கல்வி ரீதியாக மருதங்கேணி பிரதேச செயலக பிரிவுக்குட்பட்ட கட்டைக்காடு, வெற்றிலைக்கேணி, தாளையடி, உடுத்துறைப் பகுதி மாணவர்களினதும் அங்குள்ள பொதுமக்களினதும் போக்குவரத்துக்கு அந்த வீதி மிகவும் முக்கியத்துவம் வாய்ந்தது. ஆகவே, இதற்குப் பின்னால் ஏதும் அரசியல் தலையீடுகள் இருந்து அவ்வீதி வேலை தரமற்று மேற்கொள்ளப்பட்டதா அல்லது அந்த அதிகாரிகள் பிழைவிட்டிருந்தார்களா என்பதைக் கண்டறிந்து, அவர்களை உடனடியாக நீதியின் முன் நிறுத்த வேண்டும். ஏனென்றால், touch up என்று சொல்லி இப்போது ஒதுக்கப்பட்ட பணத்தைச் செலவழிப்பார்கள். மணல் பாங்கான அந்த வீதியைத் திரும்பத் திரும்ப touch up செய்யும்போது அல்லது வெட்டித் திருத்த வேலைகளைச் செய்யும்போது மேலும் அந்த வீதி சீர்கெடும். ஆகவே, அங்குள்ள மக்கள் - அவர்கள் சுனாமியால் பாதிக்கப்பட்டவர்கள், யுத்தத்தால் பாதிக்கப்பட்டவர்கள் - போக்குவரத்துக்கான நல்ல வீதி இல்லாமல் இன்று வரையும் யாழ்ப்பாணம் மாவட்டத்திலே பாதிக்கப்பட்ட மக்களாக இருக்கின்றவர்கள் பாவிக்கக்கூடிய வகையில், தயவுசெய்து குறித்த வீதியை நேர்த்தியானதாக அமைப்பதற்கு உதவுங்கள்!

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මේක හදලා තිබෙන්නේ 2016-2019 කාලයේ. රුපියල් මිලියන 1,500ක් වියදම් කරලා හදපු පාරක් තමයි දැන් මේ ගොඩක් අබලන් වෙලා තිබෙන්නේ. ඒ කාලයේදී දූෂණය සහ දේශපාලන බලපෑම් තිබුණාද කියලා මට අවබෝධයක් නැහැ. දූෂණය තිබුණු බව හිතෙනවා, ඒ මාර්ගය කැඩිලා තිබෙන විධිය දැක්කාම. නමුත්, අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. අපි මුදල් වෙන් කරලා තිබෙනවා.

ඊට අමතරව, වඩමාරච්චි නැඟෙනහිරට අදාළව ගත්තොත් RDA එකට අයත් පාරවල් දෙකක් තිබෙනවා. එකක් තමයි, මරුතන්කර්නි පාර. අනික් එක සෝරන්පට්ටු ඉඳලා තල්ලඩි දක්වා වන පාර. ඒ පාර අපි හදලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි උතුරේ ප්‍රධාන පාරවල් ගණනාවක්ම හදනවා. වට්ටුවාකල් පාලම හදනවා, කුරිකට්ටුවාන් ජැටිය හදනවා. ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කයේම තිබෙන වලෙයිපාඩු දක්වා පාර හදන්නත් අපි වැඩ පටන් ගෙන තිබෙනවා. ඒ නිසා කලින් මොන ප්‍රශ්න තිබුණත් දැන් ඒ ප්‍රශ්න නැහැ කියන එක මම කියන්න කැමැතියි. අපි ඒ පාරවල් හදනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ගිහිල්ලා නිරීක්ෂණය කරන්න.

ඒ වාගේම, එම දිස්ත්‍රික්කය කෙළවර තිබෙන desalination project එක බලන්න අපේ ජල සම්පාදන අමාත්‍යතුමා ලබන 19 හෝ 20වන දා යනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරි සති කිහිපය තුළදී ඒකත් ජනතා අයිතියට පත් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පෞද්ගලික පැහැදිලි කිරීම, ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

## ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතාගේ පෞද්ගලික පැහැදිලි කිරීම
## மாண்புமிகு அர்ஜுன சுஜீவ சேனசிங்ஹவினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. ARJUNA SUJEEWA SENASINGHE

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, 2025.11.12 දින පාර්ලිමේන්තුවේදී යම් මන්ත්‍රීවරියක් විසින් ස්ථාවර නියෝග 92(උ)2 යටතේ රීති ප්‍රශ්නයක් මතු කරමින් ඇයට කිසිදු සම්බන්ධතාවක් නොමැති කරුණකට අදාළව මා වෙත ද්වේෂසහගත කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

මා විසින් කිසිදු අවස්ථාවක මන්ත්‍රීවරියක් ඉලක්ක කර, මන්ත්‍රීවරියක් නම් කරමින් එවැනි ප්‍රකාශයක් සිදු කර නොමැත. මා මන්ත්‍රීවරියන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රකාශ කරන ලද අතර, මන්ත්‍රීවරියන්ගේ ගෞරවය රැක ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

කිසිම කථාවකට හෝ කිසිම සම්බන්ධතාවක් නැති මන්ත්‍රීවරියකට විනාඩි 05කට අධික කාලයක් මේ අය වැය විවාදය අතරතුර Standing Orders අනුව කථානායකතුමා විසින් ලබා දෙන ලදී. අය වැය විවාදයේදී සමහර අයට කථාවට හම්බ වෙන්නේත්, විනාඩි 5යි.

තවද, යම් ප්‍රකාශයක් කරන අවස්ථාවක ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, සභානායක පාර්ලිමේන්තුවේ සිටි අතර, තවද එවැනි ආරෝපණයක් කළා කියා සඳහන් කරන ලද මන්ත්‍රීවරිය ද පාර්ලිමේන්තුවේ සිටි අතර, ඔවුන් විසින් මේ දක්වා ඒ සම්බන්ධයෙන් කිසි ප්‍රකාශයක් කර නොමැත.

එයට හේතුව නම්, මා එවැනි දෙයක් නොකළ නිසායි. මේ, දින තුනකට පස්සේ. තවද, එම මන්ත්‍රීවරිය විසින් දෙවන හා තෙවන පාර්ශ්වවලට අදාළව නම් සඳහන් කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් එම කථාබහට ආරෝපණය කිරීමෙන් ඒ අය පත්වන අපහසුතාව සම්බන්ධයෙන් සමාව ගත යුත්තේ මා නොව එම මන්ත්‍රීවරියයි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් සිය විදේශ ගමන් වෙනුවෙන් රැගෙන යෑමට නම් කර සිටි කාන්තාවක් සම්බන්ධයෙන් ඇති වූ කථිකාවකින් පසු ගරු ජනාධිපතිතුමා විසින් එම කාන්තාවගේ විදේශ ගමන් නතර කරන ලදී. අපි ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එවැනි ආදර්ශයක් ආණ්ඩු පක්ෂයට ලබා දීම සම්බන්ධයෙන්. ඒ වාගේම එතුමා තීරණය ගන්නට ඇත්තේ එම කාන්තාවගේ ආරක්ෂාව පිළිබඳ කාරුණික හැඟීමකින් විය යුතුය. ඇයට කුමන බලහත්කාරකම්වලට මුහුණ දීමට සිදුව ඇත්ද යන්න අපි නොදනිමු. ඇයට සමාජයෙන් විශාල මඩ පහරක් මේ වන විට එල්ල වී ඇත; සමාජ මාධ්‍යවල ඒ රූපය දමමින් ඉතා අපහසුතාවට පත් කර ඇත. ඒ අපහසුතාවට පත් කරන්න ඒ සිදුවීම පාදක වී ඇත.

ඒ වාගේම, ඒ අවස්ථාවේදී තමයි එම කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරියන්ට අනිවාර්යයෙන්ම පෙනී

සිටින්න තිබුණේ, ඒ කාන්තාව වෙනුවෙන්. කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් එවැනි ඉදිරිපත් වීමක් අප නොදුටු අතර, එයින් එම මන්ත්‍රීතුමියගේ දෙබිඩි පිළිවෙතක් පිළිබිඹු වේ. එම මන්ත්‍රීතුමිය "ස්ත්‍රී විරෝධී" කෙනෙකු ලෙස මා ඍජුවම නම් කිරීම ඇතුළුව එතුමිය සිදු කළ සෙසු ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කළ යුතුය. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මාහට ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඒ වාගේම, ගරු කථානායකතුමනි, මගේ නම සඳහන් කළ අවස්ථාවේ මම ඔබතුමාගෙන් point of Order එකක් නඟන්න අවසර ඉල්ලුවා, මගේ නම ආරෝපණය කළා කියලා.

ඒ අවස්ථාව මට ලැබුණේ නැහැ. ඔබතුමා මාව එළියට දමනවා කියලාත් කිව්වා. එළියට දමන්න තරම් කිසිම දෙයක් සිදු වුණේත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
I am finishing up, Sir.

ඒ වාගේම, අර්චුනා මන්ත්‍රීතුමා රීතිය අනුව ඔබතුමාට ඒ කාරණය ඉදිරිපත් කරද්දී - නම සඳහන් කළ බව කියද්දී - ඔබතුමා ඒ අවස්ථාව ලබා දුන්නේ නැහැ. ඉතින් අපි බලාපොරොත්තු වෙනවා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. ඒ අදාළ ගරු මන්ත්‍රීතුමියට -

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කිසිම සම්බන්ධයක් නැතුව ඔබතුමා විනාඩි 5කට වඩා අවස්ථාව දෙනවා නම්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කිසිම නමක් සඳහන් කරන්නේ නැතුව, ආරෝපණය කරන්නේ නැතුව, ඉතාම අසාධාරණ ලෙස ඔබතුමා-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අදාළ ගරු මන්ත්‍රීතුමියට වරප්‍රසාද ප්‍රශ්නයක් නැඟීමේ හැකියාව තිබෙනවා. එතුමියගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා නම්, ඒ විධියේ හිංසාවක් පිළිබඳව කියන්න තිබෙනවා නම්, එතුමියට පුළුවන් වරප්‍රසාද ප්‍රශ්නයක් නැඟීමට. ගරු මන්ත්‍රීතුමනි, මම ඒ අවස්ථාවේදීම ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටියා, ඒ අදාළ මන්ත්‍රීතුමියට.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමා තනිකරම අසත්‍ය ප්‍රකාශයක් කරන්නේ. අදාළ කථා බහ සිදු වුණු අවස්ථාවේදී ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා මෙතුමා අතීතයේ කළ කී දෑ සිහිගන්වන විටදී ඒක යටිමඩි ගසා ගන්න-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, මේකට අදාළතාවක් තිබෙනවා නම්,-

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
සමාවෙන්න, ගරු කථානායකතුමනි. ප්‍රශ්නයක් නඟමින් අර මන්ත්‍රීතුමිය කියලා point out කරලා මාව පෙන්වලා ඉවර වෙලා තමයි ඒ වාගේ ප්‍රකාශයක් සිද්ධ කළේ. මා වෙනුවෙන් තමයි මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරියන් විසිදෙදෙනා නියෝජනය කරමින් ගරු ලක්මාලි මන්ත්‍රීතුමිය ඒ අවස්ථාවේදී කථා කරනු ලැබුවේ. මම මේ වන විටත් ලිපි ලේඛන සකස් කරලා අවසානයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයට මේ කාරණය ඉදිරිපත් කිරීමට සහ ගරු කථානායකතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කිරීමට. අසත්‍ය ප්‍රකාශයක් තනිකරම මේ සිදු කරනු ලබන්නේ, මේ සභාව නොමඟ යැවීමට. අපට වීඩියෝ බලලා දැන ගන්න පුළුවන්, එදා සිද්ධ වුණු ඇත්තම සිදුවීම මොකක්ද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, මේ සම්බන්ධයෙන් ඔබතුමිය අදාළ වරප්‍රසාද ප්‍රශ්නය නැඟීමට කටයුතු කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, Thank you so much.

මට දැන ගන්න පුළුවන්ද, මගේ වරප්‍රසාද කැඩුණු බව කියන කොට තවත් කෙනෙකුට නැඟිටලා, "මගේ වරප්‍රසාද කැඩුණා" කියලා ගරු කථානායකතුමාට present කරන්න පුළුවන්ද කියලා?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතැන වෙන ප්‍රශ්නයක් තිබෙන්නේ. එතැනදි Proceedings පිළිබඳ ගැටලුවක් කථා කළේ.

මීළඟට, පනත් කෙටුම්පත්- *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමාට මිනිත්තු දෙකක අවස්ථාවක් ඉල්ලනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට විනාඩි දෙකක් ලබා දෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, බාධාවකින් තොරව මට මේ කරුණ ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දෙන්න කියලා. විශේෂයෙන්ම රජය යෝජනා කර තිබෙනවා, වතු කම්කරු ප්‍රජාවට දැනට ලැබෙන දෛනික අවම වැටුප වන රුපියල් 1,350ට අමතරව රුපියල් 400ක වැඩි කිරීමක් කරන්න. ඒ, රුපියල් 200ක් ආයතන හරහා සහ රුපියල් 200ක් රජයේ මැදිහත්වීමෙන්. ඇත්තවශයෙන්ම ඒ වැඩි කිරීම පිළිබඳව අපේ ස්තූතිය, අපේ අනුමැතිය, අපේ ප්‍රශංසාව මේ අවස්ථාවේදී පළ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඒක අය වැය විවාදයේදී ඔබතුමාට යොමු කරන්න පුළුවන්.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත
### செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் (திருத்தம்) சட்டமூலம்
### STRATEGIC DEVELOPMENT PROJECTS (AMENDMENT) BILL

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා විසිනි.***

***2025 නොවැම්බර් 28වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 நவம்பர் 28, வெள்ளிக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Anil Jayantha on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Friday, 28th November, 2025 and to be printed; and to be referred to the Committee on Public Finance.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානයන්ගෙන් සහ 2025 ඔක්තෝබර් 23 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026, දෙවන වර කියවීමේ විවාදය. හයවන වෙන් කළ දිනය.

# විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.*
*ඊට අදාළ ප්‍රශ්නය - [නොවැම්බර් 07]*
*"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]*
*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [ நவம்பர் 07]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக" .- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [07th November]*
*"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]*
*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීම, the Hon. Chandima Hettiaratchi. You have ten minutes.

[පූ.භා. 10.07]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
ගරු කථානායකතුමනි, I am honoured to deliver my speech while you are presiding.

ගරු කථානායකතුමනි, 2026 වර්ෂය සඳහා වූ අය වැය පිළිබඳව විවාද කරන වෙලාවේ, 2026 අය වැය මෙන්ම 2025 අය වැය සම්බන්ධයෙනුත් ලොකු සාකච්ඡාවක් මතු වෙලා තිබෙන වෙලාවක පළමුකොටම මම කැමැතියි, ඉතිහාසය පුරා විවිධ රජයන් ඉදිරිපත් කළ අය වැය ලේඛනවල ආදායම් වියදම් සම්බන්ධයෙන් ගරු සභාවේ අවධානය යොමු කරන්න.

ගරු කථානායකතුමනි, 2015 වර්ෂයේ සිට ගත්තොත්, හැම දාම ආදායම සහ වියදම අතර පරතරය තිබුණේ සෘණ අගයක. ඇස්තමේන්තු කරනවා, හැබැයි ඒ ඇස්තමේන්තුව අසo0ලකටවත් එන්න පුළුවන්කමක් නැහැ. ගරු කථානායකතුමනි, 2022දී අය වැය හිඟය රුපියල් මිලියන 200යි. 2015 සිට 2023, 2024 යනාදී වර්ෂ සියල්ලේම පැවතියේ අය වැය හිඟයක්. ගරු කථානායකතුමනි, මේ වර්ෂයේ තමයි අපි එය ධන අගයක් දක්වා අරගෙන එන්නේ. හැබැයි, මේ අය වැය හැදුවේ සමහරුන්ට අනුව මොන්ටිසෝරි ළමයි. හැබැයි, මීට කලින් ඉදිරිපත් කළ අය වැය ඔක්කෝම හැදුවේ බොහොම දැන උගත්, උපාධිධාරි මහත්වරුන්. ඒ, කවුද? හරියට "කපුටාස් කෝප්පුස්" වාගේ අය. ඊට පස්සේ, "මහ බැංකු රොබර්ස් ඇන්ඩ් ෆුට්නෝට් බ්‍රදර්ස්" වාගේ උගත් මහත්වරුන්. එවැනි අය හදපුවා සෘණ, මොන්ටිසෝරි ළමයි හදපුවා ධන.

ගරු කථානායකතුමනි, මම ඊළඟට ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, ප්‍රාථමික ශේෂය කෙරෙහි. ප්‍රාථමික ශේෂය කියන්නේ මොකක්ද? රජයේ ආදායම් හා ප්‍රදානවලින්, ණය පොලී නොවන වියදම් අඩු කළාම ප්‍රාථමික ශේෂය එනවා. සරලව කිව්වොත්, අදායම්වලින් වියදම් අඩු කළාම එන ශේෂය. ඒක ධන වුණොත් හොඳයි, සෘණ වුණොත් අවුල්. ඉතිහාසය ගත්තොත්, 2019 වර්ෂයේ ප්‍රාථමික ශේෂය ඇස්තමේන්තු කරනවා, රුපියල් බිලියන 228කට. හැබැයි, ඒක නවතින්නේ සෘණ අගයක, රුපියල් බිලියන 536ක. 2020දීත් සෘණ අගයක්, රුපියල් බිලියන 400යි. 2021දීත් සෘණ අගයක්, රුපියල් බිලියන 1,010යි. 2022දීත් සෘණ අගයක්, රුපියල් බිලියන 954යි. 2023දීත් සෘණ අගයක්, රුපියල් බිලියන 895යි. 2024දී ඔන්න යන්තම් ධන අගයකට ආවා, රුපියල් බිලියන 650ක. 2025දීත් ධන අගයක්, රුපියල් බිලියන 1,202ක. ඒ කියන්නේ, රුපියල් කෝටි 120,000ක්. ඒ කියන්නේ මේ අවුරුද්දේ අපට වාර්තා කරන්න පුළුවන් වෙලා තිබෙනවා, ධන අගයක්. ඔන්න එතකොට සමහරුන්ට ඇඬෙනවා. සමහරුන්ට අමාරුයි. සමහරු කයිකතන්දරත් කියනවා. දැන් මොනවාද කියන්නේ? ගරු කථානායකතුමනි, මේක රුපියල් කෝටි 120,000ක් වෙන්න කලින් මෙම අය වැය ඉදිරිපත් කරන වෙලාවේ අපේ උගත් මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, "මෙහෙම වාහන ගන්නේ කවුද. මේක අත්පත් කර ගන්න බැරි වන ඉලක්කයක් කියලා අපි හිතනවා" කියලා.

හැබැයි එතුමා වෘත්තියෙන් මේ විෂය ගැන දන්නා කෙනෙක්. එතුමා අය වැය කථාවෙන් පස්සේ, පසුගිය 8වෙනි දා විද්‍යාර්ථියෙක් විධියට කිව්වා, "ඇත්ත අපට වැරදුණා, මේ රටේ භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා ගිහින් තිබෙනවා" කියලා. හොඳයි, අවංකම ඒ ගැන සතුටුයි.

ගරු කථානායකතුමනි, එතුමා එහෙම කියන්න හේතුව මොකක්ද? මේක පිටුපස කථාවක් තිබෙනවා. එතුමා ආර්ථිකය පිළිබඳව දන්නා කෙනෙක් නිසා එතුමා ඕක නිකම් කියන්නේ නැහැ. ප්‍රාථමික ශේෂය ධන අගයක් වුණාම ඇත්තටම ඒ තුළින් ලැබෙන වාසි මොනවාද? මෙය ධන අගයක පැවතීම නිසා අපේ ණය අඩු කර ගන්න පුළුවන්. මොකද, එතකොට ණය පොලී ගෙවන්නත් පුළුවන් වනවා. මේ තුළින් අනාගත අය වැය ඇතුළේ එළදායි වියදම් කරන්න ආණ්ඩුවට, මුදල් අමාත්‍යවරයාට තීන්දු තීරණ ගන්න පුළුවන් විධියේ ඉඩක් හැදෙනවා. අන්න ඒකත් විශේෂ වැදගත්කමක් වනවා.

ඊළඟ කාරණය, creditworthiness. උදාහරණයක් ගත්තොත්, දැන් රටේ මූල්‍ය විනයක් තිබෙනවා කියන එක රටට විතරක් නොවෙයි, ලෝකයටත් පේන්න පටන් ගන්නවා. ගරු කථානායකතුමනි, Fitch Ratings වාගේ ආයතනවල ණය ශ්‍රේණිගත කිරීම්වල - credit ratingsවල - අපි කලින් හිටියේ RD - Restricted Default - තත්ත්වයේ. අපි දැන් RD කියන තැන ඉඳන් CCC+ තැනට මේ හරහා එනවා. ඒක ලෝකයට පේනකොට, ඒක ලෝකය අවධානයට ගන්නවා, රට ඇතුළට ආයෝජන අරගෙන එනකොට.

ඊළඟ කාරණය තමයි, ණය ගැනීමේ පිරිවැය. ගරු කථානායකතුමනි, අපි ණය ගෙවා ගන්න බැරි අධි අවදානම් රටක් නම්, අපේ ණය ලැබෙයිද, නැද්ද කියලා ෂුවර් නැත්නම් අපේ ණය ගැනීමේ පිරිවැය වැඩි වෙනවා. ඒ, මූල්‍ය සහ ණය පැත්තෙන් මේකේ තිබෙන වාසිය.

Macroeconomics පැත්තෙන් ගත්තොත්, ඒකේත් effect එකක් තිබෙනවා. සාර්ව ආර්ථිකය ගැන කථා කළොත්, දැන් උද්ධමන පීඩනය අඩු වෙනවා. මහ බැංකුවට හැම වෙලාවේම, අපේ වියදම් පියවා ගන්න ණය අරගෙන දෙන්න, ණය අරගෙන දෙන්න කියලා ආණ්ඩුව කෙඳිරිගාන්න ඕනෑ නැහැ, අපට අතිරික්තයක් තිබෙනවා නම්. ඒ අනුව ඒකෙන් උද්ධමනය

[ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා]

කෙරෙහි තිබෙන පීඩනය අඩු කරනවා. ගරු කථානායකතුමනි, ණය ගන්නේ අඩුවෙන් නම් ස්ථාවර සහ අඩු ණය පොලියක් පවත්වාගෙන යන්න පුළුවන්, ව්‍යාපාර සහ රටේ ජනතාව වෙනුවෙන්. විනිමය අනුපාත සම්බන්ධයෙන් ගත්තොත්, external sector එක ගත්තොත්, මෙහෙම වුණාම විනිමය අනුපාත ස්ථාවර තත්ත්වයක තියාගන්න පුළුවන්. එළියෙන් එන ආයෝජකයන්ට - investorsලාට - රට ඇතුළේ විශ්වාසයක් හදනවා, රට තුළ මූල්‍ය ප්‍රතිපත්තියක් තිබෙනවා, හොඳයි, ඒක වැඩ කරනවා, ඒක ස්ථාවරයි කියලා. ඒ වාගේම දේශපාලනය ඇතුළේ ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා, තමන්ගේ policy decisionවලට, ප්‍රතිපත්තිමය නම්‍යතාව සුරකින්න, flexibility එකක් තියාගන්න. The Hon. (Dr.) Harsha de Silva knows all these things very well. ඒ නිසා තමයි එතුමා මේක කියන්නේ.

ඒ වුණාට හදිසියේ අපේ විපක්ෂ නායකතුමා කලබල වෙලා මොකක්ද කියන්නේ? මීට කලින් එක මහත්තයෙක් කියලා තිබුණා, ඕනෑම ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කියලා. ඒ වාගේම විපක්ෂ නායකතුමා කියනවා, "මොන්ටිසෝරි ළමයින්ටත් පුළුවන්, භාණ්ඩාගාරය පුරවන්න" කියලා. සමහර විට එතුමා හිතුවාද දන්නේ නැහැ, සකල බුජං සකල බුජන් කි කියන පොඩි කොලු පැටියා කොට කලිසමක් ඇඳගෙන වැල්ලේ ලස්සනට මාළිගාවක් හදලා ඒ වැලි මාළිගාවට පොල්කට්ටෙන් වැලි පුරවනවා වාගේය කියලා භාණ්ඩාගාරය පුරවන එකත්. එහෙම නම් ඒක හරි ඇති.

ගරු කථානායකතුමනි, හැබැයි එතුමා මේක කිව්වේ අපේ ගරු ජනාධිපතිතුමාට නොවෙයි. එතුමා මේක කිව්වේ කාටද දන්නවාද? එතුමා මේ මොන්ටිසෝරි කථාව කිව්වේ කාටද? එතුමා කිව්වේ මෙහෙම නේ. "පිරිලා ඉතිරිලා ගියා කියලා භාණ්ඩාගාරය ගැන කියපු කථා අපි පිළිගන්නවා කියලා කිව්ව මොන්ටිසෝරි කථාව පිළිගන්න එපා" කියලා තමයි එතුමා කිව්වේ. ඒ මොන්ටිසෝරි කථාව කියපු කෙනාටම තමයි නැවත ඒ මොන්ටිසෝරි කථාව කිව්වේ, අපේ ජනාධිපතිතුමාට නොවෙයි. ඒක නේ ඉන්දියාවේ යනකොට කියලා ගියේ නැත්තේ, ඒක නේ ඉන්දියාවට ගිහින් ඇවිල්ලා කිව්වේත් නැත්තේ. ඒ මොන්ටිසෝරි කථාව කිව්වේ වෙන කාටවත් නොවෙයි. ඒක ඒගොල්ලන්ගේ අභ්‍යන්තර ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමනි, මේකේ වැදගත්ම කොටසක් තිබෙනවා. ඒ තමයි, මේක පරිපූරක ඇස්තමේන්තු දාපු නැති අවුරුද්දක්. ඒ නිසා ලෝකයට සහ රට ඇතුළේ විශ්වාසය හදලා තිබෙනවා හරි පිළිවෙළට. සැරින් සැරේ ආර්ථික ප්‍රතිපත්ති වෙනස් කරන්නේ නැහැ, එහෙම වෙනස් කරන්න වුවමනාවක් නැහැ, ඒ නිසා බය නැතුව මේ රටට ආයෝජන කරන්න එන්න පුළුවන් කියන අදහස හදලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේක විශ්වසනීය ආණ්ඩුවක් කියන කාරණය ඒකෙන් එළියට තහවුරු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය ලේඛනයේ 6 වන පිටුවේ තිබෙන එක් කොටසකට අවධානය යොමු කරන්න මම කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
ගරු කථානායකතුමනි, මම තව පොඩි කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have to wrap up now.

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
Okay.

ගරු කථානායකතුමනි, එතුමා එහි එක් තැනක කියනවා, අපි රජයේ ආදායම සියයට 15.3ක, 15.4ක අගයක තබාගන්න ඕනෑ කියලා. එම අගයේ තබා ගත්තොත් අපට ඩොලර් මිලියන 7.9ක ණය සේවාකරණයේ වාසියක් ගන්න පුළුවන් කියලා කියනවා. මේ අවුරුද්දේම අපි සියයට 15ට ඇවිල්ලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. එහෙම වුණොත් ඩොලර් මිලියන 63ක විශාල ණය වාසියක් අපට අත්පත් කරගන්න පුළුවන්. හැබැයි, විපක්ෂ නායකතුමා හැම වෙලේම කියනවා, බදු ගහලා; බදු ගහලා; බදු ගහලා, භාණ්ඩාගාරය පුරවලා මොනවා කරන්නද කියලා. ඒගොල්ලන් මේ රට ණය කළා. ණය කරලා හිඟන්නෝ කළා. අන්න, ඒ ණය ගෙවන්න තමයි ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව මහන්සි වෙන්නේ. ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. අපි මේ කාරණයත් අහන්න ඕනෑ. වතුකරයේ දෙමළ ජනතාවගේ ඡන්දයෙන් පත් වෙලා ආපු සමහර මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. හැබැයි, ඒ වතු කම්කරුවන්ට රුපියල් 200 ගෙවීම ගැන පැමිණිලි කරනවා. රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියගෙන් අහන්න ඕනෑ, මේක ඔබතුමියගේ ස්ථාවරය විතර ද, සමගි ජන බලවේගයේත් ස්ථාවරය ද කියලා. ලජ්ජා නැද්ද? මේ රටේ අහිංසක වතු කම්කරු ජනතාවට රුපියල් 200ක් දෙන්න හදනකොට, ගිහිල්ලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරන්න ලජ්ජා නැද්ද? ලජ්ජාවක් තිබෙනවා නම් කොහොමද ගමට යන්නේ? එතුමිය මැයි දිනය සැමරුවේ වතු කම්කරුවන් එක්ක. එහෙම කරලා, දැන් වතු කම්කරුවන්ට පැමිණීමේ දීමනාවක් විධියට රුපියල් 200ක් දෙනකොට ලජ්ජා නැතුව ගිහිල්ලා කොහොමද පැමිණිලි කරන්නේ? මේක ඔයගොල්ලන්ගේ පක්ෂයේ ස්ථාවරය ද කියලා කියන්න. ලජ්ජා නැතුව ගිහිල්ලා ජනතාවට එරෙහිව පැමිණිලි කරන්නේ කොහොමද?

ගරු කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසාන කරනවා. මේ ආණ්ඩුව යන්නේ නිශ්චිත ගමනක්, ජනතාවාදී ගමනක්. ඒ ජනතාවාදී ගමන ජයග්‍රහණයෙන් තොරව නතර කරන්නේ නැහැ කියන කාරණය අපි තහවුරු කරලා, ජනතාවට ඒ ජයග්‍රහණය අරගෙන දීලා තමයි මේ ගමන නතර කරන්නේ.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. S.M. Marikkar. You have 22 minutes.

[පූ.භා. 10.19]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මම කථාව ආරම්භ කරන්න කලින් මේ කාරණය කියන්න කැමැතියි. මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා දේශපාලන වේදිකාවක කථා කරනවා වාගේ ඉතා උද්වේගකර කථාවක් සිදු කළා. අපි පැහැදිලිව කියන්න ඕනෑ, රජය වතු කම්කරු ජනතාවට රුපියල් 200ක් ලබාදෙන එකට අපි කිසිසේත්ම විරුද්ධ නැති බව. පක්ෂයක් විදියට අපි ඒකට කැමැතියි. මොකද, අපි විශ්වාස කරනවා, වතුකරයේ දෙමළ ජනතාවට වාගේම උතුරේ දෙමළ ජනතාවටත් ඉතිහාසය විසින් කරපු අසාධාරණකම්වලට, අඩුපාඩුකම්වලට සාධාරණය ඉටු කළ යුතුයි කියලා. අපි එදා වාගේම අදත්, හෙටත් ඒ මතයේ තදින්ම ඉන්න පක්ෂයක්. එතුමාට ඒ උත්තරය ලබා දීලාම මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මේ අය වැය කියවනකොට මට නිකම් තේරුණේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ මුණුබුරා ඇවිල්ලා අය වැය කියවනවා වාගෙයි. ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක, රණසිංහ ප්‍රේමදාස, රොනී ද මැල් අත්පුඩි ගහනවා වාගේ තමයි මම දැක්කේ, එතුමා මේ අය වැය කියවනකොට. මොකද හේතුව, මේ වාමාංශික ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන්නේ ලිබරල්වාදී අය වැයක්. රාජ්‍ය සම්පත් විකුණන්නේ නැහැ කියලා අවුරුදු ගණනාවක් මිනිස්සුන්ව මහ පාරට බස්සලා වැඩ වර්ජන, උද්ඝෝෂණ කරලා, මේ රටේ ආර්ථිකය කාබාසිනියා කරපු, මේ රටේ ආර්ථිකය කඩා වට්ටන්න ප්‍රධානතම දායකත්වය ලබා දුන් කණ්ඩායම විසින් පාඩු ලබන රාජ්‍ය ආයතන විකුණනවා කියලා අමු අමුවේ කියන අය වැයක් ගැන මට නම් ඇත්තටම සතුටුයි. මම ජනාධිපතිතුමාටත්, ආණ්ඩුවටත් ඒකට නම් ස්තුතිවන්ත වෙනවා. හරිද? මම ඒකට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, දැන් මේ භාණ්ඩාගාරයේ සල්ලි උතුරලා කියන කථාව කියනවා. දැන් ඇස්තමේන්තු කරපු ආදායම රුපියල් බිලියන 4,990ක මුදල රුපියල් බිලියන 5,100ට වැඩි කර ගන්නවා ලු. ඔව්, ඇයි? රීරි යකා ලේ මාංශ උරා බොනවා වාගේ බදු ගහලා, ගහලා, බදු පිට බදු ගහලා ආදායම් වැඩි කරනවා. ඉතින්, ඒක ඕනෑ කෙනෙකුට කරන්න පුළුවන් තමයි. වතුර බිල් වැඩි කරලා, කරන්ට් බිල් වැඩි කරලා, බදු වැඩි කරලා, VAT වැඩි කරලා, බඩු මිල වැඩි කරලා ඕනෑ කෙනෙකුට ආදායම් හොයන්න පුළුවන්. ඒකට මහා ලොකු ආර්ථික විශේෂඥයෙක් වෙන්න ඕනෑ නැහැ. ඒ වාගේම, වියදම් කරන්න තිබෙන මුදල් ඉතිරි කරලා අය වැය පරතරය අඩු කරන්න පුළුවන්. ඒක අපේ ගෙදර අම්මත් කරනවා නේ. තාත්තා පඩිය ගෙනැවිත් දුන්නාට පස්සේ අම්මා දන්නවා පොළට මෙච්චරයි, වතුර බිල මෙච්චරයි, ටියුෂන් එකට මෙච්චරයි කියලා වෙන් කරන්න. අච්චරයි, මෙච්චරයි කියලා පටි තද කරගන්න ඒගොල්ලනුත් දන්නවා.

දැන් වියදම් කරන්න ඇස්තමේන්තු කරලා තිබුණේ රුපියල් බිලියන 7,190යි. ඒක රුපියල් බිලියන 6,548ට අඩු කරලා තිබෙනවා. කොහොමද මේක අඩු කරලා තිබෙන්නේ? දැන් සුමාන 2කට කලින් මහා මාර්ග අමාත්‍යාංශයෙන් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා; වියදම් කරන්න තිබුණු රුපියල් බිලියන 36ක් වියදම් කරගන්න බැරිව භාණ්ඩාගාරයට හරවා යවනවා.

ගරු කථානායකතුමනි, අපි පළමුදා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව රැස් වෙලා අදාළ අමාත්‍යාංශ හතරේ progress review එකක් කළා. ගොඩාක් ආයතනවල වෙන් කරපු මුදල්වලට වැඩ කෙරිලා නැහැ. උතුරේ පාලම් හදන්න දීපු සල්ලිවලට වැඩ කෙරිලා නැහැ. මෙතැන නිකම් බොරුවට දෙසනවා. ගරු කථානායකතුමනි, වියදම් කරන්න තිබෙන මුදල් වියදම් නොකර මිනිස්සුන්ව තළා පෙළා මිරිකලා බදු ආදායම් වැඩි කරලා, ඕනෑ කෙනෙකුට භාණ්ඩාගාරය උතුරවන්නත් පුළුවන්; අය වැය පරතරය අඩු කරන්නත් පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ. අපි පැහැදිලිව කියනවා, මේ අවුරුද්දේදී හෝ අඩුම ගණනේ පොරොන්දු වෙච්ච ඒවා කියන්න, පොරොන්දු වෙච්ච ඒවා කරන්න කියලා. බලය ගන්න කලින් කිව්වේ මොකක්ද? ඩොලර් බිලියන 41ක ණය ගෙවන එක මහ කජ්ජක්ද ඇහුවා. ණය ගන්න ආණ්ඩුවක් ඕනෑද ඇහුවා. හැබැයි, මේ අවුරුද්දේ පොරොන්දු වෙලා තිබෙන ගණන වියදම් කළොත් ඩොලර් බිලියන 5.8ක මුදල් ප්‍රමාණයක් ණය ගන්න ඕනෑ. මොකද, මේගොල්ලෝ රට භාර ගන්නකොට ඩොලර් බිලියන 93යි ණය තිබුණේ. අවුරුද්දක් ඇතුළත අධිවේගී මාර්ග හදලාත් නැහැ, ගුවන් තොටුපොළවල් හදලත් නැහැ. මම හිතන විදියට, දැනෙන සංවර්ධනයක් කරන්නේ නැතිව ණය සීමාව ඩොලර් බිලියන 105ක් දක්වා ඉහළ නැඟලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙවර අය වැය කථාව පටන් ගන්නේ මාර ඔස්තාර්ලා ටිකක් නේ. එක්කෙනෙක් ඇවිල්ලා කිව්වා, "ආණ්ඩුවේ ඉන්නවා, එකසිය ගණනක් කදිර්ගාමර්ලා වාගේ අය" කියලා. දැන් "හර්ෂණගාමර්" ඇවිල්ලා කියනවා, රටේ තෙල් පෝලිම්, ගෑස් පෝලිම් තිබෙනකොට තමයි ලු එතුමන්ලා ආණ්ඩුව භාර ගත්තේ. මම දන්නේ නැහැ, මේ වාගේ විහිළු සපයන්නේ ඇයි කියලා. මට අනෙක් එක්කෙනාගේ නම මතක නැහැ, කවුද කියලා. ඒ "ගාමර්" ඇවිල්ලා කිව්වා, - පෙරේදා ද කොහේද කිව්වේ. "ආණ්ඩුව ගනිද්දි මේ රටේ ඩොලර් තිබුණේ නැහැ, රුපියල් තිබුණේ නැහැ" කියලා. භාර ගන්නකොට ඩොලර් බිලියන පහයි දශම ගණනක් තිබියදී භාර ගත්තේ. පට්ටපල් බොරු නේ මේ කියන්නේ. මේ රටේ මිනිස්සු පුනක්කු කනවා, තණකොළ කනවා කියලා හිතාගෙන ද දන්නේ නැහැ මේ කථා කරන්නේ. ගරු කථානායකතුමනි, මේ අය වැය පතෝල අය වැයක්. ගුණත් නැහැ, අගුණත් නැහැ.

දැන් අපි බලමුකෝ මේගොල්ලන් මේ රටේ ජනතාවට කොච්චර කථා කිව්වාද කියලා. මේ රටේ ජනතාවට කිව්වා, අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරනවා කියලා. අය වැය දෙකක් ඉදිරිපත් කළා, සියයට හය වෙන් කරලා නැහැ. මට මතකයි, ගරු අගමැතිතුමිය එදා - මගේ දුරකථනයේ ෆොටෝ එකකුත් තිබෙනවා - ටී-ෂර්ට් එකකුත් ඇඳගෙන ගියේ, අධ්‍යාපනයට සියයට හයක් වෙන් කරන්න ඕනෑ කියලා කියමින්. අද නිහඬයි. ඊළඟට කිව්වා, පළමු අය වැයෙන්ම අධ්‍යාපනය, ආහාර, සෞඛ්‍ය සඳහා වැට් එක බින්දුවට ගෙනෙනවා කියලා. මේ වන විට දෙවැනි අය වැයත් ඉදිරිපත් කරලා තිබෙනවා. වගේ වගක් නැහැ, ඒ ගැන කථාවකුත් නැහැ. ඒ ගැන කියන්නේත් නැහැ. ඒක කළා නම් ගිය අවුරුද්දේ රුපියල් 10,000ට ගත්ත බඩු මල්ල, එහෙම නැත්නම් ගිය අවුරුද්දේ රුපියල් 10,000ට ගත්ත බෙහෙත් ටික, එහෙම නැත්නම් රුපියල් 10,000ට ගත්ත පොඩි එකාගේ පෑන්, පැන්සල්, පොත් පත් ටික අද ඒ විදියට ගන්න පුළුවන් වෙන්න එපා යැ. නැත්නම් ඊට වැඩිය මිල අඩු වෙන්න එපා යැ.

බදු අඩු කරලා නැහැ, හැබැයි මිල වැඩි වෙලා තිබෙනවා. ඒක අපි ආණ්ඩුවට මතක් කරලා දෙන්න කැමැතියි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හැම තෙල් ලීටරයකින්ම මහා භාණ්ඩාගාරයට ලබා දෙන රුපියල් 50 මේ අය බලයට ආ ගමන් අයින් කරනවා කිව්වා. එතකොට මිනිස්සු හිතුවා, අනේ එහෙනම් තෙල් ලීටරයක මිල රුපියල් 180ට අඩු වෙයි කියලා. අද වෙනකොට අය වැය දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් ඒ ගැන වගේ වගක් නැහැ. ඊළඟට මේගොල්ලන් ගණන්-ඉලක්කම් සහිතව කිව්වා,

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කියලා. රුපියල් 9,000 බිල රුපියල් 6,000ට ගේනවා කිව්වා. රුපියල් 6,000 බිල රුපියල් 4,000ට ගේනවා කිව්වා. රුපියල් 3,000 බිල රුපියල් 2,000ට ගේනවා කිව්වා. දැන් ඒ ගැන කථාවක්වත් නැහැ. පම්පෝරි විතරයි. අපි පැහැදිලිව කියනවා, මේ අය වැය නිකම් හිස් වචන ගොඩක් විතරයි, පොඩි එකාගේ සුරංගනා කථා පොතක් කියවනවා වාගේ තමයි පැය හතරහමාරක් තිස්සේ මේ අය වැය කියවලා තිබෙන්නේ කියලා.

ගරු කථානායකතුමනි, තරුණයන්ට ව්‍යාපාර පටන් ගන්න ඇප නැතිව ණය දෙන්න බැංකුවක් පටන් ගන්නවා කිව්වා. කෝ, දැන් ඒක? අය වැය දෙකක් කියවලා ඉවරයි නේ. ඒකත් නැහැ. ඊළඟට කිව්වා, වෘත්තියවේදීන් තොගයක් ඇවිල්ලා, දක්ෂ විධියට පරිපාලනය කරන, ඉතිහාසයේ පළමුවැනි වතාවට රුපියලක්වත් හොරකම් නොකරන, නාස්ති නොකරන ආණ්ඩුවක් මේ ඇවිල්ලා තිබෙන්නේ කියලා. ගරු කථානායකතුමනි, මේ තිබෙන්නේ කෙරුවාව! මේ නිසායි දැන් රාජ්‍ය ආයතන වහන්න කථා කරන්නේ. පසුගිය අවුරුද්දේ ලාභ ලබපු ආණ්ඩුවේ සමාගම්වල ලාභය දැන් අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම පාඩු ලබපු සමාගම්වල පාඩුව වැඩිවෙලා තිබෙනවා. මම ඔබතුමාට උදාහරණයක් කියන්නම්. අයිටීඑන් නාළිකාව පසුගිය අවුරුද්දේ රුපියල් මිලියන 3ක profit එකක් ලැබුවා. හැබැයි, මේ අවුරුද්දේ අයිටීඑන් නාළිකාවේ සහ රූපවාහිනී සංස්ථාවේ loss එක රුපියල් මිලියන 580ක්. මෙන්න, වැඩ්ඩන්ගේ පරිපාලනයට වෙලා තිබෙන දේ. ඊළඟට, ලංකා විදුලිබල මණ්ඩලය මේ අවුරුද්දේ රුපියල් මිලියන 10,700ක් පාඩුයි. සීමාසහිත ලංකා සීනි සමාගම රුපියල් මිලියන 2,600ක් පාඩුයි. ඊළඟට, ඖෂධ සංස්ථාව රුපියල් මිලියන 330ක් පාඩුයි. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව රුපියල් මිලියන 640ක් පාඩුයි. ගුවන් විදුලි සංස්ථාව රුපියල් මිලියන 310ක් පාඩුයි. මාර කදිරගාමර්ලා සෙට් එකකුයි, ගෝලයෝ සෙට් එකකුයි ඉන්නේ. එහෙම නේද? මට තව දෙන්න පුළුවන්, පෝලිමක්. මම මේ උදාහරණ කිහිපයක් තමයි ගත්තේ. ගරු කථානායකතුමනි, කයිවාරු ගහලා, බොළඳ කථා කියලා වැඩක් නැහැ. මහ ජනතාවට උදේ නැඟිටලා බොන ඇල් වතුර උගුරේ ඉඳලා රෑට නිදාගන්න යනකොට බොන බෙහෙත් පෙත්ත දක්වාම විශාල දුක් කන්දරාවකට මුහුණ පාන්න සිදුවෙලා තිබෙනවා.

අද වන විට ඉස්කෝලේ යන්නේ නැති ළමුන් සංඛ්‍යාව වැඩිවෙලා තිබෙනවා. ලෙඩ්ඩුන්ට බෙහෙත් ගන්න මුදල් මදිවෙලා තිබෙනවා.

විශ්‍රාමිකයින්ට කිසිම දෙයක් කරලා නැහැ. මට තව කියන්න පුළුවන්; තව කියන්න පුළුවන්. පසුගිය අවුරුද්දේ මැතිවරණයේදී කිව්වා, උපයන විට ගෙවන බදු සීමාව රුපියල් ලක්ෂ දෙකකට අඩු කරනවා කියලා. නමුත්, ලක්ෂ එකහමාරෙන් බද්ද ගහලා තිබෙනවා. මේ අය වැයෙනුත් ඒක කරන්න බැරි වෙලා තිබෙනවා.

ඊළඟට, දැරිය හැකි මිලට ලබා ගත හැකි උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය සඳහා ප්‍රවේශ වීමේ සීමාව ඉවත් වීමේ අරමුණින් සරල විනිවිදභාවයෙන් යුතු සහ පුරෝකථනය කළ හැකි තීරු බදු රාමුවක් නිර්මාණය කරනවා කිව්වා. කෝ, කරලා තිබෙනවාද? ඊළඟට කිව්වා, සේවයේ සිටියදී හදිසි අනතුරකට මුහුණ දෙන සේවකයෙකුගේ වෛද්‍ය වියදම් දරනවා සහ රැකියාවට නැවත පැමිණෙන තෙක් සුදුසු දීමනාවක් දෙනවා කියලා. කෝ, ඒවා ගැන වගේ වගක් නැහැ.

ඊළඟට, ආහාර සම්බන්ධ වෙළඳ දැන්වීම් නියාමනය කිරීම සඳහා ආයතනයක් සහ පාරිභෝගිකයන්ට නිවැරදි තොරතුරු සහිත වෙළෙඳ දැන්වීම් සඳහා ආචාර ධර්ම පද්ධතියක් ගේනවා කිව්වා. ඒ ගැන කථාවක් නැහැ. ජාතික ක්‍රීඩා සංගම් නියාමන අධිකාරිය ගේනවා කිව්වා; කථාවක් නැහැ. ක්‍රීඩාවේ ශාරීරික අධ්‍යාපන ක්ෂේත්‍රයට, ආයෝජකයන්ට සහ දේශීය ක්‍රීඩා උපකරණ නිෂ්පාදකයන්ට බදු සහන දෙනවා කිව්වා. බදු සහන දෙන එක කෙසේ වෙතත්, -ක්‍රීඩා ඇමතිතුමා සභාවේ ඉන්නවා නම් බලන්න- පෙරේදා ටෙන්ඩර් එකක් දානවා, මේ මාසයේ 18වැනි දාට කලින් submit කරන්න කියලා. අමු අමුවේ හොරකමක් වෙන්න යන්නේ. ගරු කථානායකතුමනි, මම ලබන සතියේ පාර්ලිමේන්තුවට ඒ සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරන්නම්. Football එකේ ඉඳලා, football court එකේ ඉඳලා, netball එකේ ඉඳලා, cricket batවල ඉඳලා ඔක්කෝගෙන්ම හොඳට මාටියා ගහන්න යන්නේ. ගරු කථානායකතුමනි, අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, මේ බොරු ටික කරලා ජනතාව රැවටෙයි කියලා හිතනවා නම්,- *[බාධා කිරීමක්]* අහගෙන ඉන්න, අහගෙන ඉන්න. පොඩ්ඩක් ඉන්න. කතින්නේ නැතිව අහගෙන ඉන්න. *[බාධා කිරීම්]* මේ වාගේ බොරු කරලා මිනිස්සුන්ව අන්දන්න පුළුවන් කියලා හිතනවා නම් අනේ, අබ සරණයි!

ඊළඟට කිව්වා, බලශක්ති ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක සංකීර්ණ හා අතරමැදි බදු රාශියක් වෙනුවට සරල බදු ක්‍රමයක් ගෙනෙනවා කියලා. ඒ ගැනත් කථාවක් නැහැ. ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා කඩිනමින් ඉවත් කරනවා කිව්වා. ඊළඟට, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සහ මහ බැංකුවේ අධීක්ෂණය යටතේ විශ්‍රාම වැටුප් අරමුදලක් ගේනවා කිව්වා. ඒවා කෝ? මේ ඇන්දිලි. පච කියලා, මිනිස්සු අන්දපු විධිය. විශ්‍රාමිකයින් සඳහා සමාජ ආරක්ෂණ අරමුදලක් ගේනවා කිව්වා. ඒ එකක්වත් නැහැ. ගරු කථානායකතුමනි හැබැයි, ඒ වෙනුවට මරු වැඩක් කරලා තිබෙනවා. VAT එක සඳහා ලියාපදිංචිය රුපියල් මිලියන 60 ඉඳලා 36ට අඩු කරලා තිබෙනවා. ඒ කියන්නේ කාර්තුවකට රුපියල් මිලියන 9යි; මාසයකට මිලියන 3යි. ඒ කියන්නේ, දවසකට රුපියල් ලක්ෂයක්. කැස්බෑව හන්දියේ හරි, කොටිකාවත්ත හන්දියේ හරි, පිළියන්දල හන්දියේ හරි දවසකට රුපියල් ලක්ෂයක බිස්නස් කරන කෙනාව VAT එකට register කරන්න යනවා. එතකොට මොකක්ද වෙන්නේ? සාමාන්‍යයෙන් ඔවුන්ගේ ලාභය සියයට 30යි. රුපියල් ලක්ෂයක බිස්නස් කළොත්, රුපියල් 30,000යි. ඒකෙන් පඩි නඩි, වතුර බිල්, විදුලි බිල් ගෙවලා ඉවර වුණාම රුපියල් 10,000ක්වත් ලාභය තියේවි.

එතකොට, රුපියල් 10,000ක් ලාභ තිබෙන කෙනාව VAT එකට register කරලා සියයට 18ක් ඔහුගේ ව්‍යාපාරයෙන් ගත්තොත්, ඒක ඔහු දෙනවාද? නැහැ. ඔහු පාරිභෝගිකයාගෙන් ඒක අය කර ගන්නවා. මේ VAT එක implement කරපු ගමන්හන්දිවල තිබෙන සාමාන්‍ය ග්‍රොසරිවල බඩු මිල පවා වැඩි වෙන්නට නියමිතයි. එතකොට තවදුරටත් ඔබතුමන්ලාට ඔක්කෝම දේවල් අහගන්න පුළුවන්, ගමේ හන්දියේ තිබෙන three-wheeler park එකේදි. ඒ කාලයේ දන්නවා නේ, three-wheeler එකක නැගලා යන්න බැහැ, දේශනා කරනවා, දේශනා කරනවා, මොළ ගෙඩි හෝදනවා. අද three-wheeler එකක නැගලා නිස්කලංකේ යන්න පුළුවන්, කවුරුවත් මොකුත් කියන්නේ නැහැ. ඔළු ගෙඩි හෝදපු අයත් නැහැ, දැන් කවුරුවත් හෝදන්නේත් නැහැ. දැන් කථා කරන්නේත් නැහැ. ඒ වෙනුවට බණිනවා. එහෙම බණිනකොට අපට පොඩි ආතල් එකක් හම්බ වෙනවා. *[බාධා කිරීමක්]* දැන් ස්ටිකරුත් නැහැ. ඔක්කෝටම පහර වැදිලා තිබෙන්නේ. ඒ වුණාට, "උඹලා පරිප්පුව කෑවා නේ" කියලා අපට පොඩි ආතල් එකකුත් තිබෙනවා. ඒකත් මම කියන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුද්දක් ගිහිල්ලා තිබෙනවා. ආර්ථික අර්බුදයයි, කොවිඩ් අර්බුදයයි හමුවේ වැටුණු වැටිල්ලෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් තවම ගොඩ ආවේ නැහැ. ඒකෙන් ගොඩ එන්න

කිසි දෙයක් කරලාත් නැතුව දැන් රුපියල් ලක්ෂයක බිස්නස් කරන කෙනාව VAT එකට register කරලා ව්‍යාපාරිකයාවයි, පාරිභෝගිකයාවයි දෙගොල්ලන්ම අමාරුවේ දාන්න තමයි මේ ඔස්තාර්ලා කටයුතු කරන්නේ.

ගරු කථානායකතුමනි, මම මේ කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. පසුගිය රජය කාලයේ ආනයනික පොල් තෙල් -පිරිපහදු නොකළ පොල් තෙල්- පිරිපහදු කරලා විකුණනවා නම් VAT එක සහ සෙස් බද්ද සියයට 20.5ක් ගෙවන්න ඕනෑ. එතකොට සමාගම් හයක් විසින් සමාගම් තුනක නමින් පොල් තෙල් ගෙනැල්ලා පිරිපහදු කරලා විකුණනකොට ඒ සඳහා බදු ගෙවන්න කිව්වා. ඒ වෙලාවේ හිටපු ජනාධිපතිවරයාගෙන් බදු සහන ඉල්ලුවා, ලිඛිතව. එතුමා ඒක යවනවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට. අනතුරුව ඔවුන්ගේ opinion එක නැවත යවනවා. ගරු කථානායකතුමනි, මේ මොහොත වෙනකම් ඒ බදු අය කර ගන්න කිසිම වැඩකටයුත්තක් කරන්නේ නැහැ. ලජ්ජයි, ගරු කථානායකතුමනි. පසුගිය අය වැය වෙලාවේදීත් මම කිව්වා, මේ බදු අය කර ගන්න කියලා. Documents ඉල්ලුවා; දුන්නා. ඊට පස්සේ පෙබරවාරි මාසයේ අගමැතිතුමියගෙන් අසනු ලබන ප්‍රශ්න වටයේදී අගමැතිතුමියගෙන් මේ ගැන ඇහුවාම, අගමැතිතුමියත් පිළිගත්තා, ඒගොල්ලන් බදු ගෙවන්න ඕනෑය කියලා. ඒ අනුව ඒවා අය කර ගන්න ආණ්ඩුව කටයුතු කරනවා කියලා එතුමිය කිව්වා. අද වෙනකොට මාස 9ක් ගිහිල්ලා, ශත පහක් අය කරගෙනත් නැහැ, ඒ සඳහා assessment report එක දීලාත් නැහැ. ඊළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයකදීත් මම මේ ගැන වෙළෙඳ ඇමතිතුමාගෙන් ඇහුවා. එතුමා කිව්වා, "ඔව්, අය කර ගන්නවා" කියලා. නමුත් කථාවක්වත් නැහැ. රුපියල් බිලියන 10කට වැඩිය රජයට පාඩු කරලා තිබෙනවා. එතකොට රජයට වගකීමක් තිබෙනවා, මේ අය පිරිපහදු කරලා විකුණපු තෙල්වලට ගෙවන්න තිබෙන බද්ද අය කර ගන්න. ඒගොල්ලන් එය නොගෙවනවා නම්, පිරිපහදු නොකර crude oilම විකුණා තිබෙනවාද කියලා හොයන්න ඕනෑ.

එහෙම නම්, ඒක බරපතළ සෞඛ්‍ය ප්‍රශ්නයක්. හැබැයි ආණ්ඩුවට වගේ වගක් නැහැ. මහජන නියෝජිතයෙක් විධියට; පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට මම මේ ගැන රටේ අගමැතිවරියගෙන් ප්‍රශ්න කළාම ඒවා පිළි අරගෙන, උත්තරත් දීලා, ඊට පස්සේ මොකුත් කරන්නේ නැහැ. ඊළඟට අය වැය කථාවේදී කිව්වත්, ඒක අහලාත් මොකුත් කරන්නේ නැහැ. ඊළඟට වෙළෙඳ ඇමතිවරයාගෙන් මේ ගැන ඇහුවාම එතුමාත් කියනවා, "කරනවා" කියලා. ඒත් මොකුත් කරන්නේ නැහැ. මම බැරිම තැන මුදල් නියෝජ්‍ය ඇමතිවරයාගෙන් ඇහුවා. එතුමා කියනවා, "බලනවා" කියලා. මට සැකයක් තිබෙනවා, රුපියලක්වත් හොරකම් කරන්නේ නැහැයි කියපු මේ ආණ්ඩුව මේ කොම්පැනිකාරයන්ගේ අල්ලේ නැටවෙනවාද, එහෙම නැත්නම් අරමුදලට සල්ලි හම්බ වුණාද කියලා. ඒ ගැන අපි දන්නේ නැහැ. අවුරුද්දක් ගිහිල්ලාත් මේ සඳහා අවශ්‍ය මූලික පියවරවත් නොගැනීම පිළිබඳව අපට සාධාරණ සැකයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම කිව්වා නේ, මේ අය වැය පොඩි එකාගේ සුරංගනා කථාවක් වාගේ කියෙව්වා කියලා. නාගරික වතු නිවාස ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 15,000ක් වෙන් කර තිබෙනවා කියලා එහි සඳහන් වනවා. ඒකේ කොළඹ නගරයේ ස්ථාන පිළිබඳව සහ කෝට්ටේ ආසනයේ තිබෙන ඔබේසේකරපුර ගැනත් සඳහන් කරලා තිබුණා. ඔබේසේකරපුර පැත්තකින් තියමුකෝ. ගරු කථානායකතුමනි, දළ වශයෙන් කොළඹ නගරයේ විතරක් වතු නිවාස තිබෙනවා, 50,000ත්, 53,000ත් අතර ප්‍රමාණයක්. මේකෙන් නිවාස 50,000ක් හදන්න රුපියල් බිලියන 15ක් වෙන් කරලා තිබෙනවා. ගෙවල් 50,000ක් හදන්න රුපියල් බිලියන 15ක් වෙන් කළා කිව්වාම එක ගෙදරකට වෙන් වන මුදල කීයද? රුපියල් ලක්ෂ 3යි. කාටද, මේ අන්දන්න යන්නේ? මීට අවුරුදු 5කට, 6කට කලින් UDA එකෙන් මහල් නිවාස හදලා නැවත පදිංචි කිරීම් කරනකොට එක ගෙදරකට UDA එකේ cost එක වුණේ රුපියල් මිලියන 3යි. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 30යි. දැන් එක ගෙදරකට රුපියල් ලක්ෂ 3ක් දාලා තිබෙනවා. මේ බොරු නේ. මේවා කෙරෙන වැඩ නොවෙයි නේ. මේවා සුන්දර වචන. ඒ වාගේම තමයි තව ගෙවල් 10,000ක් හදන්න වෙන් වූ මුදල රුපියල් මිලියන 3,000යි. මම හිතන විධියට, ඒ පිට පළාත්වල වෙන්න ඕනෑ. සජිත් ප්‍රේමදාස මැතිතුමා ගෙවල් හදද්දි කෝච්චි පෙට්ටි වාගේ, ගිනිපෙට්ටි වාගේ ඒවා හදනවා කියලා තමයි කිව්වේ. රුපියල් ලක්ෂ 3න් කොහේද ගෙයක් හදන්න පුළුවන්? රුපියල් ලක්ෂ 3න් කුකුළු කූඩුවක්වත් හරියට හදන්න බැහැ. රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා, ගෙවල් 10,000ක් හදන්න. එතකොට රුපියල් ලක්ෂ 3යි එක ගෙදරකට. කොහේද එහෙම හදන්නේ? පට්ටපල් බොරු නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා අපි පැහැදිලිව රජයෙන් ඉල්ලීමක් කරනවා, මේ වාගේ බොරු කියන්න එපා, මිනිස්සුන්ව රවටන්න එපා කියලා.

අපි පසුගිය දවස්වල SLLDC එකේ නිලධාරින් ගෙන්වා, කොළඹ නගරයේ ගංවතුර පාලනය ගැන කථා කළාම ඒ සඳහා රුපියල් බිලියන 10ක් වෙන් කර තිබෙනවා කිව්වා. අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටුවක් පත් කරලා ඒ වැඩ කටයුතු කරනවා කියලාත් කිව්වා. හැබැයි කැලණි ගඟේ ගංවතුර පාලනය සහ ඒ ආශ්‍රිතව තිබෙන වැසි වතුර පාලනය සම්බන්ධයෙන් රුපියලක්වත් වෙන් කරලා නැහැ. මම දන්නේ නැහැ, අමාත්‍යාංශයට වෙන් කරපු මුදල්වලින් ඒකට සල්ලි දෙනවාද කියලා. අය වැය යෝජනාවල ඒක නැහැ. හැබැයි ඒ වෙනුවට කළු ගඟ සහ නිල්වලා ගඟ සම්බන්ධයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. එහෙම කළාට ප්‍රශ්නයක් නැහැ.

හැබැයි, කැලණි ගඟේ ගංවතුර පාලනය සහ ඒ ආශ්‍රිතව තිබෙන වැසි වතුර පාලනය සම්බන්ධයෙන් මෙවර අය වැයෙන් මුදල් වෙන්කර නැත්තේ ඇයි කියන එක පිළිබඳව අපි ආණ්ඩුවෙන් ප්‍රශ්න කර සිටිනවා.

ගරු කථානායකතුමනි, දැන් ආණ්ඩුව කළ යුතු දේවල් ටිකක් තිබෙනවා. ආණ්ඩුව උත්තර දෙන්න ඕනෑ දේවල් ටිකක් තිබෙනවා. බදු වංචනිකයින් සහ බැංකුවලට පොලු තැබූවන් ගැන වත්මන් රජය හෙළි කරනවා කිව්වා. මහින්ද මහත්තයා වාගේ ජනාධිපතිතුමාත් කියනවා, files තිබෙනවා, නම් දන්නවා කියලා. හැබැයි, ඒ එක නමක්වත් එළියට එන්නේ නැහැ. එහෙම නේද, ගරු කථානායකතුමනි? ජනාධිපතිතුමා කියනවා නේ, files තිබෙනවා, නම් තිබෙනවා, නම් දන්නවා, ඔක්කොම දන්නවා කියලා. හැබැයි, ඒ බදු වංචනිකයන්ගේ එක නමක්වත් එළියට එන්නේ නැහැ.

ඒ වාගේම තමයි ගරු කථානායකතුමනි, දැන් IMF එකෙන් ණය ටික හම්බ වෙලා ණය සේවාකරණය කරගෙන යනවා. ADB එකෙන් support එක ලැබෙනවා. හැබැයි, IMF එකේ කොන්දේසි අනුව 2027දී මේ ආදායම හොයන්නේ කොහොමද කියලා දන්නේ නැහැ; කියන්නේත් නැහැ. ලබන අවුරුද්ද වෙනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 13ක් සංචිතයේ තිබෙන්න ඕනෑ. දැන් තිබෙන්නේ, ඇමෙරිකානු ඩොලර් බිලියන හයයි දශම ගණනක්. ඒක හොයන්නේ කොහෙන්ද කියලා අපි දන්නේ නැහැ. මොකද, මහ ලොකුවට SMS alerts ගහලා media campaign කළාට, පසුගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ සංචාරක කර්මාන්තයෙන් ලබන ආදායම වැඩි වෙලා තිබෙන්නේ ඩොලර් මිලියන 100යි. ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණවලින් වැඩි වෙලා තිබෙන්නේ ඩොලර් මිලියන 100 - 200 අතර ගණනක්. IMF

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

එකෙන් ණය හම්බ වෙන්නේ නැත්නම් මේ සා විශාල මුදල් ප්‍රමාණයක් ලබන අවුරුද්දෙන් පසුව හොයන්නේ කොහෙන්ද? ජයශාන්ත අයියා කැනඩාවේ ඉඳලා එවයිද, එහෙම නැත්නම් රතු මල්ලිලා කැට හොල්ලලා ඩොලර් හොයන්න යනවාද කියලා මම දන්නේ නැහැ. මහා ලොකු වුන් එකක් තිබෙනවා, භාණ්ඩාගාරයේ සල්ලි පිරිලා ඉතිරිලා කියලා.

වාහන දෙලක්ෂ විසිදහසක් ගෙනාවා. අවුරුදු පහක arrears එකත් එක්ක රුපියල් බිලියන 600කට වඩා ඒ වාහනවලින් ආදායම ආවා. ඒක හොඳයි. හැබැයි, මේ ගණනටම වාහන දෙලක්ෂයක් ලබන අවුරුද්දේ ගනීවිද? මොකද, අර අවුරුදු පහක arrears එක වෙනුවෙන් මිනිස්සු ඔක්කොම ගිහිල්ලා පොරකාලා වාහන ගත්තා. වාහන ගත්තාට පසුව ඒ අවශ්‍යතාව නැති වෙනවා. එතකොට ලබන අවුරුද්දේ ඔච්චර වාහන ප්‍රමාණයක් එන්නේ නැත්නම් මේ ප්‍රමාණයේ ආදායමක් ලැබෙනවාද? ඒ නිසා අපි ආණ්ඩුවට කියන්න කැමතියි, මේ ආර්ථික ඉලක්ක සපුරන්න ආදායම් හොයන විධිය ගැන කියන්න කියලා. ඒ වෙනුවට ආණ්ඩුව මොකක්ද කරන්නේ? සුරංගනා කථා පොතක් කියලා ජනතාව රවට්ටනවා. ජනාධිපතිගේ උපදේශකයෙක් ඉන්නවා, දුමින්ද හුලංගමුව කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

හැම ආණ්ඩුවේම ඉන්න එක්කෙනෙක් ඉන්නවා. ඔහු දැන් "Citizens Budget" කියලා ගහලා ඒ පොත කොළඹ ව්‍යාපාරික පැළැන්තියේ කට්ටියට ගිහිල්ලා දෙනවා. මොකද, කොළඹ ව්‍යාපාරික පැළැන්තිය ජනාධිපතිතුමාට කියන්නේ, "good bugger" කියායි. Good buggerගේ අය වැය ගිහිල්ලා දෙනවා. අය වැය ගිහිල්ලා දීලා ඒගොල්ලන්ගෙන් voice-cut එකක් අරගෙන දාලා, "අනේ හොඳයි" කියලා කියවා ගන්නවා. හැබැයි, ඉහළ පැළැන්තියයි, පහළ පන්තියයි අතර මිරිකිලා ඉන්න පැළැන්තිය ගැන කථා කරන්න මේගොල්ලන්ට කිසිම වුවමනාවක් නැහැ; වගේ වගක් නැහැ. මේ ආණ්ඩුව ආවාට පසුව ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 3.9කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. මේ 159දෙනාගෙන් එක්කෙනෙක්වත් ඒක ගැන කථා කරනවාද? වචනයක්වත් ඒ ගැන කථා කරන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

ඒ වාගේම තමයි, සේවා අපනයනයෙන් පසුගිය අවුරුද්දේ ජනවාරි සිට සැප්තැම්බර් මාසය වෙනකම් ඩොලර් බිලියන 19ක් විතර හොයලා තිබෙනවා. නමුත්, ඒ ඉලක්කයට ගිහිල්ලා නැහැ. දැන් හොයලා තිබෙන්නේ ඩොලර් බිලියන 15.5යි. ඩොලර් බිලියන 3.5ක අඩුවක් තිබෙනවා. නමුත්, ඒක ගැන කථා කරන්නේ නැහැ. රුපියල තියාගෙන දේශීය ණය ගෙවන්න පුළුවන්. නමුත්, ජාත්‍යන්තර ණය ගෙවන්න පුළුවන්ද? ජාත්‍යන්තර ණය ගෙවන්න ඩොලර් ඕනෑ. ඩොලර් ඕනෑ නම් සේවා අපනයන ආදායම් වැඩි වෙන්න ඕනෑ. විදේශ ආයෝජන එන්න ඕනෑ. විදේශ ආයෝජන ගැන පම්පෝරි ගහනවා. අර රටට යනවා, මේ රටට යනවා. ඔක්කොම රටවලට ගිහිල්ලා එනකොට ප්‍රවෘත්තිය මොකක්ද? යනවා, එනවා; යනවා, එනවා. ආපු දෙයක් නැහැ. ජේ.ආර්.ලා, ප්‍රේමදාසලා පිට රටවලට ගියාම මොනවා හරි ලැබුණා. සිරිමාවෝ මැතිනිය පිට රටවලට ගියාම මොනවා හරි ලැබුණා. වික්ටෝරියා, රන්දෙනිගල ව්‍යාපෘතිවලට ආධාර ලැබුණා. BMICH එක ලැබුණා. ගොඩක් දේවල් ලැබුණා. මේ අය යනවා, එනවා; යනවා, එනවා. එච්චරයි.

ගරු කථානායකතුමනි, අස්වැසුමට රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබුණා. දැන් මේගොල්ලන් ආවාට පසුව දරිද්‍රතාව වැඩි වෙලා තිබෙනවා. මේ වෙන් කරපු රුපියල් මිලියන 500න් පාවිච්චි කරලා තිබෙන්නේ රුපියල් මිලියන 168යි. පවුල් මිලියන 1.6 - ලක්ෂ 16 - cover කරලා තිබෙන්නේ. එහෙම වෙන් කරපු මුදල් වියදම් නොකර ඉඳලා අය වැය පරතරය අඩු කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I am going to wind up.

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන් මේ කාරණය කියන්න ඕනෑ. මේ සුරංගනා කථා පොත් කියවන කට්ටියට, ගිය අවුරුද්දේ ධන 1.2ට තිබුණු උද්ධමනය මේ අවුරුද්දේ ඍණ 1.4ට ගෙනාපු ආණ්ඩුවට අපි කියනවා, පුළුවන් නම් පළාත් සභා මැතිවරණය තියන්න කියලා; පුළුවන් නම් තියන්න, පළාත් සභා මැතිවරණය. අන්න පොහොට්ටුවෙන්, UNP එකෙන්, සජබයෙන් ගත්ත පළාත් පාලන ආයතනවලට දැන් මොකක්ද වෙන්නේ? ඒගොල්ලන්ට ආවාම හොඳයි නේ. මේ පැත්තේ ඉන්නේ හොර තක්කඩි කියලා ඒ පැත්තට ගත්ත පළාත් පාලන ආයතන ටික ඔන්න දැන් පෝලිමේ පරදිනවා. සමුපකාරය පරදිනවා. මම නොවෙයි එහෙම කියන්නේ. වසන්ත සමරසිංහ තමයි කිව්වේ, සමුපකාරයක් දිනන්න බැරි නම් ආණ්ඩුවක් ගන්න බැහැ කියලා. පළාත් සභා මැතිවරණය තියන්නකෝ. පුළුවන් නම් තියන්න. ඒක හොඳයි නේ. එතකොට අවුරුද්දකට පසුව තමන් සම්බන්ධයෙන් ජන මතය කොහොමද තිබෙන්නේ කියලා check කරගන්න පුළුවන් නේ. නමුත්, පළාත් සභා මැතිවරණය තියන්නේ නැහැ. තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. ඒ කරුණු ටික අය වැය කාරක සභා අවස්ථාවේදී මම කියන්නම්.

ගරු කථානායකතුමනි, ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ ප්‍රකාශයකින් මගේ කථාව අවසන් කරනවා. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා කියන්නේ, මේ රටේ පහළ වෙච්ච සුවිශේෂ පුද්ගලයෙක්. දශක ගණනාවක් ඉදිරිය දැක්ක පුද්ගලයෙක්. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා කරපු ප්‍රකාශයක එක කොටසක් තිබෙනවා, "සමාජවාදය තිබෙන්නේ තමන්ගේ පළමු වත්කම උපයන තාක් පමණයි" කියලා. එදා ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා කියපු දේ අවුරුදු 40ක් ගත වුණාට පස්සේ මේ JVP ආණ්ඩුවෙන් reflect වෙනවා කියන එක ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Hon. Sarath Kumara. You have nine minutes.

[පූ.භා. 10.42]

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, දශක ගණනාවක් තිස්සේ අප දුටු සිහිනයක් තිබුණා. ඒ සිහිනය යථාර්ථයක් බවට පත් කරමින් ගොඩනඟන ලද ජනතා රජයේ දෙවන අය වැය විවාදයට සහභාගි වීමට අවස්ථාව ලැබීම මම භාග්‍යයක් හැටියට සලකනවා. අවිනිශ්චිතභාවයටත්, අපේක්ෂා භංගත්වයටත්, අස්ථාවරභාවයටත් පත් කර තිබූ අපේ මාතෘ භූමිය පුනරුදයේ දිශානතියට යොමු කර හරියටම වසරක් පූර්ණය වන මොහොතේ අධිෂ්ඨානශීලීව, ඉලක්ක සහගතව අභියෝග ජයග්‍රහණය කිරීමේ අරමුණින් අපි 2026 අවුරුද්ද සඳහා වන අය වැය මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. 2025 අවුරුද්දේ අපි අත්කර ගත් ජයග්‍රහණ පිළිබඳව, ඒ අය වැය තුළින් අපි තබා තිබූ ඉලක්ක පිළිබඳව තුලනාත්මක විග්‍රහයක් සහිතව අප මේ 2026 අය වැය දිහාවට අපේ අවධානය යොමු කරන එක හොඳයි කියලා හිතනවා. 2025 අවුරුද්දේ අපේ රටේ ස්ථාවර ආර්ථිකයක් ඇති කරන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ කාලය මූල්‍ය විනය තහවුරු කරපු වසරක් බවට පත් කරන්න අපි සමත් වුණා. එමෙන්ම ආර්ථිකයේ සියලු අංශවල ශක්තිමත් වර්ධනයක් අත්පත් කරගන්නත් අපි සමත් වුණා.

මට ඉස්සෙල්ලා මේ ගරු සභාව ආමන්ත්‍රණය කරපු මන්ත්‍රීතුමා කිව්ව විදියට අපි සියඹලා ගෙනැල්ලාම නැහැ වාගේ. නමුත්, අපි සූදානම්, මේ අය වැය විවාදය ඔස්සේ 2025 වර්ෂය තුළ අප අත්පත් කර ගත් ජයග්‍රහණ පිළිබඳව කථා කරන්න. ඇයි, අපි එහෙම කියන්නේ? අපි ණය ප්‍රතිව්‍යුහගතකරණය බොහෝදුරට අවසන් කරන්න සමත් වෙලා තිබෙනවා. අපි දේශීය හා ජාත්‍යන්තර ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගන්න සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම, ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව ණය තිරසාරභාවයේ සැහීමකට පත් වෙන්න පුළුවන් ඉසව්වකට අපි ඇවිල්ලා තිබෙනවා. ඇයි, දැන් මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒවා පෙනෙන්නේ නැත්තේ? කුහකකමින් ඒගොල්ලන්ගේ හිත් පිරිලා තිබෙන්නේ. අපි දැක්කා, ධනාත්මක විවේචන සහිතව අය වැය ගැන අදහස් ඉදිරිපත් කරන විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් හිටපු බව. හැබැයි, ඒ වාගේම තමයි කුහක විදියට, ද්වේෂ සහගතව, තමන්ගේ අඳුරු අනාගතය පෙනෙන මන්ත්‍රීවරුන් අපිට එරෙහිව අවලාද නඟනවාත් අපට පෙනෙනවා. අපි ඒ කිසිදු අවලාදයකින් නොසැලී අපේ ගමන ඉස්සරහට යනවා කියන කාරණය මම විශේෂයෙන්ම අවධාරණය කරන්න කැමැතියි.

මම කලිනුත් කිව්වා, ණය ප්‍රතිව්‍යුහගතකරණය සහ ණය තිරසරභාවය පිළිබඳව. ජාත්‍යන්තර ආයතන ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත් කරන්න අපි සමත් වෙලා තිබෙනවා. Fitch Ratings ආයතනයේ වර්ගීකරණය අනුව අපි CCC+ තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. S&P වර්ගීකරණය යටතේ CCC+ තත්ත්වයට අපි ඇවිල්ලා තිබෙනවා. Moody's වර්ගීකරණය යටතේ Caa1 තත්ත්වයට අපි ඇවිල්ලා තිබෙනවා. එහෙම නම් කොහොමද කියන්නේ, අපි 2025 අවුරුද්දේ ආර්ථික වර්ධනයක් අත්පත් කර ගත්තේ නැහැ කියලා? ඒ වාගේම තමයි, අපි එතැනින් නතර වෙන්නේ නැහැ. අපි 2025 අවුරුද්ද දිහා ආපහු හැරිලා බැලුවොත්, භාණ්ඩ අපනයනයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 8.5 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 9.1ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. 2025 අවුරුද්දේ 09වැනි මාසය දක්වා කාලය 2024 අවුරුද්දේ මුල් මාස නවයත් එක්ක සන්සන්දනය කළාම ඒ වාගේ වර්ධනයක් අපට දකින්න පුළුවන්. සේවක ප්‍රේෂණවල ඇමෙරිකානු ඩොලර් බිලියන 4.8 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 5.8ක් දක්වා වර්ධනයකුත්, සංචාරක ඉපැයීම්වල ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5 දක්වා වර්ධනයකුත්, ආදායම් සහ ප්‍රදාන මඟින් රුපියල් ට්‍රිලියන 2.9 සිට රුපියල් ට්‍රිලියන 3.8ක් දක්වා වර්ධනයකුත් අපට දකින්න පුළුවන්. ප්‍රාථමික ශේෂයේ රුපියල් ට්‍රිලියන 0.8 සිට රුපියල් ට්‍රිලියන 1.5 දක්වා වර්ධනයක්, 2025 වර්ෂයේ මුල් මාස නවයක කාල සීමාව, 2024 වර්ෂයේ මුල් මාස නවයේ කාල සීමාව එක්ක සන්සන්දනය කරනකොට අපට දකින්න පුළුවන්.

හැබැයි, අපට මතකයි, අපි මේ රජය භාර ගන්නකොට මේ රට පාලනය කරපු "කජු සීයා" ප්‍රමුඛ නඩයක් හිටපු බව. ඒගොල්ලන් මොකක්ද කළේ? ජනතාවගේ පටි තව තවත් තද කළා. ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කළා. ජනතාව පීඩාවෙන් පීඩාවට පත් කළා. 2048 වෙද්දී වැල් පාලම උඩින් ඒ ගමන යන්න කියලා අපිට ආරාධනා කළා. මේ රටේ බුද්ධිමත්, ප්‍රගතිශීලී ජනතාව ඒ අදහසට එකඟ වුණේ නැහැ. ඒ සුවහසක් ජනතාව අපිත් එක්ක බොහොම ශක්තිමත්ව එකතු වෙලා, එක කඳවුරක් බවට පත් වෙලා, මේ ජනතාවාදී රජය බිහි කරන්න, ඒගොල්ලන්ගේ ශක්තිය ලබා දුන්නා කියන එක මේ වෙලාවේ කෘතවේදීව මම මතක් කරනවා.

ඒ වාගේම තමයි, 2048 වෙද්දී ඒ ගමන යන්න සූදානම් වෙච්ච පිරිසකුත් හිටියා. කටුකොහොලින්, කලල් දියෙන් පිරුණු මාවතක් ඔස්සේ 2048 වෙද්දී යමු කියලා සූදානම් වුණු පිරිසක් අපි දැක්කා. තවමත් ඒ කොටස් මේ ගරු පාර්ලිමේන්තුව ඇතුළේ විපක්ෂය නියෝජනය කරනවා. ඒගොල්ලන්ට අපි කියන්න සූදානම්, 2025 වර්ෂයේ යම් සාධනීය ජයග්‍රහණ සහිතව අපි ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා කියන එක. ඒ වාගේම තමයි, ඒ ජයග්‍රහණ තහවුරු කර ගනිමින්, 2026 වසර ඉදිරියට ගෙන යන්න ශක්තිමත් අය වැයක් අපි මේ ගරු සභාවට මේ වෙනකොටත් ඉදිරිපත් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ ගෙවුණු පාලන කාලය තුළ අපේ රටේ රාජ්‍ය සේවා ක්ෂේත්‍රයට සලකපු විදිය අපි දැක්කා. ඒගොල්ලන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සම්පූර්ණයෙන්ම කප්පාදු කළා. රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීම් කළේ නැහැ. රාජ්‍ය සේවයේ ස්ථිර කරන්න ඕනෑ සේවකයන් ස්ථිර කරන්න ඒගොල්ලන් පියවර ගත්තේ නැහැ. හැබැයි, අද ඔක්කොම වෙනස් කරන්න මේ ජනතාවාදී රජයේ අපි සමත් වෙලා තිබෙනවා.

රාජ්‍ය සේවකයන් විදියට 75,000ක ප්‍රමාණයක් බඳවා ගන්න අපි තීන්දුවක් අරගෙන තිබෙනවා. දැනටමත් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාවට නංවමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි, විශ්‍රාම වැටුප් අහිමි වෙලා තිබුණු පිරිසට විශ්‍රාම වැටුප් ලබා දෙන්න අපි තීන්දුවක් අරගෙන තිබෙනවා. රාජ්‍ය සේවයට ස්ථිර කළේ නැති සේවකයෝ 10,000කට ආසන්න පිරිසක් ස්ථිර සේවකයන් හැටියට රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන්න අපි මේ වන විටත් කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා ගෙවුණු වසරක කාලය තුළ ආර්ථික සංවර්ධනයේ ශේෂ පත්‍රය සම්බන්ධයෙන් ජාත්‍යන්තර සංවිධානවලත්, ඒ වාගේම විපක්ෂයේ සාධනීය විවේචන ඉදිරිපත් කරන මන්ත්‍රීවරුන්ගේත් ඇගැයීමට පාත්‍ර වෙලා තිබෙනවා කියන කාරණය මේ වෙලාවේ විශේෂයෙන්ම මම සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට, එතැනින් එහාට අපි යන්න ඕනෑ 2026 වර්ෂය වෙනුවෙන් අපි සූදානම් වෙලා තිබෙන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් කථා කරන්න. 2026 වර්ෂය වෙනුවෙන් අපි උපාය මාර්ගික අරමුණු හයක් ඔස්සේ මේ අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ රටේ ආර්ථිකය මෙහෙයවන ආකාරය පිළිබඳව අපි එහිදී පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ඒ අනුව තිරසර සහ සැමට ප්‍රතිලාභ ලැබෙන ආර්ථික වර්ධනයක් පිළිබඳව අපට විශ්වාසයක් තිබෙනවා, අපට වැඩ

[ගරු නිතිඥ සරත් කුමාර මහතා]

පිළිවෙළක් තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ අපි ඉදිරිපත් කර තිබෙනවා. දැන් විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට ඒවා පේන්නේ නැහැ. මේ රට ගොඩගන්න ආර්ථික වැඩ පිළිවෙළ මොකක්ද, අපි ඩොලර් උපයන්නේ කොහොමද කියන කාරණා මොනවත් පේන්නේ නැහැ. ඒගොල්ලන්ට ඒවා පේන්නේ නැත්තේ ද්වේෂයෙන් අන්ධ වෙලා තිබෙන නිසායි. ඒගොල්ලන් නිදා ගත්තාම ඒගොල්ලන්ගේ අඳුරු අනාගතය හීනෙනුත් පේන්න පටන් අරගෙන තිබෙන්නේ. ඒකයි ඒගොල්ලන්ට මේ සාධනීය තත්ත්වයන් තක්සේරු කර ගන්න බැරිවෙලා තිබෙන්නේ.

තිරසර සහ සැමට ප්‍රතිලාභ ලැබෙන ආර්ථික වර්ධනයක් යටතේ අපි බලාපොරොත්තු වෙනවා ජන සහභාගීත්ව ආර්ථිකයක් ඇති කරන්න. ඒ වාගේම තමයි, රාජ්‍ය හා පුද්ගල හවුල්කාරීත්වය මත පදනම් වූ ආර්ථිකයක් ගොඩ නඟන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, අගය එකතු කළ කර්මාන්ත ඔස්සේ අපේ රටේ ආර්ථිකය වර්ධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම තමයි, අපනයන විවිධාංගීකරණය තුළින් ඉහළ ආදායමක් අපි අපේක්ෂා කරනවා. අපි කවුරුත් දන්නවා, පසුගිය කාලයේ රජයන් වෙළෙඳ ගිවිසුම්වලට ඇතුළත් වෙලා තිබුණු බව. ඒ වෙළෙඳ ගිවිසුම් හරහා ජාත්‍යන්තර වෙළෙඳාම් කටයුතුවලට සහභාගිත්වය ලබා දීලා තිබුණා. අපි ඒ වෙළෙඳ ගිවිසුම් සමාලෝචනය කරන්නත්, නව නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට එළඹෙන්නත් බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ වෙනුවෙන් සැලසුම් හදලා මේ වනකොටත් අපි ක්‍රියාත්මක වෙමින් ඉන්නවා කියන කාරණය විශේෂයෙන්ම මම සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට, ණය තිරසරභාවය සහතික කිරීම අපේ උපාය මාර්ගික වැඩ පිළිවෙළේ විශේෂ අරමුණක්. මේක ගැන විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ. මීට කලින් මේ ගරු සභාව ආමන්ත්‍රණය කරපු මන්ත්‍රීවරයා මේ ණය තිරසරභාවය සම්බන්ධයෙන් අපට වැඩ පිළිවෙළක් නැහැ කියලා තමයි කිව්වේ. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ වන විටත් ණය සේවාකරණ කටයුතුවල සැලකිය යුතු ප්‍රගතියක් අපි අත්පත් කරගෙන තිබෙන බව. මේ අවුරුද්ද අවසන් වන විට අපි තවත් ගෙවන්න ඉතිරි වෙලා තිබෙන්නේ ඩොලර් මිලියන 487ක ප්‍රමාණයක්. අපි ඒ මුදල ගෙවන්න සූදානමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි, 2028 වර්ෂයට අපි යන්නේ කොහොමද කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයකු අපෙන් ඇහුවා. විපක්ෂයේ ඉඳන් අපට ද්වේෂ සහගත විවේචන ඉදිරිපත් කරන මන්ත්‍රීවරුන්ට අපි කියන්නේ මෙච්චරයි. තමුන්නාන්සේලා කලබල වෙන්න එපා. තමුන්නාන්සේලා බලාගෙන ඉන්න. මේ රටේ ජනතාව තමුන්නාන්සේලාව තියන්න ඕනෑ තැන තියලා තිබෙනවා.

මේ අය වැයෙන් පස්සේ ජනතාව නිශ්චිතව තීන්දු කරයි, තමුන්නාන්සේලා ඉතිහාසයේ කුණු බක්කියට යවන්න සුදුසු කොටසක් හැටියට. ජනතාව තමුන්නාන්සේලාව ඒ විධියට හඳුනා ගන්නවාය කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ හින්දා ණය තිරසරභාවය සම්බන්ධයෙන් කලබල වෙන්න එපා කියන එක තමයි මට විශේෂයෙන් කියන්න ඕනෑකම තිබෙන්නේ.

2025ට සාපේක්ෂව ඇමෙරිකානු ඩොලර් මිලියන 761ක වැඩිපුර මුදලක් තමයි අපට 2028 අවුරුද්දේ ගෙවන්න තිබෙන්නේ. ඒ මුදල ගෙවන්න සූදානම් වෙමින් අපි ඉදිරි කාල පරිච්ඡේදය තුළ වැඩ කටයුතු කරනවා. දැනටමත් අපි ඒ සඳහා සැලසුම් සකස් කර තිබෙන බව මේ වෙලාවේ මම විශේෂයෙන් සඳහන් කරන්නට අවශ්‍යයි.

ඒ වාගේම මතක් කළ යුතු තවත් විශේෂ කාරණාවක් තිබෙනවා. අපේ රටේ ණය තිරසරකරණය සම්බන්ධයෙන් 2022 අවුරුද්දේ IMF එකේ නිර්වචනය ඉදිරිපත් කරලා තිබුණා. 2022 අවුරුද්දේ ඒගොල්ලෝ ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් වුණේ නැහැ. ඒ ඇයි? අපි ගත් ණය මුදලට සාපේක්ෂව අපේ රටේ වත්කම් උත්පාදනය වෙලා නැහැ. ඒ විතරක් නොවෙයි, ඒ ලබා ගත් ණය මුදල්වලින් අපේ ව්‍යාපෘති ප්‍රමුඛතාවක් අනුව ඒගොල්ලන් කටයුතු කරලා නැහැ. එම නිසා අපේ රට වළ පල්ලට දමපු විපක්ෂ මන්ත්‍රීවරු තමයි අපට එරෙහිව අවලාද කියමින් මේ පාර්ලිමේන්තුවේ යකා නටන්නේ.

ඊළඟට, අපි නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන්න ඕනෑ, ග්‍රාමීය දිළිඳුකම තුරන් කරන්න ඕනෑ, ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කරන්න ඕනෑ. මෙන්න මේ අරමුණු ඔස්සේ ඉදිරියට යමින්, අපේ රටේ ආර්ථිකය නඟා සිටුවමින්, ඉදිරි වසරේ අපේ ක්‍රියාදාමයන් තුළින් මේ අය වැය අපේ රටේ ඓතිහාසික අය වැයක් බවට පත් කරන්න අපි කටයුතු කරනවා. හැබැයි මට ඇහුණා, විපක්ෂයේ එක් මන්ත්‍රීවරයෙක් කියනවා, මේක ඓතිහාසික වෙන්නේ පැය හතරහමාරකට ආසන්න කාලයක් අය වැය ඉදිරිපත් කරපු නිසා කියලා. අපි එතුමාට කියන්න කැමැතියි, එතුමාගේ බාප්පොච්චි කපුටු න්‍යායෙන් මේ රටට අය වැය ඉදිරිපත් කරපු පාර්ලිමේන්තුවේ ඉඳගෙන තමයි අපි හදපු අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. ඒ වාගේම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කියනවා මම දැක්කා, මේ අය වැයෙන් වංචා, දූෂණ වළක්වන්න පියවර අරගෙන නැහැ කියලා. වංචා, දූෂණ වැළැක්වීම සඳහා අවශ්‍ය තරම් පියවර අපි මේ අය වැය යෝජනාවල අන්තර්ගත කරලා තිබෙනවා. මහ බැංකු වංචාවට අදාළව කථා කරන්න COPE එකට ගිහිල්ලා කණ්ඩායම් හැදිලා footnotes දාපු අය තමයි අපට මේ විධියේ විවේචන ඉදිරිපත් කරන්නේ.

එම නිසා අපි බොහොම විශ්වාසයෙන් කියනවා, මේ අය වැය; මේ ජනතාවාදී අය වැය, ජනතාවාදී ආණ්ඩුවේ ජයග්‍රහණයක් බවට පරිවර්තනය කරන්න අපි උපරිම ශක්තියෙන් වැඩ කරනවා කියලා. ගරු කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්න මම ඉතා කෙටි වේලාවක් ඉල්ලා සිටිනවා. අපේ අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා අය වැය කථාවේදී ඉදිරිපත් කළ වාක්‍ය කිහිපයකින් මම මගේ කථාව අවසන් කරන්න සූදානම්. එතුමා අය වැය කතාවේ "සමාප්තිය" කොටසේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "වඩා ලස්සන රටක් වෙනුවෙන් තමන්ගේ සෑම සිහිනයක්ම කැප කරමින්, ඒ ලස්සන රට බිහි වෙන්නට පෙර මිය ගිය සෑම හදවතකම ප්‍රාර්ථනාව තිබුණේ මේ රට ලස්සන රටක් කරනවා දකින සිහිනය.
>
> අපි දෙවුර මතට ගෙන තියෙන්නේ ඒ පවිත්‍ර මිනිස්සුන්ගේ මරණාසන්න ප්‍රාර්ථනාවන්. ඒ ප්‍රාර්ථනාවන් දේව වාක්‍ය තරම් වුවමනාවකින් අපි ඉටු කරනවා."

එම ප්‍රාර්ථනාවන් ඉටු කරන්න අපි බැඳී ඉන්නවා කියන සපථ කිරීම කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
**(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)**
(The Hon. Speaker)

Next, the Hon. Asitha Niroshana Egoda Vithana. You have nine minutes.

[පූ.භා. 10.54]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මීට ටික වේලාවකට කලින් කථා කළ විපක්ෂයේ ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා, එතුමාගේ කථාව අවසන් කළේ, අපේ රට; ශ්‍රී ලංකාව නමැති ජාතික රාජ්‍යය මුළුමනින්ම දිය කර හරින්න කටයුතු කරපු, ඒ වාගේම මෙරට ජනතාව අද විඳින සමාජ ආර්ථික ප්‍රශ්නවල නිර්මාතෘවරු වෙච්ච, මේ රටේ තරුණයින් දහස් ගණනක් සංහාර කිරීම සඳහා න්‍යාය පත්‍ර සකස් කරපු, සමාජ ආර්ථිකමය වශයෙන් මේ රට මුළුමනින්ම විනාශ කිරීම සඳහා පිඹුරුපත් සකස් කරපු ආර්ථික, දේශපාලන ඝාතකයාගේ වචනයකින්.

ඒ නිසා මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි, 1789 සිද්ධ වෙච්ච ප්‍රංශ විප්ලවයෙන් පසුව ප්‍රංශය තුළ ඇති වුණු ඒ ජනතා නැඟිටීම, ඒ මහා සමාජ පරිවර්තනය, ඉන් පසුව ඇති වුණු දේශපාලන කැලඹීලිසහගත තත්ත්වය, සමූහාණ්ඩු නිර්මාණය වීම, ජාතීන් ගොඩනැඟීම, ජාතික ආර්ථිකය ගොඩනැඟීම, ඉන් පසුව ඇති වුණු දේශපාලන කුමන්ත්‍රණවල ප්‍රතිවිපාක තත්ත්වයන් කියන සියල්ල මැද ප්‍රංශය නැවත ජාතික රාජ්‍යය ගොඩනැඟීමේ කාර්යයේදී ඒ පිළිබඳව අවධානය යොමු කරපු 20වැනි සියවසේ ශ්‍රේෂ්ඨතමයා ලෙස හැඳින්වූ කාල් මාක්ස් කියන දාර්ශනිකයාගේ කියමනකින්. ගරු කථානායකතුමනි, ඔහු කියා තිබෙනවා, "මිනිස්සු ඉතිහාසය නිර්මාණය කරති. එහෙත් ඔවුන් එසේ කරන්නේ ඔවුන්ට රිසි පරිදි නොවේ. ඔවුන් විසින් තෝරා ගනු ලැබූ තත්ත්වයන් යටතේ ඔවුහු එසේ නිර්මාණය නොකරති. ඔවුන් ඉදිරියේ පවතින ඔවුන්ට ලැබී ඇති තත්ත්වයන් සහ අතීතයෙන් සංක්‍රමණය වුණු තත්ත්වයන් යටතේ ඔවුහු එසේ නිර්මාණය කරති" යනුවෙන්.

ගරු කථානායකතුමනි, 2024 සැප්තැම්බර් මාසයේ 21 වැනි දා අපට මේ රටේ රාජ්‍ය බලය ලැබුණා; අනුර කුමාර දිසානායක සහෝදරයා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් වුණා. ඉන් පසුව අපි මේ රාජ්‍යය ගොඩනැගුවේ අපට ලැබී තිබුණු තත්ත්වයන් යටතේයි; අතීතය විසින් අපට උරුම කරනු ලැබූ සමාජ, ආර්ථික තත්ත්වයන් යටතේයි. අපට ලබා දුන් රාජ්‍යය තමයි අප එතැන් සිට මෙසේ ඉදිරියට ගොඩනහමින් තිබෙන්නේ. අපි වසරක් තුළ ඉතා හොඳ, ප්‍රගතිශීලී, ශක්තිමත් ගමනක් ඇවිල්ලා තිබෙනවා. ඒ ගමනේ තවත් ඉදිරි පියවර ගණනාවක් තබන්න තමයි අපි මෙවර අය වැය ඉදිරිපත් කළේ.

මට කලින් කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වන ගරු මරික්කාර් මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද? මේ පාර්ලිමේන්තුව පරිශ්‍රයේ කොහේ හෝ එතුමා ඉන්නවා නම්, මම එතුමාට කියන්න කැමැතියි, කරුණාකර අඩුම තරමින් මෙම විසර්ජන පනත් කෙටුම්පත තෙවැනිවර කියවීමට කලින් හෝ මේ අය වැය කථාව කියවා එන්න කියලා. ඉක්සෙල්ලාම අය වැය කථාව කියවා එන්න ඕනෑ, ගරු මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව බොහොම ඉක්මනින්, හදිසියේ, තකහනියේ, බොහොම කාර්යශූරව කැඳවනවා, තොරතුරු ටික ගන්න. හැබැයි, තමුන්නාන්සේ අය වැය කථාව කියවා නැහැ. කරුණාකර අය වැය කථාව කියවන්නත් කාලයක් වෙන් කර ගන්න.

ගරු කථානායකතුමනි, එතුමා "චෛතිය" ගණයේ බොරු රාශියක් මෙතැන මහ හයියෙන් කෑ ගහලා කිව්වා. පළමුවැනි එක තමයි, කැලණි ගඟ ආශ්‍රිත ගංවතුර උවදුර පාලනයට කිසිදු කථාවක් කරලා නැහැ, කිසිදු මුදලක් වෙන් කරලා නැහැ කියන එක. ඒක චෛතිය බොරුවක්. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අය වැය කථාව කියවලා එන්න.

ගරු කථානායකතුමනි, අපි මේ අය වැයෙහි සඳහන් කර තිබෙනවා කොළඹ, ගම්පහ, ගාල්ල, අම්පාර, මන්නාරම, පුත්තලම නගර ආශ්‍රිත ගංවතුර පාලනය සඳහා ඒකාබද්ධ සැලැස්මක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම සඳහා -ඒ ව්‍යාපෘතිය සකස් කර ගැනීම සඳහා, එම යෝජනාව සකස් කර ගැනීම සඳහා, වඩා හොඳම වැඩසටහන සකස් කරගැනීම සඳහා- රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙන බව.

ගරු මරික්කාර් මන්ත්‍රීමනි, කොළඹ, ගම්පහ කිව්වාට පස්සේ කොළඹ, ගම්පහ දිස්ත්‍රික්ක දෙක සීමා වෙන්නේ කැලණි ගඟෙන්. අඩුම තරමින් භූවිෂමතාවවත් දැනගෙන එන්න කියලා මම ඔබතුමාට කියනවා.

ඒ විතරක් නොවෙයි. ගරු අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කොළඹ දිස්ත්‍රික්කයේ ඉන්න සියලු මහජන නියෝජිතයන් එකතු කරලා, ගංවතුර ගැටලුව සම්බන්ධයෙන් කටයුතු කරන සියලු අමාත්‍යාංශ එකතු කරලා, විද්‍යාත්මක සැලැස්මක් ගැන සාකච්ඡා කිරීම සඳහා expert team එකක් සකස් කරමින් කැලණි ගඟ ගංවතුර උවදුර පාලනය කිරීම සඳහා 1961 සෝවියට් දේශය සකස් කරන ලද වැඩසටහන, මහවැලි අධිකාරිය විසින් සකස් කර තිබෙන වැඩසටහන, 1992දී සකස් කර තිබෙන වැඩසටහන, ඒ විතරක් නොවෙයි 2016 CRIP ව්‍යාපෘතිය යටතේ සකස් කර තිබෙන වැඩසටහන ආදී සියල්ල ගැන සාකච්ඡා කරමින් මෙම ගැටලුව සඳහා හොඳම විද්‍යාත්මක විසඳුම සකස් කිරීමට අපි කටයුතු කර තිබෙනවා. ඒ නිසා මරික්කාර් මන්ත්‍රීතුමනි, අය වැය කියවන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට කියනවා, 2025 වර්ෂයේ වෙන් කරපු මුදල් විශාල ප්‍රමාණයක් හැරිලා යනවා ලු; සංවර්ධනය බිංදුවයි ලු. තක්කඩි ගණයේ බොරුවක්. ඒක චෛතිය ගණයේ දෙවන බොරුව. අප වෙන් කරලා තිබුණු රුපියල් බිලියන එක්දහස් ගණනින් රුපියල් බිලියන පන්සිය අනූඑකක් මේ වන විට අපි වැය කරලා තිබෙනවා. මේ වනකොට සියයට 58යි අපේ සංවර්ධනයේ ප්‍රගතිය. තවත් මාස දෙකක් තිබෙනවා, මරික්කාර් මහත්තයෝ. තමුන්නාන්සේලා දන්නවා, රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා අයවැයෙන් වෙන් කළ මුදල් වැය කිරීම අවසන් වෙන්නේ කොහොමටත් අවසන් මාස කිහිපය තුළ බව. ඇස්තමේන්තු සකස් කරනවා. ඒ ක්‍රියාවලිය - process එක - යනවා. වර්ෂයේ අවසන් මාස කිහිපයේ තමයි ව්‍යාපෘති වැඩ සඳහා අයවැයෙන් වෙන් කළ මුදල් වැය කර අවසන් වෙන්නේ. ඉදිරියේදී සියයට 90 ඉක්මවනවා, පසුගිය අය වැයේ අපේ එම සාධනීය තත්ත්වය. ගරු මන්ත්‍රීතුමනි, සියයට 90 ඉක්මවා අපි පෙන්වන්නම් තමුන්නාන්සේට.

ඒ විතරක් නොවෙයි, කොළඹ දිස්ත්‍රික්කයේ නිවාස සඳහා වෙන් කරපු මුදල බොරුවක්, ව්‍යාජයක් කියලා විවේචනයක් ඉදිරිපත් කළා. ඒ, එතුමා කියපු අනෙක් බොරුව. කොළඹට පමණක් මෙවර අය වැයෙන් ලබන වසරේ නිවාස 3,000කට අපි බිලියන 15ක් වෙන් කරලා තිබෙනවා. ඒ කොළඹට පමණයි. මුළු රටේම තව ගෙවල් 10,000ක් ලබන වසරේ හදන්න මුදල් වෙන් කරලා තිබෙනවා. අපි දැනට හඳුනා ගෙන තිබෙනවා, ඉදිරි වසර තුන තුළ නිවාස 50,000ක් හදන්න ඕනෑ කියලා. අපි ඉලක්ක සහගත, සැලසුම් සහගත ආණ්ඩුවක් ලෙස කටයුතු කරනවා. මේ වසරේ අවසන් මාස හය තුළත් නිවාස තුන්දහස් ගණනක් හදලා පසුගිය මාසයේ නිවාස දාහක් ජනතාවට භාර දුන්නා. දැන් ක්‍රමානුකූලව ඉතිරි ටිකත් භාර දෙමින් තිබෙනවා. ඒ නිසා චෛතිය ගණයේ බොරු ඇද බාන්න එපා කියලා අපි ගරු මරික්කාර් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා.

පසුගිය කාල පරිච්ඡේදයේම අපේ රටේ ජාතික රාජ්‍යය ගොඩනැඟීම සඳහා ඉතා ඉහළින් දායක කරගන්න තිබුණු රාජ්‍ය

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

ව්‍යුහය මුළුමනින්ම දිය කර හැරියා. බඳවා ගැනීම් කළේ නැහැ. උසස්වීම් ලබා දුන්නේ නැහැ. තරග විභාග ක්‍රමය මුළුමනින් අකුළා විනාශ කරලා තිබුණා. ඒ නිසා අපේ රටේ රාජ්‍ය ව්‍යුහය දිගින් දිගටම බරපතළ විධියේ කප්පාදු කිරීමක්, දියකර හැරීමක් සිදු වුණා. ඔබතුමා දන්නවා, පසුගිය අය වැයෙන් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වෙනුවෙන් කෝටි 11,000ක් වෙන් කළා කියන එක.

මෙවරත් අපි රුපියල් කෝටි 11,000ක් වෙන් කරලා තිබෙනවා, රාජ්‍ය සේවයේ වැඩි කළ වැටුප් ගෙවීම සඳහා. තෘප්තිමත් රාජ්‍ය සේවයක් ඇති කරලා, දක්ෂතා තිබෙන නිලධාරින් රාජ්‍ය ව්‍යුහය තුළ තියාගෙන, ඒ කාර්යක්ෂම නිලධාරින් එක්ක මේ රට ගොඩනැඟීම සඳහා අපි කටයුතු කර තිබෙනවා. උදාහරණයක් විධියට, 2020දී අයවැඹපත් කැඳවා නතර කළ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ බඳවා ගැනීමේ විභාගය අපි 2025 ඔක්තෝබර් 01 වැනිදා පවත්වලා, අදාළ බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් තිබෙනවා. උසස් පෙළ සමත් දක්ෂ, තරුණ නිලධාරින් 2,000ක් බඳවා ගෙන තිබෙනවා. ඔවුන්ගෙන් 400කට ආසන්න පිරිසක් උපාධිධාරින්. ඔවුන්ගේ ආරම්භක වැටුප රුපියල් 60,000යි. අපි තෘප්තිමත් රාජ්‍ය සේවයක් අපි ඇති කරමින් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි, 2025.02.11 වැනිදා කැබිනට් මණ්ඩල තීරණයක් මඟින් අපි 7,456දෙනෙකු බඳවා ගත්තා. ඊට පස්සේ 2025.05.27වන දා තවත් 15,073දෙනෙකු බඳවා ගත්තා. 2025.10.28වන දා තවත් 8,547දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කළා. ඒ අනුව රාජ්‍ය ව්‍යුහය මුළුමනින්ම ශක්තිමත් කරමින්, මේ රටේ ජාතික රාජ්‍යය ගොඩනැඟීම සඳහා අපි කටයුතු කරමින් තිබෙනවා. ශ්‍රී ලංකා පරිපාලන සේවයට නිලධාරින් 297දෙනෙකු, ගණකාධිකාරිවරුන් 499දෙනෙකු, ක්‍රම සම්පාදන නිලධාරින් 139දෙනෙකු, ඉංජිනේරු සේවය සඳහා නිලධාරින් 249දෙනෙකු, විද්‍යාත්මක සේවය සඳහා නිලධාරින් 126දෙනෙකු, ආධුනික මිනින්දෝරුවන් 33දෙනෙකු, ඒ වාගේම සිතියම් තාක්ෂණ නිලධාරින් 64දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කරමින්, මේ රටේ ශක්තිමත් කළ යුතු සියලු ආයතන අපි ශක්තිමත් කරමින් තිබෙනවා. වෛද්‍යවරුන් 1,408දෙනෙකු, හෙද සේවයට 3,447දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර තිබෙනවා. දියකර හැරපු රාජ්‍ය සේවය, ජනතාවට ලබා දිය යුතු සේවාවන් අකර්මණ්‍ය කරපු රාජ්‍ය සේවය අපි ඉතාම ශක්තිමත් ලෙස ගොඩනඟමින් තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
හොඳමයි, ගරු කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි. වාහන මිල දී ගැනීම සඳහා අපි රුපියල් මිලියන 12,500ක් වෙන් කරලා තිබෙනවා. කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමාගේ වාහනය PD number එකක් තිබෙන වාහනයක්, වසර 15ක් පැරණි වාහනයක්. හැම වසරකම මිලියන ගණනක් වැය වෙනවා, ඒ ඩබල් කැබ් රථය අලුත්වැඩියා කරන්න. අන්න ඒ ප්‍රාදේශීය ලේකම්වරුන්ට, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ට, වනජීවී නිලධාරින්ට, ඒ වාගේම මේ රටේ රාජ්‍ය ව්‍යුහයට අවශ්‍ය කරන යටිතල පහසුකම් ටික ලබා දීම සඳහා අපි ඒ කටයුතුත්ත සිදු කරමින් තිබෙනවා. ඒ වාහන එක්දහස් ගණනෙන් වාහන 700කට ආසන්න සංඛ්‍යාවක් වෙන් කරලා තිබෙන්නේ, පළාත් පාලන ආයතන වෙනුවෙන්. කොළඹ මහ නගර සභාවට අවසන් වතාවට කසළ ඇදීම සඳහා භාවිත කරන කම්පැක්ටර් රථයක් ලබාගෙන තිබෙන්නේ 1997දී, ගරු කථානායකතුමනි. ඒ බිඳ වැටිච්ච රාජ්‍ය සේවය තමයි අපි ශක්තිමත් කරමින් තිබෙන්නේ. ඒ නිසා අපි විපක්ෂයට කියනවා, තමුන්නාන්සේලා අන්ත අසරණ වෙලා, දේශපාලන වශයෙන් මුළුමනින්ම බිඳ වැටිලා සිටින බව. තමුන්නාන්සේලාට අල්ලන්න බැරි උසකට අපි මේ රටේ දේශපාලනය ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා දේශපාලන වශයෙන් තමුන්නාන්සේලාට "අනිච්චාවත සංඛාරා!" කියලා අපි ප්‍රාර්ථනා කරන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Chaminda Wijesiri. You have 16 minutes. Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.04]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර 80වන අය වැය ලේඛනය තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි අහන්න කැමැතියි, 79වන අය වැය ලේඛනයේ ඉදිරිපත් කරපු යෝජනාවල ප්‍රගතිය පිළිබඳව තමුන්නාන්සේලා සතුටු වනවාද කියලා. එය එසේ නොවෙයි කියන කාරණය නිසා තමයි, ඔයගොල්ලන්ගේ ජනාධිපතිවත් දන්නේ නැති, ඔයගොල්ලන් දැන් කියවන මහා භාණ්ඩාගාරයේ අතිරික්තය පිළිබඳව හර්ෂ ද සිල්වා මහත්මයා කිව්වේ. හර්ෂ ද සිල්වා මහත්මයා ඉගැන්වූයේ ඔයගොල්ලන්ට විතරක් නොවෙයි. සමගි ජන බලවේගයේ අපේ කණ්ඩායමේ හර්ෂ ද සිල්වා මහත්මයා ඒ නිහතමානී දේශපාලන ඉගැන්වීම එදා රනිල් වික්‍රමසිංහටත්, බැසිල් රාජපක්ෂටත්, ගෝඨාභය රාජපක්ෂටත්, මහින්ද රාජපක්ෂටත් ඉගැන්වූවා. මේ රටේ යහපත, උන්නතිය, පැවැත්ම වෙනුවෙන් නිහතමානීව ඒක කියලා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළ එතුමා සතුව තිබෙනවා. ඔයගොල්ලන්ගේ ජනාධිපතිතුමා කිව්වාද, මුදල් අතිරික්තයක් තිබෙනවා කියලා? ඔයගොල්ලන් හර්ෂ ද සිල්වා මහත්මයා කිව්වාට පස්සේ නේ දන්නේ, එහෙම අතිරික්තයක් තිබෙනවා කියලා. හැබැයි, මම කියන්නම්, ඕකට මොකද කරන්නේ කියලා.

සමහරු බදු එකතු කරලා භාණ්ඩාගාරය පුරවනවා පෙන්වලා හොරා කෑවා. ඒක, එක ක්‍රමයක්. ඒක හොඳට විවේචනය කළේ ඔයගොල්ලන්. ඒක එදා විවේචනය කළේ ඔයගොල්ලන්ගේ ජනාධිපතිතුමා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, භාණ්ඩාගාරය පුරවලා හොරා කනවා. එතකොට හොරා කනවා කියලා පෙනෙන්නේ නැහැ. ඒක හරි මාර්කට්. ඒ, ජාතික ජන බලවේගයේ -NPP එකේ- හොරා කෑම. ඒක තමයි නූතන, නවීන පන්නයේ අලුත්ම හොරා කෑම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාවට ප්‍රවේශ වෙන්න කලින් මම මේ කාරණය කියන්නම්. අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, 2026 අය වැය ලේඛනය මම දකින්නේ, -

මම ජනතාවට කියවන්න කියනවා, මම කියෙව්වා- 76 අවුරුද්දක ශාපය සැබෑවටම සිද්ධ කළේ කවුද කියන කාරණය දකින්න පුළුවන් අය වැය ලේඛනයක එක් පියවරක් විධියට; එහි එක් පියවරක්. නලින්ද ජයතිස්ස මැතිතුමා මම ගරු කරන අපේ ඇමතිවරයෙක්. එතුමාටයි මේ ප්‍රශ්නය යොමු කරන්න වෙන්නේ. එතුමා විතරයි ඇමතිවරයෙකු හැටියට මේ වෙලාවේ සභාවේ ඉන්නේ. එතුමා විතරයි ඊයේ ඉල් මහ විරු සමරුවට ගිහිල්ලා ඉන්නවා දැක්කේ. මම දැක්කා, ඔබතුමා මල් කලඹක් ගිහිල්ලා තියනවා, ගරු ඇමතිතුමනි. ඒක බොහොම හොඳයි.

1987, 1988 කාලයේ මම ළාබාල වයසේ හිටියේ. ඒ වනවිට මට අවුරුදු 6ක්, 7ක් විතර ඇති. එදා ඔයගොල්ලන් ඉන්දු-ලංකා ගිවිසුමට විරුද්ධ වුණා. බලය බෙදීම වෙනුවෙන්, පළාත් සභා මැතිවරණය වෙනුවෙන් ඔයගොල්ලන් අවුළපු ඒ ගින්නේ ප්‍රතිඵලය වෙනුවෙන් මියැදුණු, ඔබේ පක්ෂයේ විරුවෝ සමරපු වෙලාවේ අපි ඉල්ලීමක් කරනවා. නලින්ද ජයතිස්ස ඇතුළු කොන්දක් -කශේරුකාවක්- තිබෙන JVPකාරයෙක් ඉන්නවා නම් අද දවස ඉවර වෙන්න කලින් අපට පෙන්වන්න, ඔයගොල්ලන් ආණ්ඩුව අරගෙන අත්සන් කරපු ඉන්දු-ලංකා ගිවිසුමේ පිටපතක්. ඒක සහනයක් වෙයි, ඔබේ පක්ෂයේ මියැදුණු විරුවන්ට. ඔයගොල්ලන් බලය ලබා ගැනීම වෙනුවෙන් මිනී මරපු චෝදනාවෙන් ගැලවෙන්න නම් ඔයගොල්ලන් ඉන්දියාවට විකුණන්නේ මොනවාද කියලා කියන්න, ඔයගොල්ලන් ඉන්දියාවට දෙන්නේ මොනවාද කියලා කියන්න. ඔයගොල්ලන් ගිහිල්ලා මල් කලඹ තියපු උදවියට පිනක් වෙන්න නම්, ඒ අය විරුවෝ හැටියට සලකනවා නම්, මම කියපු කාරණාවලට උත්තර දෙන්න. මම විනාඩියක් දෙන්නම්. කොන්ද තිබෙන JVPකාරයෙක් ඉන්නවා නම් නැඟිටලා දැන් හරි සභාගත කරන්න, අපට පෙන්වන්න, ඔයගොල්ලන් ඉන්දියාවට තෙල් ටැංකි ටික විකුණනවාද, ඉන්දියාවට වරාය විකුණනවාද කියලා. එදා ඔයගොල්ලන් විරුද්ධ වුණේ ඒවාට නේ. දැවැන්ත විරුවෝ කියලා සමරලා මල් තිබ්බේ මොකටද? සමහරු කිඹුල් කඳුළු හෙළුවේ, එදා හිටපු අපේ තරුණ අයියලා, මල්ලිලා සියලුදෙනා මරා ගත්තෙත් ඉන්දු-ලංකා ගිවිසුමට විරුද්ධව නේ.

එහෙම නම් මම ඉල්ලීමක් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. NPP කට්ටියට මේක අදාළ වෙන්නේ නැහැ. JVP කියන මේ උදවිය අය වැය ඉවර වෙන්න ඉස්සෙල්ලා අපට වාගේම රටට පෙන්වන්න, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා පහුගිය කාලයේ ඉන්දියාවත් එක්ක ගහපු ගිවිසුම. මේ රටටත් බොරු කියලා, පාක්ෂිකයාටත් බොරු කියලා, පාක්ෂිකයා විනාශ කරන බොරුව ඉදිරියේදීවත් නවත්වන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 76 වසරක ශාපයට එක කාරණයක්, ඒක. දෙවන කාරණය මම දැන් කියන්නම්. ඔබ දැන් MCC කියන ගිවිසුමට, එහෙම නැත්නම් MCC කියන ආයතනයට රුපියල් බිලියන 100ක් වෙන් කර තිබෙනවා. ඒ මොකටද?

ඊළඟ අවුරුද්දේ දේපළ බද්දක් ගහනවා. මේ රටේ තිබෙන දේපළ පිළිබඳව නිශ්චිතව වාර්තා නැහැ. ඒ කාලයේ MCC ගිවිසුම පිළිබඳව වැඩියෙන්ම බිල්ලෝ මැව්වේ කවුද? මේ රටේ ඉඩම් ඇමෙරිකාවට යනවා, ඇමෙරිකාව තමයි රට පාලනය කරන්නේ, මේ රට බෙදනවා කියලා එදා පොදුජන පෙරමුණත්, වැඩියෙන්ම JVP එකත් තමයි කථා කළේ. එහෙම නම් ඇයි ඔබතුමන්ලා දැන් ඒවාට සල්ලි වෙන් කරන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෘත්තිකයෝ එකතු කරලා, විශ්වවිද්‍යාල දරුවෝ මහ පාරට ගෙනැල්ලා වීදි සටන් කරලා, එදා රට බෙදනවාට, විකුණනවාට, වෙන් කරනවාට, කෑලි කරනවාට විරුද්ධ වුණු ඔබතුමන්ලාම, අද ඔබතුමන්ලාගේ අය වැය තුළින් සල්ලි වෙන් කරනවා, ඒ දේවල්වලට. අද 76 අවුරුද්දක ශාපය ගැන කියනවා. මේ රටේ ආයෝජන නැති කර, මේ රටේ සංවර්ධනය විනාශ කළේ ඔබතුමන්ලා. මට මෙය කියවනකොට දැනෙන්නේ මේකයි. 76 අවුරුද්දක් තිස්සේ රටට වින කරලා, රට නන්නත්තාර කරලා, රට බංකොලොත් කරලා, දැන් ඔබතුමන්ලාගේ අය වැය තුළින් එය ඉදිරිපත් කරනකොට සතුටුයි. හැබැයි, අපට දැනෙනවා අහිමි වුණු දේවල් ගැන. ඒ අහිමි කළ දේවල් නැවත රටට ලැබෙනවාද? ඔබතුමන්ලා දැන් සමාව ගන්න ඕනෑ. මේ අය වැය ගැන කථා කරනකොට කියන්න, "ඔව්, අපි 76 අවුරුද්දක් විරුද්ධ වුණා. අපි වීදි සටන් කළා. මේ ව්‍යාපෘතිය ගෙනෙනකොට අපි විරුද්ධ වුණා. මේවා අපි නැවැත්තුවා. මේවා නවත්වලා අපි මේ රටේ අනාගතය විනාශ කරන්න කටයුතු කළා. දැන් අපට ඒක තේරිලා තිබෙනවා. එම නිසා එදා අපි එපා කියපු දේවල් 2026දී නැවත කරනවා" කියලා. ඉතින්, මේවා ශාප නොවෙයිද? මේවා ශාප නොවෙයිද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේ වෙන දේවල් පිළිබඳව අපට සතුටක් දැනෙනවා. ඔව්, හරි. හැබැයි, එදා මේවා වළක්වලා, මේවා එපා කියලා, තමුන්නාන්සේලා මේවා නැවත උජාරුවට ගෙනැල්ලා "ඔව්, අපි ඒවා කරනවා" කියනකොට අපට දැනෙන්නේ 76 අවුරුදු ශාපය ඔබයි කියලා; 76 අවුරුදු ශාපය ඔබයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. ජනාධිපතිතුමා කියනවා, හොරු අල්ලනවා කියලා. මේ රටේ සිදු වුණු ලොකුම හොරකම මොකක්ද? පසුගිය කාලයේ කිව්වේ මහ බැංකු බැඳුම්කර වංචාව කියලා. හැබැයි, දැන් ඔබතුමන්ලාට බැඳුම්කර වංචාව, සීනි බදු වංචාව, පොල් තෙල් වංචාව පිළිබඳව මේ ගරු සභාවේ කථා කරන්න බැහැ. ඇයි, ඒ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බැඳුම්කර වංචාව ගැන ප්‍රශ්නයක් අසමින් ඒක කවුද කළේ, කොච්චර ප්‍රමාණයක් අලාභද කියලා ඇහුවා. ඒ වාගේම මම ඇහුවා, සීනි බදු වංචාවක් සිද්ධ වුණාද, ඒක කවුද කළේ, ඒකෙන් කොච්චර අලාභයක් වුණාද කියලා. මම එම ප්‍රශ්න ඇහුවේ මේ ආණ්ඩුවේ අගමැතිතුමියගෙන්. මම අගමැතිතුමියගෙන් පොල් තෙල් වංචාව ගැනත් ඇහුවා. එම ප්‍රශ්න මම ඇහුවේ, 2025 අගෝස්තු 06වැනි දා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අගෝස්තු 06වන දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1461 සිට 1466 දක්වා කොටස මම මේ අවස්ථාවේදී සභාගත* කරනවා.

මොකක්ද අගමැතිතුමිය කියන්නේ? එතුමිය කියනවා, "මහ බැංකුවේ වංචාවක් සිද්ධ වෙලා නැහැ. ඒකේ නම් ගම් නැහැ. ඒකෙන් අලාභ වෙලා නැහැ" කියලා. ඊළඟට කියනවා, "සීනි බදු වංචාවක් වෙලා නැහැ. ඒකේ නම් ගම් නැහැ. ඒකෙන් අලාභයක් වෙලා නැහැ" කියලා. හැබැයි, මම දැක්කා ඊයේත් ඇමතිවරයෙක් කියනවා, හොරකම් කරලා, වංචා කරලා, අහවල් හොරකම කරලා,- *[බාධා කිරීමක්]* හැබැයි, ඔබතුමන්ලාට ඒවා කියන්න අවස්ථාවක් දැන් නැහැ. මොකද, දැන් ඔබතුමන්ලා ආණ්ඩුවේ ඉන්නේ. විධායක ජනාධිපතිවරයා ඔබතුමන්ලාගේ, අගමැති ඔබතුමන්ලාගේ, අමාත්‍ය මණ්ඩලය ඔබතුමන්ලාගේ. මන්ත්‍රීවරු 159ක් තියාගෙන දැනුත් files පෙන්ව පෙන්වා ඒ නාඩගම නටන්න ඔබතුමන්ලාට අවස්ථාවක් නැහැ. මොකද, එම වංචා සිද්ධ වෙලා නැහැම කියලා කිව්වා.

ඊළඟ එක තමයි, විව්ගේ රොකට් එක. ඒකෙන් පාඩුවක් නැහැ, ලාභ ලබා තිබෙනවා කිව්වා. එහෙම නම් දැන් 76 අවුරුදු ශාපය කවුද? තමුන්නාන්සේලා බොරු ගොතලා, හොරු හදලා, වංචාවක් සිදු වෙලා තිබෙනවාය කිව්වා. නමුත්, අද ඔබතුමන්ලාගේ අගමැතිතුමිය පාර්ලිමේන්තුවේදීම ඒවා හොරකම්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චමින්ද විජේසිරි මහතා]

නොවෙයි, වංචා නොවෙයි කියලා ඔප්පු කරලා තිබෙනවා නම් මොකක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශාපය? ශාපය බොරුව නේද? එම නිසා කවුද අද චෛත්‍ය රජ්ජුරුවන්ටත් එහා ගිහිල්ලා බොරු කියලා තිබෙන්නේ කියන කාරණය කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වාට, ඒ ඇඟිලි තුනම හැරිලා තිබෙන්නේ ඔබතුමන්ලාගේ පැත්තට.

ඊළඟට, බහලුම් වංචාව ගැනත් මම කියන්න කැමතියි. බහලුම් දෙකක් හම්බ වුණා. ඒවායේ තිබුණේ මත් කුඩු කිව්වා. ඒවායේ වටිනාකම් බරපතළයි. ඒවා කවුද ගෙනාවේ, මොන දේශපාලනඥයාද ගෙන්වූයේ කියලා තවම තමුන්නාන්සේලාට ඔප්පු කර ගන්න බැරි වුණා; අර ප්‍රාදේශීය සභාවේ අපේක්ෂකයා හැරෙන්න මහා පරිමාණයෙන් සම්බන්ධ වුණු දේශපාලන නායකයා කවුද කියලා අදටත් ඔප්පු කරන්න බැරි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බරපතළ කාරණය මේකයි. නිදහස් කළ බහලුම් තවත් 300 ගණනක් තිබෙනවා. රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා කිව්වා, ඒවායේ ආයුධ ආවාද, රත්තරන් ආවාද කියලා දන්නේ නැහැ කියලා. ඒ සියලු දේවල්වල වටිනාකම ඉතිහාසයේ හිටපු පාලකයෝ කරපු එක වංචාවකට, දූෂණයකට වඩා වැඩියි. එහෙම නම් ජනාධිපතිතුමාගේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වරාය ඇමතිකමෙන් අයින් කළා කියලා ඒක පිරිසිදු වෙන්නේ නැහැ. හැබැයි, හොරකම, වංචාව හා දූෂණය වළක්වනවා නම්, ඒක නිර්භීතව කරනවාය කියනවා නම්, ජනාධිපතිතුමා මුලින්ම කරන්න ඕනෑ එතුමාගේ වම් පැත්තේ, අගමැතිතුමියට එහා පැත්තේ ඉන්න එතුමාට විරුද්ධව කටයුතු කරන එකයි.

ඒ විතරක් නොවෙයි නේ. දැන් මහා භාණ්ඩාගාරය පුරවලා තිබෙනවා. ඒක පුරවලා තිබෙනවා කියලා හර්ෂ ද සිල්වා මහත්මයා කියපු නිසා, දැන් ඒ ගැන රටේ ජනතාවට කියනවා. ඉතිහාසයේ කවුරුත් නොකළ හොරකම්, වංචා ටික මේ ආණ්ඩුවේ අගමැතිතුමියගේ වම් පැත්තේ ඉන්න එක්කෙනා කළා. දකුණු පැත්තේ ඉන්නවා එහෙ බැලුවාම මේ පැත්ත ජේන එක්කෙනෙක්, මාර කොමිස් ගහන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කියන කථාව පුළුවන් නම් මේ සභාවේ රාජ්‍ය නිලධාරි මැදිරියේ ඉන්න නිලධාරින්ගෙන් අහන්න. එහෙම නැත්නම් එහා පැත්තේ තිබෙන පුටුවලට කථා කරන්න පුළුවන් නම් NPP මන්ත්‍රීතුමන්ලාට කියයි. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්නකොට අනුර කුමාර දිසානායක මහත්මයා ඇතුළු බිමල් රත්නායක, හඳුන්නෙත්ති මහත්මයලා හොරකම, වංචාව ගැන කථා කළා. හොරාට බැන්නා. එතුමන්ලා ඉන්නේ විපක්ෂයේ, හොරා ඉන්නවා එහා පැත්තේ. කථාව කරලා ඉවර වෙලා එළියේ පුටුවේ හොරාත් එක්ක වාඩිවෙලා කථා කරනවා. බොරු නොවෙයි, මේ කියන්නේ. පාර්ලිමේන්තුවේ කැන්ටින් එකේ දවල්ට කෑවා, මලික් සමරවික්‍රමත් එක්ක. මහ බැංකු වංචාව ගැන බැන්නා, හොරකම් ගැන බැන්නා. එහෙම එදා හොරකම ගැන කියලා, වංචාව ගැන කියලා, හොරාට බැණලා සභාවෙන් එළියට ගිහින් Lobby එකේදී ඒ අයත් එක්ක කථා කරලා නැද්ද? කියන්නේ නැහැ, හයට. දැකලා නැද්ද? අපි මේ ඇස් දෙකෙන් ඒවා දැකලා තිබෙනවා. ඕස්ට්‍රේලියාවෙන් පුනර්ජනනීය විදුලි බලය ගන්න එක ගැන එදා අනුර කුමාර දිසානායක මහත්මයා මේ සභාවේ කෑ ගැහුවා. හැබැයි, මම එළියට යනකොට මහින්දානන්ද අලුත්ගමගේ එක්ක කථාව. එදායින් පස්සේ ඒ ගැන කථා කරන්නේ නැහැ. ඒක තමයි ඔබතුමන්ලාගේ එදා style එක. දැන් style එක මොකක්ද? ඔබතුමන්ලා භාණ්ඩාගාරය පුරවලා ඒක හොරා කනවා. මහත්තයෝ මතක තියා ගන්න, ඔබතුමන්ලා ලූණු ගෙනැල්ලා හොරා කෑවා. හාල් ගෙනැල්ලා හොරා කන එක අදටත් කරනවා; ඒ සියලු දේවල් කරනවා. හැබැයි හොරු අල්ලනවා ලු. වම් පැත්තේ ඉන්නවා කන්ටේනර් නිකුත් කරලා වංචා, දූෂණ කළ එක්කෙනා. දකුණු පැත්තේ ඉන්නවා අදටත්, මේ මොහොතටත් මේ රටේ අහිංසක මිනිස්සුන්ට බදු බර පටවලා, ඒ වෙනුවෙන් ආනයනය කරලා, හාල්, සීනි, පොල් තෙල්වලින් සුපුරුදු කොමිස් එක ඒ විධියට ගන්න ඇමතිවරු. ඒක නේ බඩු මිල අඩු වෙලා නැත්තේ, ඒක නේ වියදම වැඩි වෙලා තිබෙන්නේ. රටේ ජනතාව තේරුම් ගන්න ඕනෑ. වෙස් වළාගෙන, සූට් ඇඳගෙන එදා කිඹුල් කඳුළු හෙළපු සියලුදෙනා දැන් පසුගිය ආණ්ඩු සිද්ධ කළ ඒ සුපුරුදු වැඩ පිළිවෙළ සිද්ධ කරනවා කියන කාරණය තමයි මට කියන්න තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට, ආණ්ඩු පක්ෂයේ දෙවැනි පේළිය ගත්තාම, එතුමා තමයි ඉස්සර ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් අධිකරණයේ පඩිපෙළේ නීතිඥයා. එතුමා ඉන්න මහල් නිවාසය කෝටි 50යි. අපි අහන්නේ කොහොමද ඒක ලැබුණේ? කවුද දුන්නේ? යාළුවෙක් දුන්නා නම්, ඒ යාළුවා කවුද? එයා මොන වාගේ යාළුවෙක්ද? අර්ජුන් ඇලෝසියස් වාගේ යාළුවෙක්ද? කුඩු, ගංජා, පාතාලය මෙල්ල කරනවා කියලා, එක කණ්ඩායමක් අල්ලනකොට තවත් කණ්ඩායමකින් පෝෂණය වෙන නියෝජ්‍ය ඇමතිවරු මේ ආණ්ඩුව තුළ ඉන්නවා. තව අවුරුදු 3යි, ඔහොම යමු. ඔහොම යනකොට ඔබතුමන්ලා වෙස් වළාගෙන ඉන්න සියලු දේවල් ගැළවෙනවා.

අපට චෝදනා කරනවා, ඒවා චෝදනා පමණයි. අපි අභියෝග කරන්නේ ඒකයි. ඔතුමන්ලාට ආණ්ඩු බලය තිබෙනවා. අගමැති ඉන්නවා; ජනාධිපති ඉන්නවා; අධිකරණ ඇමති ඉන්නවා. චෝදනා කර කර ඉන්න එපා. චෝදනා කර කර ඉන්න එපා, කෝපි කඩේ දයාවති වාගේ. එදත් මම කිව්වා. ඔබතුමන්ලාට දැන් වරම තිබෙනවා. මොකද, ජනාධිපතිතුමා ඒ කාලයේ කිව්වා නේ "මම ඔය පැත්තේ හිටියා නම් මේ වෙනකොට ඔක්කෝම ඉන්නේ හිරේ" කියලා. කෝ දැන්? දැන් ඔන්න එයාලා 21වෙනි දා එකතු වෙනවා. 21වෙනි දා එකතු වෙලා ඔබතුමන්ලාට විරුද්ධව පෙළ ගැහෙනවා. ඔබතුමන්ලා අල්ලනවාය කියපු කට්ටිය; අල්ලලා හිරේ දාන්න හදපු කට්ටිය, අන්න නුගේගොඩදී එකතු වෙනවා. ඇයි? ඔබතුමන්ලා බොරු කියලා, රවට්ටලා එයාලා දැන් - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chaminda Wijesiri, you have only two more minutes.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මට තව විනාඩි දෙකක් විතර ඕනෑ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඔබතුමන්ලා ආදායම් බදු සම්බන්ධයෙන් සූක්ෂමව කපටි කෛරාටික වැඩ පිළිවෙළ පාවිච්චි කළා. VAT එක ගෙවන ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා හන්දියේ කඩපිලටත් දැන් VAT එක එනවා, දෛනික පිරිවැටුම ලක්ෂයක් නම්. එතකොට මොකද වෙන්නේ? ඒක වක්‍ර බද්දක්. මුදලාලිට VAT ගෙවන්න වෙනවා. මුදලාලි VAT ගෙවීම වෙනුවෙන් සීනි කිලෝ එකෙන්, පරිප්පු 500න් ඒක අය කර ගන්න පිළිවෙළ හදනකොට ඒ වක්‍ර බද්ද ක්‍රමානුකූලව අහිංසක ජනතාවගෙන් අය කර ගන්නවා, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි. එතකොට සෑම භාණ්ඩයකම මිල ඉහළ යනවා, සෑම භාණ්ඩයකම මිල ඉහළ දාන්න වෙනවා. මෙන්න ඔබතුමන්ලාගේ කපටි න්‍යාය. මේක එළි වෙනවා. දවසට දෙකකට, මාසයකට, දවස් 365කට ඇයි මේ බොරු කියන්නේ? මේ අය වැය කියන්නේ දවස් 365ක බොරුවක්. මේවා එළි වෙනවා, හෙට අනිද්දා වෙනකොට. බලය ආවාට පස්සේ බලය රඳවා ගන්න ඔබතුමන්ලාට වෙන විකල්පයක් නැහැ. හැකියාවක්, දක්ෂතාවක් පිළිබඳව පේන්නේ නැහැ. ඔබතුමන්ලා විපක්ෂයේදී කියපු දේවල්, කරපු දේවල් දැන් වෙන්නේ නැහැ. කොහේ හරි ගියාම නාගෙන, ගාගෙන එන්නේ. දවස පෝෂණය වෙන්න; පැය 24 පෝෂණය වෙන්න; දවස් 365 පෝෂණය වෙන්න, බොරු කියන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩිජිටල් හැඳුනුම්පත ගැන මහා විශාල භීතිකාවක් ඇති කළා. ඉන්දියාවේ RAW ඔත්තුකාරයින්ට අපේ සියලු තොරතුරු දෙනවාය කියලා අනුර කුමාර මහත්මයා මෙතැන කෑගැහුවා. හැබැයි, එතුමාගේ කටින් දැන් කියනවා මේක වෙන්න ඕනෑ, මේක කරන්න ඕනෑ කියලා. ඔව්, ඒක වෙන්න ඕනෑ, ඒක කරන්න ඕනෑ තමයි. හැබැයි, ඔබ විසින් හදපු බිල්ලෝ, ඔබ විසින් හදපු ඒ වැඩ පිළිවෙළවල් සියල්ල, අවුරුදු 10කට, 15කට කලින් වෙන්න තිබුණු කාරණා සියල්ල ඉටු නොවීම ශාපයක් නොවේද කියා අපි අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙනම්, සැබෑ ශාපය තිබෙන්නේ ඔබේ මේ අය වැය ලේඛනය තුළයි. රටට යෝග්‍ය වූ ඉටු විය යුතු කාරණා සියල්ල අකර්මණ්‍ය කරලා, නැවත ඒවා ඉටු කරන්න යෑමේදී ඔබේ බොරුව, ඔබේ හෙලුව, ඔබේ ශාපය මේ පොත තුළ හරියට අන්තර්ගත වෙලා තිබෙනවා. ඒ නිසා රටේ ජනතාව මේ කාරණය තේරුම් ගන්න, ඔබට අභිමි කරපු හැම දෙයක්ම, එදා එපා කියපු හැම දෙයක්ම අද ඉටු කරන එකට අපි විරුද්ධ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපේ කවිරත්න මන්ත්‍රීතුමිය කියන්නේ, වතු කම්කරුවන්ට රුපියල් 200ක දීමනාව දෙන්න එපා කියන එක නොවෙයි. ඒක දෙන්න. ඒ දෙන එක මුදල් රෙගුලාසිවලට එකඟව ඒ වතු කම්කරුවා රවටන්නේ නැතිව දෙන්න කියන එකයි අපි කියන්නේ. අපේ මන්ත්‍රීතුමා ඇහුවාම කිව්වා, දවසක් ගියත් දෙනවා කියලා. ඒක හොඳයි. ඒ පැමිණීමේ වැඩ පිළිවෙළ අධ්‍යයනය කරන්නේ ග්‍රාම නිලධාරි ද, වතු අධිකාරි ද? ඒවා තමයි මූල්‍ය ගැටලු. මූල්‍ය ගැටලු එනකොට ඒවා වතු කම්කරුවාට ලබා නොදෙන තැනට පත් වෙනවා නම් ඒක වළක්වා ගැනීමේ අයිතිය විපක්ෂයට තිබෙනවා. අපි වතු කම්කරුවාට ඒ දීමනාව දෙන්න එපා කියන්නේ නැහැ. දෙන එක නීත්‍යානුකූලව දෙන්න පුළුවන් විධියට දෙන්න කියන ඉල්ලීමයි කරන්නේ. රුපියල් 200ක් නොවෙයි, රුපියල් 500ක් දක්වා වැඩි කරන්නය කියලා අපිත් යෝජනා කරනවා. ඒ පළාතේ ජනතාව හැටියට අපි දන්නවා, වතු කම්කරුවන් කොහොමද ජීවත් වන්නේ කියලා. අවසානයේ අපි හරස් වුණා, අපි උසාවි ගියා කියලා ඒක නවත්වන්න යන්න එපා. අපි කියන්නේ, මුදල් රෙගුලාසිවලට, ආයතන සංග්‍රහයට එකඟව දෙන දේ හරියට නීත්‍යානුකූලව දෙන්න හදන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ දේවල් කියන්න තිබුණත්, ඔබතුමා මට කාලය සීමා කර තිබෙන නිසා ඒවා කියන්න විධියක් නැහැ. විශේෂයෙන්ම මේ වාහන මිලදී ගැනීම පිළිබඳවත් මම කියන්න ඕනෑ. ලබන අවුරුද්දේ වාහන මිල අඩු වෙනවා. හැබැයි, මේ අවුරුද්දේ මේ වාහන ගන්නේ, වාහන දෙන්න හදන්නේ, මේ ටෙන්ඩරය නිකුත් කර තිබෙන ආයතනය එක්ක තිබෙන එකඟතාවක් නිසාය කියන කාරණය අපට අනාවරණ වෙලා තිබෙනවා. වාහන මිල අඩු වෙනකොට වැඩි මිලට තමයි මේ වාහන ගන්න හදන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතකයි 2010දී බැසිල් රාජපක්ෂ මහත්මයා එදා හිටපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ජීප් රථ ගත්තා. ඒවා අදත් තිබෙනවා. ඒවා තමයි තමුන්නාන්සේලා වෙන්දේසියේ දමන්න ඕනෑ කියලා ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහා කෑ මොර දීලා, ටීවී ෂෝ දාලා පෙන්නුවේ. දැන් ඔබට ඒක ගන්න බැහැ. ඒක ප්‍රාඩෝ එකක්, ජීප් එකක්. ඔබේ මන්ත්‍රීවරයාට ඒකේ යන්න බැහැ. ඒකට අපි නොවෙයි වැරදි. ඔබ දේශපාලන වේදිකා තුළ බලය ගන්න, දේශපාලන වෛරය හදන්න රටට, ජනතාවට කිව්වා අපි කැබ්වල විතරයි යන්නේ, අපි ජීප්වල යන්නේ නැහැ කියලා. කැබ්වල යන්නෙත් නැහැ, පාරේ බස් එකේ යනවා කියලා කිව්වා. අපට කියන්න, බස් එකේ ඇවිල්ලා, කෝච්චියේ ඇවිල්ලා ඔබලාට වෙච්ච හිංසනය, පීඩනය ගැන. එහෙම නැත්නම් බස් එකේ, කෝච්චියේ ඇවිල්ලා ඔබේ සංවර්ධනය කරන්න ඔබට බැරි වෙච්ච ආකාරය පිළිබඳව පෙන්වලා, ඒක සාධාරණය කරලා මේක ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිත් පසු පෙළේ සිටියා. ඒ පසු පෙළේ සිටින මන්ත්‍රීවරුන්ට මේ වාහන දෙන එක සාධාරණයි. මොකද, කිව්වාට ඕවා කරන්න බැහැ. ඇමතිවරයෙක් ඔබලා දෙස බලන්නේ නැහැ, ඔබලා කියන දෙයක් ගණන් ගන්නේ නැහැ. ජනතාවට දීපු පොරොන්දු ඉටු කරන්න ඔබලා උදේ හවා හමු වුණාට, ඔබලාගේ ඇමතිවරු ඔබලාව සත පහකට ගණන් ගන්නේ නැහැ. ඒක තමයි මේ දේශපාලනයේ යථාර්ථය. අපි හිතන දේ නොවෙයි, ඔබලාගේ ඇමතිවරු කරන්නේ. එම නිසා අපි කියනවා, ඔබතුමන්ලාට දෙන්න යන දෙයට අපි විරුද්ධ වෙන්නේ නැහැ. හැබැයි, ඔබතුමන්ලා වාහන ගන්නේ නැහැ කියලා වාහන ගන්න එක සාධාරණ නැහැ. මේ අතර තිබෙනවා ගේමක්. එදා, බැසිල් රාජපක්ෂ මහත්මයාට "Mr. Ten Percent" කිව්වේ ඇයි? කරපු හැම දෙයකින්ම සල්ලි ගත්තා. අද මේ කැබ් රථ ගෙන්වන එකේ 10 per cent එක යන්නේ කාටද කියලා ඔබතුමන්ලාට තව අවුරුදු 3කින් අපි කියන්නම්. සුදු ඇඳගෙන ඇවිල්ලා, කොණ්ඩය පැත්තට පීරුවාට, රාජපක්ෂලා, රනිල් වික්‍රමසිංහලා කරපු දේ ඔබලාගේ ආණ්ඩුවේ මේ ඉදිරි පෙළ සිටින

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කරනවා. ඒ නිසා අපි NPP එකට හැම දාම කියනවා, ඔබලාගේ වෘත්තීය, ඔබලාගේ අධ්‍යාපනය, ඔබලාගේ ගෞරවය විකුණලා මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ටික හොරකම් කරනකොට බලාගෙන ඉන්න එපා කියලා. අවුරුද්දක් බලාගෙන සිටියා, අවුරුදු දෙකක් බලාගෙන සිටියා. හැබැයි, තුන්වැනි අවුරුද්ද බලාගෙන ඉන්නකොට ඔබතුමන්ලාට දරුවන් එක්ක මහ පාරේ බැහැලා යන්න බැරි වෙනවා. අන්න එතැනදී තමයි ඔබතුමන්ලා අසරණ වෙන්නේ. ඔබතුමන්ලා එහෙම අසරණ නොවෙයි කියන කාරණය මත තමයි ඒ බලය හදාගත්තේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up now.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ ටිල්වින් සිල්වා මහත්මයා ඊයේත් කවියක් කිව්වා. එතුමා කලින් කියපු කවිය තමයි "කුසට සාගිනි, හදට සෝගිනි, ඉනට වැරහැලි කැබලි එල්ලා..." එහි ඉතුරු පද මට මතක නැහැ. හැබැයි, දැන් කියන්න වෙනවා, "කුසත් පිරිලා, හදත් පිරිලා, ඉනට branded ඇඳුම් ඇඳලා" කියලා. එහෙම නේ, දැන් ඔබලාගේ කුසත් පිරිලා, හදත් පිරිලා, අඳින්නේ branded ඇඳුම් නේ. "සතුට සැනසිලි අහිමි කරලා, අඳුර දුරලා ගිහිල්ලා" ඒක තමයි දැන් කියන්න වෙන්නේ. ඔබතුමන්ලා දැන් අඳින්නේ branded ඇඳුම්. දැන් ඔබතුමන්ලාගේ කුසත් පිරිලා, හදත් පිරිලා. හැබැයි, ඔබතුමන්ලා වෙනුවෙන් ඡන්දය දුන්න, ඔබතුමන්ලාගේ බලාපොරොත්තු ඉටු කරපු සියලු දෙනා මහ පාරට එනකොට, ඔවුන්ට ගෙදරට වෙලා ඉන්න කියන එක සාධාරණ ද කියන කාරණය අපි තමුන්නාන්සේලාගෙන් අහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Aruna Panagoda. You have ten minutes.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. (Dr.) Ramanathan?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නමත් සඳහන් කරලා තිබෙනවා, මෙතුමාගේ කථාවේ දිගින් දිගටම. අර කන්ටේනර් 323 දැන් මගේ ගෙදර තිබෙන කන්ටේනර් වාගේ වෙලා තිබෙනවා. "අර්චුනාගේ කන්ටේනර්" කියලා තමයි ඕනෑ කෙනෙකුට කියන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා මට මේ ගැන පැහැදිලි කරන්න අවස්ථාවක් දෙන්න, මගේ නමත් සඳහන් කරලා තිබෙන නිසා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, he did not refer to you in bad taste. He just referred to those containers. So, I do not think there was any ill directed towards you.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ නිසා පාරේ යන්න බැරි වෙලා තිබෙනවා. මට උත්තර දෙන්න අවස්ථාවක් දෙන්න. මට පාරේ යන්න බැරි වෙලා තිබෙනවා. මට පෙට්‍රල් ගහන්න යන්නවත් බැරි වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, it does not concern this. I am telling you, he did not refer to you with any malice.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I went to court; I was asked to come to the CID. Therefore, please let me clear this.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you a minute.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, only 30 seconds is enough.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you so much, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැම දාම කියන්නේ "මගේ කන්ටේනර්, මගේ කන්ටේනර්" කියලා. ඇත්තටම මේවා බිමල් රත්නායක අමාත්‍යතුමා අමාත්‍ය ධුරය දරපු කාලයේ එතුමා release කරපු කන්ටේනර්. මාව CID ගෙන්වා විමර්ශනය කළා, මම ඇතුළේ කරපු කථාවට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි කරුණ මෙයයි. මම මාසයක විතර කාලයකට Europe tour එකක් ගියා. එතැනදීත් මට documents ලැබිලා තිබෙනවා, කන්ටේනර්ස් 323 ඇතුළේ අවි ආයුධ තිබුණා කියලා. අදත් මම වගකීම අරගෙනයි කියන්නේ, ඒ කන්ටේනර් ඇතුළේ තිබුණේ අවි ආයුධ තමයි. ඕනෑ නම් මාව CID එකට නොවෙයි, Interpol එකට හරි ගෙනිහින් අහන්න, මම උත්තර දෙන්නම්. හැබැයි, ඒ වාර්තාව දාන්න කියන්නකෝ; ඒ committee එක පත් කරන්න කියන්නකෝ. ඇයි, ඔක්කෝටම මාව ඇදගන්නේ? මම බය නැතිව අදත් කියනවා, ඒ කන්ටේනර් ඇතුළේ තිබුණේ අවි ආයුධ තමයි කියලා.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, it is understood.

Next, the Hon. Aruna Panagoda.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද ජාතික ජන බලවේග රජයේ -

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 86(අ) යටතේ,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, අපි ගරු අරුණ පනාගොඩ මන්ත්‍රීතුමාගේ කථාව අවසන් වුණාට පස්සේ ඔය කාරණය ගනිමු. ඒ මන්ත්‍රීතුමාගේ කථාව දැන් පටන් අරගෙන තිබෙන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, could you please give me a minute?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මොකක්ද, ඔබතුමා ඉදිරිපත් කරන point of Order එක?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා දැන් ස්ථාවර නියෝග 86(අ) යටතේ කථා කළා. එතුමාගේ නම මගේ කථාවේදී කියවුණා. ඒ කථාව වරදවා තේරුම් ගැනීම පහදා දෙන්න තමයි ස්ථාවර නියෝග 86(අ) තිබෙන්නේ. සමාවෙන්න, ගරු අර්චුනා මන්ත්‍රීතුමා. ඇත්තටම මේ වෙලාවේ එතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද එතුමා ඉතා පැහැදිලිව කියනවා, ඒවායේ ආයුධ තිබුණාය කියන කාරණය එතුමාට සනාථ කරන්න පුළුවන්ය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ආයුධ කන්ටේනර් නිකුත් කරපු ඇමතිවරයාව තියාගෙන තමයි ජනාධිපතිතුමා අර කථාව කියන්නේ. මේක බරපතළ කාරණයක්. ගරු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේක කරලා තිබෙනවා කියන කාරණය, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා කියපු එක ගැන දැන් අහලා තිබෙන්නේ. ඒ නිසා අපි දැන් විවාදයට යොමු වෙමු.

Hon. Aruna Panagoda, you may commence your speech and your time starts now.

[පූ.භා. 11.27]

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ජාතික ජන බලවේග රජයේ දෙවන අය වැය පිළිබඳව විවාද කරන මේ මොහොතේ ඒ පිළිබඳව අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මම කැමැතියි, මගේ කථාවට මෙසේ ප්‍රවේශයක් ගන්න. ප්ලේටෝ කියන දාර්ශනිකයා කිව්වා, "වැඩියෙන්ම වෛරයට පාත්‍රවන පුද්ගලයා සත්‍ය කථා කරන කෙනා" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අද මේ අය වැය විවාදය යන මුළු කාල සීමාව ඇතුළේ අපි දැක්කා, විපක්ෂය වෛරී සහගතව, මොන තරම් බොරු ප්‍රමාණයකින් මෙවර අය වැය පිළිබඳව තිබෙන ඇත්ත -යථාර්ථය- හංගන්න කටයුතු කරනවාද කියන කාරණාව. මේ විපක්ෂය මොන තරම් වෛරී සහගතව, මොන තරම් ද්වේෂයෙන් බොරුව වපුරන්න කටයුතු කරන කණ්ඩායමක්ද කියන එක අද ඔප්පු කරමින් ඉන්නවා. ඒ නිසා අපි හිතනවා, මේ වෛරී සහගත විපක්ෂයේ බොරු අවලාදවලට මේ සත්‍ය යට කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසය පුරාම අපි දැකපු දේ ඒක. බොරුවෙන්, වෛරයෙන් සත්‍ය කථාව යට කරන්න පසුගිය කාලය තිස්සේම මේ නිල්-කොළ බලකාය විශාල උත්සාහයක් දැරුවා. විශේෂයෙන් ඊයේ දිනයේ විහාර මහා දේවී උද්‍යානයට දහස් ගණනක් මිනිස්සු එකතු වුණේ, බොරුව වෙනුවට ඇත්ත කථා කරපු මිනිස්සුන්ව මරා දමද්දි, ඒකට එඩිතරව මුහුණ දීලා අවසානයේ තමන්ගේ ජීවිත මුදා හළ මිනිස්සු සමරන්නයි.

අන්න, ඒ සත්‍යයට උත්තර දුන් විධිය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මේ කථා ඇහෙද්දි දෙව්දත්වරු බණ කියනවා වාගේ තමයි පෙනෙන්නේ. අපි දැක්කා, පසුගිය කාලය පුරාවටම ජනතා විමුක්ති පෙරමුණ, එහෙම නැත්නම් ජාතික ජන බලවේග රජය කරගෙන යන මේ ජනතාවාදී වැඩ පිළිවෙළ යට ගහන්න මොන තරම් අසත්‍ය වපුරන්න කටයුතු කළාද කියලා. ඒ විධියට කටයුතු කරන්නේ කවුද? ඒක, අද මේ පාර්ලිමේන්තුව තුළත් හොඳට පෙනෙන්න තිබෙනවා. වංචාවෙන් කෙළ පැමිණි මිනිස්සු තමයි බොරුව වපුරන්න උත්සාහ කරන්නේ. හොරකමට සම්බන්ධ වෙච්ච මිනිස්සු තමයි බොරුව වපුරන්න උත්සාහ කරන්නේ. එහෙම කිය කියා ජනතා විමුක්ති පෙරමුණට හෝ ජාතික ජන බලවේගයේ අපට බොරුවට අවලාද නඟන්න උත්සාහ ගන්නවා.

පසුගිය කාලයේ අපි ඉන්දියාවත් එක්ක ගිවිසුමක් අත්සන් කළා. මේ වෙනකොට මාස අටක් ගෙවිලා තිබෙනවා. මම දැනගන්න කැමැතියි, ගෙවුණු මාස අට තුළ මේ රටේ තිබෙන ඉන්දියාවට විකුණපු එකම දෙයක් හෝ ගැන. එහෙම කිසිවක් සිදුවෙලා නැහැ. අපි දැක්කා, මේ කණ්ඩායමත් එක්ක ඉන්න විමල් වීරවංශ මේ සම්බන්ධව අධිකරණයට ගිය ආකාරය. නමුත් අධිකරණයෙන් මොකක්ද කිව්වේ? මේ ගිවිසුමෙන් කිසිදාක එවැනි තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ කිව්වා. මේ අය අධිකරණයටත් අපහාස කරනවා. අධිකරණයෙන් එහෙම සහතිකයක් දීලා තිබියදීත් බොරුව වපුරන්න උත්සාහ කරනවා. අද අපට පෙනෙන්න තිබෙන දෙය මොකක්ද? බංකොලොත් කරලා තිබ්බ්ච රටක් පියවරෙන් පියවර නිවැරදි මහට අරගෙන මේ රටේ ජනතාවට සැබෑ ජීවිතයක්, පොහොසත් ජීවිතයක්, සතුටින් ඉන්න පුළුවන් ජීවිතයක් දිනා දෙන්න කටයුතු කරන්න හදනකොට මොකක්ද මේ කරන්න හදන්නේ? ඒකට එරෙහිව -විරුද්ධව- කටයුතු කරන එක, ඒක නැවත පහළට ඇද දමන්න කටයුතු කරන එක තමයි මේ කරන්න සූදානම් වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[ගරු අරුණ පනාගොඩ මහතා]

සමහර අය මහ ලොකුවට පම්පෝරි ගහනවා. කළු චරිත තමයි මේ සුදු ඇඳගෙන ඇවිල්ලා ඉන්නේ. අපි දන්නවා, සමහරුන් ගැන. බැඳුම්කර වංචාව ගැන කථා කළොත්, ඒකට සම්බන්ධ වුණු, හිටපු මුදල් ඇමතිවරුන් පස්සේ ගිහිල්ලා ගෙවල් ගන්න කථා කරපු මිනිස්සු අද බෝධිසත්වයෝ වාගේ මෙතැන කථා කරනවා. මන්ත්‍රීකම විකුණලා රුපියල් කෝටි ගණන් හොයා ගන්න උත්සාහ කරපු මිනිස්සු -කළු චරිත- අද මෙතැනට සුදු ඇඳගෙන ඇවිල්ලා මේ ජනතාවාදී අය වැය පහළට දමන්න බොරු ඇද දමන්න කල්පනා කරමින් ඉන්නවා. අපට පෙනෙන්න තිබෙන දෙය මොකක්ද? ලංකාවේ 80වැනි අය වැය ඉදිරිපත් කරන වෙලාවේදී, අය වැය ලේඛන 78කට වග කියන්න ඕනෑ මිනිස්සු තමයි මේ නිල්-කොළ පාලක කණ්ඩායම. මේ අය රට බංකොලොත් කරලා, මේ රට වංචාවෙන්, දූෂණයෙන්, නාස්තියෙන් ඉහවහා ගිය රාජ්‍යයක් බවට පත් කරලා, එහි ප්‍රතිලාභ හැටියට ජනතාවට පෝලිම්වල මැරෙන්න සිද්ධ කරලා, බෙහෙත් ටික නැතිව ඉන්න සිද්ධ කරලා, මේ රටේ දූවා දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් කරන්න අදාළ වටපිටාවක් නිර්මාණය කරලා තිබෙන මොහොතක, ජාතික ජන බලවේගයේ පළමුවැනි අය වැයෙන් පුරෝකථනය කරපු ආදායම් ඉලක්ක පන්නලා ඉස්සරහට යද්දි ඒක දරා ගන්න බැරිව ජාතික ජන බලවේගයට එරෙහිව මේ සභාව තුළ බොරු ඇද දමන්න පටන් ගෙන තිබෙනවා. කල්පනා කරලා බලන්න, පළමුවැනි වතාවට අය වැය පුරෝකථනයක් තුළ අය වැය හිඟය සියයට 5.2ක් දක්වා අඩු වෙලා තිබෙනවා. පළමුවැනි වතාවට, පුරෝකථනය කරපු ආදායම ඉක්මවා ආදායම් ලැබිලා මහා භාණ්ඩාගාරය පිරිලා තිබෙනවා. එහෙම වෙලාවක තමයි දෙවිදත්වරු මෙතැන බණ කියන්න පටන්ගෙන තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ සීනි බදු වංචාවට සම්බන්ධ වුණු, පොල් තෙල් වංචාවට සම්බන්ධ වුණු, සුදු ලූනු වංචාවට සම්බන්ධ වුණු, මහ බැංකුව කඩපු සෙට් එක තමයි අදත් මේ බණ කියන්නේ. ඒ, ඇයි? ජනතාවට ලැබෙන්න තිබෙන දේවල් තවදුරටත් අහිමි කරන්න, ජනතාවට ලැබෙන්න තිබෙන දෙයට එරෙහිව කටයුතු කරන්න තමයි මේ අය කල්පනා කරමින් ඉන්නේ. බොරුවක් හරි කියලා ජනතාව අන්දන්න පුළුවන්ද කියලා මේ අය දැන් බලනවා.

ඒ නිසා ආදායම් වැඩි වීමේ ප්‍රතිලාභ ජනතාවට ලබා දෙන්න මේ අය වැයෙන් කටයුතු කරමින් ඉන්න වෙලාවක් මේක, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන් ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී, නවීකරණයක් සහිත කෘෂි කර්මාන්තයක් මේ රටට ලබා දීම වෙනුවෙන් කෘෂිකර්ම, වාරිමාර්ග, පශු සම්පත්, වැවිලි කර්මාන්තය, ධීවර, ඉඩම් යන ක්ෂේත්‍ර දියුණු කිරීම වෙනුවෙන් රුපියල් බිලියන 267ක් වෙන් කර තිබෙන අය වැයක් මේක. ඒ සඳහා රුපියල් බිලියන 267ක් වෙන් කරලා තිබෙන මොහොතක තමයි මේ අමූලික බොරු, බේගල් ඇදලා අරින්න කල්පනා කරමින් ඉන්නේ.

ඒ විතරක් නොවෙයි, රුපියල් බිලියන 456ක්, ආරක්ෂිත, කාර්යක්ෂම පරිසර හිතකාමී සහ තිරසර ප්‍රවාහන සේවයක් වෙනුවෙන් ලබා දීලා මේ තිබෙන තත්ත්වය වෙනස් කරන්න කටයුතු කරපු වෙලාවක තමයි බොරු බේගල් අදිමින් ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු පළමුවැනි මොහොතේම ප්‍රවාහන ඇමතිතුමාට යොමු කරපු ප්‍රශ්නයකට උත්තර මේ අය වැයෙන් ලැබිලා තිබෙනවා. මම කියන්න සන්තෝෂයි, පසුගිය කාලයේ පැවැති ආණ්ඩු රුවන්පුර අධිවේගී මාර්ගය හදන්න ඉඩම් අත්පත් කරගෙන ඒවාට නිසියාකාර වන්දි නොගෙවා, අවුරුදු 10කට වැඩි කාලයක් ඒවා අතරමග නවත්වා දාලා පැනලා ගිය වෙලාවේ, මම ඒ ප්‍රශ්නය මේ ගරු සභාවේ අවධානයට යොමු කරපු නිසා ගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් රුපියල් මිලියන 1,500ක් වෙන් කරලා, රුවන්පුර අධිවේගී මාර්ගයේ සංවර්ධන කටයුතු නැවත ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන බව. කහතුඩුවේ ඉඳලා ඉංගිරිය දක්වා යන මේ රුවන්පුර අධිවේගී මාර්ගය පටන් ගන්නේ මගේ ආසනයේ කහතුඩුවෙන්. පසුගිය කාලයේ ඒ සඳහා ඉඩම් අත්පත් කර ගෙන, රජයෙන් වන්දි නොගෙවපු 800කට වැඩි දෙනෙක් කහතුඩුවේ විතරක් ඉන්නවා. එම නිසා මේ කටයුතු යථාවත් කරලා ඒ ඉඩම් අත්පත් කර ගත්ත අයට වන්දි ගෙවලා රුවන්පුර අධිවේගී මාර්ගයේ වැඩකටයුතු ආරම්භ කිරීමට අදාළ මුදල් ටික වෙන් කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැඳුම්කර වංචාව කරපු, මේ රට විනාශ කිරීමට මැදිහත් වීම් කරපු අයම නැවත මෙතැනට ඇවිල්ලා අද බණ කියන්න පටන් අරගෙන තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු දේවල් නිවැරදි කර ගෙන අපි අද මේ අය වැය ඉදිරියට ගෙන යන්න සූදානම් වන වෙලාවේ අපට කියන්න තිබෙන්නේ මොකක්ද? මේ අයට තිබෙන්නේ අය වැයෙන් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ ටික නැති කරලා, මේවා බොරුවක් බව කියලා, මේවා බොරුවෙන් යටපත් කරන්න දක්වන ඉතාම නිහීන උත්සාහයක්. වාහන permit නොලැබෙද්දි, ගෙවල් නොලැබෙද්දි, වරප්‍රසාද ගන්න බැරි වෙනකොට, තමන් හදා ගත්ත දිව්‍ය ලෝකය කඩා ගෙන වැටෙනකොට, ඒකට එරෙහිව ජනතාවට ලැබෙන දේ වළක්වන්න කටයුතු කරන තත්ත්වයක් තමයි මේ පෙනෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව මෙහෙම පාඨයකින් අවසන් කරන්න කැමැතියි. "දෙව් ලොව කඩා වැටුණත් යුක්තිය ඉටු වීමට ඉඩ දෙන්න" අපි කියන්නේ ඒකයි. අද විපක්ෂය කලබල වෙලා ඉන්නේ. මොකද, ඒ අය හදා ගත්ත දිව්‍ය ලෝකය කඩා ගෙන වැටෙන්න යනවා; බලාපොරොත්තු වෙච්ච සැප සම්පත් නැති වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up now.

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

වංචාව, නාස්තිය ඉහවහා ගිය රට නැවත හරි පැත්තට පෙරළෙද්දී, අපි රට හදද්දි, ජනතාවට යමක් ලැබෙද්දී අද සජබය උසාවියට යනවා. ඒ අය උසාවියට යනවා, වතු කම්කරුවාට දෙන රුපියල් 200 නවත්වන්න කියන්න. මෙහෙම තත්ත්වයක් ඇතුළේ තමයි අපි කටයුතු කරන්න උත්සාහ කරන්නේ. ජාතික ජන බලවේගයේ අපි අද දුෂ්කර ක්‍රියාවලියක් තමයි පටන් අරගෙන තිබෙන්නේ. ඒ නිසා, මේ ක්‍රියාවලියට විරුද්ධ වෙලා ජනතාවට ලැබෙන දේ වළක්වන්න කටයුතු කරන්නේ නැතිව, බොරුව

සමාජගත කරන එක වෙනුවට හරි දේට එකතු වෙලා හරි තැනින් හිටගෙන, තමුන්නාන්සේලා විනාශ කරපු රට ගොඩ නඟන්න අපට සහාය දෙන්න කියලා විපක්ෂයෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani. You have 10 minutes.

[පූ.භා. 11.38]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ජනතාවාදී ආණ්ඩුවේ දෙවැනි පුරවැසි අය වැය ඉදිරිපත් කර තිබෙන මේ මොහොතේදී කරුණු දැක්වීමට මට අවස්ථා ලබා දීම වෙනුවෙන් ඔබතුමාට කෘතඥ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දෙවැනි පුරවැසි අය වැය ඉදිරිපත් කරන්න මාස අටකට පෙර අපි 2025 අවුරුද්දේ අපේ පළමුවැනි පුරවැසි අය වැය ඉදිරිපත් කළා. විශේෂයෙන්ම ආර්ථික වශයෙන් කඩා වැටුණු, සමාජය ඉතාම පහළ මට්ටමකට කඩා වැටුණු, රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය අහිමි වුණු රටක් තමයි අපට භාර ගන්න සිදු වුණේ. ඒවා තමයි අපි ඉස්සරහ තිබුණු අභියෝග බවට පත් වුණේ. ඒ අභියෝග ජය ගන්නත්, රාජ්‍ය මූල්‍ය ස්ථාවරභාවය සහතික කරන්නත්, රටේ ආර්ථික ස්ථාවරභාවය සහතික කරන්නත්, ඒ සහතික කිරීම තුළින් මේ ජන සමාජයේ ජීවත් වෙන ආදරණීය ජනතාවගේ ජීවිත ස්ථාවර කරන්නත් අපේ පළමුවැනි පුරවැසි අය වැය තුළින් දැවැන්ත ක්‍රියාමාර්ග ටිකක් තේරුවා.

විශේෂයෙන්ම ඒ ක්‍රියාමාර්ග ඇතුළේ කඩා වැටුණු රටක, බංකොලොත් වුණු රටක ආර්ථිකය ගොඩනඟා ගැනීමේදී, විශේෂඥයින් වාගේම ආර්ථික විශේෂඥයින් බලාපොරොත්තු වන ප්‍රමාණයට වඩා, එහෙම නැත්නම් බහුපාර්ශ්වීය සංවිධානවල පුරෝකථන අභිභවා යමින් අපට, අපේ ආර්ථිකය ස්ථාවර කර ගන්න පළමු මාස 8 තුළ හැකියාව ලැබුණා. විශේෂයෙන්ම 2025 අවුරුද්දේ පළමු භාගය ගත්තොත්, අපේ ආර්ථික වර්ධන වේගය සියයට 4.8ක ප්‍රමාණයට ඔසවා තබන්නට අපට හැකියාව ලැබුණා. ඒ විතරක් නොවෙයි. භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකය අඩුවීමෙන් මූල්‍ය ස්ථාවරභාවය ඇති කර ගන්න අපට හැකියාව ලැබුණා. අපි ආණ්ඩුව ගන්නට කලින් විපක්ෂය අනියම් බියක් මැව්වා, අපි ආණ්ඩුව ගත්තාට පස්සේ විනිමය අනුපාතිකය ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල් 500ට ළඟා වෙයි කියලා. නමුත් පසුගිය අවුරුද්ද තුළ අපට හැකියාව ලැබුණා විනිමය අනුපාතිකය ස්ථාවරව පවත්වා ගන්නට.

ඒ වාගේම විදේශ අංශය අපි බලාපොරොත්තු වුණාට වඩා වැඩි ප්‍රමාණයකින් ශක්තිමත් කරන්නත් අපට හැකියාව ලැබුණා. එමෙන්ම දළ නිල සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6 ඉක්මවා යන ප්‍රමාණයට ඔසවා තබන්නටත් අපට හැකියාව ලැබුණා. ඒ විතරක් නොවෙයි, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 2.3ක ඉතිහාසයේ ඉහළම ප්‍රාථමික අතිරික්තයක් වාර්තා කරන්නත් අපේ පළමුවන අය වැයෙන් අපට අවස්ථාව ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විපක්ෂය අපට එල්ල කරන චෝදනා බලන්න. ඔවුන් අපට කියනවා අරක කළේ නැහැ, මේක කළේ නැහැ කියලා. ඔබතුමන්ලා, අපි මේ අය වැය ඉදිරිපත් කිරීමේ උපායමාර්ගික අරමුණු හොඳින් කියවා ගන්න කියන ආරාධනය මම කරනවා.

විශේෂයෙන්ම මේ 2026 අය වැය ඉදිරිපත් කිරීමෙන් අපි බලාපොරොත්තු වෙන්නේ මෙයයි. 2025 අවුරුද්දේ අපි ආර්ථික ස්ථාවරත්වය ඇති කළා. ඒ ස්ථාවර කරපු ආර්ථිකය තවදුරටත් ස්ථාවරව පවත්වා ගනිමින් රට ගොඩනැඟීමේ, එහෙම නැත්නම් ආර්ථිකය සංවර්ධනය කිරීමේ, රටේ ජනතාවගේ ජීවිත ඔසවා තැබීමේ ක්‍රියාමාර්ගය තමයි අපි මේ අය වැය තුළින් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම සියයට 7ක් ඉක්මවා ගිය ආර්ථික වර්ධනයක් අත්පත් කර ගනිමින් එහි සැබෑ ප්‍රතිලාභ මේ රටේ ජීවත් වෙන හැම පුරවැසියෙකුටම අත්පත් කර දීමේ උපායමාර්ගික අරමුණ අපි මේ අය වැයෙන් ඉටු කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් මඟින් නව අපනයන නිෂ්පාදන හා සේවා ප්‍රවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සපයන්නත් අපි මෙවර අය වැයෙන් බලාපොරොත්තු වෙනවා. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, පසුගිය කාල වකවානුව තුළ ණය ගත්තේ අපේ රටේ යම් ඒකායන අරමුණකට නොවෙයි කියලා. ව්‍යාපෘතිවලට ණය ගත්තත්, ඒ ණය ඒ ව්‍යාපෘතිවලට සාධනීය විධියට යොදවපු බවක් අපට දකින්න ලැබුණේ නැහැ. ඒ නිසා 2022 අවුරුද්ද වෙනකොට අපේ ණය ප්‍රතිශතය 114.2ක් වාර්තා කළා. අපි අපේක්ෂා කරනවා, 2026 අවුරුද්ද වෙනකොට ඒක සියයට 96.8කට අඩු කර ගන්න. ඒ වාගේම 2030 අවුරුද්ද වෙනකොට එය සියයට 87කට අඩු කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ණය තිරසරභාවය තහවුරු කිරීම වෙනුවෙන් පැහැදිලි සැලැස්මක් ඇතුව කටයුතු කරන්න මේ අය වැය තුළින් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තිබෙන්නේ ආනයන මත රඳා පවතින ආර්ථිකයක්. ඒ වෙනුවට අපි අපනයනය දිරිමත් කිරීම සඳහා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමත් මෙවර අය වැයේ ප්‍රධාන අරමුණක් කරගෙන තිබෙනවා.

අපේ ඊළඟ ප්‍රධාන අරමුණ බවට පත් වෙන්නේ ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමයි. විශේෂයෙන්ම ගම්වල ජීවත් වෙන මිනිස්සුන්ට ආර්ථික අවස්ථා බහුල කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, නිෂ්පාදන ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සහ අධ්‍යාපනය, සෞඛ්‍ය ඇතුළු සියලු පහසුකම් ළඟා කර දීම තමයි ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහන තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ වාගේම ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපි තෝරන ක්‍රියාමාර්ග ඇතුළේ මෙන්න මේ ග්‍රාමීය දිළිඳු ජනතාවට ප්‍රතිපාදන සපයන්න මෙවර අය වැයෙන් යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව විශේෂයෙන් වතු කම්කරු ජනතාවට රුපියල් 200ක් අපේ ආණ්ඩුවෙන් ගෙවන්න කටයුතු කරන්න සූදානම් කරලා, එය මේ අය වැය තුළින් එම යෝජනාව ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත්, විපක්ෂය නියෝජනය කරන විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම අවුරුදු ගණනාවක් තිස්සේ ජීවන තත්ත්වය අහිමි වුණු ඒ අහිංසක වතු කම්කරු ජනතාවට ආණ්ඩුවෙන් ලබා දෙන රුපියල් 200 නොගෙවන තැනට අපට අභියෝග කරන්නට කටයුතු කරමින් සිටිනවා. විශේෂයෙන්ම රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය ඒ සම්බන්ධයෙන් අල්ලස් හෝ

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය]

දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වතු කම්කරුවෝ ජීවත් වෙන්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට, ජනතා නියෝජිතයන් හැටියට අපි ඔවුන්ට අභියෝග කරන්න ඕනෑ පසුබිමකද කියලා මම අහන්න කැමැතියි.

විශේෂයෙන්ම අපේ තේ කර්මාන්තය ගත්තොත්, මේ රටේ සුවහසක් වතු කම්කරු කාන්තාවන් මේ වතු ඇතුළේ ගෙවන ජීවිත ඉතාම බේදනීයයි. උදේ පාන්දර වත්තට ආපු වෙලාවේ ඉඳලා කූඩැල්ලෝ කද්දී, අතැඟිලි පුපුරු ගහනකම් තේ දළු කඩලා මේ රටේ මිනිස්සුන්ට ජීවිත දීපු මිනිස්සු ඒ අය. ඒ නිසා ඔවුන්ට පුරවැසි යුතුකමක් ඉටු කරන්නයි මේ ආණ්ඩුවෙන් රුපියල් 200ක මුදලක් ගෙවන්න සූදානමින් මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරිම බේදනීයයි, විශේෂයෙන් කාන්තාවක් විධියට මේ සම්බන්ධයෙන් අල්ලස් කොමිසමට යනවා නම්. වතු කම්කරු ප්‍රජාව ඇතුළේ බහුතරයක් ඉන්නේ කාන්තාවෝ. මේ මිනිස්සුන්ගේ ජීවිත හදන එකට විරුද්ධව අල්ලස් කොමිසමට යන්න පුළුවන් හෘදය සාක්ෂියක් තිබෙනවා නම්, ජනතා නියෝජිතයෝ හැටියට සහකම්පනය කොතැනද තිබෙන්නේ, හෘදය සාක්ෂිය කොතැනද තිබෙන්නේ කියලා අපි ප්‍රශ්න කරන්න කැමැතියි. මේ මතය, සමස්ත විපක්ෂයේම මතය ද කියා අපි ප්‍රශ්න කරන්න කැමැතියි. ඒ නිසා අපිට ඒකට කිසි විටෙකත් අභියෝග කරන්න එපා. කෙසේ අභියෝග කළත් අපි මේ ජනතාවගේ ජීවිත හදනවා කියන එක අපි කියන්න ඕනෑ.

ඒ වාගේම විපක්ෂයේ අජිත ප්‍රසාද් සිරිවර්ධන මන්ත්‍රීතුමා - විපක්ෂ නායකතුමාගේ මාධ්‍ය ප්‍රකාශකතුමා- කියනවා, වතු සේවකයින්ගේ වැටුප් වැඩි කරන්න රටේ වැඩ කරන ජනතාවගේ බදු මුදල් භාවිත කරන එක වැරදියි කියලා. මම අහන්න කැමැතියි, රටේ වැඩ කරන ජනතාව කියනකොට වතු කම්කරුවෝ අත හැරලාද මේ රටේ වැඩ කරන ජනතාව ගණනය කරන්නේ කියලා. ඔබතුමන්ලා මොහොතකටවත් අමතක කරන්න එපා, අපිට ආර්ථික අර්බුද හමුවේ යම්තාක් හරි පමණකින් මෙරට අල්ලාගෙන ඉන්න පුළුවන් වුණේ ඒ මිනිස්සුන්ගේ දහඩිය කඳුළුවලින් කියන එක. මොහොතකටවත් ඒක අමතක කරන්න පුළුවන්ද, ජනතා නියෝජිතයන්ට?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය ඇතුළේ මොන තරම් සාධනීය කාරණා ඉදිරිපත් කරලා තිබුණත්, ඒවා ගැන කථා කළේ නැහැ. අධ්‍යාපනයට, සෞඛ්‍යයට, අබාධිත දරුවන් ඇතුළු සියලු මහජනතාව වෙනුවෙන් මේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි ආරක්ෂාව, රැකවරණය ලැබිය යුතු සතුන් පවා ආරක්ෂා කරන අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. හැබැයි විපක්ෂයේ එක මන්ත්‍රීවරියක් කථා කරනකොට කියනවා මම දැක්කා, බල්ලන්ට වඩා පොඩ්ඩක් විදුහල්පතිවරුන්ට මේ අය වැය ඇතුළේ සලකලා තිබෙනවා කියලා. මොන තරම් නොගැළපීමක් තිබෙනවාද, ඇත්තටම මේ කථා ඇතුළේ? විශේෂයෙන්ම අපි මේ ඉදිරිපත් කරපු අය වැයේ ඉතාම සාධනීය කාරණා තිබෙනවා කියන එක ඔවුන්ගේ හෘදය සාක්ෂිය දන්නවා. ඒ නිසා තමයි ඔවුන් වතු කම්කරුවන්ට රුපියල් 200 දෙනවාට තරයේ විරුද්ධ වෙන්නේ? ඇයි? අපි වතු කම්කරුවන්ට රුපියල් 200 විතරක් නොවෙයි දෙන්නේ. ගිය අවුරුද්දේ අය වැයෙන් ඔවුන්ට අවශ්‍ය කරන රෝහල් ටික හැදුවා, මංමාවත් ටික හැදුවා, පාසල් ටික හැදුවා. මේ හැම දෙයක්ම කරලා ඔවුන්ගේ ජීවිත ගොඩනැඟීම වෙනුවෙන් අපි මැදිහත්වීමක් කළා. ඒ මැදිහත්වීම ඇතුළේ මේ වැටුප රුපියල් 200කින් වැඩි කරනකොටත් ඔවුන් දන්නවා, තවදුරටත් ඒ වතු කම්කරුවන්ගේ ජීවිත මාර්කට් කරමින් එහෙම නැත්නම් කේවල් කරමින් ඔවුන්ට ජන වරමක් ලබන්න බැහැ කියන එක. ඒ අනිසි බිය නිසා තමයි ඔවුන් එසේ කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කැමැතියි මගේ කථාව මෙසේ අවසන් කරන්න. ඔස්කාර් වයිල්ඩ් කියන දාර්ශනිකයා ප්‍රකාශ කර තිබෙනවා, "හැම දේකම මිල දන්නා, එහෙත් වටිනාකම නොදන්නා පුද්ගලයා නරුමයෙක් වෙනවා" කියලා. ඉතාම හොඳ, සාධනීය කාරණා මේ අය වැය තුළ තිබුණත්, හෘදය සාක්ෂිය ඒක හොඳින්ම හඳුනාගෙන තිබුණත්, සංඛ්‍යා දත්ත අතර තෙරපෙමින් මේ කරන්නේ නරුමවාදී විවේචන. අපේ ජනාධිපතිතුමා හැම මොහොතකම ඔබතුමන්ලාට ආරාධනා කරනවා, ඔබ දේශපාලනය කරනවා නම් අපිට වඩා හොඳ මාවතක ගමන් කරන්න එන්න කියලා. ඒ නිසා අපි මහජන නියෝජිතයන් නම්, නරුමවාදියෙකු නොවී අපි අපේ හෘදය සාක්ෂියට එකහව අපේ යුතුකම, වගකීම ඉටු කරමු කියලා ඔබතුමන්ලාට ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) M.L.A.M. Hizbullah. You have 14 minutes.

[මු.ප. 11.48]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்காகச் சிறந்ததொரு வரவு செலவுத்திட்டத்தை 2026ஆம் ஆண்டுக்காக இந்தச் சபையில் சமர்ப்பித்த சனாதிபதியும் நிதி அமைச்சருமான மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களுக்கு எங்களுடைய நன்றிகளையும் பாராட்டுக்களையும் தெரிவித்துக் கொள்கின்றோம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பொருளாதார ரீதியில் மிக மோசமான நிலையில் இருந்த எமது நாட்டை இப்போது நாம் அதிலிருந்து மீட்டு வருகின்றோம். இந்தக் காலகட்டத்தில் 2026ஆம் ஆண்டுக்கான Budget என்பது மிக முக்கியமானது. 2028ஆம் ஆண்டில் நாம் கடனைச் செலுத்தவேண்டி இருக்கிறது. அந்தக் கடனைச் செலுத்து வதற்கான வழிவகைகள், அதற்கான வருமானத்தை ஈட்டுவதற்கான வெளிநாட்டு முதலீடுகள் அல்லது உள்நாட்டில் பணத்தைப் பெற்றுக் கொள்வதற்கான வழிமுறைகள் தொடர்பில் இந்த அரசாங்கம் அதிக கவனம் செலுத்தவேண்டிய ஒரு காலகட்டத்திலேதான் இந்த வரவு செலவுத்திட்டத்தை மாண்புமிகு சனாதிபதி அவர்கள் சமர்ப்பித்து இருக்கிறார்கள்.

பணவீக்கத்தை 5 சதவீதத்துக்குக் குறைவாகப் பேணவும், நாட்டில் பொருளாதார நெருக்கடிக்குப் பின்னரான மீட்சியை விரைவுபடுத்தவும் இந்த வரவு செலவுத்திட்டம் வழிவகுக்குமென மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்லி இருக்கிறார். இதனை நாங்கள் பாராட்டுகின்றோம். அந்த அடிப்படையில், அதற்கான சூழ்நிலைகள் உருவாக்கப்பட வேண்டும். குறிப்பாக, இந்த நாட்டில் வெளிநாட்டு முதலீடுகளை அதிகரிப்பதற்கான வழிவகைகள் செய்யப்பட வேண்டும். நமக்கு இருக்கின்ற அன்றாட வருமானமானது, வெறுமனே நாட்டைக் கட்டியெழுப்புவதற்குப் போதுமானதாக

இருக்கும். எதிர்காலத்தில் நமது நாடு கடனைச் செலுத்துவதற்கு முற்படும்போது, அதற்காக நாங்கள் வெளிநாட்டு முதலீடுகளுக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டும். அதற்கான வழிவகைகளை அரசாங்கம் மேற்கொள்ள வேண்டும்.

அண்மையில் கௌரவ வெளிநாட்டலுவல்கள் அமைச்சர் சவூதி அரேபியாவுக்குச் சென்று, இலங்கைக்கும் அந்நாட்டுக்கும் இடையில் Economic Council ஒன்றை உருவாக்கி இருக்கிறார். அதை நாங்கள் பாராட்டுகின்றோம். அண்மையில் UAE உடனும் - ஐக்கிய அரபு அமீரகத்துடனும் - உடன்படிக்கை ஒன்று செய்யப்பட்டு இருக்கிறது. அண்மையில் சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர் கௌரவ முனீர் முலாபர் அவர்கள் சவூதி அரேபியாவுக்குச் சென்று பல்வேறுபட்ட நடவடிக்கைகளை மேற்கொண்டு இருக்கிறார். அதையும் நாங்கள் பாராட்டுகின்றோம். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வெளிநாட்டு முதலீட்டாளர்களை எமது நாட்டுக்கு வரவழைத்து முதலீடுகளை மேற்கொள்ளச் செய்ய வேண்டும். அந்த முதலீடுகள் ஊடாக எமது கடன்களை 2028ஆம் ஆண்டிலிருந்து செலுத்துவதற்கான ஒழுங்குகளைச் செய்யவேண்டிய தேவைப்பாடு இருக்கின்றது. எனவே, அரசாங்கமானது அதற்குத் தேவையான ஒழுங்குகளைச் செய்ய வேண்டும்; வழிமுறைகளைக் கையாள வேண்டும்; உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும்.

இன்று நமது நாட்டில் மிக மோசமாகப் புரையோடிப்போய் இருக்கின்ற விடயமாக போதைப்பொருளுக்கு அடிமையாகுதல் காணப்படுகின்றது. இன்று முழு நாடும் போதைப்பொருளுக்கு அடிமைப்பட்டு இருக்கின்றது. பாடசாலை மாணவர்கள், தொழிலாளர்கள், கல்விமான்கள், முதலாளிமார் என எல்லாத் தரப்பினரும் மிக மோசமாகப் போதைப்பொருளுக்கு அடிமையாகி இருக்கிறார்கள். அதனைத் துடைத்தெறிவதற்கு, அதிலிருந்து இந்த நாட்டை மீட்டெடுப்பதற்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் எடுத்திருக்கின்ற முயற்சியை நாங்கள் முழு மனதுடன் பாராட்டுகின்றோம். அதற்கு எங்களுடைய பூரண ஒத்துழைப்பை வழங்குவதற்கும் நாங்கள் ஆயத்தமாக இருக்கின்றோம். போதைப்பொருள் அச்சுறுத்தலைத் தடுப்பதற்காக மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த Budgetஇல் கிட்டத்தட்ட 1,500 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்திருக்கிறார். இந்த வேலைத்திட்டமானது எல்லோருக்கும் பொதுவான ஒரு வேலைத்திட்டமாகும். இது வெறுமனே அரசாங்கத்துடன் மாத்திரம் தொடர்புடைய ஒரு வேலைத் திட்டமல்ல. மாறாக, ஆளுங்கட்சி, எதிர்க்கட்சி என்ற வேறுபாடு இல்லாமல், எல்லாத் தரப்பினரும் ஒன்றுசேர்ந்து மேற்கொள்ளவேண்டிய ஒரு வேலைத்திட்டமாகும். அவ்வாறு செயற்பட்டால்தான் எங்களால் இந்த நாட்டை அந்த மோசமான, பயங்கரமான நிலையிலிருந்து மீட்டெடுக்க முடியும். இன்று நாங்கள் எல்லாத் துறைகளிலும் பின்தள்ளப்பட்டு இருக்கின்றோம்.

இந்த நாட்டில் பல பாரிய நோய்களால் பாதிக்கப்பட்டு இருக்கின்றவர்களுக்கு இதுவரை காலமும் நிதி ஒதுக்கீடு செய்யப்படவில்லை. அந்த நோயாளர்கள் மாதாந்தம் நிதி உதவிகளைப் பெறுவதற்கான வழிவகைகள் இந்த வரவு செலவுத்திட்டத்தில் செய்யப்பட்டு இருக்கின்றன. நாங்கள் இவ்வாறான நல்ல விடயங்களைப் பாராட்டுகின்றோம். மேலும், பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கும் விவசாயத்துறையைக் கட்டியெழுப்புவதற்கும் மீன்பிடித்துறையைக் கட்டியெழுப்புவதற்குமென பல முன்மொழிவுகள் இந்த Budgetஇல் முன்மொழியப்பட்டு இருக்கின்றன. இவை உண்மையிலேயே பாராட்டப்பட வேண்டிய விடயங்கள் ஆகும்.

மலையக மக்கள் நீண்ட காலமாக நமது நாட்டின் பொருளாதாரத்துக்கு முதுகெலும்பாக இருக்கின்றார்கள். அவர்கள் தங்களுடைய நாளாந்த சம்பளத்தைக் கூட்டித் தருமாறு பல ஆண்டுகளாகப் போராடிக்கொண்டு இருக்கிறார்கள். ஒவ்வோர் அரசாங்கமும் அதனைப் பெற்றுத் தருவதாகக்கூறி, பெருந்தோட்டக் கம்பனிகளோடு பேச்சுவார்த்தை நடத்தின. எனினும், எந்தவொரு கம்பனியும் அதற்கு இணங்கவில்லை. முதற் தடவையாக மாண்புமிகு சனாதிபதி அவர்கள் அரசாங்க நிதியில் இருந்து ஒவ்வொரு தொழிலாளிக்கும் வருகைக்கான ஊக்குவிப்புக் கொடுப்பனவாக நாளாந்தம் 200 ரூபாயைக் கொடுப்பதற்கு இணங்கியிருப்பது உண்மையிலேயே பாராட்டப்பட வேண்டிய விடயமாகும். இது மலையகத்தில் வாழுகின்ற இலட்சக் கணக்கான மக்களுடைய வாழ்வாதாரத்தில் மிகப் பெரிய தாக்கத்தை ஏற்படுத்தி இருக்கிறது. இவ்வாறு மாண்புமிகு சனாதிபதி அவர்கள் முன்வைத்திருக்கின்ற நல்ல விடயங்களை நாங்கள் பாராட்டுகின்றோம்.

2025ஆம் ஆண்டுக்கான Budgetஇல் கிழக்கு மாகாணத்துக்கு எந்தவொரு நிதி ஒதுக்கீடும் செய்யப் படவில்லை. அது தொடர்பில் நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களிடம் கேட்டபோது, இந்திய அரசாங்கம் நிதி ஒதுக்கீடு செய்யுமெனச் சொன்னார். எனினும், 2025ஆம் ஆண்டில் இந்திய அரசாங்கம் கிழக்கு மாகாணத்துக்கு எந்தவித நிதி உதவியையும் வழங்கவில்லை. இலங்கை அரசாங்கமும் கிழக்கு மாகாணத்துக்குத் தரவில்லை. இதனால் இந்த ஆண்டு முழுவதும் கிழக்கு மாகாணம் கைவிடப்பட்ட நிலையிலே கழிந்திருக்கின்றது.

2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள், எங்களுடைய மறைந்த மாபெரும் தலைவர் அஷ்ரப் அவர்களின் நினைவாக நிந்தவூரில் கட்டப்பட்டு பல ஆண்டுகளாக அப்படியே கைவிடப்பட்ட நிலையில் இருக்கும் கலாசார மண்டபத்தைக் கட்டியெழுப்புவதற்காக 300 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்திருக்கிறார். பொருளாதார நெருக்கடிக்கு மத்தியில் ஒதுக்கப்பட்டு இருக்கின்ற இந்த நிதியானது உண்மையிலேயே பெறுமதியானது. அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு கிழக்கு மாகாண மக்கள் சார்பிலும் எங்களுடைய கட்சி சார்பிலும் நன்றிகளையும் பாராட்டுக்களையும் தெரிவித்துக் கொள்கின்றேன்.

நான் இந்தச் சபையில் கடந்த வரவு செலவுத்திட்ட விவாதத்தின்போதும், அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டங்களிலும் வாழைச்சேனை மீன்பிடித் துறைமுகத்தை அபிவிருத்தி செய்ய வேண்டுமெனவும், அங்குள்ள மீனவர்களுடைய படகுகளை நிறுத்தி வைப்பதற்காக மேலதிக jetty ஒன்றை அங்கு அமைப்பதற்கு நிதி ஒதுக்கீடு செய்ய வேண்டுமெனவும் தொடர்ச்சியாக கோரிக்கை விடுத்து வந்தேன். இதற்கு நிதி ஒதுக்கீடு செய்வதற்கு கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்கள் இணங்கினார். அந்த அடிப்படையில், மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த Budgetஇல் வாழைச்சேனை மீன்பிடித் துறைமுகத்தை மேம்படுத்துவதற்காக 350 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்திருக்கிறார். அதற்காக அவருக்கு எனது மாவட்ட மக்கள் சார்பாக நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டத்திலுள்ள இன்னுமோர் அம்சம் பற்றி கூற வேண்டும். அது மக்களுக்கு பொருளாதார ரீதியாகப் பாதிப்பை

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

ஏற்படுத்துகின்ற ஒரு விடயமாகும். இதுவரை காலமும் ஒரு நாளைக்கு 150,000 ரூபாய்க்கு வியாபாரம் செய்யக்கூடிய வியாபார நிலையங்களுக்குத்தான் 'வற்' வரி செலுத்தவேண்டி இருந்தது. அதாவது, 'வற்' வரியும் ஏனைய வரிகளும் உள்ளடங்கலாக கிட்டத்தட்ட 20.5 சதவீதம் செலுத்த வேண்டும். இந்த வரவு செலவுத்திட்டத்தில் அந்தத் தொகை ஓரிலட்சம் ரூபாயாகக் குறைக்கப்பட்டு இருக்கிறது. உண்மையிலேயே இது மக்களின் பொருளாதாரத்தை மிகவும் பாதிக்கின்ற ஒரு விஷயமாகும். சாதாரண ஹோட்டல்களில் கூட, ஒரு நாளைக்கு ஓரிலட்சம் ரூபாய்க்கு மேல் வியாபாரம் நடக்கும். ஹோட்டல்களில் மாத்திரமல்ல, கிராமங்களில் இருக்கின்ற சில்லறைக் கடைகள், bakery போன்றவற்றிலும் கூட, ஒரு நாளைக்குக் குறைந்தது ஓரிலட்சம் ரூபாய்க்கு வியாபாரம் நடக்கும். ஒரு நாளைக்கு ஓரிலட்சம் ரூபாய்க்கு வியாபாரம் செய்தால், 20.5 சதவீதத்தை 'வற்' வரி உட்பட ஏனைய வரியாகச் செலுத்த வேண்டும். வியாபாரிகள் அந்த 20.5 சதவீதத்தை பொதுமக்களிடம் இருந்துதான் அறவிடுவார்கள். இதனால் சாதாரணமாக எல்லாப் பொருட்களின் விலைகளும் 20.5 சதவீதத்தால் அதிகரிக்கின்ற ஒரு சூழ்நிலை ஏற்படும். இது கிராமப்புறங்களில் வாழுகின்ற மக்களுக்கு கஷ்டத்தை ஏற்படுத்துகின்ற ஒரு விடயமாகும். எனவே, இது தொடர்பில் மாண்புமிகு சனாதிபதி அவர்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நாட்டில் பொருளாதாரப் பிரச்சினை இருப்பது உண்மை! வரிகளை அதிகரித்து அதன்மூலம் நிதியைப் பெற வேண்டும் என்பது IMFஇன் நிபந்தனை! அதை நாங்கள் ஏற்றுக்கொள்கிறோம். இருந்தாலும், இன்று நமது நாட்டில் இருக்கின்ற பொருளாதார சூழ்நிலையில், நிறைய தொழிற்சாலைகள் மூடப்படுகின்றன; விவசாயப் பொருட்களுக்கு உரிய சந்தைவாய்ப்பு கிடைப்பதில்லை. இதனால் வருமானம் இல்லாத நிலையிலே பொதுமக்கள் இருக்கிறார்கள். இந்நிலையில், வியாபாரிகளும் பொருட்களின் விலையை அதிகரிப்பதால் வாழ்க்கைச் செலவு அதிகரித்து பொதுமக்கள் அதிக சுமைகளைச் சுமக்கவேண்டி வரும். எனவே, இது தொடர்பில் அரசாங்கம் உரிய கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

புத்தளம் வைத்தியசாலை District General Hospitalஆகத் தரமுயர்த்தப்படுமென மாண்புமிகு சனாதிபதி அவர்கள் தேர்தல் காலத்தில் அம்மாவட்ட மக்கள் மத்தியில் சொல்லியிருந்தார். அந்த வைத்தியசாலையைத் தரமுயர்த்த வேண்டுமென தொடர்ச்சியாக புத்தளம் மாவட்ட மக்கள் கோரிக்கை விடுத்து வருகின்றார்கள். அது ஓரிலட்சத்துக்கும் மேற்பட்ட மக்கள் சேவை பெறுகின்ற முக்கியமான ஒரு மாவட்ட வைத்தியசாலை ஆகும். எனினும், அந்த வைத்தியசாலை இன்னும் தரமுயர்த்தப்படவும் இல்லை; அதற்குத் தேவையான வசதிகள் செய்து கொடுக்கப்படவும் இல்லை. 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் அதற்கான நிதி ஒதுக்கீடு செய்யப்படுமென புத்தளம் மாவட்ட மக்களும் அங்குள்ள வைத்தியசாலை அதிகாரிகளும் எதிர்பார்த்து இருந்தார்கள். ஆனால், இந்த வரவு செலவுத்திட்டத்தில் அதற்கு எந்தவொரு நிதி ஒதுக்கீடும் செய்யப்படவில்லை. இதனால் அங்கிருக்கின்ற மக்கள் மிகக் கவலையோடு இருக்கிறார்கள். சனாதிபதித் தேர்தல், பாராளுமன்றத் தேர்தல், ஏன் உள்ளூராட்சித் தேர்தலில்கூட அந்த மக்கள் அரசாங்கத்துக்கு ஆதரவாக வாக்களித்து, அரசியல் அதிகாரத்தை உங்களிடம் ஒப்படைத்து இருக்கிறார்கள். தற்பொழுது, இங்கு கௌரவ சுகாதார அமைச்சர் Hon. (Dr.) Nalinda Jayatissa அவர்கள் இருக்கிறார். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பில் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

புத்தளம் பிரதேசத்தின் அருவைக்காட்டுப் பகுதியில் குப்பை கொட்டுகின்ற நிலைமையால் அங்குள்ள மக்கள் ஏற்கெனவே பல்வேறுபட்ட சுகாதார சீர்கேடுகளுக்கு உள்ளாகி இருக்கிறார்கள். அந்தத் திட்டத்தை மேலும் அபிவிருத்தி செய்வதற்கு நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கிறது. இதனால் இன்று அந்த மக்கள் வீதிகளில் இறங்கி ஆர்ப்பாட்டம் செய்கின்ற நிலைமை ஏற்பட்டு இருக்கின்றது. கௌரவ சுகாதார அமைச்சர் அவர்களே, நீங்கள் புத்தளம் வைத்தியசாலையை District General Hospitalஆகத் தரமுயர்த்தி, அதற்குத் தேவையான வசதிகளைச் செய்து கொடுக்க வேண்டும். அத்துடன், இந்தக் குப்பைப் பிரச்சினை மேலும் அதிகரிக்காமல் பார்த்துக்கொள்ள வேண்டும். ஏனெனில், ஏற்கெனவே அந்தப் பிரதேச மக்கள் Norochcholai Coal Power Plant projectஆல் முழுமையாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். வீடுகளில் இருக்கின்ற குடிநீரைக்கூட அவர்களால் குடிக்க முடியாது. அதுமாத்திரமன்றி, வீடுகளில் துணிகளைக் கழுவிப் போட முடியாது. இவை நான் அங்கு நேரடியாகச் சென்றபோது பார்த்த விஷயங்கள்! எனவே, கௌரவ அமைச்சர் அவர்களும் மாண்புமிகு சனாதிபதி அவர்களும் இது தொடர்பில் உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, Budget என்பது வெறும் எண்களைக் கொண்டு வெள்ளை paperஇல் செய்கின்ற ஒரு விடயம் அல்ல என்பது உங்களுக்குத் தெரியும்! இதிலுள்ள விடயங்கள் நடைமுறைப்படுத்தப்பட வேண்டியவை. கடந்த Budgetஇல் ஒதுக்கப்பட்ட நிதியில் கிட்டத்தட்ட 55 சதவீதம்தான் செலவு செய்யப்பட்டு இருக்கிறது. கிட்டத்தட்ட 16 projectsஇன் வேலைகள் இன்னும் ஆரம்பிக்கப்படவில்லை. Budget என்பது நாட்டைக் கட்டியெழுப்புகின்ற, பொருளாதாரத்தைக் கட்டியெழுப்புகின்ற, மக்களுடைய தேவைகளை நிறைவேற்றுகின்ற கூட்டுப் பொறுப்பின் சின்னமாகும். எனவே, இந்த Budgetஐ முழுமையாக அமுல்படுத்தி அர்த்தமுள்ளதாக்க வேண்டும். வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்பட்டுள்ள ஒவ்வொரு ரூபாயையும் மக்களுக்குப் பயனுள்ளதாக மாற்ற வேண்டும். பாடசாலைகள், வைத்தியசாலைகள், சுகாதார வசதி, சுத்தமான குடிநீர், வேலைவாய்ப்பு, வீதி அபிவிருத்தி என்று மக்களின் அடிப்படைத் தேவைகளை நிறைவு செய்வதற்காக இந்த Budgetஇல் ஒதுக்கப்படுகின்ற நிதியை முழுமையாகப் பயன்படுத்துவதை அரசாங்கம் உறுதிப்படுத்த வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். மாண்புமிகு சனாதிபதியின் தலைமைத்துவத்தில் இந்த நாடு முன்னேறும், ஊழலற்ற, நேர்மையான ஓர் அரசாங்கம் உருவாகும், மக்களுடைய பிரச்சினைகளுக்குத் தீர்வு காணப்படும், வடக்கு, கிழக்கு வாழ் தமிழ் மக்களின் பிரச்சினைக்குத் தீர்வு காணப்படும் என்ற நம்பிக்கையோடு மக்கள் இருக்கிறார்கள்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Sir, I will wind up in a minute.

இந்த நாட்டில் மாகாண சபை முறைமை உருவாக்கப்பட்டு, அதனூடாகச் சிறப்பானதொரு நிருவாகம் இடம்பெற்று வந்தது. இன்று மாகாண சபைகள் செயற்படாத காரணத்தால், அதிகாரிகளின் கட்டுப்பாட்டிலே மாகாண நிருவாகம் இருக்கின்றது. இது வடக்கு, கிழக்கு மாகாணங்களில் பாரிய தாக்கத்தை ஏற்படுத்திக்கொண்டு இருக்கின்றது. மாண்புமிகு சனாதிபதி அவர்கள் மாகாண சபைத் தேர்தலை நடத்துவதற்காக இந்த வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கீடு செய்திருக்கிறார். அந்த நிதியைக் கொண்டு மாகாண சபைத் தேர்தலை நடத்துவதற்கு அரசாங்கம் முயற்சிக்க வேண்டும்.

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Let him conclude, Hon. Member. Hon. Hizbullah, your time is up. Would you please wind up?

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up, Sir. After that, you give him time. No problem. But, I do not want to give him my time.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please wind up now. Your time is up.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மாகாண சபைத் தேர்தலை காலதாமதமின்றி நடத்த வேண்டும். அதனூடாக மக்களுடைய தேவைகளை மக்கள் பிரதிநிதிகளே நிறைவேற்றக்கூடிய சூழலை உருவாக்க வேண்டும். அதற்கு மாறாக, தொடர்ச்சியாக அதிகாரிகளுடைய கரங்களில் நிருவாகத்தை ஒப்படைத்து, அவர்கள் ஊடாக மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பது ஜனநாயகமல்ல!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Hizbullah, your time has long passed.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
எனவே, மிக விரைவாக அரசாங்கம் மாகாண சபைத் தேர்தலை நடத்தி, மாகாண சபைகளை இயக்கி, ஜனநாயக அடிப்படையில் மக்களுடைய தேவைகளை மக்கள் பிரதிநிதிகளே நிறைவேற்றுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
Hon. Deputy Speaker -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order? He did not mention your name.

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
Sir, he did not mention my name, but as the Chairman of District Coordination Committee, I want to ask him one question.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We will come to that later. He did not mention any name. We have to suspend for lunch and there are two more speakers.

Next, the Hon. Muneer Mulaffer. You have 12 minutes.

[பி.ப. 12.05]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டம் சம்பந்தமாக ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் நிலைப்பாடு தொடர்பில் எனக்குச் சந்தேகமொன்று ஏற்பட்டு இருக்கின்றது. குறிப்பாக, மலையக மக்களுக்கு - தோட்டத்துறையில் பணியாற்றுகின்ற சகோதரர்களுக்கு - அரசாங்கத்தால் வழங்கப்படுமெனக் கூறப்பட்ட 200 ரூபாய் சம்பந்தமாக கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் பாராளுமன்றத்தில் கடுமையாக விமர்சித்து பாரியதொரு புரளியைக் கிளப்பினார். இப்பொழுது கௌரவ எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்கள் அந்த விடயத்துக்கு ஆதரவாகப் பேசினார். கஷ்டப்படுகின்ற, வேதனைப்படுகின்ற, அல்லல்படுகின்ற பெருந்தோட்ட மக்களுக்கு இவ்வாறான உதவிகளை அரசாங்கம் வழங்குவது பொருத்தமற்றதென ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் செயலாளர் நிசாம் காரியப்பர் அவர்கள் கருதுகிறார். "Ceylon Tea" என்ற வர்த்தக நாமத்தின்மூலம் இலங்கையை உலகுக்கு அறியச் செய்த, அந்த நாமத்தைப் பெற்றுத் தருவதற்காக இரத்தம் சிந்திய மக்களுக்கு அந்தக் கொடுப்பனவை வழங்குவதற்கு நிதி ஒதுக்கியதை கடுமையாக எதிர்க்கின்ற நிலையிலே அவர் காணப்பட்டார். எனினும், அத்தகைய நிலைப்பாட்டில் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் இருக்காது என்பது எனது நம்பிக்கை!

විශේෂයෙන් 2025 අය වැය ඉදිරිපත් කළ මොහොතේත් විපක්ෂය විශාල බියක් සමාජගත කළා. ඒගොල්ලන් ඇති කරපු බිය තමයි, ඒ දවස්වල ඒ අය වැය විවාදය තුළත් කථා කරපු දේ තමයි, "මේ අය වැය ක්‍රියාත්මක වන විට රටේ කර්මාන්තශාලා ටික වැසී යන්න පුළුවන්, ආයෝජකයන් මේ රට හැර යන්න පුළුවන්, නැවත වතාවක් මේ රට බංකොලොත්භාවයට පත් වෙන්න පුළුවන්, ඒ ඔස්සේ අටවැනි මාසය වෙනකොට තව ජනාධිපතිවරයෙකුත්, නවවැනි මාසය වෙනකොට තව ජනාධිපතිවරයෙකුත්, දෙසැම්බර් මාසය වෙනකොට තව ජනාධිපතිවරයෙකුත් පත් වෙන්න පුළුවන්" කියන එක. ඒගොල්ලන් එහෙම පෙරුම් පුරාගෙන හිටියා.

[ගරු මුනීර් මුලාෆර් මහතා]

දැන් මේ අය වැය ඔස්සේ ඒගොල්ලන්ගේ ප්‍රධාන චෝදනාව බවට පත් වෙලා තිබෙන්නේ මොකක්ද? අපේ රටේ නිෂ්පාදනයක් වෙනුවෙන් ලැබී තිබෙන, ලෝකය තුළ කොහේ ගියත් පිළිගැනීමක් තිබෙන එකක් තමයි, "Ceylon Tea" කියන සන්නාමය. ඒ සන්නාමය අපට උරුම කර දීමේදී විශාලම කැප කිරීම කරන, ඒ වෙනුවෙන් කටයුතු කරන අපේ ආදරණීය මලෙයහම් ජනතාවට රුපියල් 200ක් ලබා දුන්නාම විපක්ෂය ඒ පිළිබඳව කලකිරීමට පත් වෙලා තිබෙනවා. අද මේ අය වැයට එරෙහිව ඡන්දය දෙනවා නම්, ඒ ජනතාවට ලබා දෙන සහනයට අපි විරුද්ධයි කියන පණිවුඩය තමයි දෙන්නේ. විපක්ෂය බොහෝදුරට අද සවස් යාමයේදී ඒ පණිවුඩය තමයි ලබා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. මේ අය වැය පිළිබඳව කියාගන්න බැරුව, විවේචන එල්ල කරගන්න බැරුව අද වෙනකොට විපක්ෂය ඒ යෝජනාවේම එල්ලෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම වර්තමාන අය වැය පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතු දෙයක් තිබෙනවා. අපේ ජනාධිපතිතුමන් අය වැය කථාව ඉදිරිපත් කරනකොට ඉතාම වැදගත් පණිවුඩයක් අපට ලබා දුන්නා. ඒ පණිවුඩය තමයි, "ආයෝජකයන් යනු අපට සම්පතක්" කියන එක. මම මේ අවස්ථාවේ මතක් කළ යුතු වැදගත් දෙයක් තිබෙනවා. මම පසුගිය සතියේ සවුදි අරාබියට ගියා. ඊට කලින් මට කටාර් රාජ්‍යයට යන්න අවස්ථාව ලැබුණා. පසුගිය කාලයේ පැවැති ආණ්ඩුවල සමහර අය ඒ රටේ ආයෝජකයන් රවට්ටලා අමාරුවේ දාලා තිබෙනවා. ඒ රටේ සමහර අය මේ රටේ ආයෝජනය කරන්න කැමැත්තෙන් ඉඳලා මේ රටේ සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ, ඇමතිවරුන් සමඟ සම්බන්ධකම් ඇතිකර ගත්තත්, මොවුන් ඒ ආයෝජකයන්ව රවට්ටපු ඉතිහාසය පිළිබඳ ඔවුන් අපට පැහැදිලි කරලා දුන්නා. දැන් මේගොල්ලන් කිඹුල් කඳුළු හෙළනවා, "ආයෝජකයන් අපේ රට අතහැර යයි" කියලා. ඔව්, ඔය වාගේ පාලකයන් තවදුරටත් මේ රට පාලනය කළා නම්, මේ රටට කවදාවත් ආයෝජකයන් එන්නේ නැහැ. පසුගිය ආණ්ඩු කාලවල සමහර රටවල් මේ රටේ ව්‍යාපෘති අතහැර යන තත්ත්වයට පත් වුණා. හැබැයි, අද මේ අය වැය ගැන, ආයෝජකයන් ගැන මේගොල්ලන් කථා කරන්නේ මොකක්ද? ආයෝජකයන් තුළ අවිශ්වාසය ගොඩ නැඟිලා ඔවුන් රටින් බැහැරව යන තත්ත්වයක් තිබුණු රටක, ජාතික ජන බලවේගයේ අපි ආණ්ඩුව අරගෙන ක්‍රමවත්ව නැවත ඒ ආයෝජකයන්ගේ විශ්වාසය දිනාගන්න වැඩ කරමින් ඉන්නවා.

විශේෂයෙන් වර්තමාන ආණ්ඩුවේ ප්‍රාග්ධන වියදම පිළිබඳ කරුණු කාරණා මෙතැනදී කථා කළා. බය නැතිව ඉන්න, අපි නිසි ඉලක්කයට යනවා. මම විශේෂයෙන් මතක් කළ යුතු දෙයක් තිබෙනවා. මෙහිදී 2016 වර්ෂයේ යහ පාලන ආණ්ඩුවේ ප්‍රාග්ධන වියදම කොතරම්ද කියන එක සොයා බලන එක වටිනවා කියලා මම හිතනවා. ඒ විතරක් නොවෙයි. මේ අය වැය මේ රටේ ජීවත් වන සියලු පාර්ශ්ව සිතේ තබාගෙන හදපු අය වැයක් කියා කියන්න පුළුවන්. ඒ නිසා තමයි අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල ගේට්ටුකරුවන් පිළිබඳවත් විශේෂයෙන් හිතේ තබාගෙන මේ අය වැය හදලා තිබෙන්නේ. එවැනි පුංචි මිනිසුන් පිළිබඳවත් මේ අය වැය තුළ තිබෙනවා. පසුගිය කාලයේ සමහර අය හදපු අය වැය ලේඛන පිළිබඳව ඔබට මතක ඇති. "මරණ තුනක් ඇති මිනිසෙක් පැණි කෑය" කියලා කථාව පටන් ගත්ත සමහර අය, ඒ අය වැය අවසානය වෙනකොට රටත් මරණාසන්නයට අරගෙන ගිය ඉතිහාසයක් අපට තිබුණේ.

මේ අවස්ථාවේදී විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ, surprise එකක් දෙනවාට වඩා, ජනතාව මුළාවට පත් කරනවාට වඩා, ජනතාව අන්දනවාට වඩා, ජනතාවට විශ්වාසය ගොඩ නඟමින්, ජනතාව වෙනුවෙන් කටයුතු කරන අය වැයක් බවට මේ අය වැය පත් කර තිබෙන බව. ඒ විතරක් නොවෙයි, අපේ ජයග්‍රහණයේ පංගුකාරයින් බවට පත්වෙච්ච විදේශගත අපේ ශ්‍රී ලාංකික සහෝදරවරු පිළිබඳවත් මේ අය වැයෙන් වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. ඔවුන් පිළිබඳවත් හිතේ තබාගෙන මේ අය වැය තුළ කටයුතු කර තිබෙන වග අපට කියන්න පුළුවන්.

ඒ වාගේම සඳහන් කළ යුතු තවත් කාරණා රාශියක් තිබෙනවා. මේ ආණ්ඩුව පත් වෙච්ච දා ඉඳලාම විපක්ෂය ඒගොල්ලන්ගේ විරුද්ධතාව හැම විටම ඇති කරගෙන තිබුණේ සිල්ලර, සරල කෑලිවලින්. ආණ්ඩුව පත් වෙච්ච දවස්වල බිත්තර, ලුණු, ලූනු, අල, වී වාගේ කරුණු කාරණා ඔස්සේ තමයි ඒ අය තමන්ගේ විවේචන ඉදිරිපත් කළේ. ඒක ඔවුන් හැම විටම උත්සාහ කරපු දෙයක්. අපි හැමකෙනාම දන්නවා, යහ පාලන ආණ්ඩුව කියන්නේ, රටේ තිබුණු සංවර්ධන ව්‍යාපෘති පවා නතර කරපු ආණ්ඩුවක් බව. මධ්‍යම අධිවේගී මාර්ගයේ කටයුතු ඇතුළු සංවර්ධන ව්‍යාපෘති රාශියක් ඇනහිටපු, නවත්වපු රට තුළ තමයි ජනතාවගේ විශ්වාසය ක්‍රමවත්ව ගොඩ නඟමින්, නැවතත් ඒ සංවර්ධන ව්‍යාපෘති පටන් ගනිමින් අපි කටයුතු කරගෙන යන්නේ. මේ අය වැය හරහා විවිධ පාර්ශ්ව පිළිබඳව කටයුතු කර තිබෙනවා. වැදගත්ම කාරණාව තමයි, අපි මේ අය වැය තුළින් රටේ ආර්ථික වර්ධනය සියුම් ලෙස සකසා ගනිමින් ක්‍රමවත්ව මේ රට ගොඩ නඟමින් තිබීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රට බංකොලොත් වෙනකොට, රටේ අර්බුද ඇති වෙනකොට පසුගිය කාලයේ පාලකයන් මොකක්ද කිව්වේ? ජනතාවට පටි තද කරගන්න කිව්වා. ජනතාවට පටි තද කරගන්න කියලා ඒගොල්ලන් රිසි සේ ජනතා මුදල් අවභාවිත කළා. ඒ විතරක් නොවෙයි, ජනතා මුදල් මංකොල්ල කෑවා. හැබැයි අද විපක්ෂයට මේ අය වැය ගැන කථා කරන්න කිසි දෙයක් නැති වෙනකොට, ඒගොල්ලන් කථා කරනවා, වාහන පිළිබඳව. ඒගොල්ලන් මොන තරම් කෑ ගැහුවත්, මේ රටේ ජනතාවට හෘදය සාක්ෂියක් තිබෙනවා. ඒ හෘදය සාක්ෂිය කියයි, පසුගිය කාලයේ හිටපු ඇමතිවරු රාජ්‍ය වාහන කොතරම් දුරට අවභාවිත කළාද -වැරදි විධියට පාවිච්චි කළාද- හැබැයි අද වෙනකොට ඉන්න ජනාධිපතිතුමා, අගමැතිතුමිය ඇතුළු මැති ඇමතිවරු ඒ වාහන ටික කෙතරම් දුරට පරිස්සමෙන් පාවිච්චි කරනවාද කියන කාරණාව. පසුගිය ආණ්ඩුව සහ අපේ ආණ්ඩුව අතර තිබෙන වෙනස ඒකයි. ජනතාවට පටි තද කරගන්න කියලා ඒගොල්ලන් රිසි සේ ජීවත් වුණා. හැබැයි, ජනාධිපතිතුමා පටන් අපේ ආණ්ඩුවේ සියලුදෙනාම තමන්ගේ සියලු වියදම් කපා හරිමින් මේ රටේ ජනතාවට දෙන්න පුළුවන් උපරිමය ලබා දෙන්න මේ අය වැය තුළිනුත් කටයුතු කර තිබෙනවා.

පසුගිය කාලයේ හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවා නම් පෙනේවි, අද වාහන ගැන කථා කරන අය කොතරම් විශාල මුදලක් වියදම් කර තිබුණාද කියලා. මැති ඇමතිවරුන් වෙනුවෙන් පමණක් ලක්ෂ 28,000ක් විතර වියදම් කර තිබුණු ඉතිහාසයක් අපට තිබුණා. හැබැයි, අපි වාහන රැගෙන එන්නේ කුමක් සඳහාද? මේ රටේ රාජ්‍ය යන්ත්‍රණය කාර්යක්ෂම කරලා, මේ රටේ පළාත් පාලන ආයතන වාගේම රාජ්‍ය ආයතන සියල්ල කාර්යක්ෂම කරලා ජනතාවට හොඳ සේවාවක් සපයන්න පුළුවන් තත්ත්වයකට ඒ ආයතන පත් කරන්නයි අපි ඒ කටයුත්ත කරන්නේ. අපි දන්නවා, මීට අවුරුදු 10කට, 12කට පෙර තමයි රාජ්‍ය ආයතනවලට වාහන මිලදී ගෙන තිබුණේ. හැබැයි ඒ හිටපු ඇමතිවරු ඒ අර්බුදකාරී කාලය තුළ ජනතාවට පටි තදකරගන්න කියලා කොතරම් සැණකෙළි පැවැත්වූවාද? හොඳ හොඳ වාහන අරගෙන ඇවිල්ලා පාවිච්චි කළාද?

ඒ නිසා, අද විපක්ෂය මොන තරම් පාරම්බෑවත්, කොතැනට එකතු වුණත්, ජනතාවගේ අභිමතය පරිදි, ජනතාවගේ සුබසිද්ධිය පරිදි මේ ආණ්ඩුව කටයුතු කරන බව ජනතාවගේ හෘදය සාක්ෂිය දන්නවා. ඒ අනුව මේ අය වැය සැකසී තිබෙන්නේ ජනතාව වෙනුවෙන් මිසක්, ඒගොල්ලන් වාගේ පාලකයන්ගේ වුවමනාවට නොවන වග ජනතාව දන්නවා. ඒ නිසා මේ අය වැය විශේෂයෙන්ම ජනතාව මුල් කර ගත් අය වැයක් බව සඳහන් කරන්න ඕනෑ.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Ananda Wijepala. You have 18 minutes.

[අ.භා. 12.17]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අය වැය විවාදය අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා මේ අය වැය ඉදිරිපත් කළේ මොන තත්ත්වයක් යටතේද කියන එක මේ වෙලාවේදී මා අවධාරණය කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ අය වැය ඉදිරිපත් කරන්නේ බිඳ වැටුණු රටක; ආර්ථික, සමාජ හා දේශපාලන වශයෙන් බිඳ වට්ටපු රටක බව ඔබතුමා දන්නවා. අපි පාලන බලය ගත්තාට පසුව පළමුවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කළා. මේ ඉදිරිපත් කරන්නේ දෙවැනි අය වැය ලේඛනය. සාමාන්‍ය තත්ත්වයක පැවතුණු රටක ඉඳගෙන නොවෙයි, අපි මේ අය වැය ලේඛන ඉදිරිපත් කළේ. ඒ පිළිබඳවත් අවධාරණය කර ගනිමින් තමයි මේ අය වැය කියවා ගත යුත්තේ. මේ රට සාමාන්‍ය විධියට පවත්වා ගෙන ගිය රටක් නොවෙයි. රට බිඳ වැට්ටුවා විතරක් නොවෙයි, සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය කරපු කෝටි ගණන් මුදල් අපට ගෙවා ගන්න බැරිවයි තිබුණේ. ඒ විතරක් නොවෙයි. සංවර්ධන ව්‍යාපෘති සියල්ල මහා පරිමාණයෙන් බිඳ වට්ටලා තිබුණු රටක්. සමාජ, ආර්ථික වශයෙන් බිඳ වැටුණු රටක් ජාතික ජන බලවේගය ආණ්ඩුව අරගෙන, උපාය මාර්ගික ප්‍රවේශයක් සහිතව, ප්‍රධාන උපාය මාර්ගික අරමුණු හයක් ඔස්සේ මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා.

පළමුවැනි එක තමයි තිරසරභාවය, එහෙම නැත්නම් සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථිකයක් හදන එක. ඒ සඳහා සියයට 7ක ආර්ථික වර්ධනයක්, අභිවෘද්ධියක්, ආර්ථික වර්ධන වේගයක් පදනම් කරගෙන, අරමුණු කරගෙන තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. සැමට ප්‍රතිලාභ ලැබෙන අය වැයක්, තිරසරභාවය සහතික කරන අය වැයක්, රටේ සෑම පළාතකටම සංවර්ධනය විහිදී යන, සෑම ජන කණ්ඩායමකටම සංවර්ධන ප්‍රතිලාභ ලැබෙන අය වැයක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ප්‍රධාන අරමුණු හයෙන් පළමුවැනි අරමුණ ඒක. ඒ වෙනුවෙන් තමයි දැක්මක්, වැඩ පිළිවෙළක් සහිතව එක් වර්ෂයක් සඳහා වූ ආර්ථිකය, එහෙම නැත්නම් රජයේ ආර්ථික සංවර්ධන දිශානතිය මේ අය වැය ලේඛනයෙන් සනිටුහන් කරලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. දෙවැනි අරමුණ තමයි අපනයන විවිධාංගීකරණය. 2025-2029 ජාතික අපනයන සංවර්ධන සැලැස්ම මේ මඟින් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක අපේ ආර්ථික දිශානතියේ ප්‍රධාන කාරණයක්. තුන්වැනි කාරණය තමයි, ණය තිරසරභාවය. ඒ පිළිබඳව විශේෂ කාරණයක් සඳහන් කරන්නට ඕනෑ. අපි මේ වෙනකොට බහුපාර්ශ්වීය ණය හැර අනෙක් ණය ගෙවන්නේ නැහැ. නමුත්, 2028දී ණය ආපසු ගෙවිය යුතු වෙනවා. ඒ සඳහා වූ ණය තිරසරභාවය ඇති කරන්න, මේ අය වැයෙන් සියලු පියවර අරගෙන තිබෙනවා.

ගරු ජනාධිපතිතුමා අය වැය කථාව ඉදිරිපත් කරමින් කිව්වා වාගේම අපට 2025දී ඇමෙරිකානු ඩොලර් මිලියන 2,435ක් ගෙවන්න තිබුණා. මේ වෙනකොට අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 1,948ක් ණය ගෙවලා තිබෙනවා, ඉතිරි ඩොලර් ප්‍රමාණයත් මේ මාස දෙක ඇතුළත ලෙහෙසියෙන්ම ගෙවා දමන්න අපට හැකියාව තිබෙනවා කියලා කිව්වා. ඒ වාගේම, 2028දී අපට ණය ගෙවන්න තිබෙනවා. 2028දී අපට ණය වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 3,259ක් ගෙවන්න තිබෙනවා. ඒ මුදල අපිට කිසිදු බාධාවකින් තොරව ගෙවා ගැනීමට හැකියාව තිබෙනවා. අපි ඒ සඳහා ණය තිරසරභාවය ඇති කරලා තිබෙනවා. ඒ සඳහා වූ අය වැයක් ලෙසත්, මේ උපාය මාර්ගික අරමුණු ඔස්සේ අපි ඒකට පදනම දමලා තිබෙනවා.

හැබැයි, ණය තිරසරභාවය මේ විධියට හදලා තිබියදීත් විපක්ෂයේ අය මේ පාර්ලිමේන්තුව තුළත්, සමහර නාළිකා ඔස්සේත් බොරු බිල්ලෝ මවනවා. බංකොලොත්භාවයක් ගැන කථා කරනවා. ණය ගෙවා ගැනීමට හැකියාවක් නැති වෙයි කියන කාරණය පිළිබඳව සැක මුසු සංකා ඇති කරනවා. බොරුවට ව්‍යාජ ප්‍රවෘත්ති සමාජගත කරමින් ඉන්නවා. එහෙම කිසිදු බාධාවක් නැහැ. එදා ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවට ප්‍රකාශ කළා සේම, 2028දී කිසිදු බාධාවකින් තොරව ණය ගෙවීමට හැකි වන පරිදි ණය තිරසරභාවය තහවුරු කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟ එක තමයි, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම. සමාජයේ කිසිවෙකුත් අත් නොහැර, සියලු දෙනාට ආර්ථික ප්‍රතිලාභ ලැබෙන ජාතික සංවර්ධන සැලැස්මක් අපි මේ වෙනකොට ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒ සඳහා පදනම දමා තිබෙනවා. තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක පදනම් කර ගනිමින්, ඒ සඳහා වූ ජාතික සංවර්ධන රාමුවක් අපි නිර්මාණය කර තිබෙනවා.

ඒක උපාය මාර්ගික සැලැස්මේ තවත් එක කාරණයක්. දරිද්‍රතාවෙන් පෙළෙන පිරිස් එයින් මුදාගැනීම සඳහා "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළට රුපියල් මිලියන 25,000ක් වෙන් කර තිබෙනවා. ඊළඟ එක තමයි, ඩිජිටල්කරණය. විශේෂයෙන්ම ආර්ථික වර්ධනයටත්, සමාජ ජීවිතය උසස් කිරීමටත්, රාජ්‍ය පාලන සේවා සැපයීම විනිවිදභාවයෙන් කාර්යක්ෂමව ඉටු කිරීමටත් අපි ඩිජිටල්කරණය ගෙනැල්ලා තිබෙනවා. 2026 වසරේදී එය රාජ්‍ය සේවය පුරා ව්‍යාප්ත කරන්න අවශ්‍ය ප්‍රතිපාදන අපි අය වැයෙන් වෙන් කර තිබෙනවා. විපක්ෂයේ බොහෝ අය මෙවර අය වැය සඳහා විවේචන ගෙනෙන්නේ පදනමක් ඇතිව නොවෙයි. කිසිදු පදනමක් සහිත කාරණාවක් ඉදිරිපත් කරමින් නොවෙයි, ඔවුන් විවේචන ගෙනෙන්නේ. කිසිදු සාධනීය විවේචනයක් බොහෝ අය ගෙනාවේ නැහැ. මේක ද්වේෂසහගතව කරන විවේචනයක් විතරයි. මොකද, අපි ආර්ථික දර්ශක පදනම් කරගෙන තමයි අය වැය කථාව ඉදිරිපත් කරනකොටත්, අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොටත් අදහස් ප්‍රකාශ කරලා තිබෙන්නේ.

2024 මුල් මාස 9ට සාපේක්ෂව 2025 මුල් මාස 9 සංසන්දනය කරනකොට අපනයන ආදායම රුපියල් බිලියන 8.5 ඉඳලා, රුපියල් බිලියන 9.1 දක්වා වැඩිවෙලා තිබෙනවා. මේ වාගේ ආර්ථික දර්ශක, නැත්නම් අපනයන ආදායම වර්ධනය වීම්

[ගරු ආනන්ද විජේපාල මහතා]

පිළිබඳව සංඛ්‍යාලේඛන, නිවැරදි දත්ත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් තමයි ගරු ජනාධිපතිතුමා එදා අය වැය කථාවේ මේ ආර්ථික වර්ධනය තහවුරු කළේ. ඒ දත්ත පදනම් කරගෙන තමයි එතුමා ආර්ථිකය වඩා උසස් තැනකට ඔසවා තැබීම පිළිබඳව ප්‍රකාශ කළේ. සේවක ප්‍රේෂණ ඩොලර් බිලියන 4.8 ඉඳලා, ඩොලර් බිලියන 5.8 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම, සංචාරක ඉපැයීම් ඩොලර් බිලියන 2.3 සිට ඩොලර් බිලියන 2.5 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ආදායම් ප්‍රදාන ට්‍රිලියන 2.9 ඉඳලා, ට්‍රිලියන 3.8 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. මේ විධියට ආර්ථික දත්ත අරගෙන තමයි මේ ආර්ථික ස්ථාවරත්වය පිළිබඳව අපි කථා කළේ. විපක්ෂයට කියන්න දෙයක් නැති වුණාම යම් යම් ප්‍රකාශ මේ පාර්ලිමේන්තුව තුළත්, එළියේදීත් ඔවුන් සිදු කරනවා. විපක්ෂ නායකතුමා පසුගිය දවසක මේ අය වැය විවාදයට එක් වෙමින් කිව්වා, "භාණ්ඩාගාරය පුරවනවා කියන එක පොඩි ළමයෙකුටත් කරන්න පුළුවන්" කියලා. මොකද, අපි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් කිව්වා, "අපි රුපියල් ට්‍රිලියනයක් භාණ්ඩාගාරයේ පුරවලා තිබෙනවා" කියලා. එතකොට විපක්ෂ නායකතුමා කිව්වා, භාණ්ඩාගාරය පුරවන එක පොඩි ළමයෙකුටත් කරන්න පුළුවන්; මොන්ටිසෝරි දරුවෙකුටත් කරන්න පුළුවන් කියලා. අපි එතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. එතුමා පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ අමාත්‍යාංශ 3ක ඇමතිකම් දැරුවා. ඒ තමයි, සමෘද්ධි අමාත්‍යාංශය, නිවාස අමාත්‍යාංශය සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය. මේකේ අරමුදල් 3ක් තිබුණා. එතුමා ඒ අරමුදල් 3ම කාබාසිනියා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් ඒ බව දන්නවා. ඒ ආකාරයට තමන්ට අමාත්‍යාංශයක්වත් කරගන්න බැරිව හිඳිමින් එතුමා දැන් කියනවා, "මහා භාණ්ඩාගාරය පොඩි ළමයෙකුටත් පුරවන්න පුළුවන්" කියලා. එතකොට අපට කියන්න තිබෙන්නේ මේකයි. ඒ පොඩි ළමයාටත් වඩා පහළ තැනක ඉඳලා තමයි විපක්ෂ නායකතුමා අමාත්‍යාංශ පාලනය කරලා තිබෙන්නේ. එහෙම නැත්නම් ඒ අමාත්‍යාංශවල අරමුදල් වර්ධනය කරන්න තිබුණා නේ. නමුත්, එහෙම කරලා නැහැ. මේ රට ඒ දේවල් දන්නවා. ඒ අමාත්‍යාංශවල වැඩ කරන ඇමතිවරු දන්නවා, මේ අමාත්‍යාංශවලට අත්කරදී තිබෙන ඉරණම. ඒ නිසා අපි මේ පිළිබඳව සාකච්ඡා කරනකොට අපට සාධනීය විවේචන අවශ්‍යයි. එහෙම නැතිව, ද්වේෂසහගතව මේ අය වැය විවේචනය කිරීමෙන් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ.

මට පෙර කථා කරපු අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ අපේ සහෝදර වතුකරයේ ජනතාව සේවයට පැමිණීම වෙනුවෙන් දෛනිකව රුපියල් 200ක දීමනාවක් වැඩිපුර ලබා දෙන්න කටයුතු කරනකොට, ඒකට එරෙහිවත් කටයුතු කරන විපක්ෂයක් අද නිර්මාණය වෙලා තිබෙනවා. සමහර අය ඒ පිළිබඳව පැමිණිලි කරන්නත් සූදානමින් ඉන්නවා. එවැනි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මොන අභියෝග ආවත් වතු කම්කරු සහෝදර ජනතාව සේවයට පැමිණීමේදී දෛනිකව ලබාදෙන රුපියල් 1,750ක වැටුප, එහෙම නැත්නම් රජය මැදිහත් වෙලා ලබාදෙන රුපියල් 200ක දීමනාව අනිවාර්යයෙන්ම ලබා දෙන්න කටයුතු කරනවා. අපි ඉදිරියටත් ඒක කරනවා.

රාජ්‍ය සේවකයන්ට කැබ් රථ ලබා දීම පිළිබඳවත් දිගින් දිගටම කථා කළා. රුපියල් මිලියන 12,500ක් දීලා රජයේ සේවකයන්ට කැබ් රථ ලබා දීමටත් එරෙහිව මේ විපක්ෂයේ සමහර කණ්ඩායම් අදහස් ප්‍රකාශ කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමට රාජ්‍ය සේවය සඳහා කැබ් රථ 1,750ක් ලබා දෙනවා කියලා ගරු ජනාධිපතිතුමා පැහැදිලිව ප්‍රකාශ කළා. ඒ සඳහාත් මුදල් වෙන් කර තිබෙනවා. හැබැයි, මන්ත්‍රීවරුන්ට කැබ් රථයක් ලබා දෙනවා කියන එක අලුත් කාරණයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 194වැනි පිටුවේ අපි ලියා තිබෙනවා, මන්ත්‍රීවරුන්ගේ ධුර කාලයට සීමාවන පරිදි කැබ් රථයක්, නැත්නම් වාහනයක් ලබා දෙනවා කියලා. එම ධුර කාලයට පමණක් සීමා කරලා අපි එම වාහන ලබා දෙනවා. දැන් ඇවිල්ලා කියනවා, ඒකට ඉන්ධනත් දෙන්න යනවා කියලා. ඉන්ධන අලුතින් දෙන්න දෙයක් නැහැ, හැම මන්ත්‍රීවරයෙකුටම ඉන්ධන දීමනාවක් දෙනවා. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට ලබා දෙන ඉන්ධන දීමනාව ගන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ මන්ත්‍රීවරුන්ටත් අදාළව ඉන්ධන දීමනාවක් ලබා දෙනවා. ඒ නිසා කැබ් රථ දුන්නා කියලා, ඒවාට ඉන්ධන ලබා දෙන්න කටයුතු කරන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. ඒ කාලයේ සිටි ඇමතිවරුන් ඒ ඒ අමාත්‍යාංශවලින් ලබා දෙන ඉන්ධන දීමනාවත් ගත්තා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන ඉන්ධන දීමනාවත් ගත්තා, දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති හැටියට ලබා දෙන ඉන්ධන දීමනාවත් ගත්තා. ඒ විධියට ඉන්ධන දීමනා තුනක් අරගෙන මේ රට බංකොලොත් කරන්න දායක වුණු සමහර අය දැන් විපක්ෂයේ ඉඳගෙන කිඹුල් කඳුළු හෙළනවා. එහෙම තත්ත්වයක් තමයි අද නිර්මාණය කරලා තිබෙන්නේ. හැබැයි, අපි මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරනවා කියන ස්ථාවරයේ ඉඳලා කටයුතු කරලා තිබෙනවා. අපේ ඇමතිවරුන් සහ නියෝජ්‍ය ඇමතිවරුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ලබා දෙන ඉන්ධන දීමනාව ගන්නේ නැහැ. එතුමන්ලා අමාත්‍යාංශයෙන් ලබා දෙන ඉන්ධන දීමනාව පමණයි ගන්නේ. ඒ අනුව එක් ඉන්ධන දීමනාවකට සීමා කරලා අපි දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා තිබෙනවා.

රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂම කිරීමට අපි මෙවර අය වැයෙන් පියවර රාශියක් අරන් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබ දන්නවා, මේ වෙනකොට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල් - ETF, EPF - ගෙවාගන්න බැරිව බංකොලොත් වුණු ආයතන 10ක් තිබුණු බව. ඒ හේතුවෙන් එම සේවකයින්ට විශාල මුදලක් අහිමි වෙලා තිබුණා. ඒ වෙනුවෙන් මෙවර අය වැයෙන් සුවිශාල සහනයක් සලසා තිබෙනවා. අපි ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. මොකද, අඩුම වශයෙන් ඒ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වය ලබා දීම අවශ්‍යයි. ඒ වෙනුවෙන් රජය මැදිහත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. දේපළ ණය සඳහා වන පොලියෙන් සියයට 4ක කොටසක් රජයෙන් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. එම ණය මුදල රුපියල් ලක්ෂ 30 ඉඳලා ලක්ෂ 50 දක්වා යනකොට අමතරව සියයට 2ක සහනයක් ලබා දෙන්නත් කටයුතු කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, ඒ ප්‍රමාණය මදි කියලා. 1,350,000ක් වන රාජ්‍ය සේවකයින්ට ඒ ප්‍රමාණයෙන් ණය දෙන්නේ කොහොමද කියලා ඇහුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1,350,000ක් වන ඒ පිරිස මේ වෙලාවේ බඳවා ගත් අය නොවෙයි. ඔවුන්ගෙන් විශාල පිරිසක් දීර්ඝ කාලයක් තිස්සේ ණය අරන් තිබෙනවා. තව යම් ප්‍රමාණයකට තමයි ණය දෙන්න තිබෙන්නේ. මේ මුදල වෙන් කරලා තිබෙන්නේ ණය දෙන්න නොවෙයි. සියයට හතරේ හෝ සියයට දෙකේ පොලී සහනය සඳහායි මේ මුදල වෙන් කරලා තිබෙන්නේ. එම රුපියල් මිලියන 500 මදි නම් ඒකට තවත් රුපියල් මිලියන 500ක් හෝ 1,000ක් වෙන් කරලා දෙන්න අපට බාධාවක් නැහැ. අය වැයෙන් පසුවත් යම් මුදල් වෙන් කර ගැනීමකට ඉඩ කඩ තිබෙනවා. ඒකට කිසිදු බාධාවක් නැහැ. එම නිසා මේ කරන හැම විවේචනයක්ම සාධනීය විවේචන නොවෙයි. රාජ්‍ය සේවයේ සිටින 1,350,000ම

මේ සඳහා ඉල්ලුම් කරන්නේත් නැහැ. ඔවුන්ගෙන් සියයට 60ක්, 70ක් දේපළ ණය සහ විවිධ ණය වර්ග අරගෙන තිබෙනවා. ඒ හින්දා දේපළ ණය සඳහා මූලික සුදුසුකම් සපුරන පිරිසට එම සහනය ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඊට අමතරව අපි උත්සව අත්තිකාරම් මුදල රුපියල් 10,000 ඉඳලා රුපියල් 15,000 දක්වා වැඩි කරලා තිබෙනවා.

රජයේ සමහර ආයතන එම ආයතනවලටත් දරාගන්න බැරි විධියට ගොඩනැඟිලි විශාල ප්‍රමාණයක් - 2,000කට අධික ප්‍රමාණයක් - ඉදිකරලා තිබෙනවා. මෙවර අය වැයෙන් අපි එම ගොඩනැඟිලි ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමටත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. එම නිසා රාජ්‍ය සේවය වඩාත් ශක්තිමත් කිරීමේ දිශාවටත්, කාර්යක්ෂම කිරීමේ දිශාවටත් අපි මෙම අය වැය තුළ යෝජනා රාශියක් ඇතුළත් කරලා තිබෙනවා.

රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම සඳහා රුපියල් බිලියන 110ක් -රුපියල් කෝටි 11,000ක්- වෙන් කරලා තිබෙනවා. වැටුප් වැඩි කිරීම සඳහා විතරක් ගිය අවුරුද්දේත් රුපියල් කෝටි 11,000ක් වෙන් කළා. වැටුප් වැඩි කිරීම වෙනුවෙන් මේ අවුරුද්දේත් අපි රුපියල් කෝටි 11,000ක් වෙන් කරනවා, ලබන අවුරුද්දේත් ඒ වෙනුවෙන් රුපියල් කෝටි 11,000ක් වැය කරන්න සූදානම් කරලා තිබෙනවා. දේශපාලනීකරණයෙන් රාජ්‍ය සේවය නිදහස් කර ගත්තා විතරක් නොවෙයි, හැම නිලධාරියෙකුටම අභිප්‍රේරණයක් සහිතව වැඩ කිරීමට හැකි වටපිටාවක් අපි හදලා තිබෙනවා. එම නිසා රාජ්‍ය සේවයේ බර අඩු කරලා කාර්යක්ෂම කරන්නත්, අදූෂිත රාජ්‍ය සේවයක් නිර්මාණය කරන්නත් මේ වෙනකොට අපි කටයුතු කරලා තිබෙනවා. අපි මේ වෙලාවේ රාජ්‍ය සේවකයින්ට ස්තුතිවන්ත වෙනවා. ඔවුන් මේ වෙනකොට කැපවීමෙන්, මැදිහත්වීමෙන් යුතුව සක්‍රිය ලෙස රාජකාරි කරමින් ඉන්නවා. ඒ සඳහා අවශ්‍ය වටපිටාව තමයි අපි මේ අය වැයෙන් හදලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හින්දා රාජ්‍ය සේවය වඩාත් ශක්තිමත් කිරීම මේ අය වැයේ තිබෙන විශේෂ කාරණයක් හැටියට අපට හඳුන්වා දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආකාරයට බැලුවාම මෙම අය වැය ලේඛනය පුරාම සාධනීය යෝජනා රාශියක් තිබුණත්, විපක්ෂයේ මෙම විවේචනය කිසිදු ආකාරයේ සාධනීය විවේචනයක් හැටියට අපට සලකන්න හැකියාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම තව එක කාරණයක් මතු කරන්න කැමැතියි. මීට පෙරාතුව විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මතු කළා, මාධ්‍යවලට තොරතුරු දෙන්න එපා කියලා අපි පොලිස් චක්‍රලේඛයක් නිකුත් කළා කියලා. මාධ්‍යවලට තොරතුරු දීමේදී යම් යම් සීමා තිබෙනවා. අපි එම චක්‍රලේඛය හරහා ප්‍රකාශ කළේ, විමර්ශනවලට බාධා වන ආකාරයෙන් තොරතුරු ලබා දෙන්න එපා කියන කාරණයයි. අනුරාධපුර ප්‍රදේශයේ විදුහල්පතිවරයෙක් පාදක කරගෙන අපි මේ චක්‍රලේඛය නිකුත් කළා කියලා ව්‍යාජ ප්‍රවෘත්තියක් සමාජගත කරන්න ඔවුන් උත්සාහ කළා.

මේක ඇත්තටම සිද්ධ වුණේ මෙහෙමයි. වැලිගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයාගේ ඝාතනයට අදාළ චූදිතයා අත්අඩංගුවට ගන්නා වෙලාවේ සමාජ මාධ්‍යයට ආ රූප රාමු පෙළක් පදනම් කරගෙන තමයි පොලිස්පතිවරයා එම චක්‍රලේඛය නිකුත් කර තිබුණේ. ඒක සාමාන්‍ය චක්‍රලේඛයක්. ඊට පෙරත් චක්‍රලේඛ 3ක් නිකුත් කර තිබෙනවා. අනාගතයේදීත් එවැනි චක්‍රලේඛ නිකුත් කරනවා. ඒක සාමාන්‍යයෙන් පරිපාලනයට අදාළ චක්‍රලේඛයක්. ඒවායෙන් මාධ්‍යයට තොරතුරු වසන් කිරීමක් නොවෙයි අපි කිසිසේත්ම සිද්ධ කරන්නේ. විමර්ශනවලට බාධා වන විධියට කිසිදු ආකාරයකින් තොරතුරු හෙළිදරව් කිරීම තහනම් කියන එක විතරයි කිව්වේ. එහෙම නැතුව මාධ්‍යයට තොරතුරු වසන් කිරීම හෝ තොරතුරු ලබා දීම අපි ආවරණය කර නැහැ, ඒක අවහිර කර නැහැ. ඒ නිසා ඒ ව්‍යාජ ප්‍රකාශයත් අපි ප්‍රතික්ෂේප කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙවර සාධනීය අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. කිසිවෙකුත් අත නෑර, රටේ සියලුම ක්ෂේත්‍ර ආවරණය කරමින් සියලුදෙනාට සේවා සපයන අය වැයක් මෙවර අපි ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව පලවා හැරීමේ පළමු වෙඩිමුරය නුගේගොඩින් පටන් ගන්නවා කියලා බොහෝ අය කිව්වා. නමුත් ඊයේ කියනවා, නුගේගොඩ රැලිය ආණ්ඩුවට පොරොන්දු මතක් කර දීමේ රැලියක් කියලා. දැන් පල්ලම් බැහැලා. ආණ්ඩුව පලවා හැරීමේ වෙඩිමුරය දැන් පොරොන්දු මතක් කර දීමේ රැලිය බවට පත් වෙලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කරන්නේ මොකක්ද, අපි කරගෙන යන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක මේ රටේ ජනතාව දන්නවා. ඒ වාගේම ජනතාවගේ පැතුම මොකක්ද, ජනතාව අපට බලය දුන්නේ කවර කාරණයක් සඳහා ද කියන කාරණා පිළිබඳව ජනතාව සමඟ සමීප සම්බන්ධතාවක් පවත්වන අපේ මාලිමාවේ මන්ත්‍රීවරුන් සියලුදෙනාත් හොඳ අවබෝධයකින් ඉන්නවා. අපි මේ කටයුතු කරන්නේ මේ රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන්. මේ රටේ ඉපදී සිටින දරුවාට මෙන්ම තවම ඉපදී නැති දරුවාටත් මේ රටේ අනාගතය සකස් කර දී, තිරසර ආර්ථිකයක් සහිතව මේ රටේ දරුවන්ට යහපත් අනාගතයක් ලබා දීම වෙනුවෙන් තමයි අපි මේ කටයුතු කරන්නේ කියන කාරණය අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 1.30 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, please. You have 16 minutes.

[අ.භා. 1.30]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, මගේ කථාව ආරම්භ කිරීමට පෙර මා කාරණයක් සඳහන් කරන්න කැමැතියි. පසුගිය සතියේ අභාවප්‍රාප්ත වුණු මගේ පියාගේ අවසන් කටයුතුවලට සහභාගි වූ ගරු කථානායකතුමා, ගරු නියෝජ්‍ය කථානායකතුමා, අතිගරු ජනාධිපතිතුමා, මැති-ඇමතිවරුන්, මන්ත්‍රීවරුන්, පාර්ලිමේන්තුවේ නිලධාරි මණ්ඩලය ඇතුළු සියලුදෙනාටම මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කර සිටිනවා.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 වසරට ඉදිරිපත් කර තිබෙන මේ අය වැය දිහා බැලුවාම අපට පෙනී යනවා, මේ අය වැය තුළ තිබෙන යෝජනාවලින් විශාල ප්‍රමාණයක්, ඒ කියන්නේ සියයට 61ක් වාගේ ප්‍රතිශතයක් economical decisions කියලා. මම දැක්කා, PAFFREL එකත් ඒක කියා තිබෙනවා. ඒ කියන්නේ social welfare කියන පැත්ත පිළිබඳව මේ අය වැය තුළ දකින්න පුළුවන් ප්‍රමාණය ගොඩක් අඩුයි. වමේ ප්‍රතිපත්ති තිබෙන ආණ්ඩුවකින් බලාපොරොත්තු වෙන්න පුළුවන් සමහර social welfare projects පවා මේ අය වැය තුළින් අපට දැකගන්න බැරි වුණාය කියන ඒ කාරණය මතක් කරමින්, මේ අය වැය සම්බන්ධව අපගේ ඉලංගෛයි තමිළ් අරසු කච්චි පක්ෂය තීරණයක් ගන්න අවශ්‍යයි කියන කාරණයත් මා සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාව තුළ තිබෙන ගැටලු තත්ත්ව පිළිබඳවත්, විශේෂයෙන්ම දෙමළ ජනතාවට සම්බන්ධ යම් යම් කාරණා කිහිපයක් පිළිබඳවත් මෙම අය වැය විවාදයේදී කියන්න ඕනෑ.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மிக முக்கியமாக தமிழ் மக்களுடைய பிரதான கட்சியாகிய இலங்கைத் தமிழரசுக் கட்சி 2026ஆம் ஆண்டுக்கான இந்த வரவு செலவுத்திட்டத்தை எந்த வகையில் பார்க்கவேண்டி இருக்கிறது என்பதைக் கூறவேண்டும். தமிழ் மக்களுக்கு அரசியல் உரிமையைப் பெற்றுக்கொடுப்பதற்காக, அவர்களுடைய அரசியல் அபிலாஷைகளைப் பூர்த்தி செய்வதற்காகத்தான் எங்களுடைய கட்சி உருவாக்கப்பட்டது. இந்த நாட்டிலே 'சமஷ்டி' அடிப்படையில் தமிழ் மக்களுக்குக் கௌரவமான ஓர் அரசியல் தீர்வு வழங்கப்பட வேண்டும் என்ற வகையில்தான் எங்களுடைய கட்சியின் செயற்பாடுகள் அதிகளவாக அமைந்திருக்கின்றன. தமிழ் மக்களுடைய பிரதானமான கட்சியாகவும், இன்று பாராளுமன்றத்திலே மூன்றாவது பிரதானமான கட்சியாகவும் இருக்கின்ற எங்களுடைய இலங்கைத் தமிழரசுக் கட்சிக்கு எங்களுடைய தமிழ் மக்கள் வாக்களிக்கும்பொழுது, மிக முக்கியமாகத் தங்களுடைய அரசியல் இருப்புக்காக, அரசியல் எதிர்காலத்துக்காக, அரசியல் நலனுக்காக, அரசியல் தீர்வுக்காகத்தான் வாக்களிப்பார்கள்.

இது கார்த்திகை மாதம்! எமது இனத்தினுடைய விடுதலைக்காகப் போராட்டத்திலே ஈடுபட்டு, கொல்லப்பட்டு இந்த மண்ணிலே விதைக்கப்பட்ட ஆயிரக்கணக்கான போராளிகளை நினைவுகூரும் மாதம்! எங்களுடைய வடக்கு, கிழக்குப் பூராவும் எங்களுடைய இனத்தினுடைய விடுதலைக்காகப் போராடிய அந்த வீர மறவர்களுக்காக அஞ்சலி செலுத்தப்படுகின்ற மாதம்! நேற்றைய தினம்கூட, JVPயினுடைய போராளிகளை நினைவுகூருமுகமாக அந்தக் கட்சியைச் சேர்ந்த முக்கியஸ்தர்கள் கொழும்பிலே நிகழ்வொன்றை நடத்தியிருந்தார்கள். அவ்வாறுதான், இந்த மாதத்தில் வடக்கு, கிழக்கு பூராவும் எங்களுடைய மக்களுடைய விடுதலைக்காக ஆயுதம் ஏந்திப் போராடிய அந்தப் போராளிகளை நினைவுகூருவார்கள். அந்த வகையில், தமிழ் மக்களுக்காகப் பொறுப்புடன் செயற்படுகின்ற பிரதானமான தமிழ்க் கட்சியாகிய, தமிழ் மக்கள் அந்தப் பொறுப்பை வழங்கிய கட்சியாகிய இலங்கைத் தமிழரசுக் கட்சிக்கு தமிழ் மக்களுடைய எதிர்காலத்தைப் பற்றி சிந்திக்க வேண்டிய தேவை இருக்கிறது. எனக்கு ஏனைய கட்சிகளைப் பற்றி தெரியாது.

அந்த அடிப்படையிலே பார்க்கின்றபோது, நான் சொன்னதுபோல ஆயுதம் ஏந்திப் போராடிய எத்தனையோ ஆயிரக்கணக்கான போராளிகளை இந்த மண்ணிலே விதைத்து, எத்தனையோ இழப்புகளைச் சந்தித்த ஓர் இனத்துக்கு வெறுமனே இந்த வரவு செலவுத்திட்டத்தில் கொக்கிளாயிலே பாலம் அமைப்பதற்காக ஓர் ஆய்வு செய்வதற்கு நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது. அது ஆய்வு மட்டும்தான்! கொக்கிளாயில் பாலம் கட்டலாமா என்று ஆய்வு செய்வதற்காக நிதி ஒதுக்கப்பட்டிருக்கிறது. மட்டக்களப்பிலே 2 பாலங்கள் கட்டுவதற்காக ஆய்வு செய்வதற்கு நிதி ஒதுக்கப்பட்டிருக்கிறது. இவ்வாறான விடயங்களுக்காக அரசாங்கத்தை நாங்கள் ஆதரிக்க வேண்டும் என்றோ, அரசாங்கத்துடன் நாங்கள் சேர்ந்து பயணிக்க வேண்டும் என்றோ இலங்கைத் தமிழரசுக் கட்சி நினைக்க முடியாது. ஏனென்று சொன்னால், தமிழ் இனம் இத்தனை ஆயிரம் உயிர்களைத் தியாகம் செய்தது ஒரு பாலத்துக்காக அல்ல! இன்று எங்களுடைய இந்த வரவு செலவுத்திட்டத்தின் உள்ளடக்கத்தைப் பார்த்தோம் என்று சொன்னால் கூடுதலாக -

They are called placeholder projects. As the main Tamil political party that represents the Tamil people, Hon. Deputy Speaker, we cannot agree with or support the Government just because the Government has allocated money to do a feasibility study to build a bridge in Trincomalee.

Our party stands for the constitutional struggle of the Tamil people. That is why our party was created, to ensure the political rights of the Tamil people through a new Constitution so that they could live with dignity, they could govern themselves and be equal citizens of this country. Equality cannot be just on paper, where somebody would say, "Oh! All of us are Sri Lankans now. Let us come together as Sinhalese, Tamils and Muslims. Let us be equal". That is not equality. Every citizen is entitled to their political rights.

Even within the Budget, Sir, there are a lot of gaps. If you take development of the Northern Province, last year, the Government said that they had allocated funds to develop the Northern Province. But, if you go back and check the amount spent out of the allocations that were made, you would be surprised to find that most of the allocations had not been spent. This year, I saw that funds have been allocated for the Eastern Province: Rs. 29.6 billion. A Provincial Council which is under a Governor with no elected representatives will get these allocations. We do not know whether those will be spent or how they will be spent. The Illankai Tamil Arasu Kadchi's stance is that, at least for now and untill we come to an agreement and find a solution through a new Constitution, the Provincial Council Elections should be held. Even that is not being done.

இந்த வரவு செலவுத்திட்டத்திலே கால்நடைகளுக்கான சில ஒதுக்கீடுகள் செய்யப்பட்டிருப்பதைப் பார்த்தேன். மொத்தமாக 4.2 பில்லியன் livestock அமைச்சிற்கு ஒதுக்கப்பட்டிருக்கிறது. ஆனால், வடக்கு, கிழக்கிலே இருக்கின்ற தமிழ் மக்களுடைய மேய்ச்சல் தரைகளை மகாவலி அதிகாரசபை வேறு இனத்தவர்களுக்கு வழங்கிக் கொண்டிருக்கின்றது.

அடுத்ததாக, Maduru Oya Right Bank Development Project, which is mentioned in the Budget Speech, அதனை அபிவிருத்தி செய்வதாகச் சொல்லப்பட்டிருக்கிறது. மட்டக்களப்பு

எல்லையில் இருக்கின்ற மாதுரு ஓயா தெற்குப் பிரதேசத்தை அபிவிருத்தி செய்வதென்றால், அங்குள்ள காணி சம்பந்தமாக எங்களுக்குப் பல பிரச்சினைகள் இருக்கின்றது. அரசாங்கத்தினுடைய நல்ல விஷயங்களை நாங்கள் வரவேற்கின்றோம்.

ආණ්ඩුව කරන හොඳ දේවල්වලට අපේ සහයෝගය තිබෙන බව අපි හැම අවස්ථාවකදීම කියලා තිබෙනවා. ආණ්ඩුව කුඩු අල්ලන එකට අපේ සහාය ලබා දෙන්න ලැස්තියි කියලා අපි කියා තිබෙනවා. ආණ්ඩුව වංචා සහ දූෂණය කරන අය අල්ලන එකට අපේ සහයෝගය ලබා දෙන්න ලැස්තියි කියලා අපි කියා තිබෙනවා. ආණ්ඩුව කරගෙන යන හොඳ වැඩවලට අපේ සහයෝගය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව මඩකලපුව දිස්ත්‍රික්කයේ පාලමක් හදන්න feasibility study එකක් කරනවාය කියන පදනම මත අපට ආණ්ඩුවේ අය වැයට සහයෝගය දෙන්න බැහැ. මේ සභාව ඇතුළතදීත්, සභාවෙන් පිටදීත් සමහර අයට කියන්න පුළුවන්, "අපට 159ක් තිබෙනවා. ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයේ සහයෝගය දුන්නත් එකයි. විරුද්ධව දුන්නත් එකයි. මධ්‍යස්ථව හිටියත් එකයි. අපට අදාළ නැහැ" කියලා. හැබැයි, මතක තියා ගන්න, ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂය කියන්නේ, ශ්‍රී ලංකාවේ ජීවත් වන දෙමළ ජනතාවගේ ප්‍රධාන පක්ෂය කියන එක. අපි ආසනයක්, ආසන දෙකක් අරගෙන, නැත්නම් අහම්බෙන් පාර්ලිමේන්තු ආපු අය නොවෙයි. අපි අවුරුදු 75කට වැඩි කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂයක්. දෙමළ ජනතාවගේ දේශපාලන අභිලාෂය මේ පාර්ලිමේන්තුව තුළ මේ අය වැයේදී අපි ගන්නා තීරණය තුළින් ජාත්‍යන්තරයට සහ රටේ ඉන්න සමස්ත දෙමළ ජනතාවට ලැබෙනවා. මේ අදහස ඉදිරිපත් කරන එක තමයි මේ අය වැයේදී අපේ ඡන්දයෙන් සිදු වෙන දේ කියන එක මතක තියා ගන්න. මොකද, තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙන බව හැමෝම දන්නවා. එහෙම බැලුවොත් අය වැයක් ඉදිරිපත් කරන්නත් ඕනෑ නැහැ. අය වැයක් කියන්නේ, financial, එහෙම නැත්නම් ගණන් හෝ මුදල් සම්බන්ධ දෙයක් පමණක් නොවෙයි. මේ රට තුළ ඉදිරි අවුරුද්ද ඇතුළත ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තමයි අය වැයෙන් ඉදිරිපත් වෙන්නේ. අපි ප්‍රධාන වශයෙන් ගත්තාම,-

Sir, through the Budget, even though there are certain allocations made to the Northern Province and the Eastern Province, we have always raised the fact that unless connectivity to the North and the East is improved or developed, development of the North and the East would not be sustainable. The economies of those two provinces would not thrive unless connectivity is increased, but, unfortunately, if you look at development of ports and airports, even through this Budget, from the 2026 Citizens Budget, only Rs. 4 billion has been allocated. It is in page numbers 16 to 20. Going further, Sir, the Hingurakgoda Airport is the only airport that has clear commitments from the Government. What about the Palaly International Airport? What about the Batticaloa Airport? What about the KKS Harbour? What about the Trincomalee Harbour? When are we going to develop those harbours? So, if you really want to develop the North and the East of this country and want to do something for the Tamil people, you should look at developing those ports, at least. So, you have to develop those ports.

Sir, I saw that there were some allocations for the Agriculture Sector Modernization Project. For agriculture modernization, the entire Mahaweli Project needs to be revisited. All remaining lands under the Mahaweli Irrigation Project must be given to the Tamil people because, under the Mahaweli Act, land must be divided based on the national ethnic ratio of this country, but, to date, the Tamil people have not got their share of land. So, that is how you develop the agriculture industry in the North and the East! Therefore, give those lands to the Tamil people who are landless. But, there are no proposal which states that land is being allocated. So, there are huge gaps between the election Manifesto of the NPP and Budget, 2026.

ජනාධිපතිතුමා පැය හතරකට වැඩි කාලයක් කරපු කථාවක සියලු කාරණා අපට විනාඩි 16කින් කියන්න බැහැ. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සහ මේ අය වැය අතර විශාල පරතරයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අස්වැසුම ගත්තත් එහෙමයි. අද කථා කරපු හැම මන්ත්‍රීවරයාම වතුකරයේ දෙමළ ජනතාවගේ පඩි වැඩි කිරීම ගැන කථා කළා. මම දැක්කා මන්ත්‍රීවරයෙක් කියනවා, "විපක්ෂයේ මන්ත්‍රීවරු කවුරු හරි අය වැයට විරුද්ධව ඡන්දය දෙනවා නම් වතුකරයේ දෙමළ ජනතාවට විරුද්ධ නිසා තමයි එහෙම ඡන්දය දෙන්නේ" කියලා. මොන විහිළුවක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? එහෙම නම් මේ අය වැය හදන්න තිබුණා, අන්න ඒ කාරණය විතරක් දාලා. වතුකරයේ දෙමළ ජනතාවට විපක්ෂය අසාධාරණයක් කරනවා නොවෙයි. හැබැයි, රුපියල් 2,138ක මුදලක් වතුකරයේ දෙමළ ජනතාවගේ පඩිය වැඩි කරනවා කිව්වේ ඡන්දයට පෙර ජාතික ජන බලවේගයට සම්බන්ධ trade unions. රුපියල් 1,700 කළාම ඒකේ නෛතිකභාවය පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. වතුකරයේ දෙමළ ජනතාවට ආණ්ඩුවෙන් රුපියල් 4,000ක් දුන්නත් විපක්ෂයේ ඉන්න සියලුදෙනාම එකඟයි. හැබැයි, දෙන්න ඕනෑ ක්‍රමයක් තිබෙනවා. වතුකරයේ ඉන්න දෙමළ ජනතාවගෙන් සියලු කණ්ඩායම් - Malaiyagam Tamil community - එකේ සියලුදෙනාම දැන් තේ වතුවල වැඩ කරන අය නොවෙයි. ඒක මතක තියා ගන්න. They want to live with dignity as well. Not all of them work in the estates anymore. Also, there are other issues like land rights. ඒ ජනතාවට ඉඩම් අයිතිය ලබා දෙන්න ඕනෑ; නිවාස ලබා දෙන්න ඕනෑ. ඉන්දියානු රජයෙන් ලබා දුන් නිවාස මාසයකට පෙර භාර දුන්නා. ඒක හොඳයි.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඉතා පැහැදිලිව කියා තිබෙනවා, වතුකරයේ දෙමළ ජනතාවට නිවාස හදලා දෙනවා කියලා. හැබැයි, මට පෙනෙන විධියට සමස්තයක් වශයෙන් නිවාස අමාත්‍යාංශය හරහා හදන නිවාසවලින් කොටසක් තමයි ඒ ගොල්ලන්ට දෙන්නේ. එහෙම නැතුව විශේෂයෙන් ඒ අයට නිවාස හදලා දීමක් පෙනෙන්න නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සඳහන් කළා වාගේම අපේ පක්ෂය ස්ථාපනය කළේ, අපේ පක්ෂයට ජනතාව ඡන්දය දෙන්නේ, අපේ පක්ෂය ජනතාව ඉස්සරහට ගිහිල්ලා ඡන්දය ඉල්ලන්නේ, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළින් මේ රට තුළ ජීවත් වන දෙමළ ජනතාවගේ දේශපාලන අයිතිවාසිකම් ලබා ගැනීම සඳහායි. ඒ වාගේම අතුරුදන් වූ පුද්ගලයන්ට සාධාරණයක් වෙන්න ඕනෑය කියන මතයේ අපි ඉන්නවා. ඒ සිදු වෙච්ච මානව හිමිකම් උල්ලංඝනයවීම්වලට සාධාරණයක් වෙන්න ඕනෑය කියන මතයේ අපි ඉන්නවා. ඉතින් ඒ පිළිබඳව කටයුතු කරන්න තමයි අපේ පක්ෂයට ප්‍රධාන වශයෙන් mandate එකක් ලැබී තිබෙන්නේ. ඒ ඒ විෂයයන්වලට අදාළව ඉදිරි දිනවලදී පැවැත්වීමට නියමිත අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී කථා කරන්න පුළුවන්.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ඉඩම් සම්බන්ධ ගැටලු නිරාකරණය කර ගන්න අපේ පක්ෂයට ජනතාව ඡන්දය දීලා තිබෙනවා. ඒ Archaeology Department එක Forest Department එක සම්බන්ධ සියලු ඉඩම් ප්‍රශ්න. හමුදාවේ ඉඩම් යම් ප්‍රමාණයක් නිදහස් කරලා තිබෙනවා. මම මුලින් කිව්වා වාගේ ඒකට ඇත්තටම අපි ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, තවත් ගොඩක් දුර යන්න තිබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පක්ෂය අද හවස පැවැත්වෙන ඡන්ද විමසීමේදී ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් තීන්දුවක් ගත්තා. ඒ සඳහා ඉතිහාසයේ - historic - යම් යම් දේවලුත් කියන්න ඕනෑ. අපේ පක්ෂය ආණ්ඩුවත් එක්ක සාකච්ඡාවක නිරත වෙලා හිටපු අවස්ථාවලදීත් -මම එතකොට පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ- මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවටත් අපි ඡන්දය දීලා තිබෙනවා; සහයෝගය දීලා තිබෙනවා. යහපාලන ආණ්ඩුව කාලයේ විපක්ෂ නායක ධුරය දරන ගමන් වුණත් අපි ආණ්ඩුවත් එක්ක වැඩ කරලා තිබෙනවා. හැබැයි, මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුද්දක් වාගේ කාලයක් තුළ ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයට ආණ්ඩුවත් එක්ක සම්බන්ධයක් ඇති කරගෙන වැඩ කරන්න, සෑහීමට පත් වෙන්න පුළුවන් තත්ත්වයක මේ ආණ්ඩුවේ යම් යම් කටයුතු තිබිලා නැහැ. මීට සතියකට පෙර පැවැති අපේ රැස්වීමේදීත් අපි පක්ෂයක් වශයෙන් මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්න ඕනෑය කියන මතයේ හිටියා. මේ ආණ්ඩුව අවුරුද්දක් ඇතුළත දෙමළ ජනතාව රවටලා තිබෙන්නේ, අපේ සාධාරණ ඉල්ලීම්වලට ඇහුම්කන් දීලා නැහැ කියන පණිවුඩය මේ රටේ ජනතාවට සහ ලෝකයේ ජනතාවට දෙන්න අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්න ඕනෑය කියන මතයේ අපේ පක්ෂයේ බොහොමයක් අය හිටියා.

හැබැයි, මම පෙර කිව්වා වාගේම අපේ පක්ෂයේ පිහිටෙව්වේ, දෙමළ ජනතාවගේ දේශපාලන අයිතිවාසිකම් වෙනුවෙන්. ඒ නිසා අපි ජනාධිපතිතුමා කෙරෙහි තවමත් විශ්වාසය තබාගෙන ඉන්නවා. ජනාධිපතිතුමා ලබන සතියේ අපේ පක්ෂයත් එක්ක සාකච්ඡාවක් පවත්වන්න, අපේ මේ තිබෙන කරුණු කාරණා පිළිබඳව සාකච්ඡාවක් පවත්වන්න අපට වෙලාවක් ලබා දීලා තිබෙනවා. ආණ්ඩුවට අවුරුද්දයි ගිහිල්ලා තිබෙන්නේ. ඒ කියන්නේ අපට තවමත් කාලය තිබෙනවා. තවත් අවුරුදු හතරක් තිබෙනවා ආණ්ඩුවේ කාලය, අපේ ගැටලු නිරාකරණය කර ගන්න, සාකච්ඡා කරන්න.

ඒ නිසා ජනාධිපතිතුමා කෙරෙහි විශ්වාසය තබලා, only at today's Vote, our party will abstain from voting. We will not vote for or against the Government only as a measure of goodwill, trusting and putting our faith in the President that he would resolve our issues, he would listen to us, he would look after the Tamil people's political issues, he would bring in a new Constitution which would include the Tamil people's aspirations, he, in the upcoming months, at least, on the accountability issues, would listen to the victim community and that he would act even on land issues. So, it is only because we want to engage and as a goodwill gesture that we will abstain from voting. And, we have four more years to oppose, if nothing is done.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rasamanickam, would you please wind up?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir.

So, if nothing is done next year, maybe, we will oppose next year. But, like I said, the Ilankai Tamil Arasu Kadchi's abstaining from the Vote is a serious message sent out to the entire world that we are still trying to work and that we still want to work with the Government. Therefore, now, it is the President's responsibility. It is only because the President has given us time to meet him in the coming week that we have taken the decision to abstain from voting for the Budget, 2026.

Thank you, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Nandana Millagala. You have 10 minutes.

[අ.භා. 1.49]

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාලිමාව ආණ්ඩුවේ -අපේ ආණ්ඩුවේ- 2026 සඳහා වන අය වැය යෝජනාවලිය ඉදිරිපත් කරලා විවාද කරන මේ මොහොතේ මට කථා කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා.

මීට පෙර අදහස් ඉදිරිපත් වුණා, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල මලෛයහ ජනතාවට රුපියල් 2,100ක වැටුප් වැඩි කිරීමක් ලබා දෙන්න පොරොන්දු වෙලා තිබුණා කියලා. නමුත්, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හෝ වෙන යම් තැනක එසේ සඳහන් වෙලා නැහැ. හැබැයි, අපි රුපියල් 200ක පැමිණීමේ දීමනාවක් ලබා දීම සඳහා ඉතා පැහැදිලිව කටයුතු කර තිබෙනවාය කියන එක සඳහන් කරමින්, ඒ මන්ත්‍රීතුමා නිවැරැදි කරමින් මගේ අදහස් ප්‍රකාශ කිරීමට පිවිසෙන්න කැමැතියි.

ආණ්ඩු පක්ෂය විධියට අපේ රට නිවැරැදි දියුණු දිශාවකට යොමු කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන අය වැය යෝජනාවලිය පිළිබඳ අපි අපේ ප්‍රතිපත්තිමය කාරණා ඉදිරිපත් කරන අවස්ථාවේදී, විපක්ෂයේ සියලුදෙනාගෙන්ම නොවුණත් විශාල පිරිසකගෙන් ඉදිරිපත් වෙච්ච අදහස් බොහොමයක තිබුණේ කිසියම් ආකාරයක ද්වේෂසහගත, වෛරී ප්‍රකාශ කියලා තමයි මට දැනුණේ. ඒ ගෝරණාඩු ප්‍රකාශ ඇහෙන කොට මා කියවූ කෘතියක උපුටනයක් ඉදිරිපත් කරන්න මට හිතුණා. එයින් කථාවට ප්‍රවේශ වෙන්න මම කල්පනා කළා.

වී.අයි. ලෙනින් කියන්නේ දාර්ශනිකයෙක්, දේශපාලනඥයෙක්, ශ්‍රේෂ්ඨ නායකයෙක්. "ලෙනින් - තෝරාගත් කෘති, වෙළුම 8" හි 60 වන පිටුවෙන් උපුටා ගැනීමක් තිබෙනවා.

"මහ පැරණි ගස් කපා හෙළීමේ දී විසිවන සෑම අතිරේක අතු කැබැල්ලක් ගැන බොලරුසොව්ගේ පටන් මාර්තව් දක්වා වූ - එකල හිටපු අය ගැනයි මේ කියන්නේ- ධනපති සමාජයේ සුරතල් බල්ලන් කෙඳිරිගෑවාවේ; බිරුවාවේ. නිර්ධන පංති ඇතා දැක බිරීමට නොවේ නම් ඒ සුරතල් බල්ලන් සිටින්නේ කුමට ද? ඔවුන් බිරුවාවේ. අපි අපේ මග යන්නෙමු."

මට මේ අවස්ථාවේදී ඒ ශ්‍රේෂ්ඨ අදහස මතක් වුණා.

ඒ වාගේම මේ විධියේ පැරණි රුසියානු කියමනක් තිබෙනවා.

"හොඳ දෙයක් වෙනුවට හොඳ දෙයක් දීම කාටත් කළ හැකිය. එහෙත් නරක දෙයක් වෙනුවට හොඳ දෙයක් දිය හැක්කේ නිර්භීත මිනිසුන්ට පමණි."

අපි අපේ ආණ්ඩුව ලබා ගන්නා මොහොතේ මේ රටේ තිබුණේ හොඳ දේශපාලන වටපිටාවක්වත්, හොඳ ආර්ථික වටපිටාවක්වත්, හොඳ සංස්කෘතික, සමාජ වටපිටාවක්වත් නොවෙයි. හැම අතින්ම පරිහානියට පත් වෙච්ච රටක් තමයි අප හමුවේ නිර්මාණය කර තිබුණේ. එබඳු රටක සියල්ල හොඳ තත්ත්වයේ තිබුණේ නැහැ. නරක වටපිටාවක් තමයි අප හමුවේ තිබුණේ. ඒ නරක දේ වෙනුවට හොඳ දෙයක් දෙන්න තමයි ආණ්ඩුව විධියට අපි අපේ මේ අය වැය යෝජනාවලිය ඉදිරිපත් කර තිබෙන්නේ. ඒක කරන්න පුළුවන් නිර්භීත මිනිසුන්ට පමණයි.

මුදල් අමාත්‍යවරයා හැටියට ජනාධිපතිතුමා 2026 වසර සඳහා අය වැය කථාව ඉදිරිපත් කරන කොට ඉදිරිපත් කළ එක අදහසක් තිබුණා. විශේෂයෙන් මෙම අය වැය ඉදිරිපත් කරන අවස්ථාව වන විට අප පසු වන තත්ත්වය පිළිබඳව අවධානය යොමු කරමින් එතුමා කියනවා, "නිරහංකාර ආත්ම තෘප්තියකින් අපේ ජනතාවාදී ආණ්ඩුවේ දෙවන අය වැය -2026 වසර සඳහා වන අයවැය- ඉදිරිපත් කරනවා" කියලා. අන්න ඒ නිරහංකාර ආත්ම තෘප්තිය අපටත් තිබෙනවා.

ඒකට හේතුව මේකයි. 2025 අවුරුද්ද සඳහා අපි ඉදිරිපත් කළ අය වැය දැන් මාස 8ක්, 9ක් තිස්සේ ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. එම අය වැය ක්‍රියාත්මක වෙමින් තිබෙන මේ කාල සීමාව ඇතුළත අපට පුළුවන් වෙලා තිබෙනවා, දූෂණයට එරෙහි ශක්තිමත් සහ වේගවත් ක්‍රියාමාර්ග ගැනීමට; ජාති, ආගම් ආදි අන්තවාදය වෙනුවට ජනතා පරමාධිපත්‍යය සහිතව ආණ්ඩුකරණයේ නිරත වීමට; නීතියේ ආධිපත්‍යය සහ විධානය ස්වාධීන කළ රටක් විධියට මේ රට ගොඩනැඟීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට; මහජන මුදල් අවභාවිත නොකර හොඳ මූල්‍ය විනයක් සහිතව මේ රට පවත්වාගෙන යෑමට. මත්ද්‍රව්‍ය හා පාතාලය මැඩලීමට ඍජු සහ නිවැරැදි තීන්දු තීරණ ගනිමින් කටයුතු කිරීමට හැකියාව ලැබෙමින් තිබෙන නිසා තමයි නිරහංකාර ආත්ම තෘප්තියක් සහිතව මෙම අය වැය ඉදිරිපත් කරන්න හැකියාව ලැබෙන්නේ කියා එතුමා සඳහන් කළා.

අපේ රටේ ආර්ථිකය අස්ථාවරව බිඳ වැටුණු, කඩා වැටුණු, දූෂිත තැනක තමයි තිබුණේ. ඒ දූෂිත සහ අස්ථාවර ආර්ථිකය වෙනුවට ස්ථාවර ආර්ථිකයක් ගොඩනඟන්න අවශ්‍ය මූල්‍ය පිළිවෙත් මේ අය වැය තුළ ඉතා පැහැදිලිව සඳහන් වෙනවා. රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමට සමත් වීම හරහා අපට පුළුවන්කම ලැබී තිබෙනවා ආර්ථිකමය වශයෙන් විතරක් නොවෙයි, සමාජ හා සංස්කෘතික දේහය තුළත් ඉතා දියුණු තීන්දු තීරණ ගන්නට සහ ඒවා ක්‍රියාවට නඟන්නට පුළුවන් වන විධියට අය වැය යෝජනා සකස් කරන්න සහ ඉදිරිපත් කරන්න.

මෙන්න මේ පදනම මත පිහිටා ඉදිරිපත් කර තිබෙන අපේ මේ අය වැය තුළ අපි විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට රුපියල් බිලියන 704ක් වෙන් කර තිබෙනවා. ඒ රුපියල් බිලියන 704 තුළ විශේෂයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය වාගේම පාසල් පද්ධතිය පිළිබඳව අවධානයක් යොමු කර තිබෙනවා. මෙහිදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, පිරිවෙන් සහ වතු පාසල් වාගේම, දහම් පාසල් ක්ෂේත්‍රය පිළිබඳවත් අවධානය යොමු කර තිබෙන බව. ඒකෙනුත් මම වැඩි අවධානයක් යොමු කරන්න කැමැතියි, වතු පාසල් පිළිබඳව. ඒකට හේතුව තමයි, මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට සහ බුලත්කොහුපිටිය කියන ආසනවලට අයත් කන්දල්ඔයවත්ත, නාගස්තැන්න, වෙවැල්තලාව, කලුපහනවත්ත, ඇඳුරාපොළවත්ත, හල්ගොල්ල ආදී ප්‍රදේශවල තිබෙන වතු පාසල් ඉතාම දුර්වල තත්ත්වයේ පැවතීම. ඒත් ඒ ජනතාව තේරුම් ගනිමින් ඉන්නවා, අධ්‍යාපනය හැරුණු කොට ඒ අයගේ ජීවිතවලට වෙන ගැලවීමේ මාර්ගයක් නැහැ කියලා.

එම පාසල් දියුණු කිරීම සඳහා අපේ අය වැයෙන් සැලකිය යුතු කොටසක් වෙන් කරලා තිබෙනවා. ඒ කියන්නේ ඔවුන්ට රජයෙන් දෛනිකව රුපියල් 200ක් ලබා දෙන එකෙන් එහාට ගිහිල්ලා ඔවුන්ගේ සමාජ ජීවිතය දියුණු කිරීම සඳහා තමයි මේ අය වැයෙන් මේ විධියට කටයුතු කරලා තිබෙන්නේ. 2026 සඳහා ඉදිරිපත් කරලා තිබෙන අය වැය යෝජනාවලිය හරහා අපි අපේක්ෂා කරන ඉලක්කවලට අනිවාර්යයෙන් ගමන් කරනවා. 2025දී අපි පදනම දැම්මා. ඒ පදනම මත පළමුවෙනි පියවර අපි 2026දී තබනවා. ඊළඟ වසරවල අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇතුළේ තිබෙන අනෙකුත් ඉලක්කවලට ගමන් කරනවා කියන පැහැදිලි ප්‍රකාශය කරමින්, මට අවස්ථාව සලසාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 12 minutes.

[අ.භා. 2.00]

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 සඳහා ජාතික ජන බලවේගය රජය ඉදිරිපත් කළ දෙවැනි අය වැය සම්බන්ධව අද දිනයේ ඉතා වැදගත් විවාදයක් පැවැත් වෙන අවස්ථාවක්. මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න මම කැමැතියි. මේ සතිය පුරාවටම මේ විවාදය පැවැත් වුණා. එහිදී තර්කයට නඟපු යම් කාරණා කිහිපයක් ගත්තොත්, විපක්ෂය විසින් ගොඩ නංවපු එක ප්‍රධාන විවේචනයක්, අදහසක් තමයි මෙම අය වැයෙහි න්‍යායික පදනම මොකක්ද, අපි දක්ෂිණාංශිකද, වාමාංශිකද, අපේ පදනම මොකක්ද කියන එක. ඒකට ප්‍රතිචාරයක් දක්වා මගේ කථාව පටන් ගන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේකට ජාතික අය වැය, එහෙම නැත්නම් සංවර්ධන අය වැය කියලා කිව්වාට, මම කැමැතියි මේක "කිසිවෙකු අත්නොහල අය වැය" කියලා හඳුන්වන්න. ඇයි එහෙම කියන්නේ? අපි 2025 අය වැයේදීත්, 2026 අය වැයේදීත් දිගටම ගත්ත ප්‍රධාන ප්‍රවේශයක් තමයි කිසිවෙකු අත්නොහැරීම. ඇයි කිව්වොත්, ඓතිහාසිකව සමාජයෙන් බැහැර කළ, දේශපාලනයෙන් බැහැර කළ කණ්ඩායමක් වෙත අප දක්වන සමානාත්මතාව පිළිබඳ සැලකිල්ල තමයි මේ අය වැයෙහි පදනම, ඒක තමයි අපේ දාර්ශනික පදනම, ඒක තමයි අපි ඇතුළත් කර ගැනීමේ පදනම කියලා මම හිතනවා. ඒක තමයි අපි සාධාරණත්වය - equity - පිළිබඳව ගෙනෙන පදනම. අධ්‍යාපනයට, සෞඛ්‍යයට, එහෙම නැත්නම් පොදු ප්‍රවාහනයට කොපමණ වැය බරක් දරනවාද, සමාජය විසින් පිළිනොගත් කණ්ඩායම්වලට, අව වරප්‍රසාදිත කණ්ඩායම්වලට

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය ]

කොපමණ වැය බරක් රජය විසින් දරනවාද යන්න මතම අපේ දේශපාලන සහ දාර්ශනික න්‍යාය පැහැදිලියි කියලා අපි විශ්වාස කරනවා. ඒක මුදල් වෙන්න පුළුවන්, රජයෙන් දෙන ආහාර, බඩු මලු වෙන්න පුළුවන්, අස්වැසුම, වැඩිහිටි දීමනා, ආබාධ සහිත අයට දෙන දීමනා, විශ්‍රාම වැටුප්, රජයේ සේවකයන්ට දෙන වැටුප් ආදී විධියට වෙන්න පුළුවන්. එහෙම නැත්නම් අපි 2025 පුරාවටම ක්‍රියාත්මක කරගෙන ගිය නිවාස ව්‍යාපෘති වෙන්න පුළුවන්. ඒ වාගේම දිගටම ක්‍රියාත්මක කරගෙන ගිය ආහාර ලබාදීම්, පෝෂ්‍යදායී බඩු මලු ලබාදීම්, පාසල් යන දරුවන්ට පොත්පත් ලබාදීම, සපත්තු ලබාදීම වාගේ දේවල් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම වෙන්න පුළුවන්. මේ සියල්ලම තමයි අපේ අය වැයෙහි සමානාත්මතාව පිළිබඳ පදනම, අතුළත් කර ගැනීම පිළිබඳ පදනම.

අපි පසුගිය කාලයේ ඉඳලා දිගටම කරගෙන ආවා වාගේ මෙවර අය වැයෙන් රුපියල් බිලියන 231ක් වෙන් කරලා තිබෙනවා, අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට ලබා දෙන පාසල් උපකරණ වෙනුවෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ලබා දෙන්නේ සපත්තු සඳහා ලබා දෙන වවුචර්වලට **අමතරව**. මුල්ම වතාවට 2025 අය වැය යෝජනාවක් අනුව තමයි සපත්තු වවුචර්වලට ලබා දෙන්න පටන් ගත්තේ. ජනතාව විශාල වශයෙන් නිෂ්පාදන ආර්ථිකයට සම්බන්ධ කර ගන්න වැඩසටහනක් අපි 2025දී ක්‍රියාත්මක කරගෙන ගියා. අපේ ප්‍රධාන අරමුණ වුණු නිෂ්පාදන ආර්ථිකය ඇති කිරීම, එයට ජනතාවගේ සහභාගීත්වය ඇති කර ගැනීම සහ එහි ප්‍රතිලාභ සාධාරණව ජනතාව අතට බෙදී යාම කියන ඉලක්ක තුන වෙනුවෙන් තමයි අපි 2025 පුරාවටම අපේ රාජ්‍යය පවත්වාගෙන ගියේ.

අපි පැහැදිලිවම නිසි, නිවැරදි මූල්‍ය කළමනාකරණයකින් සහ මූල්‍ය විනයකින් යුක්තව රජය පවත්වාගෙන ගිහිල්ලා තමයි මේ තත්ත්වයට, 2026දී වඩාත් හොඳින් සහන ලබාදිය හැකි තලයකට රජය ගෙනැල්ලා තිබෙන්නේ. මෙවර අපි මේ subsidies දෙන එක ගැන ලොකු විවාදයක් පැවැත්වුණා, මේ සතිය පුරාම. අපි වතුවල වැඩ කරන ශ්‍රමිකයින්ට රුපියල් 200ක දිරි දීමනාවක් ලබා දීම සම්බන්ධව ලොකු විවාදයක් ගියා. ඇත්තටම වතුවල වැඩ කරන අයට විතරද මේක දෙන්නේ? අපි විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික වෙනුවෙන් රුපියල් බිලියන 565ක් වෙන් කර තිබෙනවා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන සුභසාධන වැඩ සඳහා අපි රුපියල් බිලියන 10.65ක් වෙන් කර තිබෙනවා.

ඇත්තම කිව්වොත්, මේ අය වැය ස්ත්‍රීවාදී අය වැයක් ලෙස හඳුන්වන්න මම කැමැතියි. ඒ මොකද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 76 පිටුවේ -අපටත් වඩා හොඳින් මේක අපේ විපක්ෂයට කට පාඩම් නේ මේ දවස්වල- අපි පැහැදිලිවම කියනවා, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්මතාවය උදෙසා ආර්ථික සාධාරණත්වය, වැටුප් නොලබන **සුරැකුම්** ශ්‍රමය ආර්ථිකයට සිදු කරන දායකත්වය අගයන රාජ්‍ය ප්‍රතිපත්ති කියන මූලධර්ම දෙක පිළිබඳව. එහෙනම්, මොනවාද අපි මේ අවුරුද්ද පුරාවට වැටුප් නොලබන ශ්‍රමය ජාතික ආර්ථිකයට ගෙනෙන්න කරලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

අපි ගිය අවුරුද්දේම අපේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ එක් දිශානතියක් වෙනුවෙන් වැඩ කළා. දිවා සුරැකුම් මධ්‍යස්ථාන වෙනුවෙන් මෙවරත් අපි රුපියල් බිලියන 0.35ක් වෙන් කර තිබෙනවා. ඇයි, මේක වැදගත් වෙන්නේ? අපේ රැක බලාගැනීමේ වගකීම, කාන්තාවන් සතු රැකවරණ වගකීම්වලට වැටුපක් ගෙවන්නේ නැහැ. ඒවා රජය විසින් බලාගන්න ඕනෑ කියන පදනම අපි මේ අය වැයට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි අපි වැඩිහිටියන් වෙනුවෙන් වැඩිපුර වැය කිරීම් කරද්දී, පොදු ප්‍රවාහනය සහ අධ්‍යාපනය වෙනුවෙන් වැඩිපුර වැය කිරීම් කරද්දී, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, වැඩිහිටි මධ්‍යස්ථාන, ආබාධ සහිත අය වෙනුවෙන් කරන වැය කිරීම් කරද්දී මෙන්න මේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමය කියන දේ තමයි ජාතික ආර්ථිකයට එකතු වන්නේ. මේක තමයි රජය විසින් දරන වැය බර, වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමය වෙනුවෙන්. ඒ වාගේම, කවදාවත් ලංකාවේ ඔටිසම් සහිත දරුවන් ගැන කථා කළේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආබාධ සහිත දරුවන්ට, ආයතනගත දරුවන්ට විශේෂයෙන් ඔවුන්ගේ නමින් බැංකු ගිණුම්වල මුදල් එක් රැස්වන "අර්ථ" කියලා වැඩසටහනක් අපි පටන් ගත්තා. ඉතිහාසයේ කවදාවත් මෙබඳු අය වැය යෝජනා තිබුණේ නැහැ. මම විශේෂයෙන් මේ වැදගත් කාරණයත් කියන්න කැමැතියි. ආබාධිත කෙනෙක් පෞද්ගලික ආයතනයක රැකියාවකට බඳවා ගත්තොත්, රජයෙන් රුපියල් 15,000ක උපරිමයකට යටත්ව දීමනාවක් ඒ අයගේ වැටුපට ලබා දෙනවා. මේවා තමයි subsidies.

මට හරිම කනගාටුවක් දැනෙන කාරණයක් තමයි, ඇයි මේ වතු සේවකයින්ගේ රුපියල් 200 වෙනුවෙන් මෙච්චර ලොකු අරගළයක් කරන්න යන්නේ කියන එක. ඒ වෙන මොකවත් නිසා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ඒ කණ්ඩායම් වත්තේ ශ්‍රමිකයන් වට කරගෙන කරපු දේශපාලනය දැන් මේ නිසා ඉවර වෙලා තිබෙනවා. අපි ඇත්තටම වත්තේ වැඩ කරන ශ්‍රමිකයන් ගැන හිතන ආණ්ඩුවක් බවට පෙනී යන නිසා දැන් මේ දේශපාලනය ඉවර වෙලා යයි කියන බයට තමයි මේක කරන්නේ. එක් අතකින් මම සතුටු වෙනවා, අපේ ගරු විපක්ෂ නායකතුමා ප්‍රකාශයක් නිකුත් කර තිබුණා, "මේක කිසි ප්‍රශ්නයක් නැහැ, අපි කැමැතියි" කියලා. එතුමා තව හොඳ යෝජනා වගයකුත් කරලා තිබුණා. මම හිතන විධියට ඊයේ සහ පෙරේදා දෙකේම අපේ වතුවල වැඩ කරන ජනතාව පොල් ගැහුවා, මිරිස් ඇඹරුවා, ගම්මිරිස් ඇඹරුවා. සමහරවිට බයටද දන්නෙත් නැහැ, එහෙම කිව්වේ. කොහොම වුණත් මම විපක්ෂ නායකතුමාට කියනවා, ඔබතුමා ළඟම ඉන්න,- දැන් රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය අල්ලස් කොමිසමට සහ විගණකාධිපතිට ලියලා තිබෙනවා. ඇත්තටම එතුමිය දැනගන්න ඕනෑ, අල්ලස් කොමිසම සහ විගණකාධිපති සතු වගකීම් සහ කාර්යභාරය වන්නේ පාර්ලිමේන්තුවේ සම්මත වන පනත්වල නීත්‍යානුකූලභාවය විමසීම නොවන බව. ඒ සඳහා අයිතිය තිබෙන්නේ වෙන තැනකට. ඒ අයිතිය තිබෙන්නේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට පමණයි. ඊළඟට, **විපක්ෂ නායකතුමාගේ** මාධ්‍ය ප්‍රකාශකතුමාත් විරුද්ධ වුණා. ඒ වුණාට ඊයේ අපේ චමින්ද්‍රාණි මන්ත්‍රීතුමිය මේකට සහයෝගය දක්වා කථා කළා. ඇත්තම කිව්වොත්, විපක්ෂය ඇතුළෙත් මේ සම්බන්ධව කිසි එකඟතාවක්, මතවාදයක් නැහැ. ඒ නිසා ගරු විපක්ෂ නායකතුමාගේ මතය විපක්ෂයේ ඉන්න අනෙක් කණ්ඩායම් ඇත්තටම නියෝජනය කරන්නේ නැහැ නේද කියන අදහස මෙතැනට ගෙනෙන්න මම කැමැතියි.

මම ලැබී තිබෙන කෙටි කාලයත් එක්ක මම මේ කාරණයත් කියන්නම්. "කිසිදු කණ්ඩායමක් අත් නොහැරීම" කියන තර්කය මත අපි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ග්‍රාමීය ආර්ථිකය නැංවීම,- විශේෂයෙන් මෙවර ක්‍රියාකාරී කාන්තා සමිතිවල සාමාජිකාවන්ට ස්වයං රැකියා වෙනුවෙන් රුපියල් මිලියන 240ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම සැපයුම් දාම කළමනාකරණය - supply chain management - සඳහා, නිෂ්පාදන සමුපකාර සමිති ගොඩනැංවීමට රුපියල් මිලියන 100ක්, ඒ වාගේම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන්ගේ කාරක ප්‍රාග්ධනය සඳහා සහ ගෙවතු වගා සඳහා රුපියල් බිලියන 18ක්, චක්‍රීය ණය රුපියල් බිලියන 59ක් වාගේ විශාල ප්‍රමාණයක වැඩ මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට පෙනෙනවා ඇති, මේ සියලු දේවල්වල දී අපි අල්ලා ගන්න උත්සාහ කරලා තිබෙන්නේ මේ කාන්තාවන් ආර්ථිකයට දායක වන තැන් බව. කාන්තාවන් ගෙවතු වගාවල, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල යෙදෙනවා. ඒ වාගේම කාන්තාවන් ග්‍රාමීය වශයෙන්, කුඩා පරිමාණ වශයෙන් කෘෂිකර්මාන්තයේ යෙදෙනවා. ඒ අය capture කර ගන්න, ඒ අයව අත්නොහැර මෙම නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගන්න තමයි මේවා ගෙනැල්ලා තිබෙන්නේ. එතැනදී මේවා උතුරට ද, දකුණට ද කියලා වෙන් කරල නැහැ. මුළු රටටම එක සේ ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ගම්මාන සඳහා ජීවනෝපාය සංවර්ධනය කියලා තවත් රුපියල් බිලියන දෙකක ව්‍යාපෘතියක් තිබෙනවා.

ඉතා වැදගත් කාරණයක් මම කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මෙවර විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා, පානීය ජල සැපයුම නංවන්න. විශේෂයෙන් අඩු ආදායම්ලාභී නිවාස ඒකක 20,000ක පානීය ජල ප්‍රශ්නය විසඳන්න, ප්‍රජා ජල සැපයුම් යෝජනා ක්‍රම 3,780ක් වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 ගත්තොත්, සැමට ජලය සහ සනීපාරක්ෂාව ලබා ගැනීම සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම රාජ්‍යයක වගකීම වෙනවා කියලා එහි සඳහන් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෙදරක වතුර නැති වුණාම ඒ පවුලේ කාන්තාවට තමයි විශාල බරක් යොමු වෙන්නේ කියලා අපි දන්නවා. එක්සත් ජාතීන්ගේ වාර්තාවල කියනවා, සාමාන්‍යයෙන් වතුර නැති පවුල්වල සියයට 80ක බර පැටවෙන්නේ කාන්තාවට කියලා. මොකද, වතුර ගෙන ඒම සඳහා දීර්ඝ දුර ප්‍රමාණයක් යන්න වෙන නිසායි එහෙම කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේක තමයි මම මුලිනුත් කියන්න අදහස් කළේ, මේක ස්ත්‍රීවාදී අය වැයක් ලෙස මම හඳුන්වන්නේ ඇයි කියලා. අපේ දැක්ම තිබෙන්නේ, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ යෝජනා කරපු, සමාජයේ අව වරප්‍රසාදිත සියලු කණ්ඩායම් ඇතුළත් කර ගන්නා සුළු න්‍යායික සහ ප්‍රායෝගික දැක්මක් වෙනුවෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශේෂයෙන් මෙහි දේශගුණික විපර්යාස ගැන කථා කරනවා. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ දේශගුණික විපර්යාස අතර තිබෙන සෘජු සම්බන්ධය අපි දන්නවා. ඒ ගැනත් අවධානය යොමු කරලා තිබෙනවා. ඒ ගැනත් වැඩසටහන් හදා ගෙන තිබෙනවා. මේ වන විට ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධයෙන් අපි කටයුතු කරගෙන යනවා. කාන්තාවන්ගේ යෝජනා අරගෙන, කලින් තිබුණු පනතට ටිකක් වෙනස් විධියට ඒ අලුත් පනත් කෙටුම්පත ගෙනෙන්න මේ වන විටත් ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් වෙලා සාකච්ඡා කරගෙන යනවා. ඒ වාගේම විශේෂයෙන් කාන්තාවන්ට බලපාන නීති සහ ප්‍රතිසංස්කරණත් මේ යෝජනාවල - අපේ ඊළඟ අවුරුද්දේ සැලසුමේ - තිබෙනවා.

එහෙම නම් මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ න්‍යායික පදනම ගැන තර්ක ගෙනාපු ගොඩාක් අයට මම පැහැදිලිවම මේ උත්තරය දෙනවා. අපේ න්‍යායික පදනම තමයි 'සියල්ලන් ඇතුළත් කර ගන්නා කිසිවකු අත් නොහරින අය වැයක්' කියන එක.

මට වේලාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. B. Ariyawansha. You have ten minutes.

[අ.භා. 2.12]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 වර්ෂයේ අය වැය පිළිබඳව පක්ෂ, විපක්ෂ මන්ත්‍රීතුමන්ලා විසින් දීර්ඝ වශයෙන් විස්තර කථා කළා. ඉතින්, අය වැයක් කියන්නේ ඉදිරි වර්ෂය සඳහා රජයේ ආදායම් සහ වියදම් ලේඛනගත කරලා ඉදිරිපත් කිරීමක්. ගරු ජනාධිපතිතුමා පසුගිය 07වෙනි දා පැය හතරහමාරක් පමණ පාර්ලිමේන්තුවේ දීර්ඝ විස්තරයක් කළා. අපි දන්නවා, මෙරටේ අය වැයක් ඉදිරිපත් කරනකොට ජනතාව විශේෂයෙන් බලාගෙන ඉන්නවා, ලැබෙන සහන මොනවාද කියලා; ඉදිරි වර්ෂය තුළ රටේ සංවර්ධිත ඉලක්ක සපුරා ගන්නේ මොන ආකාරයෙන්ද කියන කරුණු කාරණා පිළිබඳව දැඩි අවධානයෙන් ඉන්නවා. ඉතින්, මේ අය වැය තුළ ජනතාවගේ පැත්තෙන් සහන ලබා දීලා තිබෙනවා දැක්කා. විශේෂයෙන් සෞඛ්‍යය, අධ්‍යාපනය, ජීවන මට්ටම ඉහළ නැංවීම කළ යුතු වෙනවා. අය වැයක් සකස් කිරීමේ දී රටක දියුණුව සඳහා ජාතික ආරක්ෂාව විශේෂයෙන් වැදගත් වෙනවා. මෙහිදී අපි දකින ආකාරයට මේ පිළිබඳව ආණ්ඩුව විසින් දැඩි ලෙස ක්‍රියාත්මක වෙලා නැහැ කියලා තමයි අපිට කියන්න වන්නේ. අපි දැක්කා, සමහර කරුණු කාරණාවලදී යම් සාධනීය තත්ත්වයක් තිබෙන බව. විශේෂයෙන් වතුකරයේ ජනතාවට රුපියල් 1,750ක් දක්වා වැටුප් වැඩි කිරීමක් සිදු කරලා තිබුණා.

ඒ වාගේ දේවල් ඉතා වැදගත් වෙනවා. මම නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ වතු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වතුවල ජීවත්වන වතු කම්කරුවන්ගේ වැටුප වැඩි කිරීම සම්බන්ධව අපි විපක්ෂයක් වශයෙන් එකඟ වෙනවා. නමුත්, ඒ ජනතාවට වැටුප පමණක් වැඩි කිරීම ප්‍රමාණවත් වෙන්නේ නැහැ. මොකද, ඒ දමිළ ජනතාව අවුරුදු 200කට වැඩි කාලයක් වතුකරයේ සේවය කරනවා. ඔවුන්ගේ යටිතල පහසුකම්වල අඩුපාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඔවුන් ලැයිම් කාමරවල තමයි ජීවත් වෙන්නේ. ඒ එක ලැයිම් කාමරයක තුන් හතර දෙනෙක් ඉන්නවා. ඒ නිසා ඒ අයට අවශ්‍ය කරන නිවාස පහසුකම් ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම වතු ආශ්‍රිතව තිබෙන අක්කර දහස් ගණන් මුඩු ඉඩම් බවට පත් වෙලා තිබෙනවා. ඒ වතුකරයේ තේ, රබර් ඉතාම සුළු ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. ඒ නිසා මෙම ඉඩම්වලින් ප්‍රයෝජනයක් ගැනීම සඳහා ඒ ප්‍රදේශයේ රැකියා විරහිත අයට ඒ ඉඩම් වෙන්කර දීලා, රටට අපනයන ආදායමක් ලබා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරනවා නම්, එය වැදගත් වෙනවා.

ඒ වාගේම සෞඛ්‍ය ගැනත් අපි කථා කරන්න ඕනෑ. අද රෝහල්වල අත්‍යවශ්‍ය ඖෂධවල විශාල හිඟයක් තිබෙනවා. රජයේ රෝහලකට හෘද සැත්කමක් කර ගන්න ගියාම පොරොත්තු ලේඛනයේ ඉන්න වෙනවා. පොරොත්තු ලේඛනයේ අවුරුදු දෙක තුනක් ඉන්න අයත් ඉන්නවා. පෞද්ගලික රෝහලකින් හෘද සැත්කමක් කර ගන්න ගියොත්, රුපියල් ලක්ෂ 10ක්, 15ක්, 20ක් වාගේ විශාල මුදල් ප්‍රමාණයක් වැය වෙනවා. රජයේ රෝහලකින් හෘද සැත්කමක් කරගන්න ගියොත් පොරොත්තු ලේඛනයේ ඉන්න වෙනවා. ඒ අවස්ථාව උදාවෙනකොට සමහර විට ඒ රෝගියා මිය ගිහිල්ලා තිබෙන්න පුළුවන්. ඒ වාගේ තත්ත්වයක් අද උදාවෙලා තිබෙනවා. ඒ වාගේම වකුගඩු රෝගීන්ට අවශ්‍ය උපකරණවල හිඟයක් තිබෙනවා. ග්‍රාමීය රෝහල්වල අඩුපාඩුකම් රාශියක් තිබෙනවා. මම ජීවත්වන ප්‍රදේශයේ තිබෙන කොළොන්න මූලික රෝහලේ X-ray යන්ත්‍රය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය technician කෙනෙකුගේ පුරප්පාඩුව වසර ගණනාවක්ම තිබෙනවා. කොළොන්න වාගේ අතිදුෂ්කර ප්‍රදේශයක තිබෙන්නේ එක

[ගරු බී. ආරියවංශ මහතා]

රෝහලයි. ඒ වාගේ ග්‍රාමීය රෝහල්වල - ගොඩකවෙල ප්‍රදේශීය රෝහලේ, කහවත්ත මූලික රෝහලේ - අඩුපාඩු රාශියක් තිබෙනවා. ඒ රෝහල්වල ඉඩ පහසුකම් නැහැ. මම පසුගිය දවසක ඇඹිලිපිටිය මහ රෝහලට ගියා. ඒ රෝහලේ රෝගීන් පුටුවල, එහෙම නැත්නම් බංකුවල, එහෙමත් නැත්නම් බිම රෙද්දක් එළාගෙන ඉඳලා තමයි ප්‍රතිකාර ලබා ගන්නේ. ඒ වාගේ තත්ත්වයක් තුළ සෞඛ්‍යය වෙනුවෙන් මීට වඩා වැඩි අවධානයක් යොමු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි අධ්‍යාපනය. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල සඳහන් වුණා, මැතිවරණ වේදිකාවේදී කිව්වා, අඩු ආදායම්ලාභී පවුල්වල අයට පමණක් නොවෙයි පාසල් දරුවන් සියලු දෙනාටම අවශ්‍ය පාසල් උපකරණවලට පනවා තිබෙන VAT එක ඉවත් කරලා පහසු මිලට ඒවා ලබා ගන්න අවස්ථාව ලබා දෙනවා කියලා. ඒ පොරොන්දුව මේ වනතෙක් ඉටුවෙලා නැහැ. මේ වෙනකොට අවුරුද්දක් ගතවෙලා තිබෙනවා. මීට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමන්ලා විවිධ දේවල් කථා කළා. සමහර මන්ත්‍රීවරු මේ අය වැය පිළිබඳව කථා කරද්දී, ජනාධිපතිතුමාව දේවත්වයෙන් සලකනවා අපි දැක්කා. ඒ වාගේම ජනාධිපතිතුමාට මේ රටේ ජනතාව වැඳුම් පිදුම් කරනවා කියලා සමහර මන්ත්‍රීවරු කිව්වා. ඒ වාගේ තත්ත්වයක් උඩ අපි කියන්න කැමැතියි, මේ කාරණයත්. ජනාධිපතිතුමාගේ දිස්ත්‍රික්කය වන අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ මේ වනවිට ලූනු ගොවීන්, අල ගොවීන් විශාල වශයෙන් කන්නලව් කරන ආකාරය අපි මාධ්‍ය තුළින් දකිනවා. අල ටික, ලූනු ටික විකුණාගන්න බැරිව ඒ ගොවීන් ඉතා අසරණ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. අද ඒ පැත්තට යන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. එහෙම අවස්ථාවක එක සාධනීය කරුණක් සම්බන්ධයෙන් පමණක් සැලකීමක් කරන්න ජනතාව බලාපොරොත්තු වන්නේ නැහැ. අපි කියන්න කැමැතියි, ඉදිරි කාලය තුළ අනිවාර්යයෙන්ම පළාත් සභා මැතිවරණ පවත්වන්න කටයුතු කරන්න කියලා. එතකොට ඔබතුමන්ලාට පෙනේවි, ජනතාව මොන වාගේ තීන්දුවකද ඉන්නේ කියලා. ඒ වාගේ තත්ත්වයක් තුළ තමයි මේ අය වැය විවාදය අද පවත්වාගෙන යන්නේ. 2025 අය වැය ඉදිරිපත් කරලා අවුරුද්දකට ආසන්න කාලයක් ගත වෙලා තිබුණත්, වෙන් කළ මුදලින් සියයට 25ක්වත් මුදල් වියදම් කර ගන්න බැරි වෙලා තිබෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් ඉන්නවා. අපට විමධ්‍යගත ප්‍රතිපාදන ලැබුණේ නැහැ. මේ වසරේ මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කර ගන්න බැරිව ආපහු භාණ්ඩාගාරයට යවනවා. විමධ්‍යගත ප්‍රතිපාදන විධියට අපේ මන්ත්‍රීවරුන් තුන්දෙනාට රුපියල් මිලියන 30ක් ලබා දුන්නා නම්, අපි ඒ මුදල්වලින් ගම්වල මොනවා හරි සංවර්ධන කටයුතු කරනවා. ජල ව්‍යාපෘති සඳහා, වතුකරයේ එක එක ව්‍යාපෘති සඳහා අපි ඇස්තමේන්තු සකස් කරලාත් දුන්නා. නමුත්, ඒවාට මුදල් වෙන් කර නැහැ. ඉතින් මේ තුළත් මුදල් විශාල වශයෙන් අපතේ යාමක් සිදු වෙනවා. අපේ ජනාධිපතිතුමා පසුගිය දවස්වල රත්නපුර සම්බන්ධීකරණ කමිටුවට ආවා. එතුමා ඇවිල්ලා කිව්වේ, මේ මුදල් යවන්න එපා, මේවා වියදම් කරන්න, මේ රටේ ජනතාව වෙනුවෙන් ඒවා වියදම් කරන්න කියලා. හැබැයි, එහෙම වියදමක් කරලා තිබෙනවා කියලා අපි දකින්නේ නැහැ.

විශේෂයෙන්ම, ජනාධිපතිතුමාගේ දිස්ත්‍රික්කයේ අනුරාධපුර නගරය සංවර්ධනය සඳහා මිලියන 29.6ක් වෙන් කර තිබුණත්, මේ වෙනකොට ප්‍රගතිය බින්දුවයි. ඒ වාගේම අනුරාධපුර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට වෙන් කළ මුදල මිලියන 750යි, ප්‍රගතිය බින්දුවයි. ඒ වාගේම අවුරුද්දේ දවස් 365ම ජනාකීර්ණ නගරයක් වන කතරගම නගරය සංවර්ධනයට වෙන් කළ මුදල රුපියල් මිලියන 300යි. එහි ප්‍රගතියක් නැහැ. ඒ වාගේම රජය මහා ඉහළින් කථා කළ කාන්තා අයිතීන් ඉහළ නැංවීමට එම අමාත්‍යාංශයට වෙන් කළ මුදල රුපියල් මිලියන 7යි. වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 1යි. ඒ වාගේම මුළු අධ්‍යාපන ක්ෂේත්‍රයම දැස් දල්වාගෙන බලා සිටි උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව දීමනාව සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 200යි. ඒකේ ප්‍රගතියක් නැහැ. ඒ වාගේ පසුගිය අය වැය තුළ මේ රට සංවර්ධනය කරන්න තිබුණු දේවලින් සංවර්ධනයක් වෙලා නැහැ. 2026 වර්ෂය සඳහා මේ අය වැය තුළ වෙන් කර තිබෙන මුදල් ඒ වර්ෂය තුළ වියදම් කරලා, ඒ ප්‍රදේශවල ජනතාවට සහනයක් සලසන වැඩ පිළිවෙළක් මේ අය වැය තුළින් 2026 වසරේ හෝ ක්‍රියාත්මක වේවි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මේ අය වැය පිළිබඳව රටේ ජනතාව දැඩි බලාපොරොත්තුවෙන් ඉන්නවා. මොකද, පසුගිය මැතිවරණ වේදිකාව තුළ ඉදිරිපත් කළ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණු දේවල් ඉටු කරන තුරු රටේ ජනතාව බලන් ඉන්නවා. ඒ දේවල් මේ වෙනකොට ඉටු වෙලා තිබෙනවාද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම ඉදිරි වර්ෂයේ අය වැය ලේඛනය තුළිනුත් ඒවා ඉටු වන බවක් පෙනෙන්නේ නැහැ. මේ අය වැයත් පසුගිය අය වැය වාගේම පුස්සක් බවට පත් නොවන්න ඔබතුමන්ලා වගබලාගන්න. මේ වනකොට ආණ්ඩුවට අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. මේ අය වැය ඉවර වෙනකොට අවුරුදු දෙකයි. තව තිබෙන්නේ අවුරුදු තුනයි. ඉතින්, ඒ අවුරුදු තුන තුළ මේ රටේ විශාල සංවර්ධනයක් ඇති කරන්න අවස්ථාව උදා වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Vijitha Herath. You have 20 minutes.

[අ.භා. 2.22]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි භාර ගත්තේ බංකොලොත් වෙච්ච ආර්ථිකයක්. ආර්ථික සැලසුම්කරණය, මූල්‍ය විනය යටතේ අපේ ආර්ථිකය දවසින් දවස ශක්තිමත් කරලා ඉතාම කෙටි කාලයක් තුළ ස්ථාවර තැනකට ගේන්න අපි සමත් වෙලා තිබෙනවා. අද වනකොට අපි අවුරුද්දක් ගත කරලා තිබෙනවා. මේ අවුරුද්දක කෙටි කාලය තුළ අනාගතයේදී අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන දිශානතියට මෙහෙයවන්න අවශ්‍ය මූලික පදනම -අත්තිවාරම- අපි යොදා තිබෙනවා.

ඒ අත්තිවාරම යොදන තවත් එක් පියවරක් තමයි, අපි මේ ඉදිරිපත් කරපු අය වැය ලේඛනය. ලබන වසර සඳහා අපේ ආර්ථික ප්‍රතිපත්තිය, ඒ ප්‍රතිපත්තිය මත පදනම් වෙච්ච වැඩසටහන් තමයි මෙහි තිබෙන්නේ. ඉතා පැහැදිලිව අපි ඉතා ශක්තිමත් ගමනක් යනවා. මේ වනකොට අපේ රටේ ආර්ථිකය දවසින් දවස ස්ථාවර වෙමින් යනවා. ඒ වාගේම දැන් රටේ දේශපාලන ස්ථාවරත්වයක් තිබෙනවා. ජාතිවාදී, ආගම්වාදී ගැටුම් නැහැ. පසුගිය ඉතිහාසයේ තිබුණේ එහෙම තත්ත්වයක් නොවෙයි. ආර්ථිකය කඩාගෙන වැටෙන තත්ත්වයක් තිබුණා, වංචා

දූෂණවලින් පිරිච්ච තත්ත්වයක් තිබුණා. ජාතිවාදී, ආගම්වාදී කෝලාහල තිබුණා. අද මේ සියල්ලෙන් තොර ඉතාම සාමකාමී, ප්‍රජාතන්ත්‍රවාදී රටක් අපි නිර්මාණය කර තිබෙනවා. ඒ නිසා අපේ රටේ ජනතාව තමන්ගේ අනාගතය පිළිබඳව සුබවාදී බලාපොරොත්තු සහිතව ඉදිරියට යමින් තිබෙනවා. එවැනි මොහොතක තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ අය වැයේදී අපි ආර්ථිකයේ ඉලක්ක සාකච්ඡා කළා. දින ගණනාවක් තුළ ඒ පිළිබඳ අපේ දැක්ම ඉදිරිපත් කළා. විවිධ මන්ත්‍රීවරුන් විවිධාකාරයෙන් මේ සම්බන්ධව අදහස් ඉදිරිපත් කළා. අපේ මූලික ප්‍රතිපත්තිය සහ වැඩ පිළිවෙළ අපි ඉදිරිපත් කරලා තිබෙනවා. කවුරු මොනවා කිව්වත්, අපි ඒ ගමන ඉතාම ශක්තිමත්ව, සාර්ථකව ඉස්සරහට යනවා. රටේ ජනතාව ඒ ගමනත් එක්ක අත්වැල් බැඳගෙන බලාපොරොත්තු සහගතව ඉස්සරහට එනවා.

එවැනි මොහොතකදී තමයි අවුරුදු 200කට වැඩි කාලයක් අපේ රටේ ජාතික ධනය උපයන්න තමන්ගේ දහඩිය මහන්සිය වගුරපු මේ රටේ සිටින මලෙයහම් ජනතාවගේ ඒ අයිතිවාසිකම් වෙනුවෙන් අපි අද මැදිහත් වෙලා තිබෙන්නේ. අවුරුදු 200ක් තිස්සේ ඔවුන්ට හරියට ඉන්න හිටින්න තැනක් තිබුණේ නැහැ. අද වෙනකම් ඔවුන්ට හරියට ගෙයක් නැහැ, තමන්ගේම කියලා ඉඩම් කෑල්ලක් නැහැ, ජීවත් වීමට සරිලන වැටුපක් නැහැ. வீடு இல்லை, காணி இல்லை, சம்பளம் இல்லை. මේ තමයි, ප්‍රධාන ප්‍රශ්න තුන. එදා ඉඳලා අවුරුදු සිය ගණනක් මේ ජනතාව දුක් වින්දේ මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න. අද නිදහස් අධ්‍යාපනයේ අපි යමක් භුක්ති විඳිනවා නම්, නිදහස් සෞඛ්‍ය සේවයේ යම් අයිතිවාසිකමක් භුක්ති විඳිනවා නම්, අපේ රටේ ආර්ථිකය තුළ යම්කිසි හෝ වරප්‍රසාදයක් රටේ ජනතාව විධියට අපි භුක්ති විඳිනවා නම්, ඒ සියල්ල උපයන්න කැප කිරීම් කරපු ජනතාව තමයි මේ මලෙයහම් ජනතාව. අඩුම ගානේ මේ මලෙයහම් ජනතාවට තමන්ගේ සංස්කෘතික අනන්‍යතාව සහිත හඳුන්වාදීමක්වත් කළේ නැහැ. ඔවුන්ව හැමදාම වහල්භාවයට ඇදලා දාලා, වහල්ලු සේ සලකා තමයි කටයුතු කළේ. ඒ නිසාම විවිධ දේශපාලනඥයන් හරහා ඔවුන්ට යන්න වුණා. විවිධ දේශපාලනඥයන් ඔවුන්ව රැවටුවා. මුට්ටි කාසි දේශපාලනය ඇතුළේ ඔවුන්ගේ ජීවිත තවත් අගාධයට තල්ලු වුණා. එහෙම අඳුරු අතීතයක් තමයි පසුගිය කාලය පුරාම අපේ මලෙයහම් ජනතාව අත්වින්දේ.

අපි බලයට එන්න කලින් ඉතා පැහැදිලිව ඓතිහාසික "හැටන් ප්‍රකාශය" ඉදිරිපත් කරලා, එදා හැටන් නගරයේ ඉඳලා අපි සහතික කරලා වතුකරයේ ජනතාවට පොරොන්දුවක් දුන්නා, ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට ආපු ගමන් අවුරුදු 200ක් තිස්සේ අනේකවිධ පීඩා විඳපු, දුක් විඳපු වතුකරයේ සිටින මේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ලබා දෙන්න අපි උපරිමයෙන් මැදිහත් වෙනවා කියලා. ඔවුන්ගේ නිවාස ප්‍රශ්නය, ඉඩම් ප්‍රශ්නය, වැටුප් පිළිබඳ ප්‍රශ්නය, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ අනෙකුත් යටිතල පහසුකම් පිළිබඳ ප්‍රශ්න විසඳන්නත්, ශ්‍රී ලාංකික පුරවැසියෙක් විධියට ඔවුන්ට ලැබිය යුතු අයිතිවාසිකම් ලබා දෙන්නත්, විශේෂයෙන් මේ රටේ අනෙකුත් සෑම සියලු පුරවැසියෙකුටම තිබිය යුතු අයිතිවාසිකම් හා සමානව මලෙයහම් ජනතාවටත් ලැබිය යුතුයි කියන පිළිගැනීම අපි ලබා දෙනවා කියන එක ඉතා පැහැදිලිව එදා අපි සහතික වුණා. ඉතිහාසයේ පළමුවෙනි වතාවට "ශ්‍රී ලංකා මලෙයහම් ජනතාව" විධියට අපි ඔවුන්ව හැඳින්වූවා. මෙතෙක් කල් ඔවුන්ව හඳුන්වා තිබුණේ ඉන්දියානු සම්භවයක් සහිත පුරවැසියන් විධියට. ඒ නිසාම ඔවුන්ව දෙවැනිකොට සලකා තමයි කටයුතු කළේ.

1948දී ඔවුන්ට පළමුවැනි වතාවට ලංකාවේ පුරවැසිභාවය ලබා දෙන්න හදනකොටත් එදා තිබිච්ච එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තමයි විරුද්ධ වුණේ. ඒ පුරවැසි පනත ගෙනාපු වෙලාවේ ඔවුන් මේ රටේ පුරවැසියන් විධියට පිළිගන්න එදා පැවතිච්ච ආණ්ඩුව එකඟ වුණේ නැහැ; විරුද්ධ වුණා. ඔවුන්ට ඡන්ද අයිතිය දුන්නේ නැහැ, 70 දශකය වෙනකම්. ඔවුන් පිටස්තරයෝ විධියට සැලකුවේ. ඔවුන් වහල්ලු විධියට සැලකුවේ. ඔවුන්ගේ ඡන්ද ගන්න විවිධ උපක්‍රම යෙදෙව්වත්, ඔවුන්ගේ අයිතිවාසිකම් දෙන්න කිසිදු ආණ්ඩුවක් සමත් වුණේ නැහැ. ඒ නිසා තමයි මේ රටේ ශ්‍රී ලාංකික පුරවැසියන්ට ලැබිය යුතු සියලු අයිතිවාසිකම් ලබා දීමේ අපේ මූලික ප්‍රතිපත්තිමය රාමුවේ ඉඳලා ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දෙන්න අපි මැදිහත් වුණේ. අද ඔවුන්ට ඉඩම් ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඔවුන්ට නිවාස ලබා දෙන්න අපි මේ අය වැය තුළ විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඉන්දියානු ණය ආධාර යටතේ අපි ඒ නිවාස ආධාර ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. ඔවුන්ට ස්ථිරව අයිතිය කියන්න පුළුවන් ඉඩම් ඔප්පුවක් ලබා දීමේ කටයුත්ත අපි ආරම්භ කරලා තිබෙනවා. දැනට ඒ සඳහා මූලික නෛතික පසුබිම අපි සකස් කරමින් යනවා.

ඒ වාගේමයි, ඔවුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නයත්. ඡන්දවලදි හැම දාම මේ වැටුප ලබා දෙනවා කියලා ඔවුන් රැවැට්ටුවා. හැබැයි ලබා දුන්නේ නැහැ. අපි පසුගිය කාලයේ ඒ වතු හිමිකරුවන් එක්ක සාකච්ඡා කළා. ඔවුන් එක්ක විවිධ මට්ටමින් සාකච්ඡා වාර කිහිපයක් පවත්වලා, අවසානයේ ඔවුන් එකඟ වුණා, ඔවුන්ගේ පැත්තෙන් රුපියල් 200කින් වැටුප් වැඩි කරන්න. නමුත් ඒක ප්‍රමාණවත් නැහැ. අද කවුරුත් දන්නවා, මේ රටේ මේසන් කෙනෙකුට අත්වැඩ දෙන්න ගියත් රුපියල් 3,000ක්, රුපියල් 3,500ක් ඒ අත්වැඩ දෙන දෛනික කුලීකරුවාට ලැබෙනවා කියලා. හැබැයි පාන්දර 4ට, 5ට නැඟිටලා වත්තේ වැඩට ගිහින් අව් කාෂ්ටකේ පිච්චෙමින්, එහෙම නැත්නම් කුඩැල්ලෝ කකා, මහ වැස්සේ තෙමී තෙමී වැඩ කරන කම්කරුවාට සොච්චම් මුදලක් තමයි ලබා දෙන්නේ, වැටුප විධියට. ඉන්න හිටින්න ගෙයක් නැතුව, බොන්න වතුර ටික හරියට නැතුව, වැසිකිළි පහසුකම් නැතුව ඉන්න වතුකර ජනතාවගේ, ඒ මලෙයහම් ජනතාවගේ අයිතිවාසිකම් සපයන්න තමයි අපි මේ අය වැයෙන් තීන්දුව ගත්තේ. වතු අයිතිකරුවන් එකඟ වුණේ රුපියල් 200ට නම්, ආණ්ඩුවක් විධියට අපට තේරුණා ඒක ප්‍රමාණවත් නැහැ කියලා. ඒ නිසා අපිත් තීන්දුවක් ගත්තා, රුපියල් මිලියන 5,000ක් මේ වැටුප් වැඩි කිරීම සඳහා වෙන් කරන්න. භාණ්ඩාගාරයෙන් වැවිලි අමාත්‍යාංශයටයි වෙන් කරන්නේ ඒ සල්ලි. භාණ්ඩාගාරයෙන් සෘජුව පෞද්ගලික ආයතනයක වැඩ කරන සේවකයෙකුට දෙන වැටුප් වැඩි කිරීමක් නොවෙයි මේ. ඒක වරද්දාගෙන තිබෙන්නේ මේ සමහරු. අපි ඉතා පැහැදිලිව මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට. ඒ අමාත්‍යාංශයට බලය, හැකියාව, නෛතික පසුබිම තිබෙනවා, වතු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඒ මුදල් යොදවන්න. ඒකට කිසිදු නීතිමය බාධාවක් නැහැ. ඒක අල්ලස් කොමිසමට නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණයට ගියත් කිසිදු ආකාරයකින් challenge කරන්න බැහැ. නීතිය නොදන්නාකමට ඒ වාගේ ආයතනවලට යන්න ඇති. ඇත්ත ගත්තොත් අපි දන්නවා, විවිධ හේතු මත අමාත්‍යාංශවලට එවැනි මුදල් වෙන් කිරීම් කරනවා කියලා. අස්වැසුමට මුදල් වෙන් කරන්නේත් එහෙම තමයි.

අපේ රටේ අඩු ආදායම්ලාභී පවුල්වලට ජීවත් වෙන්න අපි යම් දීමනාවක් දෙනවා. ඒවා මේ රටේ බදු ගෙවන මිනිස්සුන්ගේ සල්ලි. ජනතාවගේ බදු සල්ලි තමයි අපි ඒ ආපහු දෙන්නේ. මොනරාගල උක් ගොවියෝ උක් ගස් ටික විකුණාගන්න බැරුව, තමන්ගේ අස්වැන්නට සරිලන ආදායම ගන්න බැරුව පීඩාවට ලක් වෙනකොට අපි ඒ ගොවියෝ වෙනුවෙන් යම් සහනයක් දෙනවා. ඒක ඒ අමාත්‍යාංශය හරහා ඒ කර්මාන්තය දියුණු කිරීම සඳහා වෙන් කරන මුදලින් දෙන්නේ. ඒ විධියට තමයි වැවිලි කර්මාන්ත

[ගරු විජිත හේරත් මහතා]

අමාත්‍යාංශයට වෙන් කරපු මේ රුපියල් මිලියන 5,000න්, රුපියල් 200ක පැමිණීමේ දිරි දීමනාවක් ලබා දෙන්න තීන්දු කරලා තිබෙන්නේ. ඒ වැඩිවීමේ දීමනාවත් එක්ක ඒ අයට රුපියල් 400ක වැටුප් වැඩිවීමක් සිදු වෙනවා. මෙතෙක් ඉතිහාසයේ කිසිදු ආණ්ඩුවක් වැඩ කරන මලෙයහම් ජනතාවගේ වැටුප කවදාවත් රුපියල් 400කින් එකවර වැඩි කරලා නැහැ. ඉතිහාසයේ පළමුවැනි වතාවට අපේ ආණ්ඩුව ඇවිල්ලා තමයි රුපියල් 400කින් වතු කම්කරුවන්ගේ වැටුප් වැඩිවීම කළේ.

ඔවුන් අවුරුදු 200ක් තිස්සේ මේ රට තුළ වැඩ කළා; අපේ ජාතික ධනය ඉපැයුවා. ඒ ජාතික ධනය උපයන ජනතාවට අවුරුද්දකට රුපියල ගණනේ වැටුප් වැඩි කළා නම්, අවුරුදු 200ක් යනකොට රුපියල් 200ක් ලැබෙනවා. ඒ, අවුරුදු 200ක් තිස්සේ මේ රටේ ජාතික ධනය ඉපැයීම වෙනුවෙන් ලේ, කඳුළු, දහඩිය හෙළපු ජනතාව. ඒ ජනතාව වෙනුවෙන් මේ අයිතිවාසිකම ලබා දෙනකොට, කියන්න ලජ්ජයි, අද ඒකට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යන එක ගැන. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කරන්නේ, මේ රටේ මහජන ධනය කොල්ල කාපු, හොරා කාපු දූෂිතයන්ට විරුද්ධව, ඒ අපරාධකරුවන්ට විරුද්ධව. අපි නම් මෙච්චර කල් අල්ලස් කොමිසමට පැමිණිලි කළේ ඒවාට. අද කොයිතරම් බංකොලොත් තත්ත්වයට පත් වුණාද කියනවා නම්, කියන්න ලජ්ජයි, ඒ වතු ජනතාවට රුපියල් 200ක සොච්චම් මුදලක් ලබා දීමට එරෙහිවත් අල්ලස් කොමිසමට පැමිණිලි කරනවා. ඒ පැමිණිලි කළ මන්ත්‍රීවරිය මාතලේ දිස්ත්‍රික්කයේ කෙනෙක්. මාතලේ කියන්නේ, වතු ජනතාව ඉන්න දිස්ත්‍රික්කයක්; මලෙයහම් ජනතාව ජීවත් වන දිස්ත්‍රික්කයක්. අඩුම ගාණේ මොළේ කළඳක් තිබුණා නම් මේ උගුලට අහුවෙන්නේ නැහැ. විපක්ෂ නායකතුමාගේ ලුණුව කාලා අන්තිමට බෙල්ල තිබ්බා. මොළේ පොඩ්ඩක් හරි තිබුණා නම් ඒ මෝඩ වැඩේ කරන්නේ නැහැ. අද විපක්ෂය කරපු අන්තිම, අමන, තකතීරු, මෝඩම වැඩේ තමයි මේක. ඒ තමයි, අවුරුදු 200ක් තිස්සේ මේ රටේ ජාතික ධනය උපයන්න මහන්සි වෙච්ච මලෙයහම් ජනතාවට ලබා දෙන රුපියල් 200ට විරුද්ධ වීම. ලජ්ජයි, ඒවාට විරුද්ධව වචනයක් හරි කථා කරපු අය ගැන.

මනෝ ගනේසන් මන්ත්‍රීතුමාට, දිගම්බරම් මන්ත්‍රීතුමාට, රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමාට, ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමාට කොන්ද කෙළින් තියාගෙන ඉන්න පුළුවන්ද? ඒ අයට මේ රුපියල් 200 වැඩි කරනවාට විරුද්ධ වෙන්න පුළුවන්ද? ඒ කිසි කෙනෙකුට විරුද්ධ වෙන්න බැහැ. විරුද්ධ වෙලා, නුවරඑළියට, බණ්ඩාරවෙලට, බදුල්ලට යන්නත් බැහැ. රුපියල් 200 වැඩි කිරීමට විරුද්ධව ඔබතුමන්ලාට අද මේ වැය ශීර්ෂයට ඡන්දය දෙන්න පුළුවන්ද? බැහැ. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමාට, දිගම්බරම් මන්ත්‍රීතුමාට මම ඉතා පැහැදිලිව කියනවා, අපි මේ අය වැය තුළ ඉදිරිපත් කරපු වතු කම්කරු ජනතාවට රුපියල් 200ක් වැඩි කිරීමට විරුද්ධව ඔබතුමන්ලාට ඡන්දය පාවිච්චි කරන්න බැහැ කියලා. එයට විරුද්ධව ඡන්දය පාවිච්චි කරලා නැවත ගිහිල්ලා ඔබතුමන්ලාට වතු ජනතාව රවට්ටන්න බැහැ. ඒ නිසා හරි පැහැදිලියි. විපක්ෂය සමගි පෙරමුණ විධියට තීන්දුවක් ගත්තා නම්, ඒ තීන්දුවට පටහැනි තීන්දුවක් අද හැන්දෑවේ 6.00ට අනිවාර්යයෙන් ගන්නවා. ඒකේ පෙර නිමිති අපට පෙනෙනවා. මොකද, ඒ තීන්දුවට යන්න බැහැ. අල්ලස් කොමිසමට ගිහිල්ලා මේ කාරණයට විරුද්ධව පැමිණිලි කරනකොට, ඒ ගැන ප්‍රශ්න කරනකොට, ඒ මන්ත්‍රීවරු කොහොමද තමන්ගේ කණ්ඩායම තුළ කොන්දක් තියාගෙන ඉන්නේ? ඉන්න බැහැ. මේ නිසා එක පැත්තකින් තමන්ගේ පක්ෂය -කණ්ඩායම- ඇතුළේ තිබ්ච්ච එකඟතාව නැති කරගන්න තැනට විපක්ෂය ඇද වැටුණා. අනෙක් පැත්තෙන්, අවුරුදු 200ක් තිස්සේ මේ රටේ ජාතික ධනය උපයන ඒ කම්කරු ජනතාවට ලබා දෙන අයිතිවාසිකමට විරුද්ධ වෙලා ඓතිහාසික වැරැද්දක් කර ගත්තා. ඓතිහාසික වැරැද්දක්. එදා, වතු ජනතාවගේ ඡන්ද අයිතිය දෙනවාට, පුරවැසිභාවය ලබා දෙනවාට විරුද්ධ වුණා වාගේම, අද රුපියල් 200ක සොච්චම් වැටුප් වැඩි කිරීමකටත් විරුද්ධ වෙනවා. ඒකටත් විරුද්ධ වෙන තරම් මෝඩ තීන්දුවක් ගන්නවා කියන්නේ, ඓතිහාසික වැරැද්දක්.

මේ වතු ජනතාව අතර වැඩිපුරම ඉන්නේ කවුද? කාන්තාවන්. අද අපේ රටට වැඩිපුරම ආදායම් ගේන්නේ විදේශගත ශ්‍රමිකයන්. ඒ විදේශ ප්‍රේෂණවලින් තමයි අපේ රටට වැඩිම ආදායමක් ලැබෙන්නේ. ඒ හරහා මේ වෙනකොට -ඔක්තෝබර් මාසය දක්වා වූ මාස 10ට- ඩොලර් බිලියන 6.5ක ආදායමක් උපයා තිබෙනවා. මැද පෙරදිග -අරාබිකරයේ- විවිධ රටවල දහසක් දුක් විඳින කාන්තාවන් ගෙවල්වල කුලී වැඩ කරලා ඒ හම්බ කරන සල්ලිවලින් වැඩි ප්‍රමාණයක් තමයි අපේ රටේ විදේශ සංචිත විධියට තිබෙන්නේ. යුරෝපයේ සහ අනෙකුත් රටවල වැඩ කරන අයගේ ආදායමත් එනවා. නමුත් වැඩි ප්‍රමාණයක් මැදපෙරදිග වැඩ කරන කාන්තාවන් එවන සල්ලි. ඒ කියන්නේ, අපේ රටේ ජාතික ආදායමින් ලොකු පංගුවක් දරන්නේ අපේ රටේ කාන්තාවන්.

දෙවැනියට අපට විදේශ ආදායම ලැබෙන්නේ අපේ ඇඟලුම් කර්මාන්තයෙන්. ඇඟලුම් කර්මාන්තයේත් වැඩිපුරම ඉන්නේ කාන්තාවන්. ඒ අනුව, දෙවැනියට අපට විදේශ ආදායම උපයන්නේත් අපේ රටේ කාන්තාවන්. ඇඟලුම් ක්ෂේත්‍රයේ කාන්තාවන් තමයි දෙවැනියට වැඩිපුර විදේශ විනිමය ගේන්නේ.

තුන්වැනියට වැඩිම විදේශ ආදායම ලැබෙන්නේ තේ, රබර් අපනයනයෙන්. එතැනත් වැඩිම ආදායම උපයන්නේ කාන්තාවන්. අද ඒ කාන්තාවන්ට රුපියල් 200ක් වැඩි කරනවාට විරුද්ධව විපක්ෂයේ මන්ත්‍රීවරියක් උසාවි යනවා; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යනවා. කාන්තාවක් විධියට, කාන්තා නියෝජනයක් විධියට හිතන්න තිබුණා නේ, මේක එතුමියට ගැළපෙනවාද කියලා. මේ අය පාර්ලිමේන්තුවේ කාන්තා සංසදයේ ඉන්නවා; කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරනවා; වැඩ කරන කාන්තාව ගැන කථා කරනවා. එහෙම කතා කරනකොට පොඩ්ඩක් හරි තේරෙන්න එපායැ, මම මේ කරන්නේ ඓතිහාසික වැරැද්දක් කියලා. නමුත් එහෙම නැහැ. අර ලුණුව කැවා. ලුණුව කාලා දුවගෙන ගිහිල්ලා පත්තරේ නම දාගත්තා. හැබැයි, ඒකට කිසිදු නීතිමය පදනමක් නැහැ. මම කලින් කිව්වා වාගේ ඉතා පැහැදිලිව නීත්‍යානුකූල පදනමක් යටතේ තමයි අපි මුදල් වෙන් කරලා තිබෙන්නේ. රජයක් විධියට වතු කම්කරු ජනතාවගේ ඉඩම් ප්‍රශ්නය, නිවාස ප්‍රශ්නය, වැටුප් පිළිබඳ ප්‍රශ්න විසඳීම අපේ වගකීමක්.

අපට මතකයි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු වතු ජනතාව ළඟට ගිහින්, "පුළුවන් නම් මාලිමා ආණ්ඩුවෙන් රුපියල් 50ක් වැටුප් වැඩි කරගෙන පෙන්වන්න" කියලා අභියෝග කළා. තොණ්ඩමන් මන්ත්‍රීවරයා හැටන්වලට ගිහිල්ලා, කොටගලට ගිහිල්ලා අර මලෙයහම් ජනතාව ආමන්ත්‍රණය කරලා අභියෝග කළා, පුළුවන් නම් අලුත් ආණ්ඩුවෙන් රුපියල් 50ක වැටුප් වැඩිවීමක් අරගෙන පෙන්වන්න කියලා. රුපියල් 50ක් නොවෙයි, අද රුපියල් 400ක් වැඩි කරලා තිබෙනවා. හරියට දවස් 25 වැඩ කළොත් මාසයකට රුපියල් 10,000කින් වැටුප් වැඩිවෙනවා. ඒක ඓතිහාසික වැටුප් වැඩිවීමක්. ඒ නිසා ඉතා පැහැදිලිව මාලිමාවේ ආණ්ඩුව, ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රටේ සියලු පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් අද සියලු ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන තිබෙන්නේ.

අපි ව්‍යාපාරිකයාගේ ව්‍යාපාර කටයුතු ආරක්ෂා කරන්න, ආයෝජකයාගේ ආයෝජන කටයුතු ආරක්ෂා කරන්න නව ආයෝජන ආරක්ෂණ ප්‍රවර්ධන පනත ගෙනෙන්න වැඩකටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි. මේ රටේ සියලු රාජ්‍ය සේවකයන්ගේ අයිතිවාසිකම් රකින්න, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අයිතිවාසිකම් රකින්න, වැඩිමනත්ම වශයෙන් මේ රටේ ජාතික ධනය උපයන මලෛයහම් ජනතාවගේ අයිතිවාසිකම් රකින්න අපි මැදිහත් වෙලා තිබෙනවා. මේ ඓතිහාසික තීන්දුවත් එක්ක එකතු වෙනවා වෙනුවට, මේ තීන්දුවට විරුද්ධ වෙනවා කියන්නේ ඓතිහාසික පාවා දීමකට ඒ මන්ත්‍රීවරු හවුල්කරුවන් වෙනවා කියන එකයි. ඒ ඓතිහාසික පාවාදීමට මම කලින් නම් සඳහන් කළ මන්ත්‍රීවරු සම්බන්ධ වෙන්නේ නැහැ කියලා අපි හිතනවා; අපි විශ්වාස කරනවා. මොකද, එතුමන්ලාට එහෙම කරන්න බැහැ. තව හෝරා කිහිපයකින් විපක්ෂය ඇතුළේ ඒ බෙදීම ඇති වෙනවා. ඒ බෙදීම ඇති කරගත්තේ ඔබතුමන්ලාමයි. ඒ බෙදීම ඇති කරගන්න තත්ත්වයට පාර කැපුවේ ඔබතුමන්ලා විසින්මයි. ඒ වැරදි තීන්දුවට, ඓතිහාසික පාවාදීමට අනුබල දෙන්න, අනුග්‍රහය දෙන්න කියලා මන්ත්‍රීවරු පෙලඹෙව්වේ ඔබතුමන්ලාමයි. ඒකෙන් තමන්ගේ කණ්ඩායම ඇතුළේම බෙදීමක් ඇතිකර ගත්තා. දේශපාලන වශයෙන් තවදුරටත් තමන්ගේ දේශපාලන අනාගතය නැතිකර ගත්තා. ඉතින්, අපට කරන්න දෙයක් නැහැ.

හැබැයි, අපි සතුටු වෙනවා. අපි මේ රටේ මලෛයහම් ජනතාවට මේ කාරණය සහතික කරලා කියනවා. අපේ ඊළඟ අය වැයේදී අපි පෞද්ගලික අංශයේ වතු හිමියන් එක්ක තවදුරටත් සාකච්ඡා කරනවා. අපි ඒ අයගේ නිෂ්පාදන පිරිවැය අඩු කරන්න තව බොහෝ පියවර ගන්නවා. අද ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ඒ අයගේ නිෂ්පාදන පිරිවැයේ යම් ප්‍රශ්නයක් තිබීමයි. ආර්ථිකය යම් සාධනීය මට්ටමකින් ඉහළට එනකොට අපට හැකියාව ලැබෙනවා, වතු හිමිකරුවන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කරන්න. නිෂ්පාදන පිරිවැය අඩු කළාම ඔවුන්ට මීට වඩා යම් දායකත්වයක් මේ මලෛයහම් ජනතාව වෙනුවෙන්, වැඩ කරන ජනතාව වෙනුවෙන් ලබා දෙන්න පුළුවන් වැටුප් වැඩිවීමක් දෙන්න පුළුවන්. අන්න ඒකත් එක්ක අපි මේ ගත්ත පියවර තවත් ඉදිරියට යනවා. තවත් වැටුප් වැඩි කරන්න අපි අනිවාර්යයෙන් මැදිහත් වෙනවා.

ඒ විතරක් නොවෙයි, ඔබේ නිවාස ප්‍රශ්නය, ඔබේ ඉඩම් ප්‍රශ්නය අපි අනිවාර්යයෙන්ම කෙටි කාලයක් තුළ විසඳනවා. ඒකට අවශ්‍ය මූලික පියවර, පදනම අපි දාලා තිබෙනවා. අපි රජයක් විධියට ශ්‍රී ලංකාවේ වතුකරයේ වැඩ කරන ජනතාව ශ්‍රී ලාංකික මලෛයහම් තමිළ් ජනතාව විධියට ඒ අනන්‍යතාව, ගෞරවාන්විතව අපි පිළිගන්නවා. ඒ ගෞරවනීය පිළිගැනීමත් එක්ක, ඔබට හිමි, ඔබට ලැබිය යුතු සියලු අයිතිවාසිකම් ලබා දෙන්න අපි මැදිහත් වෙනවා. කවුරු විරුද්ධ වුණත්, කවුරු උසාවි ගියත්, කවුරු මේකට විරුද්ධව ඡන්දය දුන්නත් අපි ඔබේ අයිතිවාසිකම රකිනවා කියන සහතිකය ලබා දෙනවා. අපි ඒ වෙනුවෙන් ඇප වෙනවා, කැප වෙනවා කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Mrs.) Hemali Weerasekara. You have ten minutes.

[අ.භා. 2.44]

**ගරු හේමාලි වීරසේකර මහත්මිය (නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. (Mrs.) Hemali Weerasekara - Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර ඉදිරිපත් කළේ, ශ්‍රී ලංකාවේ 80වැනි අය වැය; ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දෙවැනි අය වැය. එහි සාධනීය යෝජනා ගෙන හැර දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන පළමුව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. රටක් විධියට අඛණ්ඩ සාර්ව ආර්ථික ස්ථාවරත්වයක්, ශක්තිමත් රාජ්‍ය පාලනයක් හා ශක්තිමත් ආර්ථිකයක් සමඟ සැමට සමාන ප්‍රතිලාභ හිමි වන ආර්ථික වර්ධනයක් ඉලක්ක කරගෙන, ආර්ථිකය මෙහෙයවන ගමන තුළ ඒ ඉලක්ක සපුරා ගන්න ශක්තිමත් පදනමක් අපේ පළමුවැනි අය වැයෙන් ලැබිලා තිබෙනවා කියන කාරණය මම කියන්නේ ඉතාම සතුටින්.

මම ඒකට උදාහරණ කිහිපයක් කියන්නම්. 2024 වසරේ පළමු භාගයත්, 2025 වසරේ පළමු භාගයත් සසඳා බලන කොට, ආර්ථිකය වර්ධනය සියයට 4.6 ඉඳන් සියයට 4.8 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. විරැකියාව සියයට 4.5 ඉඳන් සියයට 3.8 දක්වා පහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම තමයි, 2024 මුල් මාස නවය හා 2025 මුල් මාස නවය සසඳන කොට, භාණ්ඩ අපනයනය ඇමෙරිකානු ඩොලර් බිලියන 8.5 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 9.1 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. සේවක ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් බිලියන 4.8 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 5.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. සංචාරක ඉපැයීම් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5 දක්වා වැඩි වෙලා තිබෙනවා. ආදායම් හා ප්‍රදාන රුපියල් ට්‍රිලියන 2.9 සිට රුපියල් ට්‍රිලියන 3.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. ප්‍රාථමික ශේෂය රුපියල් ට්‍රිලියන 0.8 ඉඳන් රුපියල් ට්‍රිලියන 1.5 දක්වා ඉහළ ගොස් තිබෙනවා. සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 23,500 ඉක්මා යන ඓතිහාසික වර්ධනයක් පෙන්වනවා. නමුත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මට තේරෙන්නේ නැහැ, මේවා විපක්ෂයට පෙනෙන්නේත් නැද්ද, ඇහෙන්නේත් නැද්ද, එහෙම නැත්නම් පෙනීලා නොපෙනෙනවා වාගේ, ඇහිලා නොඇහෙනවා වාගේ ඉන්නවාද කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උපාය මාර්ගික අරමුණු හයක් ඔස්සේ සකස් කරපු අපේ දෙවැනි අය වැය තුළ තිබෙන කරුණු කිහිපයක් ගෙන හැර දක්වන්න කැමැතියි. නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සහනදායී පොලී අනුපාතික යටතේ ණය යෝජනා ක්‍රම ගණනාවක් හඳුන්වා දීලා තිබෙනවා, රටේ සම්පත් භාවිත කරලා රටේ අවශ්‍යතාව සඳහා භාණ්ඩ නිෂ්පාදනයට. අපේ රටේ තමන්ගේම කියලා ව්‍යාපාරයක් ආරම්භ කරන්න දක්ෂතාව තිබුණත්, මූල්‍ය හැකියාව නැති තරුණ තරුණියන් වාගේම කාන්තාවන් එමටයි. නමුත්, ඔවුන්ට ඇපයක් නැතුව ණයක් ගන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. අපේ 2025 අය වැය තුළින් ඇප රහිත ණය ලබා දීමට රුපියල් මිලියන 4,270ක් වෙන් කළා. මේ වෙනකොට එයින් රුපියල් මිලියන 4,027ක ණය ලබා ගෙන අවසන්. එහි සියයට 94ක ප්‍රගතියක් පෙන්වනවා. ඒ ඇප රහිත ණය සඳහා 2026 වසරේදී මිලියන 7,000ක් රජයෙන් වෙන් කරලා තිබෙනවා.

[ගරු හේමාලි වීරසේකර මහත්මිය මහතා]

ඒ වාගේම සාර්ථකව පවත්වා ගෙන යන ව්‍යාපාරවලට ප්‍රාග්ධන අවශ්‍යතා හා ආයෝජන සඳහා රුපියල් මිලියන 25 දක්වා සහන පොලියට ණය ලබා ගන්නත්, ආර්ථික අපහසුතාවලට මුහුණපාන ව්‍යාපාර සඳහා රුපියල් මිලියන 15 දක්වා සහන පොලියට ණය ලබා ගන්නත් තවත් රුපියල් මිලියන 25,000ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන් සඳහා රුපියල් මිලියන 50 දක්වා ණය ලබා දීමට තවත් රුපියල් මිලියන 5,900ක් වෙන් කර තිබෙනවා. මේ විධියට 2026 වසර සඳහා රුපියල් මිලියන 80,000ක් ණය ලබා දීම සඳහා වෙන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙනකොට අපේ ගම් මට්ටමින් කුඩා ව්‍යාපාර පවත්වා ගෙන ගිය ජනතාව ඒ අයගේ ව්‍යාපාර පුළුල් කර ගන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මේ ඇප රහිත ණය ඉල්ලුම් කරමින් පවතිනවා.

ඒ වාගේම, සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනයේ අවශ්‍යතා, ඉලක්ක සපුරා ගන්න රුපියල් මිලියන 3,500ක් වෙන් කර තිබෙනවා. මේ සංචාරක කර්මාන්තයට වෙන් කරන සෑම රුපියලක්ම සෘජු හා වක්‍ර රැකියා රැසක් බිහි කරන්න දායක වෙනවා කියලා මම කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ වෙරළ හා මුහුද ආශ්‍රිතව, හැමිල්ටන් ඇළ, මීගමුව කලපුව සංවර්ධනය කිරීම සඳහාත් මේ මුදලින් කොටසක් වෙන් වෙලා තිබෙන බව කියන්නේ සතුටින්.

ඒ වාගේම, අත්‍යවශ්‍ය රාජ්‍ය සේවා පවත්වා ගෙන යෑම සඳහා රජයේ රැකියා පුරප්පාඩුවලට තරුණ තරුණියන් 75,000කට ආසන්න පිරිසක් බඳවා ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා. ආණ්ඩුවක් විධියට අපි රැකියාවක් ලබා දීමේ සුදුසුකම් තීරණය කරන්නේ, පුද්ගලයාගේ උස මිටි බව අනුව නොවෙයි. ඒක සිද්ධ වන්නේ දේශපාලන මැදිහත් වීම්වලින් තොරව, නියමිත තරග විභාග හා සේවා ව්‍යවස්ථාවට අනුව පමණයි.

ඒ වාගේම, රාජ්‍ය අංශයට වැටුප් වැඩි වීමේ දෙවන අදියර ක්‍රියාත්මකයි. සහන පොලී යටතේ නිවාස හා දේපළ ණය ලබා දීම, අග්‍රහාර සෞඛ්‍ය ප්‍රතිලාභ ආවරණය පුළුල් කිරීම, උත්සව අත්තිකාරම් රුපියල් 10,000 සිට රුපියල් 15,000 දක්වා ඉහළ දැමීම, ආපදා ණය අත්තිකාරම් රුපියල් 250,000 සිට රුපියල් 400,000 දක්වා ඉහළ දැමීමමේ අය වැයෙන් යෝජනා වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය ආණ්ඩු, ඒවායේ හිටපු මැති ඇමතිවරු හිතු හිතු විධියට කිසිදු ක්‍රමයක් නැතිව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන සේවකයන්ගෙන් පිරෙව්වා. ඒ විධියට බඳවා ගත්තු තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම යටතේ බඳවා ගත්තු සේවකයන් 9,800කට ආසන්න පිරිසක් විධිමත් ලෙස ස්ථිර කිරීමට පියවර ගෙන තිබෙනවා.

ඒ වාගේම, කිසිවකු අත් නොහරින මේ අය වැය තුළ විශේෂයෙන්ම අපේ රටේ සමස්ත ජනගහනයෙන් සියයට 7ක් වන ආබාධ සහිත ප්‍රජාව අමතක කරලා නැහැ. ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න රජයක් විධියට අපි බැඳිලා ඉන්නවා. ඔවුන් වෙනුවෙන් අස්වැසුම වැඩසටහන යටතේ රුපියල් 10,000ක සහනාධාරයක් ලබා දීම සඳහා රුපියල් මිලියන 19,000ක් මේ වන විටත් වෙන් කර අවසන්. ඔවුන්ට පොදු ස්ථානවලට ප්‍රවේශ වීමේ සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම වෙනුවෙන් තවත් රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී ආබාධ සහිත ප්‍රජාව සඳහා සියයට 3ක අවස්ථාව ලබා දීම සිදු වෙනවා. රැකියාවක නියැළිය හැකි මට්ටමේ සිටින ආබාධ සහිත තැනැත්තන් පෞද්ගලික අංශයේ රැකියාවකට බඳවා ගන්නවා නම්, රුපියල් 15,000ක උපරිමයකට යටත්ව වැටුපෙන් සියයට 50ක සහනාධාරයක් මාස 24ක් දක්වා -ඒ කියන්නේ අවුරුදු 2ක කාලයකට- රජය මඟින් ගෙවීමට රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, පාසල් දරුවන් සඳහා 2025දී ලිපි ද්‍රව්‍ය සඳහා ලබා දුන් රුපියල් 6,000ක දීමනාව 2026දීත් එලෙසම ක්‍රියාත්මක වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Mrs.) Hemali Weerasekara, you have only two more minutes.

**ගරු හේමාලි වීරසේකර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர)
(The Hon. (Mrs.) Hemali Weerasekara)

හොඳමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

කියන්න කරුණු ගොඩක් තිබෙනවා. නමුත්, තවත් විනාඩි දෙකක් පමණක් තිබෙන හින්දා නොකියාම බැරි කරුණු ටිකක් විතරක් කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දින කිහිපය තුළම විපක්ෂය 2025 අය වැයේ භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය ගැන කරපු ප්‍රකාශ පිළිබඳව මා කියන්න කැමැතියි. සාමාන්‍යයෙන් මුදල් වර්ෂයක් හැදෙන්නේ ජනවාරි 01වැනි දා සිට දෙසැම්බර් 31වැනි දා දක්වායි. මේ වන කොට මූල්‍ය ප්‍රගතිය සියයට 50 ඉක්මවා ගිහින් තිබෙනවා කියලා තමයි අද උදේ දැනගන්න ලැබුණේ. සාමාන්‍යයෙන් සෑම වර්ෂයකම අවසානයේදී තමයි ව්‍යාපෘති ශීඝ්‍රයෙන්ම සිද්ධ වෙන්නේ. මේ වසරේත් එහෙමයි. මේ වන කොට අපේ ගම් පුරා මේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේ දෙසැම්බර් මාසයේ අන්තිම වන විට ඒ නිවැරදි මූල්‍ය ප්‍රගතිය අපට බලා ගන්න පුළුවන්. මා නියෝජනය කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කයයි. ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා 2025 වසරේ පළාත් සංවර්ධන, පළාත් නිශ්චිත සංවර්ධන, ග්‍රාමීය මාර්ග, විමධ්‍යගත ආදි වශයෙන් අයිතම 13ක් ඔස්සේ රුපියල් මිලියන 6,500කට වැඩි ප්‍රමාණයක ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. මම ඉතා සතුටින් කියනවා, මේ වන විට ගම්පහ දිස්ත්‍රික්කයේ භෞතික ප්‍රගතිය සියයට 85 ඉක්මවා ගිහින් ඉවරයි කියලා. ඒ වාගේම ගම්පහට ලැබෙන එක රුපියලක්වත් නැවත මහා භාණ්ඩාගාරයට හරවා නොයන විධියට අපි වගබලා ගන්නා බවත් කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැඩ සඳහා අපේ දේශපාලන අධිකාරිය වාගේම අපේ රාජ්‍ය නිලධාරින් දිවා රෑ නොබලා උපරිම කැප වීමකින් ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා, අතිරේක දිසාපතිවරුන්, සැලසුම් ප්‍රධානීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිටින ලේකම්වරුන් ඇතුළු නිලධාරින් මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. ඒ වාගේම නගර සභා, මහා නගර සභා, ප්‍රාදේශීය සභා ආදි සෑම එකකම නිලධාරින් සහ ඔවුන් කරන කාර්යභාරය මම මේ වෙලාවේ ගෞරවයෙන් යුතුව මතක් කරනවා. ගමේ ව්‍යාපෘතියක් කරන කොට පුරවැසියන් විධියට අධීක්ෂණ කමිටු හදලා එම ව්‍යාපෘති සඳහා උපරිම සහයෝගයක් දක්වපු ගම්පහ දිස්ත්‍රික්කයේ පුරවැසියනුත් මම මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම අපේ එකඟතාව හා වගකීම බැඳී පවතින්නේ මේ රටේ පුරවැසියන් සමඟයි. අපි පිළිතුරු දෙන්න ඕනෑ ඔවුන්ටයි. මම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, ග්‍රාම නිලධාරි වසම් පුරා

ශීඝ්‍රයෙන් සිදු වන සංවර්ධනය දකින්න ගම් පැතිවලට යන්න කියලා. අඩුම ගණනේ ඔබතුමන්ලාගේ ප්‍රාදේශීය සභා නියෝජිතයන්ගෙන් හෝ ඒවා ගැන අසා දැනගන්න. 2025 මූල්‍ය ප්‍රගතිය ගැන ගල් පැළෙන බොරු කියන එක දැන්වත් නතර කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා. මොකද, මා කලිනුත් කිව්වා වාගේ මේ වන විට රටේ මූල්‍ය ප්‍රගතිය සියයට 50 ඉක්මවා ඉවරයි. අපි එය සියයට 65, සියයට 70 දක්වා ගෙන යන්න බලාපොරොත්තු වෙනවා කියලාත් මම ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වැඩ පිළිවෙළේ දෙවැනි අය වැය ඉදිරි වසර තුළ ඒ ආකාරයෙන්ම සාර්ථක කර ගන්න කටයුතු කරමු කියා රාජ්‍ය නිලධාරීන්, අපේ පුරවැසියන් ඇතුළු සියලුදෙනාගෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Dayasiri Jayasekara. You have 15 minutes.

[අ.භා. 2.55]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අය වැයට සම්බන්ධ කරුණු ගණනාවක් කථා කරන්න තිබුණත්, අපට වෙන් වූ කාල වේලාවත් එක්ක තමයි කථා කරන්න වෙන්නේ. විශේෂයෙන්ම ජනාධිපතිතුමා පැය හතරහමාරක් තිස්සේ පාර්ලිමේන්තුවේ කාලයත්, අපේ කාලයත් අරගෙන කරපු අය වැය කථාවේ අවසාන ප්‍රතිඵලය විධියට අපට කියන්න තිබෙන්නේ, "ස්කන්ධය දිරයි, ආතල් ඉතුරු වෙයි" කියන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්කන්ධය දිරනවා, ආතල් ඉතුරු වෙනවා. දැන් ආතල් විතරයි රට ඇතුළේ ඉතුරු වෙලා තිබෙන්නේ. මොකද, ජනාධිපතිතුමාගේ කථාවේ විපක්ෂ නායකතුමාට කියපු කාරණා, කරපු විහිළු ආදිය තමයි හැම තැනකම ප්‍රචාරය වෙමින් යන්නේ. ඒක නිසා තමයි මම ඒ කථාව කිව්වේ.

අද වන කොට ඒවා AIවලටත් දාලා මෙතැනටත් ගෙනැල්ලා පෙන්වා තිබෙනවා. එතුමා මේ අය වැය කථාව අරගෙන ඇවිල්ලා පළමු පිටු දෙකයි, අවසාන පිටු දෙකයි කියවන කොට තේරුණා, එතුමාගේ කථාව වෙන line එකකට අරගෙන යන්න හැදුවත්, ඇත්ත වශයෙන්ම තිබෙන්නේ IMF එකේ වැඩ පිළිවෙළයි කියලා. IMF Staff-level Agreement එකේ බොහොම පැහැදිලිව කියලා තිබෙනවා, I quote:

> "The 2026 Budget should be in line with program parameters to continue building fiscal space on the back of strong revenue measures and prudent spending execution."

ඒ විතරක් නොවෙයි, බොහොම පැහැදිලිව කියා තිබෙනවා, Staff-level Agreement එකට අනුව බදු අනුකූලතාව වැඩිදියුණු කිරීම, බදු පදනම විශාල කිරීම, බදු පැහැර හැරීම වැළැක්වීම පිණිස නීති ශක්තිමත් කිරීම මඟින් ආදායම් අහිමි වීම හෝ අඩු වීම පාලනය කිරීමට රජයේ අවධානය යොමු විය යුතුයි කියලා. ඒ වාගේම, IMF Staff-level Agreement එකේ තවදුරටත් බොහොම පැහැදිලිව මෙසේද කියලා තිබෙනවා:

> "…..should be in line with program parameters to continue building fiscal space on the back of strong revenue measures....."

මේ IMF Staff-level Agreement එක අනුව හදපු අය වැයක් තමයි ජනාධිපතිතුමා ඇවිල්ලා රස කරලා කියෙව්වේ කියන එක බොහොම පැහැදිලියි.

මම දෙවනුව මේ කාරණයත් කියන්න කැමැතියි. සමස්ත ආර්ථිකය ගැන කථා කරපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කියපු කරුණුවලට මට හිනහාත් ගියා. ඒ සමහර අය ආචාර්යවරු, සමහර අය වෛද්‍යවරු. එක් මන්ත්‍රීවරයෙක් - ඔහු වෛද්‍යවරයෙක් - කියනවා මම දැක්කා ඒ ගොල්ලෝ ආණ්ඩුව ගන්න කොට ඩොලර් සංචිත තිබුණේ නැහැ කියලා. එතුමන්ලා සිටියේ 2022 රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවේද දන්නේ නැහැ. මට එහෙමත් හිතෙනවා. මොකද, 2022දී නම් එහෙම තත්ත්වයක් තිබුණා අපට මතකයි. ඒ වාගේම, අධිකරණ ඇමතිතුමා කිව්වා, ඒ කාලයේ එතුමන්ලා ආණ්ඩුව ගන්න කොට පෙට්‍රල් තිබුණේත් නැහැ, ඩීසල් තිබුණේත් නැහැ, පාරේ යන්න විධියක් තිබුණේත් නැහැ කියලා. මා හිතන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව කාලය ගැනද කොහේද ඒ කියලා තිබෙන්නේ.

මේ රට වැට්ටුවේ කවුද කියලා මම අහනවා. මොකද, කවුරු ආණ්ඩු කළත් 2018 වනකොට මේ රට වැටෙන තැනක තිබුණේ නැහැ. 2018දී තිබුණු දළ නිල සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.9ක්. 2019දී එය ඩොලර් බිලියන 7.6ට ඉහළ ගියා. පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසුව 2020දී එය ඩොලර් බිලියන 5.6ට අඩු වුණා. ඊළඟට, 2021දී එය ඩොලර් බිලියන 3.1ට අඩු වුණා. 2022 වන කොට එය ඩොලර් බිලියන 1.8ට අඩු වුණා. මේ විධියට ගත්තාම හැම එකක්ම එහෙමයි. සංචාරක ව්‍යාපාරයත් එහෙමයි. 2018දී සංචාරක ව්‍යාපාරයෙන් ලද ආදායම ඩොලර් බිලියන 4.3යි; පාස්කු ප්‍රහාරයෙන් පසුව ඩොලර් බිලියන 3.6යි; ඊළඟට ඩොලර් මිලියන 602යි; ඊළඟට ඩොලර් මිලියන 506යි. මේ විධියට 2020, 2021, 2022 වන කොට ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටුණා. මේක තමයි වුණේ. ඇත්ත වශයෙන්ම, එය ඒ කාරණා එක්ක නිර්මාණය වූ තත්ත්වයක්. කරුණාකර බලන්න මේ දත්ත ටික අරගෙන. නමුත්, තමුන්නාන්සේලා දිගින් දිගටම කිව්වේ මොකක්ද? මෙන්න මේ මේ පක්ෂ මේ රට විනාශ කෙරුවා කිව්වා. ඒවා කියලා තමයි මේ ආණ්ඩුව හැදුවේ. හැම වෙලාවේම මේ බොරුව කියන්න හදන්න එපා. මේ රට කුඩා ආර්ථිකයක් තිබෙන රටක්, ඩොලර් බිලියන 84ක පමණ දළ දේශීය නිෂ්පාදිතයක් තිබෙන රටක්. මේකට පොඩි වෙනසක් සිද්ධ වුණු ගමන් මොකක්ද වෙන්නේ? ජනාධිපතිතුමාත් පසුගිය වතාවක කිව්වා, කුඩා වෙනසක්වත් ඔරොත්තු දෙන්න පුළුවන් තැනක් නොවෙයි, මේ රට කියලා.

කවුරු ආණ්ඩු කළත් අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි කියන්නේ මේ බොරුව තවදුරටත් වර්ධනය කරන්න හදන්න එපා කියලායි. මොකද, මේ රට නැවත ගොඩ ගන්න පුළුවන්. අප හැම කෙනෙකුටම ඒ විශ්වාසය තිබෙනවා. ඒක කරන්නේ තමුන්නාන්සේලා ද, අපි ද කියන එක නොවෙයි බලන්න ඕනෑ. ක්‍රමානුකූලව ගොඩනගා ගෙන ආපු රටේ ආර්ථික වර්ධන වේගය තමයි තමුන්නාන්සේලා දැන් 4.8ට වට්ටලා තිබෙන්නේ. එය 2024 වන කොට සියයට 5 දක්වා ඉහළ ගිහිල්ලා තිබුණේ. අද වන විට එම අගය තවත් දශම 2කින් අඩු වෙලා තිබෙනවා. සංචාර ඉපැයීම් ගත්තාම, එය එක එක කාලවල වැඩි වෙනවා, අඩු වෙනවා, ආපසු වැඩි වෙනවා. ඒ නිසා මම කියනවා, කරුණාකර ඒ බොරුවම තවදුරටත් කියමින් ඒ මතය ජනතාවට ගිල්ලවන්න හදන්න එපා කියලා.

2018දී ඩොලරයේ වටිනාකම රුපියල් 162ට තිබුණා. ඒක රුපියල් 324 දක්වා ඉහළ ගිහිල්ලා, ආයෙත් රුපියල් 300ට පමණ අඩු වෙලා, අද වන කොට රුපියල් 307ක් වෙලා තිබෙනවා. අද ඩොලරයේ අගය වැඩි වෙලා තිබෙන්නේ. ඒ නිසා මා කියන්නේ

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

මේවා හොඳින් අවබෝධ කර ගන්න කියලායි. බොරු කියලා මේ රටේ ජනතාව තවදුරටත් රවටන්න එපා කියලා මම විශේෂයෙන් ඉල්ලා සිටින්න කැමැතියි. මොකද, දිගින් දිගටම අපට දකින්න තිබෙන කාරණය මේකයි.

පසුගිය කාල වකවානුව තුළ ඇති වුණු තත්ත්වය මොකක්ද? මට පෙර කථා කරපු අපේ ගරු මන්ත්‍රීතුමියත් කිව්වා, පසුගිය වසරේ වෙන් කරපු මුදල්වලින් සියයට 50කට වඩා ප්‍රමාණයක වැඩ කර තිබෙනවා කියලා. තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා එදා කිව්වේ මොකක්ද? එතුමාගේ වචනවලින්ම කියන්නම්. "පුරුදු වෙන්න කරනවා, කරලා පුරුදු වෙනවා" කිව්වා. වැඩ කරන ගමන් පුරුදු වෙනවා, පුරුදු වෙන ගමන් වැඩ කරනවා කියලායි කිව්වේ. දැන් කරන ගමන් පුරුදු වෙන්න ගිහිල්ලා තමයි මේ වැඬේ වෙලා තිබෙන්නේ. පසු ගිය මාස 9ට තමුන්නාන්සේලා ප්‍රාග්ධන වියදම් විධියට වෙන් කළා රුපියල් බිලියන 1,315ක්. හැබැයි, සංශෝධනයෙන් පසුව එය රුපියල් බිලියන 1,033ට අඩු වුණා. පුනරාවර්තන වියදමට වෙන් කර තිබුණු රුපියල් බිලියන 5,530ක මුදල බිලියන 5,886 දක්වා වැඩි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් වෙන දා නම් අමාත්‍යාංශවලින් අපට එවනවා, Recurrent Expenditure -වර්තන වියදම- කීයද ප්‍රාග්ධන වියදම කීයද කියන තොරතුරු. නමුත් දැන් අපි ඒ තොරතුරු ඉල්ලුවාම පාර්ලිමේන්තුවට එවන්නේ මොකක්ද? මොකුත් නැහැ. ඒ දෙකම එකට දමලා තමයි එවන්නේ. සියයට කීය බැගින්ද කියලා අපි ඇහුවාම, සියයට කීයද කියන එක හොයා ගන්න බැහැ. මොකද, ප්‍රාග්ධන වියදමයි, වර්තන වියදමයි කියන දෙකම එකට එකතු කරලා තමයි හදලා එවන්නේ. වෙන දා අපට එහෙම එවන්නේ නැහැ. ප්‍රාග්ධන වියදම් ලෙස කොච්චර වෙන් කර තිබුණාද, ඒකෙන් කීයක් අමාත්‍යාංශයට වියදම් වුණාද, වර්තන වියදම් ලෙස කොච්චරක් වෙන් කර තිබුණාද, ඒකෙන් කීයක් වියදම් වුණාද කියලා සඳහන් කර එව්වා. දැන් අලුතින් සෙල්ලමක් පටන් ගෙන තිබෙනවා, මේ සියල්ලම එකතු කරලා එවන. මේක සම්පූර්ණ වැරැදියි.

ඒ නිසා තමයි අපි කියන්නේ මේ රටේ ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කළ මුදල්වලින් දැනට වැඩ කෙරිලා තිබෙන්නේ සියයට 25ක විතර ප්‍රමාණයක විතරයි කියලා. ඒ සල්ලි ඔක්කෝම තමුන්නාන්සේලා ආපසු එකතු කරගෙනයි තිබෙන්නේ, මහා භාණ්ඩාගාරයට. දැන් මහා භාණ්ඩාගාරයේ සල්ලි තිබෙනවා කියන්නේ ඒක තමයි. තමුන්නාන්සේලා බදු ගහලා එකතු කරගත්තු බිලියන ගණනක මුදලින් ගමේ මිනිසුන්ට වැඩ කරන්නේ නැතුව ඉතිරි කරගෙන කියනවා, භාණ්ඩාගාරය පිරිලා කියලා. අපි කියන්නේ ඒ සල්ලිවලින් ගමට වැඩ කරන්න කියලායි. මම කියන්නම්, එහෙම වෙන්න හේතුව මොකක්ද කියලා. අමාත්‍යවරුන්ගේ අසමත්කම, නිලධාරින් වැඩ කරන්න දක්වන බිය, ටෙන්ඩර් මගඩි, ග්‍රාමීය මට්ටමේ සිටින නිලධාරින්ගේ බිය වැනි හේතු නිසා, වෙන් කර තිබෙන මුදල්වලින් සියයට 75ක් පමණ එහෙම පිටින්ම ආපසු මහා භාණ්ඩාගාරයට යනවා. දෙසැම්බර් 31 වනකොට තමුන්නාන්සේලාට ඇත්ත තත්ත්වය බලාගන්න පුළුවන්.

මම දැක්කා, අද ගරු මරික්කාර් මැතිතුමාත් මේ ගැන කිව්වා. දැන් අමාත්‍යාංශවල හෝ ගාලා ටෙන්ඩර් දමනවා. ඇයි ඒ? සල්ලි ඉතුරුයි නේ. ඒ නිසා දැන් මොනවා හරි මිල දී ගන්න ඕනෑ. ඒක නිසා මොකද කරන්නේ? පටපට ගාලා ටෙන්ඩර් දමනවා. දින 20න් open කරන්න ඕනෑ ටෙන්ඩර් එක දින 7කින් open කරන්න දමනවා. එතකොට මොකද වෙන්නේ? තමුන්නාන්සේලා ඉස්සර කිව්වා නේ, ටෙන්ඩර් මගඩි ගැන. ඒ ටෙන්ඩර් මගඩිවල අනෙක් එක තමයි දැන් මේ වෙන්නේ. අපිත් අමාත්‍යාංශ කරලා තිබෙනවා නේ. අපි දන්නවා, සාමාන්‍යයෙන් වියදම් නොවෙන මුදල් ටෙන්ඩර් මණ්ඩලවලට දමලා අවශ්‍ය බඩු භාණ්ඩ මිල දී ගන්න ඕනෑ කොයි කාලවල ද කියලා. තමුන්නාන්සේලාට මොකද වුණේ? මේවා දන්නේ නැහැ. මෙලෝ හසරක් දන්නේ නැහැ. සල්ලි වියදම් වෙයි කියලා බලාගෙන හිටියා. දැන් සල්ලි ඉතුරු වෙලා. දැන් මොකද කරන්නේ? හදිසියේ ටෙන්ඩර් දමනවා. එහෙම දමලා දඩබඩ ගාලා සල්ලි වියදම් කරලා බඩු ගන්න හදනවා. ඒකෙන් මොකක්ද වෙන්නේ? විශාල හොරකමකට ලක් වෙන්නයි හදන්නේ.

මේත් එක්කම මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, ලංකාවේ දරිද්‍රතාව පිළිබඳ ප්‍රශ්නයත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ පවුල් ලක්ෂ 57ක් පමණ තිබෙනවා. ඒ තුළ පිරිමින් ගෘහමූලිකත්වය දරන පවුල් ලක්ෂ 40ක් පමණ සහ කාන්තාව ගෘහමූලිකත්වය දරන පවුල් ලක්ෂ 14ක් පමණ තිබෙනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ?

2019දී කරන ලද ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට පසුව අද වනතුරු රටේ දුප්පත්භාවය පිළිබඳව -රටේ දරිද්‍රතාව පිළිබඳව- කිසිම සමීක්ෂණයක් කරලා නැහැ. නමුත්, 2019න් පස්සේ හැම අවුරුදු තුනෙන් තුනටම එවැන්නක් කරන්න ඕනෑ. 2019දී කළ සමීක්ෂණයේ ප්‍රතිඵලය අනුව 2019 වසර අවසන් වන කොට ලංකාවේ පවුල් ලක්ෂ 57න් පවුල් මිලියන 3.2ක් -ඒ කියන්නේ ලක්ෂ 32ක්- දුප්පත්භාවයට පත් වෙලා තිබුණා. ලෝක බැංකු වාර්තාවලින් කියා තිබෙනවා, එය 2024දී ලක්ෂ 24.5ක් වෙලා තිබෙනවා කියලා. ඒ කියන්නේ, අද මේ රටේ ලක්ෂ 24ක් දරිද්‍රතාවෙන් පෙළෙන තැනකට තල්ලු වෙලා තිබෙනවා කියන එකයි.

ඒ සමීක්ෂණ වාර්තාව සකස් කරන්න සල්ලි නැහැ කියලා ආණ්ඩුව කිව්වා. අපි දිගින් දිගටම ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ සමීක්ෂණය කරන්න කියලා. මොකද, පවුල් ලක්ෂ 57න් ලක්ෂ 30කට අධික ප්‍රමාණයක් අද වන කොට දිරිද්‍රතා රේඛාවෙනුත් පහළ ඉන්නේ. ඔවුන්ගේ මිල දී ගැනීමේ හැකියාව ඩොලර් 3.65යි. ඒ කියන්නේ දවසකට රුපියල් 1,120යි. මේක තමයි ඔවුන් පත් වී තිබෙන තත්ත්වය. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් අහන්න කැමැතියි, විශේෂයෙන්ම දිළිඳුභාවය තුරන් කිරීම සඳහා ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා. අපි දැක්කා, අලුත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක එහෙම පිටින් දේශපාලනීකරණය වෙලා. උදේ ඉඳන් රෑ වනකල් ජනතා විමුක්ති පෙරමුණේ පෝස්ටර් ගහපු කෙනා තමයි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉන්න සංවර්ධන නිලධාරියා, සමෘද්ධි නිලධාරියා ඇතුළු ඔක්කෝටම නායකත්වය දෙන්නේ. එයා කියන විධියට තමයි දැන් වැඩ කරන්න වෙලා තිබෙන්නේ.

අපේ රටේ ජීවන බර මුදා හරින්න අලුත් වැඩ පිළිවෙළක් කවුරුවත් හදලා තිබුණේ නැහැ. ඒ නිසා මම කියනවා, දිළිඳු බව තුරන් කිරීමට වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ "ජනසවිය" තිබුණා. ඊට පසුව "සමෘද්ධි" ව්‍යාපාරය තිබුණා. එදා ඒ වාගේ වැඩ පිළිවෙළ තිබුණා. අද ඒවා සියල්ලම තමුන්නාන්සේලා පැත්තකට වීසි කරලා තමුන්නාන්සේලාගේ "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න හදනවා. බොහොම පැහැදිලිව එය දේශපාලනිකව තමුන්නාන්සේලාගේ කාඩර්වරුන් යොදා ගන්න හදපු වැඩ පිළිවෙළක් බව කියන්න කැමැතියි.

අනෙක් කාරණය තමයි, කැබ් රථ ඇතුළු වාහන ආනයනය සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය. මොකක්ද ඔබතුමන්ලා මුලදීම කිව්වේ? ගරු ජනාධිපතිතුමා ධුරයට එන්න කලින් කිව්වා, "අපි

සුඛෝපභෝගී වාහන ඔක්කෝම පිට රටවලට විකුණලා ඩොලර් ගෙනෙනවා" කියලා. ඊළඟට මොකක්ද කළේ? ජනාධිපති ධුරයට ආ ගමන්ම ගෝල්ෆේස් එකේ වාහන සේල් එකක් දැම්මා; සේල් එකේ වාහන විකුණන්න ලෑස්ති කෙරුවා. මාතර දිහා තමන්ගේ ගජමිතුරන්ට ඒ ඉතුරු ටික කුණුකොල්ලයට විකුණුවා. මේ ගරු සභාවේ ඉන්නවා, වැවිලි කර්මාන්ත ඇමතිවරයා. එතුමා කිව්වා, "මගේ අමාත්‍යාංශයේ සුඛෝපභෝගී වාහන 28ක් තිබෙනවා, ගන්න කෙනෙක් ඉන්නවා නම් කියන්න, මාස දෙකෙන් දෙනවා" කියලා. කවදාද මේ කියන්නේ? 2025.04.29වැනි දා. 2025.11.12වැනි දා මෙතැනට ඇවිල්ලා අඬනවා වාගේ කියනවා, "දැන් වාහන ගෙනෙන එකත් ලොකු දෝෂාරෝපණයක්. මගේ අමාත්‍යාංශයේත් තිබෙනවා මග කැඩි කැඩී යන වාහන. ලේකම්තුමා ළඟදී නුවර ගිහිල්ලා මග හිටියා. අලුත් ඒවා දැන් දෙන්න ඕනෑ" කියලා. කවුද මේ කියන්නේ? සුඛෝපභෝගී වාහන ටික වෙන්දේසි කරනවා කියලා කයිය ගහලා, ඒවා විකුණපු අය. ඒ වාහන ටික විකුණලා දැන් කියනවා "දුවන්න වාහන නැහැ" කියලා. ඉතින් ඒ සුඛෝපභෝගී වාහන ටික දුන්නා නම් හරි නේ, අපේ නිලධාරින්ට. එහෙම කළා නම් මඟ හිටින්නේ නැහැ නේ, ඒ ලේකම්තුමා. මේ මොකක්ද කරලා තිබෙන්නේ? මේ රටේ මිනිසුන්ට තනිකරම මතයක් හැදුවා, "මේවායේ යන්නේ ලොකු එවුන්. මේවායේ තමයි මේ කට්ටිය යන්නේ. ඒ නිසා මේ සංස්කෘතිය අපි ඉවර කරන්න ඕනෑ" කියලා. කවුද තීරණය කරන්නේ කැබ් එක තමයි මේ රටේ හැම කෙනාම යන්න ඕනෑ වාහනය කියලා? තමුන්නාන්සේලා ඒ කාලයේ කැබ් ගත්තා. තමුන්නාන්සේලා කැබ් ගත්තා කියලා ලංකාවේ හැම කෙනාම කැබ් ගන්න ඕනෑද? ඒක මාර කථාවක් නේ.

අද අපි කල්පනා කරන්න ඕනෑ, අඩුම තරමින් ඩීසල් පාවිච්චිය අඩු කරන වාහනයක් ගැන. එහෙම නේ අපි කල්පනා කරන්න ඕනෑ. ප්‍රාඩෝ, ඉන්ටකූලර් ආදිය පැත්තකින් තියන්න. මේ කැබ් ගන්නවාම කියමු. එහෙම නම්, ඒකට කොන්දේසියක් දමන්න ඕනෑ අපි ඒවායෙන් අඩුම තරමින් සියයට 50ක්වත් ඉලෙක්ට්‍රික් වාහන ගෙන්වනවා කියලා. එහෙම වැඩ පිළිවෙළක් නොවෙයි කරන්න යන්නේ. තමුන්නාන්සේලාට හිතුණාම කැබ් ගෙනෙන්න ඕනෑ කියලා, කැබ් ගෙනෙනවා.

මන්ත්‍රීවරුන්ට වාහන නැහැ කියලා දැන් කිව්වා. මන්ත්‍රීවරුන්ට ඇති වෙන්න වාහන තිබෙනවා. මන්ත්‍රීවරුන්ට එක එක අමාත්‍යාංශවලින් දීලා තිබෙන වාහන ලැයිස්තුවම මම ඉදිරිපත් කරන්නම්. අබේවික්‍රම මැතිතුමාට දීලා තිබෙනවා, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන්. ගරු එල්.එම්. අබේවික්‍රම මහත්මයාට දීලා තිබෙනවා, ලංකා ඛනිජ වැලි සංස්ථාවෙන්. සුසන්ත කුමාර නවරත්න මැතිතුමාට දීලා තිබෙනවා අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. අබේවික්‍රම මැතිතුමාට දීලා තිබෙනවා, ලේකම්, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයෙන්. මේ විධියට ඇමතිවරුන් ඔක්කෝටම සහ සාමාන්‍ය මන්ත්‍රීවරුන්ට දැන් වාහන දීලා තිබෙන්නේ. අනෙක් කට්ටියටත් කරුණාකර ඒවා දීලා ඉවර කරන්න. එහෙම නොකරන වැඩෙන් වෙන දේ මම කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාහනයක් ගන්න ගියාම දැන් තිබෙන ප්‍රශ්නය බලන්න. මේ ගැන කථා කරගෙන ගියොත්, මේ ටෙන්ඩරයට දුන්නේ දින 12යි. එතකොට මොකක්ද වුණේ? මේ කැබ් අවශ්‍ය වෙන්නේ මොකටද කියලා අපි ඇහුවා. අවසානයේ බැලුවාම කැබ් අවශ්‍ය වෙලා තිබෙන්නේ මොකටද? අපි දන්නවා, මේවායින් කෙහෙල් කැන් එකතු කරනවා. හාල්, කරවල, පොල් ටික එකතු කරනවා. තව ගන්න තිබෙන ඒවා එකතු කරනවා. යට ඇඳුම් හොඳ නැත්නම් ඒකත් එකතු කරනවා. දැන් අද මොකද වෙලා තිබෙන්නේ? පැලවත්ත කාර්යාලයේ හදන්න වෙලා තිබෙනවා, ලොකු ස්ටෝරුවක්. මොකද, කැබ් 159ක් එනවා. කැබ් 159න් කෙහෙල් කැන් 159ක් එනවා. හාල් කිලෝ එනවා. ඒ ඔක්කෝම අරගෙන කට්ටියට බෙදලා දෙන්න තමයි මේ වැඩ පිළිවෙළ සකස් කරන්නේ. එතකොට මේ කැබ් අරගෙන යන්නේ ඒ වැඩේ ඉදිරියට ගෙන යන්න.

එතකොට මේකේ duty එක මොකද වෙලා තිබෙන්නේ? දැන් මේ වාහන ගත්තාට පස්සේ තමුන්නාන්සේලා දන්නවා, ආණ්ඩුවේ වියදම. වාහනයේ insurance එකට යනවා, 1,775ට රුපියල් 150,000 ගණනේ ගත්තොත් අවුරුදු 4ට, රුපියල් බිලියන 1.6ක්. ඒ කියන්නේ රුපියල් මිලියන 1,600යි. අවුරුදු 4ට 16 වතාවක් රුපියල් 40,000 ගණනේ බැලුවොත් service එකට යනවා, රුපියල් මිලියන 1,130ක්. ආදායම් බලපත්‍රවලට යනවා රුපියල් 25,000 ගණනේ රුපියල් මිලියන 177ක්. ටයර්වලට යනවා, රුපියල් මිලියන 213ක්. එතකොට ඔක්කෝම එකතු කළාම රුපියල් මිලියන 3,120යි. දැන් මේවා ලීසිං දමලා ලු ගන්නේ, ඒ ගමන. ලබන අවුරුද්දේත් ගෙවන්න වෙනවා. ඊළඟ අවුරුද්දේත් ගෙවන්න වෙනවා. අවුරුදු කීයක් ගෙවන්න වෙයිද දන්නේ නැහැ. මොනවාද ඒ කොම්පැනි? ඒ ලීසිං කොම්පැනි මොනවාද? ඒ insurance කොම්පැනි මොනවාද? කාගේ කවුද? අපි දන්නවා, කොහොමද කරන්නේ කියලා. මේ අයගේ යහළුවෝ ඉන්නවා. මුළු එකතුව ගත්තාම මේ වාහන වැඩේට රුපියල් මිලියන 17,500යි, 1,775දෙනෙකුට කැබ් අරගෙන දෙන්න මේ ආණ්ඩුව වියදම් කරන මුදල.

මහ ලොකුවට කයිය ගැහුවා, සුඛෝපභෝගී වාහන පාවිච්චි කරන්නේ නැහැ, අපි බස්වල යන්න කැමැතියි කියලා. අර ඉස්සර පටන් ගත්ත දවස්වලම දාලා තිබුණා මම දැක්කා, මන්ත්‍රීතුමා බෑග් එක අරගෙන ඉන්නවා පාර අයිනේ, බස් එක ළඟ. දැන් මොකුත් නැහැ. දැන් කෙළින්ම සුඛෝපභෝගි කැබ් එකේ යන්න හදන්නේ. අවසානයේ මොකක්ද වෙලා තිබෙන්නේ? මහජන ප්‍රවාහනයට දීලා තිබෙන්නේ රුපියල් මිලියන 3,000යි, ජනතාව ලක්ෂ 220ටම. මුළු එකතුව රුපියල් මිලියන 17,500යි, වාහන 1,775ක් ගන්න. මේ රටේ රාජ්‍ය නිලධාරින් 19,000ක් ඉන්නවා, ඒ අයට පර්මිට් දීලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ අයට අඩුම තරමේ ඒ පර්මිට් එකෙන් ප්‍රයෝජනයක් ගන්න අවස්ථාවක් ක්‍රමානුකූලව හදලා දෙන්න. මහන්සි වෙලා ඉගෙන ගෙන, අවුරුදු 30ක්-40ක් දුක් විඳලා මේ රටට වැඩ කරපු අය විධියට ඒ 19,000දෙනාට, කරුණාකරලා ඒ අවස්ථාව ලබා දෙන්න. තමුන්නාන්සේලා මේ කරන්නේ මොකක්ද? අපට කැබ් අවශ්‍යතාවක් නැහැ. අපි බොහොම පැහැදිලිව කියනවා, තමුන්නාන්සේලාම ඒවා තියා ගන්න කියලා. මොකද, මේ කැබ් එක අරගෙන ගියාය කියලා අපි රහත් වෙන්නේ නැහැ. අපි යන එක කොහොම හරි යන්නම්. දැනටත් අපි දන්නවා, තමුන්නාන්සේලාට ආණ්ඩුවෙන් වාහන - කැබ් - දීලා තිබෙනවා. ඒ අවශ්‍ය කටයුතු ටික කරලා තිබෙනවා.

අධ්‍යාපනයට දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 6ක් දෙනවාය කියලා කෑ ගහපු අගමැතිනියගේ අමාත්‍යාංශයට, අද දීලා තිබෙන්නේ සියයට 1.2යි. පාසල් 3,100කට වැසිකිළි නැහැ කියනවා. රෝහල් 45ක් දොස්තරවරු නැතුව වැහිලා ගිහිල්ලා තිබෙනවාය කියනවා. මේවා තිබෙද්දී තමයි තමුන්නාන්සේලා මේ කැබ් ආතල් එක ගන්න හදන්නේ. ඒ නිසා මම කියන්න කැමැතියි කරුණාකරලා, මේ රාජ්‍ය සේවකයෝ -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Dayasiri Jayasekara, you have finished your time now.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මට තවත් විනාඩියක් දෙන්න, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි.

දැන් බලන්න, විශ්‍රාම ගිය රජයේ සේවකයන්ගේ ප්‍රශ්නය. මේක තමුන්නාන්සේලා දිගටම අර බී.සී. පෙරේරා වැටුප් කොමිසමේ ඉඳලා - එදා, පළමුවැනි දවසේ එනකොට අහිංසක ගුරුවරු විදුහල්පතිවරු අතිවිශාල පිරිසක් පාර දිගේ හිටියා. තමුන්නාන්සේලා පඩි වැඩි කරලා දෙනවාය කියලා, තුනෙන් එකක් දෙනවාය කියලා ඒ මිනිස්සු පාර දිගේ අරගෙන ගිහිල්ලා ඇවිද්දුවා. ඒ අයට අද සත පහක්වත් ගෙවලා නැහැ. අපි ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ ප්‍රශ්නය වහාම විසඳන්න කියලා. 2024 මැයි මාසයේ තමුන්නාන්සේලාගේ නායකයා, අනුර දිසානායක මහත්මයා ඒ අය ගෙනැල්ලා කථා කරලා කිව්වා, මේ ප්‍රශ්නය විසඳනවා කියලා. නමුත් අද වෙනතුරු ඒක විසඳලා නැහැ. ඊළඟට, 2020-2024 දක්වා විශ්‍රාම ගිය රජයේ සේවකයන් විශ්‍රාම වැටුප පිළිබඳ විශාල අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. දේපළ ණය රුපියල් ලක්ෂ 30 දක්වා වැඩි කරනවා කිව්වා. අද මිලියන 500ක්, වෙන් කරලා තිබෙන මුදල අරගෙන බෙදලා බැලුවාම රාජ්‍ය සේවකයන් ලක්ෂ 14න්, එක රාජ්‍ය සේවකයෙකුට රුපියල් 4,100යි ලැබෙන්නේ. ආපදා ණය ගත්තාට පස්සේත් එවැනිම තත්ත්වයක් තිබෙන්නේ. 2023 ඉල්ලුම් කළ අය තවම බලාගෙන ඉන්නවා, ආපදා ණය ගන්න.

අද සමෘද්ධි ව්‍යාපාරයට මොකක්ද කරලා තිබෙන්නේ? තමුන්නාන්සේලා සමෘද්ධි ව්‍යාපාර අපි ගන්නවා කියලා අරගෙන, දෙකට කඩලා, කෑලිවලට කඩලා දැන් මොකක්ද කරලා තිබෙන්නේ? ඒ අය අද දමන්න පුළුවන් වෙලා තිබෙන්නේ, MN-1 ශ්‍රේණියට විතරයි. සමෘද්ධි ව්‍යාපාරය අවුරුදු 30ක්, මේ රටේ බිලියන 472ක් එකතු කරපු ව්‍යාපාරයක්. අද තමුන්නාන්සේලා එය සම්පූර්ණයෙන් විනාශ කරලා තිබෙනවා. සමෘද්ධි ව්‍යාපාරය සම්පූර්ණයෙන් විනාශ කරන වැඩ පිළිවෙළකට මේ යන්නේ.

ඒ වාගේම කියන්න ඕනෑ, බාර් පර්මිට් ගැන ඔබතුමන්ලා මහ ලොකුවට කයිය ගැහුවා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව බාර් පර්මිට් දීලා තිබෙනවා, ඒවා සම්පූර්ණ වැරදියි කියලා කථා කළා. දැන් මොකක්ද අවසානයේ වෙලා තිබෙන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Dayasiri Jayasekara, would you please wind up now?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මට තව එක විනාඩියක් දෙන්න.

බාර් පර්මිට් ගැන මොකක්ද කියන්නේ? හර්ෂණ සූරියප්පෙරුම මහත්මයා ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට කියනවා, "මේ බාර් පර්මිට් සියල්ලම නිවැරදි විධියට දීලා තිබෙන්නේ, කිසිම ප්‍රශ්නයක් නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා දීපු ඒවා අපි පිළිගන්නවා, ඒ නිසා මේ බාර් පර්මිට් සම්පූර්ණයෙන් නීත්‍යනුකූලයි කියලා අපි පිළිගන්නවා" කියලා. මෙන්න ඒ affidavit එක, මගේ ළඟ තිබෙනවා. මෙතැනට ඇවිල්ලා මේ ගැන කථා කරපු අය, මේ. මේ ඇමතිවරු මේවා හොරට දීලා තිබෙන්නේ, සල්ලි අරගෙන දීලා තිබෙන්නේ මෙහෙමයි කියලා මේ ගැන කථා කළා. දැන් මේ ඔක්කොම නීත්‍යනුකූලයි කියනවා.

ඊළඟ කාරණය මේකයි. මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. මේ බාර් පර්මිට් වාගේම තමුන්නාන්සේලා ගත්ත පර්මිට්වල, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ - 2015.12.31 වර්ෂය සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් ප්‍රකාශය ඉදිරිපත් කර තිබෙනවා. කාටද මේක දෙන්නේ? මේක දෙන්නේ මැතිවරණ කොමිසමට. මැතිවරණ කොමිසමට දෙනවා, මන්ත්‍රීවරුන් වාහන විකුණා කරන ලද පරිත්‍යාගවලින් මිලියන 10ක්. ඊළඟට, මන්ත්‍රී වැටුප් දීමනා, පාර්ලිමේන්තු වැටුප් දීමනා, පළාත් සභා මන්ත්‍රී වැටුප්, පළාත් පාලන මන්ත්‍රී වැටුප් මේ සියල්ලම අරගෙන තිබෙනවා, මේ පක්ෂය. මේ වාහන පර්මිට්වලින් සල්ලි අරගෙන තිබෙන්නේ. මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු අනෙක් අයට චෝදනා කරනකොට ජනතා විමුක්ති පෙරමුණ මන්ත්‍රීවරු වහන විකුණලා කරන පරිත්‍යාගවලින් තව රුපියල් මිලියන 10ක් අරගෙන තිබෙනවා. ඒ කියන්නේ මේ පර්මිට් ටික ඒගොල්ලන් විකුණලා තිබෙනවා කියන එක.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you have to wind up now.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මට එක විනාඩියක් දෙන්න. අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි.

ජනාධිපතිතුමා කිව්වා, සරුංගලය වාගේ අපට එහාට මෙහාට ඕනෑ හඬකට, ඕනෑ පැත්තකට යන්න පුළුවන් කියලා. අපි යන්නේ ජනතාවගේ හඬට පමණයි. තමුන්නාන්සේලා තමයි 1994දී සරුංගල් වාගේ චන්ද්‍රිකා මැතිනිය ළඟට ගියේ. ඊළඟට, 2001 වනකොට ආයෙත් චන්ද්‍රිකා මැතිනියත් එක්ක සම්බන්ධ වුණා, ආණ්ඩු හදන්න. 2005 මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක ආණ්ඩු හදන්න සරුංගලය වාගේ ඒ පැත්තට ගියා. නැවතත් 2010දී රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක සරත් ෆොන්සේකා මහත්මයා සරුංගලය වාගේ උස්සගෙන ආවා. ඊළඟට, 2015 රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක එකතු වෙලා සරුංගලය වාගේ ගිහිල්ලා ආණ්ඩු හැදුවා. අපි සරුංගල් ඇරියේ නැහැ.

අපි ජනතාවගේ පැත්තේ ඉඳලා හොඳට වැඩ කරපු අය බව මතක තබා ගන්න. අපි ඇමතිකම් දෙපාරක් අත්හැරලා තිබෙනවා. අපි මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර අත්හැර තිබෙනවා. ඒක මතක තබා ගන්න. තමුන්නාන්සේලා වාගේ සරුංගල් අරින්න ගියේ නැහැ. ඒ නිසා අපි අනුර දිසානායක මැතිතුමාට කියනවා, සරුංගල් ඇරියේ ඔයගොල්ලන් කියලා. ඔයගොල්ලන් තමයි 1970 ඉඳලාම මැතිනියගේ ආණ්ඩුවත් එක්ක සම්බන්ධ වුණේ. ඊළඟට, 1994 වනකල්, 1994න් පස්සේ 2024 වනකල් - රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව එනකල් - සරුංගල් ඇරියේ අපි නොවෙයි, එතුමන්ලා බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sundaralingam Pradeep. You have 13 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Prof.) Sena Nanayakkara to the Chair?

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 3.17]

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුම**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் இரண்டாவது வரவு செலவுத்திட்ட விவாதத்திலே எனது கருத்துகளையும் பதிவுசெய்யச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி கூறுகின்றேன். விசேடமாக, இந்த வரவு செலவுத்திட்ட விவாதத்தில் அதிகமாகப் பேசப்பட்ட விடயமாக விருப்பது, பேசுபொருளாக மாறியிருப்பது மலையகத் தோட்டத் தொழிலாளர்களின் வேதன உயர்வு என்பதாகும். அந்த வகையில், சீ.வி. வேலுப்பிள்ளை அவர்களின் ஒரு கவிதையோடு நான் எனது உரையை ஆரம்பிக்கலாமென நான் நினைக்கின்றேன்.

"ஒரு நாள் கூலி,
ஒரு பிடி சோற்றுக்கு,
ஒன்றல்ல இரண்டல்ல... ஓர் ஆயிரம் கதை...
சம்பளப் பட்டியலில் சிறு தொகை கண்டு...
சத்தம் இல்லாமல் கண்ணீர் வடித்தனர் அன்றோ..."

சீ.வி. வேலுப்பிள்ளை அவர்கள் இந்தக் கவிதையிலே "மலையகத் தோட்டத் தொழிலாளர்களுடைய சம்பளத்தை வெறும் சம்பளமாகக் கணித்துவிட முடியாது, இந்தச் சம்பளத்தில்தான் அந்த மக்களின் ஒட்டுமொத்த வாழ்க்கையும் அடங்கிருக்கின்றது" என்ற கருத்தைச் சொல்லியிருக்கின்றார். நாங்கள் அந்த மக்களின் வரலாற்றைச் சற்றுப் பார்ப்போம்! 1823ஆம் ஆண்டு வெள்ளையர்களால் இலங்கைக்கு அழைத்துவரப்பட்ட மலையக மக்களுக்கு 1840ஆம் ஆண்டு சம்பளமாக வெறும் 6 'பென்ஸ்' மட்டுமே வழங்கப்பட்டது. 'பென்ஸ்' என்பது அப்பொழுது பயன்படுத்தப்பட்ட நாணயமாகும். அந்தச் சம்பளம் கட்டங்கட்டமாகச் சிறியளவில் உயர்த்தப்பட்டது. 2001ஆம் ஆண்டு 116 ரூபாய், 2008ஆம் ஆண்டு 405 ரூபாய், 2011ஆம் ஆண்டு 515 ரூபாய், 2013ஆம் ஆண்டு 620 ரூபாய், 2016ஆம் ஆண்டு 730ரூபாய், 2019ஆம் ஆண்டு, 750 ரூபாய், 2021ஆம் ஆண்டு 1,000 ரூபாய் என்ற வகையில் உயர்த்தப்பட்டது. இந்த 1,000 ரூபாய் சம்பளம் என்பது இவர்களுடைய சம்பளப் போராட்டத்தின் ஒரு மைல் கல்லாகும். கொழும்பு - காலி முகத்திடலிலே இலட்சக் கணக்கான மலையக இளைஞர், யுவதிகளின் போராட்டத்தின் பின்புதான் இந்த 1,000 ரூபாய் சம்பளமும் வழங்கப்பட்டது. பின்பு, 2024ஆம் ஆண்டிலிருந்து இன்றுவரை 1,350 ரூபாய் சம்பளம் வழங்கப்படுகின்றது. இந்த 1,350 ரூபாய் சம்பளத்துக்கு மேலதிகமாக, கம்பனிகள் வழங்குகின்ற 200 ரூபாயையும் அரசாங்கத்தால் வழங்கப்படுகின்ற 200 ரூபாயையும் சேர்த்து மொத்தமாக எதிர்வரும் சனவரி மாதம் முதல் 1,750 ரூபாய் சம்பளம் வழங்க இணக்கம் தெரிவித்திருக்கின்றோம். அந்த வகையில், வரலாற்றிலே அதிகூடிய சம்பளத்தைத் தேசிய மக்கள் சக்தி அரசாங்கமே இந்த மக்களுக்கு வழங்கி இருக்கின்றது.

இன்று என்ன நடக்கிறது? தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பளம் உயர்த்திய செய்தியை அறிந்த எதிர்க்கட்சியைச் சேர்ந்த பெண் பாராளுமன்ற உறுப்பினர் ஒருவர், இலஞ்சம் அல்லது ஊழல்கள் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவுக்குச் சென்று அதற்கு எதிராக முறைப்பாடு செய்கின்றார். இவர்களுக்கு மனசாட்சி இருக்கின்றதா? என்று நான் கேட்கின்றேன். இந்த நாட்டில் இருக்கின்ற அனைத்து மக்களுக்கும் கல்வி, சுகாதாரத்தை வழங்கி வாழவைக்கத் தங்களுடைய உழைப்பின்மூலமாக இந்த நாட்டின் பொருளாதாரத்துக்கு முதுகெலும்பாக இருக்கும் மக்களுக்கு இந்த அரசாங்கத்தால் 200 ரூபாய் சம்பளம் வழங்கப்படுகின்றபோது, எதிர்க்கட்சி உறுப்பினர்கள் சென்று இவ்வாறு முறைப்பாடு செய்கின்றார்கள்.

நான் கேட்கின்றேன், எதிர்க்கட்சியில் இருக்கின்ற மலையக அங்கத்தவர்களே, உங்களுக்கு வெட்கம், மானம், ரோசம், மரியாதை இருக்கிறதா? என்று. அவ்வாறு இருந்தால், நீங்கள் இனியும் அந்த எதிர்க்கட்சியில் இருக்க மாட்டீர்கள்! இன்று எதிர்க்கட்சி தலைவர் அவர்கள் ஊடக சந்திப்பில் கூறுகின்றார், "நாங்கள் மலையக மக்களுடைய சம்பள உயர்வுக்கு எதிர்ப்பு இல்லை" என்று. இன்று மலையகம் முழுவதும் மக்கள் கொதித்தெழுந்துள்ளார்கள். மலையகத்திலே இவர்களுக்கு எதிராகத் தேங்காய் உடைக்கப்படுகின்றது. இனியும், இவர்களால் மலையகத்துக்குச் செல்ல முடியாது. எதிர்க்கட்சிக்குக் கொஞ்சமாவது வாக்குகள் எஞ்சியிருந்தால், அது மலையத்தில்தான் இருந்தது. அதையும் இவர்கள் தம் கரங்களாலேயே இல்லாமற் செய்து விட்டார்கள்.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

வடக்கு?

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)

வடக்கிலும்தான்! வடக்கு, கிழக்கு உட்பட நாட்டின் எல்லா இடங்களிலும் இவர்களுடைய ஆட்டம் முடிந்து விட்டது. இனி இந்த நாட்டில் தேசிய மக்கள் சக்தி அரசாங்கத்தினுடைய ஆட்சிதான்! எனவே, நீங்கள் கதற வேண்டாம்! கௌரவ அர்ச்சுனா அவர்களே, பயங்கொள்ள வேண்டாம்! இந்த நாட்டில் கோடிக்கணக்கான சொத்துக்களைக் கொள்ளை யடிக்கும்போது, மத்திய வங்கியில் ஊழலைச் செய்கின்ற போது முறைப்பாடு செய்யாதவர்கள், இன்று தோட்டத் தொழிலாளருக்கு 200 ரூபாய் சம்பள அதிகரிப்பைச் செய்கின்றபோது முறைப்பாட்டைச் செய்திருக்கின்றார்கள்.

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

මේ රටේ මහ බැංකුව කොල්ල කෑවා. රටේ මුදල් නාස්ති කළා. වතුවල ඉඩම් දේශපාලන බලය මත අල්ලා ගත්තා. ඒකට එරෙහිව මේ අය ගිහින් පැමිණිලි කරලා නැහැ. මේ රටේ ඉන්න අහිංසක වතු කම්කරුවන්ට රුපියල් 200ක් වැඩි කරනකොට තමයි ගිහින් පැමිණිලි කරන්නේ. මෙච්චර කල් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ඇතුළු එම පක්ෂයට යම්කිසි ප්‍රමාණයක් -පොඩ්ඩක්- වතුවල ඡන්ද තිබුණා. දැන් ඒකත් නැති කර ගත්තා. ඔයගොල්ලන්ට ආපහු වතුවලට යන්න බැහැ. ඔයගොල්ලන් එනකල් මිනිස්සු බලාගෙන ඉන්නවා. ඒ පක්ෂයේ ඉන්න අපේ මලෙයගම් ජනතාව නියෝජනය කරන දේශපාලනඥයන්ට අපි කියන්නේ, තවදුරටත් ඒ පක්ෂයේ ඉන්නවාද නැද්ද කියලා ඔයගොල්ලන් කල්පනා කරන්න. ඔයගොල්ලන්ට ඒ පක්ෂයේ ඉඳගෙන ඡන්දය ඉල්ලන්න ආපහු වතුවලට යන්න බැහැ. එම නිසා දෙන්නාම පරිස්සම් වෙන්න. මේ මිනිස්සුද? අපේ ජාතික ජන බලවේගය බලන්න. අපේ සියලු මන්ත්‍රීවරුන් වතු කම්කරුවන් වෙනුවෙන් අද කථා කරනවා. ඒ අය ගැන හොඳින් සොයා බලනවා. අන්න සහෝදරත්වය, අන්න මිනිස්සු, අන්න ආදරය. ඒකට විරුද්ධව ගිහින් පැමිණිලි කරනවා. මේ මිනිස්සුද? හිතක් පපුවක් තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි.

மலையக மக்களை அங்கிருக்கின்ற கம்பனிகள் கைவிட்டாலும், கடந்தகால அரசாங்கங்கள் கைவிட்டாலும், எங்களுடைய தலைவர் அநுர குமார திஸாநாயக்க அவர்களுடைய ஆட்சி அந்த மக்களின் கரம்பிடித்து புதிய சக்தியோடு முன்னேறிச் செல்கிறது. அந்த மக்களுக்கு நாங்கள் இருக்கின்றோம். இவர்கள் இவ்வளவு காலமாக மலைய கத்திலே தொழிலாளர்களின் சம்பளத்தை வைத்துத்தான் அரசியல் செய்தார்கள். ஆரம்ப காலந்தொட்டு அவர்களுடைய தொழிற்சங்க அரசியலையும் இந்தச் சம்பளத்தை வைத்துக்கொண்டுதான் செய்தார்கள். இன்று அந்தச் சம்பள அரசியலுக்கு நாங்கள் முடிவு கட்டியிருக்கின்றோம். இனி அவர்கள் என்ன கூறுவார்கள்? காணிப் பிரச்சினை, வீட்டுப் பிரச்சினை பற்றி கூறுவார்கள். நாங்கள் அதற்கும் விரைவிலே முடிவு கட்டுவோம்! இனியும் அவர்கள் மலையக மக்களிடம் சென்று அவ்வாறு அரசியல் செய்ய முடியாது என்பதை இந்த உயரிய சபையிலே கூறிக்கொள்ள விரும்புகிறேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் இன்று மலையக மக்களை இந்த நாட்டின் கௌரவமான, சமத்துவமான பிரஜையாக வாழவைக்கவும், அம்மக்களுடைய மனித உரிமைகளை உறுதிசெய்து வளமான ஓர் எதிர்காலத்தைக் கட்டியெழுப்புவதற்காகவும் பாடுபட்டுக் கொண்டிருக்கிறது.

நேற்றைய தினம் எதிர்த்தரப்பில் இருக்கின்ற ஓர் உறுப்பினர் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு தொடர்பாகச் சில விடயங்களைக் கூறியிருந்தார். நான் அவருக்கு ஒன்றைக் கூறிக்கொள்ள விரும்புகிறேன். இலங்கையிலிருந்து வருடத்துக்கு 10,000-15,000 ஐயப்பன் பக்தர்கள் இந்தியாவுக்கு யாத்திரை செல்கின்றார்கள். 50 வருடங்களாக அவர்களுடைய கோரிக்கை இந்த யாத்திரையைப் புனித யாத்திரையாக அங்கீகரிக்க வேண்டும் என்பதாகும். இதுவரை எத்தனையோ இந்துக் கலாசார அமைச்சுகளை நாங்கள் கண்டிருக்கின்றோம்; எத்தனையோ அமைச்சர்கள் இருந்திருக்கிறார்கள். அவர்கள் அந்தக் கோரிக்கையை நிறைவேற்றவில்லை. ஆனால், இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் அவர்களுடைய 50 வருடக் கனவை நனவாக்கும் வகையில், அமைச்சரவையிலே அனுமதி பெற்று, நேற்று முன்தினம் அதிவிசேட வர்த்தமானி அறிவித்தல்மூலம் ஐயப்பன் யாத்திரையை புனித யாத்திரையாக அறிவித்திருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உலகத்திலேயே ஐயப்பன் யாத்திரையைப் புனித யாத்திரை யாக அறிவித்த ஒரே நாடு இலங்கை என்ற பெருமையை நாங்கள் பெற்றிருக்கிறோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இவர்கள் இன்னுமொரு கதையை முன்வைக்கின்றார்கள். அதாவது, மலையகத் தோட்டத் தொழிலாளர்களுக்கு அதிகரிக்கப்பட்ட சம்பளம் கிடைக்குமா அல்லது இதுவொரு கண்துடைப்பா? என்று கேட்டுக் கொண்டிருக்கின்றார்கள். இன்று உண்மையில் எதிர்க்கட்சியினருக்குப் பேசுவதற்குத் தலைப்புக் கிடையாது; இந்த அரசாங்கத்துடைய செயற்பாடு களைப் பார்த்து விமர்சிப்பதற்குக் காரணங்கள் கிடையாது. சபையில் ஏதாவது பேச வேண்டும், அவை செய்திகளில் வரவேண்டும் என்பதற்காக அவர்கள் இன்று 'முழுப் பூசணிக்காயை சோற்றுக்குள் மறைக்கும்' செயற்பாடுகளில் ஈடுபட்டுக் கொண்டிருக்கின்றார்கள். இன்று மக்கள் மத்தியில் சென்று பாருங்கள்! விசேடமாக, மலையத்தில் இருக்கின்ற அரசியல் கட்சிகளிடம் நாங்கள் கேட்கின்றோம், தயவுசெய்து பாராளுமன்றுக்கு வருவதற்காக மாத்திரம் அரசியலை மேற்கொள்ளாமல், நீங்கள் மலையகப் பகுதிகளுக்குச் சென்று பாருங்கள்! மக்களுடைய மனநிலையைப் புரிந்து கொள்ளுங்கள்! அவ்வாறு நீங்கள் புரிந்து கொண்டிருந்தால், மலையக மக்களுக்குத் துரோகம் செய்யும் இந்தத் துரோகக் கூட்டத்தோடு நீங்கள் ஒன்றிணைந்திருக்க மாட்டீர்கள்! இன்று இவர்கள் ஒவ்வொரு கதையைக் கூறுகின்றார்கள்.

மலையகப் பகுதிப் பெருந்தோட்டங்களில் இருக்கின்ற ஏக்கர் கணக்கான காணிகளைத் தம்முடைய அரசியல் பலத்தால், அதிகாரப் பலத்தால், கைவசப்படுத்தியவர்கள்தான் இன்று அந்தக் கட்சியில் இருக்கின்றார்கள். யோசித்துப் பாருங்கள்! மலையகத் தோட்டத் தொழிலாளர்களுக்கு சம்பளம் உயர்த்தப்பட்டால், தங்களுடைய தோட்டத்தில் தொழில் புரிகின்றவர்களுக்கும் சம்பளம் உயர்த்தப்பட வேண்டும். அதனால், தாம் நட்டமடைந்து விடுவோமென்று இவர்களுக் குப் பயமிருக்கின்றது. அந்தப் பயம் காரணமாகத்தான் இவர்கள் அறைகூவல் விடுத்துக் கொண்டிருக்கின்றார்கள். எனவே, யார் என்ன சொன்னாலும், நீங்கள் எங்கு சென்று முறையிட்டாலும், தேசிய மக்கள் சக்தி அரசாங்கம் சனவரி மாதம் முதல் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வைப் பெற்றுத்தரும் என்பதை ஒரு பிரதி அமைச்சர் என்ற வகையில் நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

එම නිසා මම කියන්න කැමැතියි විපක්ෂයට. ඔබතුමන්ලා ඕනෑ තරම් ගිහින් පැමිණිලි කරන්න. ඕනෑ තරම් බොරු කියන්න. ඕනෑ තරම් විවේචන කරන්න. අපි කියන පරිදි ජනවාරි සිට වතු කම්කරුවන්ට රුපියල් 1,750ක් ලබා දෙනවා කියලා මම කියනවා.

බොහොම ස්තුතියි. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிக்க நன்றி!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Hon. Presiding Member.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය ඇමතිතුමා මගේ නම සඳහන් කරලා කාරණයක් කිව්වා. මම දෙමළ භාෂාවෙන් කියන්නම්.

ஓர் இறாத்தல் பாண் 160 ரூபாய்! ஓர் இறாத்தல் பாண் கொடுக்கின்ற அரசாங்கமா நீங்கள்? நான் இருந்திருந்தால் இவ்வாறு செய்ய மாட்டேன். ஓர் இறாத்தல் பாணும் 2 வாழைப்பழமும் கொடுக்கிறதுக்கெல்லாம் அரசாங்கத்துக்கு வரவு செலவுத்திட்டம் தேவையில்லை!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක කිව්වේ නැහැ නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ஓர் இறாத்தல் பாண் வாங்குவதற்குப் பெறுமதியான காசைத்தான் ஐயா கொடுக்கின்றீர்கள் நீங்கள்! உங்களால் முடிந்தால் அவர்களின் சம்பளத்தை 1,000 ரூபாய் - 2,000 ரூபாய் என்று கூட்டுங்கள்! உங்களுடைய சக இனத்துக்குக் கொடுப்பது ஓர் இறாத்தல் பாண்! இதுகுறித்து உங்களுக்கு வெட்கமாக இல்லையா? என்ன ஐயா அரசாங்கம் நடத்துகின்றீர்கள்?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.31]

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ 80 වැනි අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන වෙලාවේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ වැරදි තර්ක දෙකක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරමින්ම මගේ කථාවට ප්‍රවිෂ්ට වෙන්නම්. එතුමා කිව්වා, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් කැබ් රථ මිලදී ගන්න රුපියල් මිලියන 12,500ක් වෙන් කරලා තිබෙනවා. ඒ කැබ් රථ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාට ලබා දෙනවා. අපට නම් අවශ්‍ය නැහැ. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට ඒවා ගන්න කියන්න, එම කැබ් රථ භාවිත වෙන්නේ බඩු මුට්ටු එකතු කරගෙන ගිහිල්ලා බෙදන්නයි" කියලා. කෙහෙල් කැන්, හාල්, පොල් සීනි එකතු කරගෙන ගිහිල්ලා අපේ සාමාජිකයන්ට බෙදා දෙන වැඩකට වාගේයි මේ කැබ් රථ භාවිත වෙන්නේ කියන අදහසක් තමයි එතුමා ඉදිරිපත් කළේ. ඒ නිසා ඒ රුපියල් මිලියන 12,500 වෙන් කරලා තිබෙන්නේ ඇයි කියලා විශේෂයෙන් පැහැදිලි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන ඉතාම අමාරුවෙන් තමයි ඒ වැඩකටයුතු කරගෙන යන්නේ. එකට හේතුව තමයි, පළාත් පාලන ආයතනයක තිබිය යුතු උපකරණ සහ යන්ත්‍රසූත්‍රවල අඩුපාඩුව.

ඒ වාගේමයි, ප්‍රධාන අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල ඉන්න ප්‍රධාන නිලධාරින්ගේ රාජකාරි කටයුතු කරගෙන යෑමට අවශ්‍ය වාහනවල තිබෙන අඩුපාඩුව. ඒ ඔක්කොම සලකා බලා, ඒ වෙනුවෙන් වාහන 2,700ක් ගෙන්වීම සඳහා තමයි මේ රුපියල් මිලියන 12,500ක් වෙන් කරලා තිබෙන්නේ. ඒ රුපියල් මිලියන 12,500 පාවිච්චි කරලා වාහන 2,700ක් ගෙන්වනකොට, ඒ තුළ කැබ් රථ 1,175ක් ගෙන්වීමටත් අපි කටයුතු කරනවා. පාර්ලිමේන්තුවේ ඉන්න අපේ ඇමතිවරුන්ට සහ නියෝජ්‍ය ඇමතිවරුන්ට අමාත්‍යාංශවලින් දැනටමත් වාහන ලැබිලා තිබෙන නිසාත්, විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු පිරිසට වාහන ලැබිලා තිබෙන නිසාත්, අපි ඒ කැබ් රථ ලබා දෙන්නේ දැනට කැබ් රථයක් නොමැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විතරයි. ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් අයින් කළාට පස්සේත් - අපි 225 දෙනාම ගත්තත්- තවත් වාහන 1,550කට වැඩි ප්‍රමාණයක් ඉතුරු වෙනවා.

අපේ දයාසිරි ජයසේකර මැතිතුමා ඉදිරිපත් කළ තර්කය අනුව මේ ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රී cadre එකට බඩු මුට්ටු එකතු කරන්න නම් මේ කැබ් රථ ගෙනෙන්නේ, එතුමා පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ, රාජ්‍ය සේවකයන්ට, රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට ඉතුරු වාහන ටික දෙන එකට එයා විරුද්ධද කියලා. එහෙම නම්, එතුමාගේ විරුද්ධත්වය තිබෙන්න ඕනෑ රාජ්‍ය ආයතනවල තිබෙන අවුරුදු 20ක්, 25ක් පැරණි වාහන වෙනුවට නව වාහන සපයා දීමටත්. ඒකට හේතුව තමයි, මේ වාහන අතරින් වාහන 150ක්, 160ක් හැරුණු කොට ඉතුරු වාහන සියල්ලම - ඉතිරි කැබ් රථ සියල්ලම යන්නේ- යන්නේ රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමට අදාළව රාජ්‍ය නිලධාරින්ට.

ඊළඟට එතුමා තව තර්කයක් ඉදිරිපත් කළා, රාජ්‍ය සේවකයන්ට දේපළ ණය ලබා දීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා, ඒ මුදල ඉන්න රාජ්‍ය සේවකයන් ප්‍රමාණයෙන් බෙදලා ගත්තාම එක් අයෙකුට රුපියල් 400ක් වාගේ ප්‍රමාණයක් තමයි ලැබෙන්නේ කියලා.

හරියට සොයලා බලන්නේ නැතිව, හරියට ගණන් හිලවු හදන්නේ නැතිව ඇවිල්ලා තර්ක ඉදිරිපත් කරන්න ගියාම ඔන්න ඔය වාගේ අමාරුවේ වැටෙනවා. රාජ්‍ය සේවකයන්ට දේපොළ ණය ලබා දෙන්නේ බැංකු විසින්. බැංකු විසින් ණය ලබා දෙනවා. ඒ ලබා දෙන ණයේ පොලියෙන් කිසියම් ප්‍රතිශතයක් ආණ්ඩුව බාර ගන්නවා. ලක්ෂ 30ක් දක්වා වනබ ණය මුදලකට සියයට 4ක පොලී සහනයක් ලබා දෙනවා ආණ්ඩුවෙන්. ලක්ෂ 50 දක්වා ඉතිරි ලක්ෂ 20ට සියයට 2ක පොලී සහනයක් ලබා දෙනවා ආණ්ඩුවෙන්. උදාහරණයක් හැටියට කියනවා නම්, සාමාන්‍ය පොලී අනුපාතය තිබෙන්නේ සියයට 12 නම්, පළමුවෙනි මිලියන 3 සඳහා රජය පැත්තෙන් සියයට 4ක සහනයක් ලබා දෙනවා. අන්න ඒ සහන මුදල ලබා දීම සඳහා, ඒ සහනයට අවශ්‍ය මුදල සඳහා තමයි මේ මිලියන 500 වෙන් කරලා තිබෙන්නේ. එහෙම නැතිව රාජ්‍ය සේවකයන්ට දේපොළ ණය ලබා දෙන්න මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා නොවෙයි. කොහෙන් හරි අහුලා ගත්ත කෑල්ලක් අරගෙන ඒක එක එක ගණනින් බෙදලා එක රාජ්‍ය සේවකයෙකුට රුපියල් 400ක දේපොළ ණයක් තමයි ලැබෙන්නේ කියලා එතුමා කිව්වාට, ඒ තරමට ගණිතය බැරි ආණ්ඩුවක් නොවෙයි මේක.

ඒ කථාව අතරතුර මගේ කථාව ප්‍රධාන මාතෘකාවෙන් එළියට ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජන වහරේ කියනවා,

[ගරු දිනේෂ් හේමන්ත මහතා]

"ඇත්තට නිදාගෙන ඉන්න මිනිස්සු අවදි කරන්න ලේසි වුණත් බොරුවට නිදාගෙන ඉන්න මිනිස්සු අවදි කරන්න උත්සාහ කරන්න එපා, ඒ කාලය අපතේ යනවා" කියලා. 2026 අය වැය තුළින් ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ මහ පොළොවේ ඇති කරලා තිබෙන සත්‍යය දකියි කියන බයට ඇස්දෙක වහගෙන ඉදිරිපත් කරන මේ තර්කවලට කාලය අපරාදේ වැය කරන්න එපා කියලා විපක්ෂය දැනුවත් කරන්න ඕනෑ. අපි ඒ කාලය වැය කරමු, උත්සාහ කරමු, මීට වසරකට කලින් අපිත් එක්ක ගිවිසුමක් ඇති කර ගත්ත බිමේ ජීවත් වෙන, ජාතික ජන බලවේගය ආණ්ඩුවක් පත් කරන්න කැප වෙච්ච ජනතාව දැනුවත් කිරීම සඳහා.

විපක්ෂය ඉදිරිපත් කළ චෝදනාවල ප්‍රධානම දේ තමයි, 2026 අය වැයේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනා, යෝජනා විතරක්මයි, ඒ අතාර්කික යෝජනා මඟින් ඉලක්ක සපුරා ගැනීමේ කිසිම හැකියාවක් ජාතික ජන බලවේගය ආණ්ඩුවට නැහැ කියන එක. 2026 අය වැය යෝජනා ඉෂ්ට කර ගන්න පුළුවන්ද බැරිද කියන එක ගැන අපට කථා කරන්න පුළුවන් 2025දී අපි කරලා තිබෙන වැඩත් එක්ක. අපි 2025 අය වැයේ මූලා ඉලක්ක සපුරා ගත්ත විදිය ගැන මම පුංචි හැඳින්වීමක් කරන්නම්. රජය බලාපොරොත්තු වුණා අය වැය හිඟය රුපියල් ට්‍රිලියන 2,2ක මට්ටමක තියා ගන්න, අපේ අය වැය කාල සීමාව ඇතළත. නමුත් අද වෙනකොට සත්‍ය ඇස්තමේන්තුව, සත්‍ය තක්සේරුව අනුව අපි අපේ අය වැය හිඟය රුපියල් ට්‍රිලියන 1. 4ක් දක්වා අරගෙන ඇවිල්ලා තිබෙනවා. රජයේ ආදායම ගැන අතීතයේ ඉඳලා කියන්න වටින නිසා මම කියාගෙන යන්නම්. 2019 අවුරුද්දේ ඇස්තමේන්තු කළා රජයේ ආදායම රුපියල් ට්‍රිලියන 2.3ක් වෙයි කියලා. හැබැයි හෙව්වේ 1.8යි. 2020දී ට්‍රිලියන 1.5ක් සොයා ගන්න පුළුවන් වෙයි කියලා හිතුවා. හැබැයි හෙව්වේ 1.3යි. 2021දී ට්‍රිලියන 1.9ක් අපේක්ෂා කළා. හම්බ වුණේ 1.4යි. 2022දී ට්‍රිලියන 2.2ක් අපේක්ෂා කළා. හම්බ වුණේ ට්‍රිලියන 2යි. 2023දී ට්‍රිලියන 3.4ක් අපේක්ෂා කළා. හම්බ වුණේ ට්‍රිලියන 3යි. 2024දී ට්‍රිලියන 4.1ක් අපේක්ෂා කළා. හම්බ වුණේ 4යි. ජාතික ජන බලවේගය ආණ්ඩුව 2025දී අපේක්ෂා කළේ ට්‍රිලියන 4.9යි. මේ මොහොතේ ට්‍රිලියන 5.2ක් ඉක්මවලා අපි අපේ අය වැය ඉලක්ක සපුරාගෙන තිබෙනවා. අපට තේ කඩයක්වත් කරන්න බැහැ, පෙට්ටි කඩයක්වත් කර ගන්න බැහැ කියලා ගෝරනාඩු කළ විපක්ෂයට, ආණ්ඩුව අරගෙන මාසයකින් දෙකකින්, මාස 6කින් ආණ්ඩුව වැටෙයි කියලා බලාගෙන හිටපු විපක්ෂයට භය නැතිව කියන්න තිබෙන්නේ, අපි අපේ මූලා ඉලක්ක සැලසුම් කළ මට්ටමටත් එහාට සපුරාගෙන තිබෙනවා කියන එකයි.

ඒ විතරක් නොවෙයි. තවත් මූලා දත්ත ටිකක් ඉදිරිපත් කරන්න මම මේ අවස්ථාව යොදා ගන්නවා. ඉතිහාසයේ වැඩිම සංචාරක පැමිණීම වාර්තා කළ වසර බවට මේ වසර පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඉතිහාසයේ වැඩිම විදේශ ප්‍රේෂණ හිමි වුණු වසර බවටත් 2025 වසර පත් වෙලා තිබෙනවා. ඒ වාගේම දිනකදී වාර්තා වූ වැඩිම ආදායම, දිනකදී ඉපයූ වැඩිම රේගු ආදායම වන රුපියල් මිලියන 27.7ක් නොවැම්බර් මාසයේ 06වෙනි දා රේගුව, නැත්නම් අපේ වරාය අධිකාරිය විසින් උපයාගෙන තිබෙනවා. ඒ වාගේම, එක් ආයතනයක් විසින් උපයපු වැඩිම ආදායම වන රුපියල් බිලියන 2,000ක් උපයන්නට රේගුව සමත් වෙලා තිබෙනවා. මෙන්න මේ වාගේ ඉලක්කම්වලින් අපි තහවුරු කරලා තිබෙනවා, 2025 අය වැය නිකම්ම අය වැයක් නොවෙයි, මේ මහ පොළොවේ යථාර්ථයක් බවට පත් වෙච්ච අය වැයක් කියලා.

ඉතිරි විනාඩි දෙක මට පාවිච්චි කරන්න වෙනවා මේ කාරණය ගැන කථා කරන්න. අද පාර්ලිමේන්තුවේදී කළ අපේ හැම කථාවකදීම ඉදිරිපත් වෙච්ච කාරණය තමයි මේ වතු කම්කරුවන්ගේ වැටුප පිළිබඳ කාරණය. වතු කම්කරුවන්ගේ වැටුප පිළිබඳ අද ආණ්ඩු පක්ෂයේ හැම මන්ත්‍රීවරයෙකුම, මන්ත්‍රීවරියකම කථා කළා කියලා විපක්ෂයෙන් චෝදනාවක් එල්ල වුණා. අද කථා කරපු මේ කිහිපදෙනා නොවෙයි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 159දෙනාම, ජනාධිපතිතුමා ඇතුළුව 160දෙනාම වුණත් කථා කළ යුතු මාතෘකාවක්. මාතලේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු විධියට මට විශේෂ අයිතියක් තිබෙනවා මේ ගැන කථා කරන්න. මාතලේ දිස්ත්‍රික්කය කියන්නේ වතු කම්කරුවන් බහුල, වතු ආශ්‍රිතව ජීවත් වන විශාල ප්‍රජාවක් සිටින දිස්ත්‍රික්කයක්. අපි ජාතික ජන බලවේගය ආණ්ඩුව පත් කරන්න, ජනාධිපතිවරණයේදී අපේ ලග්ගල ආසනයෙන් ජාතික ජන බලවේගයට, අපේ අනුර දිසානායක ජනාධිපතිතුමාට ඡන්ද ලැබුණේ නැහැ. ඒ ආසනය අපි පරාජය වුණා. ඒ ආසනය පරාජය වෙන්න බලපෑ ප්‍රධාන හේතුවක් තමයි, අඹන්ගඟ කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බහුතර ජනතාව අපේ ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අතහැර සමගි ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වැළඳ ගැනීම. සමගි ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට කැමැති වෙලා, පළාත් පාලන මැතිවරණයේදීත් අඹන්ගඟ කෝරලේ ප්‍රාදේශීය සභාවේ බලය සමගි ජන බලවේගයට දීලා තිබෙනවා වැඩ ටික කරගෙන යන්න. එහෙම සමගි ජන බලවේගයට භාරදුන් අඹන්ගඟ කෝරලයේ, හපුගස්පිටිය, ඕපල්ගල, ඇල්කඩුව කියන්නේ විශාල ප්‍රමාණයක් වතු කම්කරුවන් ජීවත් වන ප්‍රදේශයක්. අන්න, ඒ ප්‍රදේශවල ඡන්දවලින් පාර්ලිමේන්තුවට ආපු රෝහිණී කවිරත්න මැතිනිය කිසිම හිරිකිතයක් නැතිව ගිහින් වතු ප්‍රජාවට රුපියල් 200ක් වැඩි කිරීමට විරුද්ධව අල්ලස් කොමිසමට පැමිණිල්ලක් කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
**(மாண்புமிகு தினேஷ் ஹேமந்த)**
(The Hon. Dinesh Hemantha)
මට තව විනාඩියක කාලයක් ලබාදෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

1939දී ශත 16ක් වෙලා තිබුණු වැටුප වැඩි කර දෙන්න කියලා මුල්ඔය වතුයායේ සේවකයෝ කරපු අරගලයේදී පොලීසිය අතින් වෙඩි කාලා මැරෙනවා, සහෝදරයෙක්. එතැනින් පටන් ගත්ත අරගළය දිගින් දිගට ඇවිල්ලා, මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ අරගළයක් නැතිව තිබියදීත් මේ රුපියල් 200 වැඩි කරන්න අපි එකඟ වුණේ ජනතාවගේ ඇත්ත දුක පෙනෙන, ඒ ඇත්ත දුක හඳුනන ආණ්ඩුවක් නිසායි. අපට ඇත්තටම ඒ මිනිස්සුන්ගේ දුක පෙනෙනවා. ඒ මිනිස්සුන්ගේ ඇත්තම දුක මේ බිමේ අපි දකිනවා. අපට කියන්න තිබෙන්නේ, මේ රුපියල් 200 වැඩි කරපු විධිය නීති විරෝධි නම්, එහෙම කියන කණ්ඩායමට - ඔය කියන මහත්මියට- ඒ කාලයේ නියමිත ක්‍රමයට ගිහිල්ලා ඔය රුපියල් 200 වැඩි කරන්න ක්‍රමයක් හදලා දෙන්න තිබුණා. අපි දන්නා, අපි එකඟ වෙච්ච, නීතියට බරක් නොවෙන, නීතියට අවැඩක් නොවන ක්‍රමයට ඔන්න අපි රුපියල් 200ක් වැඩි කර දීලා තිබෙනවා. අද විපක්ෂයෙන් අපට නිවැරදි උත්තරයක් ඕනෑ, මේ රුපියල් 200 වැඩි කිරීමට ඔබතුමන්ලා එකඟ ද, නැද්ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කඳුකරයේ ජනතාවගේ, එහෙම නැත්නම් වතුකරයේ ඉන්න අපේ ජනතාවගේ ඡන්ද අරගෙන මේ පාර්ලිමේන්තුවට සීයලා ඇවිල්ලා තිබෙනවා, පුතාලා ඇවිල්ලා තිබෙනවා. අද මුණුබුරෝත් පාර්ලිමේන්තුව නියෝජනය

කරනවා. ඔවුන්ගේ ඡන්දවලින් අද මෙතැන ඉන්න, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට විපක්ෂව ඉන්න ඒ මන්ත්‍රීවරුන්ට ඔන්න අද වරමක් ලැබී තිබෙනවා. මොකක්ද ඒ වරම? තමන්ගේ ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටින්න පුළුවන්ද, බැරිද කියන එක අද සවස 6.00ට ඡන්දය ප්‍රකාශ කරද්දී අපට බලාගන්න හැකියාව ලැබෙනවා. ඇත්ත මහජන නියෝජිතයන් නම්, ඇත්ත වශයෙන්ම එතුමන්ලා තමන්ගේ ජනතාව නියෝජනය කරන්න පැමිණියා නම්, නුවරඑළිය වැනි ප්‍රදේශවල වතු ප්‍රජාව, නැත්නම් වතු කම්කරුවන් නියෝජනය කරමින් පැමිණි ඒ මන්ත්‍රීතුමන්ලා ඡන්දය ප්‍රකාශ කිරීමේදී ඒ ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරනවාද, නැද්ද කියා අද සවසට බලාගන්න පුළුවන්.

කාල වේලාව ඉක්ම ගොස් තිබෙන නිසා මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ, සියයට 3 කණ්ඩායම ගැන වැරදි ඉලක්ක තබාගෙන හිටපු එක තමයි විපක්ෂය කරපු ලොකුම වැරැද්ද. ඒ සියයට 3, සියයට 200ට, 300ට නොවෙයි, සියයට 1500 ගුණයකින් වැඩිවෙලා තමයි අද මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පිහිටුවා තිබෙන්නේ. ඒ නිසා මෙතැනින් ඉස්සරහට දෙවැනි, තුන්වැනි, හතරවැනි අවුරුදුවලින් එහාට ගිහින් පස්වැනි අවුරුද්ද වෙනකොට මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ මහ පොළොවේ යථාර්ථය බවට පත් වෙන බව කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.44]

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 වසරට අදාළව අපේ රටේ ආර්ථිකයේ දිශානතියට, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ඉදිරි ගමන් මඟට අවශ්‍ය මූලික ආර්ථික උපාය මාර්ග පිළිබඳව පසුගිය 7වැනි දා ඉඳලා පුරා දින 7ක් මේ පාර්ලිමේන්තුව තුළ කරන සාකච්ඡාවේ අවසාන අවස්ථාවට අද අපි සියලුදෙනා ළඟා වෙමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 වසරට අදාළ අය වැය ලේඛනයේ දිග, පළල, ගැඹුර පිළිබඳ සංවාදය ආරම්භ කරන කොට මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි මේ රට භාර ගත්තේ මීට වසරකට කලින්. වසරකට කලින් 2024 සැප්තැම්බර් මාසයේ 21වෙනි දා සහ නොවැම්බර් මාසයේ 14වෙනි දා රටේ බලය අත්පත් කරගෙන අපි ඉතා කෙටි කාලයකට අය වැය ලේඛනයක් ඉදිරිපත් කළා. ඒ ආපු ගමන පිළිබඳ පසුවිපරමක් කරලා, නිවැරදි ආර්ථික ගමනකට අවශ්‍ය අඩිතාලම දාලා, ඉන් අනතුරුව එහි දෙවැනි පියවර තබන්න තමයි 2026 වසරට අදාළ මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළේ.

අපි භාර ගන්නකොට මේ රට බංකොලොත් වෙච්ච රටක්. අප විසින්ම, රටේ දේශපාලනය විසින්ම තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යන්න නොහැකියි කියන සහතිකය ලියා ගත්ත ඛේදනීය ඉරණමට ගොදුරු වෙච්ච රටක් තමයි අපට ලැබුණේ. හැබැයි, රටේ ජනතාවට ජාතික ජන බලවේගය කෙරෙහි තිබුණු විශ්වාසයත් එක්ක ලබා දීපු දේශපාලන බලයත් එක්ක, ජනවරමත් එක්ක, ඒ දේශපාලන පරිවර්තනයෙන් පස්සේ 2025 වසරට අපි අය වැය ලේඛනයක් ඉදිරිපත් කළා. 2025 වසරට අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට විපක්ෂයෙන් කිව්වේ මොකක්ද? "ඔය ගත්තාට ගෙනියන්න බැහැ වැටෙනවා, මාස හයෙන් වැටෙනවා, හතෙන් වැටෙනවා, නවයෙන් වැටෙනවා" කිව්වා. ඒ විධියට ඒ අය ඇඳගෙන හිටියා, සහතික දීලා තිබුණා. රටට කිව්වා, ඔය කිව්වාට ආර්ථිකය වැටෙනවා, රට වැටෙනවා, ආණ්ඩුව වැටෙනවා, දේශපාලනය වැටෙනවා කියලා. හැබැයි, අවුරුද්දක් ඇතුළත ජාතික ජන බලවේගය ආණ්ඩුව ඔප්පු කරලා පෙන්නුවා දේශපාලනයෙන් විතරක් නොවෙයි, ආර්ථිකයෙනුත් රට ස්ථාවරයි, නිශ්චිතයි, නියමිතයි කියන එක. රට නිශ්චිත ගමනක ස්ථාවර වෙලා තිබෙනවා කියන එක ඔප්පු කරලා පෙන්නුවා, 2025දී.

දැන් 2025 වසර අවසන් කරලා 2026ටයි ලෑස්ති වෙන්නේ. 2026 වසරට ලෑස්ති වෙනකොට, 2026 සඳහා අය වැය ලේඛනය ගෙනෙනකොට ඔබතුමන්ලා විපක්ෂයේ ඉඳගෙන විවිධ කතන්දර කිව්වා, විවිධ සිහින මැව්වා. ඒ සිහින සියල්ල දෙස ඔබතුමන්ලා ආපහු හැරිලා බලන්න. පසුගිය අවුරුද්ද ඇතුළත විපක්ෂය හැටියට රටට ජනතාවට කියපු එක කතන්දරයක්වත් සනාථ කරන්න බැරි වුණා. ඒවා නිකම් හිස් ප්‍රලාප වුණා; රට ඉස්සරහ විපක්ෂය බොරුකාරයෝ වුණා. හැබැයි, දැන් 2026ට අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දෙවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට අද විපක්ෂය නන්නත්තාර වෙන තැනට පත් කරලා තිබෙනවා. මේ අය වැය ලේඛනයට සාධනීය විවේචනයක් ඉදිරිපත් කරන්න බැරි තරමට විපක්ෂය බංකොලොත් කරලා තිබෙනවා.

දැන් විපක්ෂය මේ විවාදය තුළ කියන්නේ මොනවාද? අපි භාරගන්න කොට හිස් වෙලා තිබුණු භාණ්ඩාගාරය අවුරුද්දක් ඇතුළත පිරිලා ඉතිරිලා යන තැනට ආර්ථිකය මෙහෙයවන්න පුළුවන් නම්, ඒක විපක්ෂය පිළිගන්නවා නම්, ඒක ඉතාම වැදගත් කාරණයක්. මූල්‍ය කළමනාකරණය අතින් ශක්තිමත්, ස්ථාවර ආර්ථික උපාය මාර්ගයකට රට අවතීර්ණ කරන්න ජාතික ජන බලවේගයට පුළුවන් වුණාය කියන එක විවාදය ආරම්භ කරනකොට විපක්ෂය පැත්තෙන්ම පිළිගත්තා; තහවුරු කළා. හැබැයි, එහෙම තහවුරු කරද්දී, ආර්ථික වශයෙන් රට ස්ථාවර වෙද්දී මේ අය වැය ලේඛනය පිළිබඳව සාධනීය විවේචනයක් ඉදිරිපත් කරන්න බැරි තරමට විපක්ෂය අසරණ වෙලා තිබෙනවා.

ඒ නිසා විපක්ෂය මේ අය වැය යෝජනා තුළ තිබෙන ප්‍රතිපත්තිමය කාරණා විවේචනය කරනවා වෙනුවට කොහෙන් හරි එකතු කර ගත්තු වෙන වෙන වැල්වටාරම් කියවන්න පටන් ගෙන තිබෙනවා. විපක්ෂය නියෝජනය කරමින් මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා, අය වැය ලේඛනය තුළින් ඉදිරිපත් කරපු ප්‍රතිපත්තිමය කාරණා පැත්තකින් තියලා වෙන වෙන වැල්වටාරම් කියවන්න පටන් ගත්තා, වෙන වෙන විකාර කියවන්න පටන් ගත්තා, වෙන වෙන සංසිද්ධි එක්ක පොර බදන්න පටන් ගත්තා. ඒ කියන්නේ, විපක්ෂයට මේ අය වැය ලේඛනය පිළිබඳව ප්‍රතිපත්තිමය වශයෙන් විරුද්ධ විය හැකි විවේචනයක් ගොනු කරන්න අසමත් වන තරමට ජාතික ජන බලවේගය 2026 වසරට ඉදිරිපත් කරපු අය වැය ලේඛනය සමත් වෙලා තිබෙනවා. විපක්ෂය ඒ තරමට අසරණභාවයට පත් කරන්න සමත් වෙච්ච 2026 අය වැය ලේඛනය ගැන තමයි අපි මේ විවාද කරන්නේ, සාකච්ඡා කරන්නේ.

දැන් විපක්ෂයට කියන්න තිබෙන්නේ මොකක්ද? විපක්ෂයට දැන් කියන්න තිබෙන්නේ මන්ත්‍රීවරුන්ට දෙන වාහන ගැන. වාහන 2,700ක් ආනයනය කරන්න රුපියල් මිලියන 12,500ක මුදල් ප්‍රතිපාදන වෙන් කරන කොට ඒ අය රටට කියනවා, මන්ත්‍රීවරු 225ට වාහන ගෙන්වන්න රුපියල් මිලියන 12,500ක්

[ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා]

වෙන් කළා කියලා. බොරු කියනවා හැරෙන්න, මේ අය වැය පිළිබඳව ඇත්ත යථාර්ථය රටට කියා ගන්න විපක්ෂයේ අයට බැරි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනය තුළ විශේෂිත කරුණු ගණනාවක් තිබෙනවා. අපේ ආර්ථික උපාය මාර්ගය ඇතුළේ මූලිකව පදනම් වෙච්ච කරුණු 6කට, ඉලක්ක 6කට, දිශානති 6කට අනුකූල වන විධියට රටේ ආර්ථිකය කළමනාකරණය කිරීමට සමත් වන ආකාරයට 2026 වසරට අදාළ මේ අය වැය ලේඛනය තුළ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ තුළ ඉතා පැහැදිලියි, ණය ගෙවා ගන්න බැරිව බංකොලොත්භාවයට පත් වෙච්ච රට, බුන්වත්භාවයට පත් වෙච්ච රට භාරගෙන අවුරුද්දක් ඇතුළත ණය ගෙවන රටක් බවට පත් කර ගන්න අවශ්‍ය ආර්ථික හැකියාව, ශක්තිය ගොඩ නඟන්න ජාතික ජන බලවේග ආණ්ඩුවේ අය වැය ලේඛනයට, ප්‍රතිපත්තියට පුළුවන්කම ලැබුණාය කියන කාරණය. ණය ගෙවා ගන්න බැරිව බංකොලොත් වුණු රටක තත්ත්වයේ ඉඳන් ණය ගෙවන්න පුළුවන් රටක් බවට අපේ රට දැන් පත් වුණා.

ඒ විතරක් නොවෙයි. මේ පාර්ලිමේන්තුව ඇතුළේ අවුරුදු 15කට ආසන්න කාලයක් තුළ අය වැය කථා 15කට වැඩි ප්‍රමාණයක් අහලා තිබෙනවා; ඒවා ගැන විවාද කරලා තිබෙනවා; සංවාද කරලා තිබෙනවා; සාකච්ඡා කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතෙක් කාලයක් ගෙනාපු ඒ හැම අය වැය ලේඛනයකම විශේෂ සමාන බවක් තිබුණා. මේ අය වැය ලේඛනය ඒ සියල්ල වෙනස් කරලා තිබෙනවා. මෙච්චර කාලයක් අපි ඇහුවේ, රාජ්‍ය ආදායම මෙච්චරයි, වියදම මෙච්චරයි, ණය මෙච්චරයි, බදු ආදායම මෙච්චරයි, බදු නොවන ආදායම මෙච්චරයි, බදු මෙච්චරකින් වැඩි කරනවා, අය වැය හිඟය පියවන්න ගන්න ණය මෙච්චරයි කියලායි. ඒ, අවුරුදු 15ක් තිස්සේ පවත්වාගෙන ආපු සාම්ප්‍රදායික අය වැයේ ස්වභාවයයි.

ඒ සියලු අය වැය අභිභවා යමින් ජාතික ජන බලවේගය ආණ්ඩුව 2026 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරපු අය වැය ලේඛනය, ජනතාව මත අලුතින් බදු පනවන්නේ නැති අය වැය ලේඛනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අලුතින් ණය නොගන්නා අය වැය ලේඛනයක් බවටත් මෙම අය වැය ලේඛනය පත් කරගෙන තිබෙනවා. මෙතෙක් කාලයක් සාම්ප්‍රදායිකව රටේ ජනතාව මත බදු පනවමින්, බර පටවමින්, ණය පරිමාණය වැඩි කරමින්, රට අමාරු අඩියකට, අගාධයකට ඇද දැම්මා. නමුත්, මේ අය වැය ලේඛනය මෙතෙක් කරගෙන ආපු ක්‍රමය වෙනස් කර තිබෙනවා. මෙතෙක් ගෙනා අය වැය ලේඛනවලින් ඔබතුමන්ලාට තිබිච්ච එකම උත්තරය තමයි, පාඩු ලබන රාජ්‍ය ආයතන විකුණා දැමීම. ඒ හැර වෙන කිසිම උත්තරයක් නැත. ඒවා විකුණලා අය වැය හිඟය පියවන්න භාණ්ඩාගාරයට කීයක් හරි ඉතිරි කරනවා හැරෙන්න වෙන මොකුත් උත්තරයක් තිබුණේ නැත.

නමුත්, පාඩු ලබන ආයතන විකුණනවා වෙනුවට, පාඩු ලබන, පවත්වා ගෙන යන්න අමාරු, අසීරු ආයතනවල සේවය කරන සේවකයන්ගේ EPF එක, ETF එක විතරක් නොව පාරිතෝෂික දීමනාව ගෙවන්නත් මේ අය වැය ලේඛනය හරහා භාණ්ඩාගාරය මැදිහත් වීමක් කරනවා. වෙන දා කරන්නේ ඒ සියල්ල අහෝසි කරලා විකුණා දමන එකයි; ඇවර කර දමන එකයි. ඒ ප්‍රතිපත්තිය වෙනුවට වඩා දියුණු කළමනාකරණයක් සහිතව රටේ ආර්ථිකය නව දිශාවකට හසුරුවන්න අවශ්‍ය කරන උපාය මාර්ගික දැක්මක් සහිතව, ඒ අරමුණ ජයග්‍රහණය කරවීම වෙනුවෙනුයි අපේ ආණ්ඩුව මැදිහත් වෙන්නේ.

විපක්ෂය අසරණ බවට පත් කරපු, මේ තරම් අන්ත අසරණ කරපු, අසීමිත දුෂ්කරතාවකට ලක් කරපු අය වැය ලේඛනයක් ඉතිහාසයේ මීට ප්‍රථම පාර්ලිමේන්තු තුළ අපි දැක්කේ නැහැ. ඒ අය වැය ලේඛනය තමයි, 2026 වසරට ජාතික ජන බලවේගය ආණ්ඩුව ගෙන ආ අය වැය ලේඛනය. විපක්ෂයේ ඔබතුමන්ලා කැමැති වුණත්, අකැමැති වුණත් අපේ රටේ ජනතාව අපට දීපු ජනවරම අනුවත්, අප ජනතාවට දීපු පොරොන්දු අනුවත් අපි මේ අය වැය ලේඛනය යථාර්ථයක් බවට පත් කරනවා. මෙය යථාර්ථයක් බවට පත් කරලා මේ රටේ ජනතාවට පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් ගෙවන්න අවශ්‍ය මූලික අඩිතාලම - අත්තිවාරම- ගොඩ නඟනවා. ඉතිහාසයේ මෙතෙක් ආපු ගමන් මඟ ගැන ලියැවුණු මේ රටේ ඉතිහාස කථාව වෙනස් කරලා ලාංකික ඉතිහාසයේ අලුත් පරිච්ඡේදයක් ලියමින් අපි මේ රට ගොඩ නඟනවා. ඒ අලුත් පරිච්ඡේදය ලියන්න අවශ්‍ය අඩිතාලම 2026 වසරේ අය වැය ලේඛනය මඟින් දමා තිබෙනවා. ඒ සඳහා අපි මේ අය වැය ක්‍රියාත්මක කරනවා කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.57]

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂක (පරිපාලන) තනතුරේ සේවයේ නියුතුව සිටි එම්.එම්.එම්. මබරුක් මහතා අද සේවයෙන් විශ්‍රාම යනවා. ඉතින් එතුමාට සුබ විශ්‍රාම දිවියක් ලැබේවා කියා මම පළමුවෙන්ම ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ලංකාවේ පැවැත්වුණා, World Marketing Forum එක. ඒ World Marketing Forum එකට තානාපතිවරුන්, විදේශ රටවල ඉන්න, marketing field එකේ ප්‍රධානීන්, දේශීය ව්‍යාපාරිකයන් සහ වැදගත්ම පිරිසක් වන ආයෝජකයන් ඇතුළු විශාල පිරිසක් සම්බන්ධ වුණා. අවාසනාවට කාරණාව වන්නේ, මේ රටේ ජනාධිපතිවරයාවත්, එහෙම නැත්නම් අගමැතිතුමියවත් ඒ අවස්ථාවට සම්බන්ධ වුණේ නැති එකයි. ඒ පිරිස දවස් තුනකට ලංකාවට පැමිණි අවස්ථාවේ ඒ අයගෙන් නිසි ප්‍රයෝජනයක් ගත්තා නම් ලංකාවේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා ගන්න තිබුණා කියා මම හිතනවා. කෙසේ වුවත් වර්තමාන ජනාධිපතිතුමාත්, අගමැතිතුමියත් ඊට සම්බන්ධ නොවීම විශාල පාඩුවක් කියලායි මා හිතන්නේ. නමුත්, අපේ ගරු විපක්ෂ නායකතුමා ඊට සම්බන්ධ වෙලා ලාංකිකයන්ගේ ගරුත්වය රැක්කා. එහිදී එතුමාට Singapore Economic Forum එකේදී දේශනයක් කරන්න පවා ආරාධනාවක් ලැබුණා. ඊයේ ආයෝජකයන් විශාල පිරිසක් ඊට සම්බන්ධ වුණා. මා හිතන්නේ ජනාධිපතිතුමා ජනාධිපති ධුරයට වඩා වැඩියෙන් JVP එකේ නායකයා විධියට පක්ෂයේ කටයුතුත්, සමහර ඇමතිවරුන්ගේ වැඩ ඇතුළු හැම එකක්ම බදාගෙන ඉන්නවා. ඉතින් ඒ කාරණාත් එක්ක ඒ වාගේ වැදගත් අවස්ථාවකට සහභාගි වෙන්න එතුමාට බැරි වෙලා තිබෙනවා.

මුදල් ඇමතිවරයා විධියට ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය ගැන මම දැන් කථා කරන්නම්. පසුගිය අය වැය කථාව අවස්ථාවේ -2025 අය වැය කථාව- ගත්තොත්, එතුමා පැය 2යි

විනාඩි 40ක් විතර කථා කළා. මෙවර අය වැය කථාව -2026 අය වැය කථාව අවස්ථාවේ- එතුමා පැය 4යි විනාඩි 20ක් විතර කථා කළා. ඊළඟ වසරේත් දෙයියන්ගේ පිහිටෙන් මේ ආණ්ඩුව මේ විධියටම තිබිලා 2027 අය වැය ඉදිරිපත් කළොත් අපට පුරෝකථනය කරන්න පුළුවන්, එතුමා අනිවාර්යයෙන්ම පැය 5ක් පන්නලා අය වැය කථාව කරනවා කියලා. ඒකට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, තානාපතිවරුන්ට සහ විශේෂ ආරාධිතයන්ට ආරාධනා කරද්දී කොට්ට මෙට්ට, පැදුරු එහෙම අරගෙන එන්න කියන්න වෙනවා. ආණ්ඩුවේ තරුණ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට ආපු දවස්වලම කිව්වා, "අපි ආවේ සම්ප්‍රදාය කඩන්න" කියලා. ඒ සම්ප්‍රදාය කඩන්න නම්, ආරාධිතයන්ට පළමුව සංග්‍රහ කටයුතු කරලා අය වැය කථාව ඉදිරිපත් කරන අවස්ථාවට ආරාධනා කළා නම් හොඳයි. මොකද, එදා ආපු සමහර අය ඒ සංග්‍රහය භුක්ති විඳින්නේත් නැතුව තමයි ගියේ.

කොහොම වුණත්, ජනාධිපතිතුමාගේ අය වැය කථාව තවත් දීර්ඝ වෙන්න නියමිතව තිබුණා. "රටම එකට" ජාතික මෙහෙයුම කියන ව්‍යාපෘතිය ආරම්භ කරලා දවස් දෙකක්, තුනක් යනකොට තමුන්ගේ බිම් මට්ටමේ ඉන්න නායකයන්, තමුන්ගේ පක්ෂයේ පහළින් ඉන්න නියෝජිතයන් මත්ද්‍රව්‍යවලට සහ විවිධ කාරණා එක්ක සම්බන්ධයි කියලා එළි වෙන්න ගත්තා. ඒ පටන් ගත්තේ පැලියගොඩින්. ඊට පසුව දෙහිවල-ගල්කිස්සෙන්. ඊට පසුව මීරිගමින්. ඊට පසුව තංගල්ලෙන්. ඒ කාරණා එළියට ආපු ගමන් අන්න, පොලිස්පතිතුමා ගැහුවා චක්‍රලේඛයක්.

එහෙම කරලා ඊට සම්බන්ධ තොරතුරු මාධ්‍යයේ ප්‍රචාරය වීම නැවැත්වුවා. ජනාධිපතිතුමාගේ මේ "රටම එකට" ජාතික මෙහෙයුම කියන්නේ ඇත්තෙන්ම විශාල වැදගත් ව්‍යාපෘතියක්. නමුත් ඒ ව්‍යාපෘතිය ගැන එක වචනයක් කථා කරන්න බැරි වුණා, ඒ අය වැයේදී. එදා නටන්න හදපු නැටුම එතුමාට නටන්න බැරි වුණා, පක්ෂයේම පහළින් තිබෙන යාන්ත්‍රණය තුළ ඒ විවිධ කාරණාවලට සම්බන්ධ අය හිටපු නිසා.

කෙසේ වුණත්, ජනාධිපතිවරයා පැය හතරහමාරක් කථා කළත්, මේ අය වැයේ අලුත් යෝජනා තිබුණේ 62ක් විතරයි. අපි දවස් ගාණක් තිස්සේ මේ අය වැය ගැන කථා කරනවා නේ. මේ දවස් ගණන තුළ කොච්චර කථා කළත්, මේ අය වැයේ අලුත් යෝජනා තිබෙන්නේ 62ක් විතරයි. ඒ 62ට වෙන් කරලා තිබෙන්නේත් රුපියල් බිලියන 109ක ප්‍රතිපාදන පමණයි. එතකොට ඒක මුළු රාජ්‍ය වියදමින් සියයට 2.46ක් පමණයි. මේ අලුත් යෝජනා 62නුත්, සංවර්ධන යෝජනා තිබෙන්නේ 13යි. මෙච්චර පැය ගණනක් කථා කර කර ඉන්නේ මේ අලුත් යෝජනා 62ක් ගැන. එයිනුත් සංවර්ධන යෝජනා තිබෙන්නේ 13යි. ඒකට වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 17යි. ඒක සමස්ත රාජ්‍ය වියදමින් දශම තුනයි. පැය හතරහමාරක් කියවලා තිබෙන්නේ, 2026 වර්ෂයට අලුතින් මේ රටට එකතු කරන්නේ, නිකම් හුනු බිත්තරයක් තරම් ආර්ථිකයක්. ඉතින් භාණ්ඩාගාරය මෙච්චර උතුරලා ගිහිල්ලා තිබෙනවා නම්, ඇයි දෙවියනේ අලුත් ව්‍යාපෘති සඳහා මුදල් යොදවා නැත්තේ? ඒ නිසා තමයි අපි කියන්නේ අය වැයකට මීට වඩා බර දාන්න කියලා.

කෙසේ වුණත්, පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු විධියට අපට තිබෙන ලොකුම වගකීම තමයි, නීති සම්පාදනය කිරීම, ඒ වාගේම නීති ප්‍රතිසංස්කරණය. අපි බැලුවොත්, 2025දී සම්මත කරපු පනත් කෙටුම්පත් ගණන 22යි. ඒකෙනුත් 2024දී සහ ඊට පෙර කෙටුම්පත් කරපු පනත් තිබෙනවා, 12ක්. එතකොට මේ ආණ්ඩුව -මේ වර්තමාන රජය- දායකත්වය දීලා තිබෙන්නේ පනත් 10කට විතරයි. ඉතිහාසය ගත්තොත්, 2023දී පනත් කෙටුම්පත් 28ක් සම්මත කරලා තිබෙනවා. ඒ වාගේම 2024දී පනත් කෙටුම්පත් 34ක් සම්මත කරලා තිබෙනවා. ඒ අනුව මේ ආණ්ඩුව සම්මත කරලා තිබෙන්නේ පනත් කෙටුම්පත් 10ක් පමණයි. එතකොට අපි පොඩ්ඩක් හිතලා බලන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ අපේ කර්තව්‍ය, අපේ රාජකාරිය, අපි හරියාකාරව ඉෂ්ට කරලා තිබෙනවාද, අපේ දායකත්වය හරියාකාරව ලබා දීලා තිබෙනවාද කියන කාරණා.

ඊළඟ කාරණාව මෙයයි. විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ කැබිනට් ඇමතිවරු නොවන මන්ත්‍රීවරු අද වැඩියෙන්ම කථා කරන්නේ අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කරපු කථාවේ සඳහන් එක කාරණයක් ගැන. එතුමාගේ කථාවේ පොඩි කාරණාවක් අල්ලාගෙන තමයි එතුමන්ලා අද කථා කරන්නේ. එතුමා මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, මේ වර්ෂය තුළ ආර්ථික ඉලක්ක සපුරාගෙන තිබෙනවා කියලා. ඉලක්ක සපුරාගෙන තිබෙනවා කියන්නේ, රාජ්‍ය ආදායම බලාපොරොත්තු වුණු විධියට ලැබිලා තිබෙනවා කියන එක. මේ රාජ්‍ය ආදායම කොහොමද ලැබුණේ? මේ රාජ්‍ය ආදායම ලැබෙන්න ප්‍රධාන වශයෙන් හේතු වුණේ වෙන කිසි දෙයක් නොවෙයි, බදු ආදායම - බදු මුදල්. හරිද? මේ බදු මුදල් ලබා ගැනීම එක්තරා විධියකට රජයේ දක්ෂතාව සහ කාර්යක්ෂමතාව කියලා විවිධ කාරණා කිව්වත්, මේ බදු මුදල් ලැබෙන්න ප්‍රධානම හේතු සාධකය තමයි, අවුරුදු පහක් මේ රටට වාහන ආනයනය කිරීම තහනම් කරලා තිබිලා, ඒ තහනම ඉවත් කිරීම තුළ අධික බද්දකට යටත්ව වාහන විශාල ප්‍රමාණයක් ගෙන ඒම.

උදාහරණයක් විධියට බලන්න, ටොයෝටා ආයතනය ගැන. වාහන නිෂ්පාදනය කරන ටොයෝටා ආයතනය, BYD සමාගම අද සාමාන්‍ය sensor එකක් හදන්නත් research කරනවා. ඒ සඳහා විශාල මුදලක් යොදවනවා. ඒ වාගේම factories දාගෙන, සේවකයන්ට පඩි ගෙවාගෙන, tax ගෙවාගෙන, risk එකක් අරගෙන තමයි ඒ ව්‍යාපාර කරන්නේ. එහෙම කරලා ගන්න ලාභය වාගේ දෙගුණයක්, තෙගුණයක් ලංකාවේ රජය බදු ගහලා, අද ආඩම්බරයෙන් කියනවා, අපේ ආර්ථිකය ශක්තිමත් වෙලා කියලා. මේක තමයි ඔබතුමන්ලා කියන පුනරුදය. හරිද? ඒ විධියට අධික බදු ගහලා භාණ්ඩාගාරය පුරවා ගන්නා ගමන්, අනික් පැත්තෙන් ගිය වර්ෂයේ වියදම් කරන්න තිබුණු, සංවර්ධනය සඳහා වෙන් කරපු මුදල් පාවිච්චි නොකර -පාවිච්චි කරන්න සැලසුම් නැතුව- නැවත භාණ්ඩාගාරයට යැම නිසා අන්න රාජ්‍ය වියදම අඩු වෙලා තිබෙනවා. ඔන්න ඔය කාරණාව නිසා තමයි ඔබතුමන්ලා මේ ඉලක්ක සපුරාගෙන තිබෙනවාය කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නැතුව රාජ්‍ය ව්‍යාපාර අධික ලාභ ලබා තිබෙනවා නම්, එහෙමත් නැත්නම් දේශීය ආයෝජන සහ සෘජු විදේශීය ආයෝජන මේ රටට ඇවිල්ලා ආර්ථිකය ස්ථාවර වෙනවා නම්, ඒකට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. එහෙම වුණා නම්, සැබෑ ලෙසම අපට සතුටු වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවතත් මම අය වැය දෙසට හැරුණොත්, විශේෂයෙන්ම 2026 වර්ෂයේ සමස්ත වියදම රුපියල් බිලියන 4,434යි. ඉන් රුපියල් බිලියන 634ක්ම වෙන් කරලා තිබෙන්නේ මුදල් අමාත්‍යාංශයට. ඒ වාගේම 2025 වර්ෂයේ ජනාධිපති වැය ශීර්ෂය රුපියල් බිලියන 2.7යි, මේ වර්ෂයේ රුපියල් බිලියන 11 දක්වා එය වැඩි කරගෙන තිබෙනවා.

ඒ කියන්නේ, අමතරව රුපියල් බිලියන 8ක් වැඩි කරගෙන තිබෙනවා. එක පැත්තකින් ගිය වර්ෂයේ වෙන් කර ගත් මුදලවත් හරියට වියදම් කරගන්න සැලසුමක් නැතුව මෙවර විශාල මුදලක් ඒ වැය ශීර්ෂයට වෙන් කරගෙන තිබෙනවා. අනෙක් පැත්තෙන් අපට පොඩි සැකයක් එනවා, එතුමාගේම සහෝදර ඇමතිවරුන් ගැන එතුමාට සැකයක් තිබෙනවාද කියලා. කැබිනට් ඇමතිවරු ඉන්නවා, නියෝජ්‍ය ඇමතිවරු ඉන්නවා. එතුමාගේ කණ්ඩායම ගැන අවිශ්වාසයෙන්ද, නැත්නම් ඒ අය වැඩ බැරි අය කියලා හිතාගෙනද දන්නේ නැහැ, එතුමා මෙච්චර මුදලක් වෙන් කරගෙන තිබෙන්නේ.

[ගරු චතුර ගලප්පත්ති මහතා]

ඊළඟට, මුදල් අමාත්‍යාංශයෙන් පසුව වැඩිම මුදලක් වෙන් කරගෙන තිබෙන්නේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට. ඒ මුදල රුපියල් බිලියන 618ක්. බැලූ බැල්මට පළාත් සභා මැතිවරණයක් තිබෙනවා වාගේ තමයි කථාව. නමුත් ජනාධිපතිතුමාගේ කථාවේදී විපක්ෂයට කිව්වා, මේකට අවශ්‍ය නීති හදන්න කියලා. එතුමා එහෙම කියන්න අවශ්‍ය නැහැ. එතුමාට ආසන 159ක් දීලා තිබෙනවා. අපට සැබෑ ලෙසම කියන්න පුළුවන්, ආණ්ඩුව මේ වෙලාවේ පළාත් සභා මැතිවරණය තියන්න නොවෙයි ඒ වාගේ කාරණාවක් කිව්වේ කියලා. අපට එහෙම කියන්න හේතු සාධක තිබෙනවා.

පාර්ලිමේන්තු මැතිවරණයේදී ආණ්ඩුවට ඡන්ද ලක්ෂ 68ක් ලැබුණා. නමුත් පසුගිය පළාත් පාලන මැතිවරණය වෙනකොට ආණ්ඩුවට ඡන්ද ලක්ෂ 23ක් අඩු වුණා. ඒ කියන්නේ, රජයට තිබුණු කැමැත්ත ලක්ෂ 23කින් අඩු වුණා. ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කය ගත්තොත්, මුලටියන සහ වැලිගම කියන ප්‍රාදේශීය සභා ජයග්‍රහණය කළේ විපක්ෂයේ කණ්ඩායම. ඒ විතරක් නොවෙයි. පසුගිය සමුපකාර ඡන්දවලදී - නිකම් මේ පොඩි දෙකයි පණහේ සමුපකාර සමිති නොවෙයි - ලංකාවේ තිබෙන වැඩිම සාමාජික සංඛ්‍යාවක් ඉන්න සහ වැඩිම මූල්‍ය හැකියාවක් තිබෙන සමුපකාර සමිති දෙකක් වන බෙරලපනාතර සහ කොටපොල කියන විවිධ සේවා සමුපකාර සමිති සමගි ජන බලවේගය ඇතුළු විපක්ෂයේ කණ්ඩායම අතිවිශිෂ්ට ලෙස ජයග්‍රහණය කළා.

ඒ විතරක් නොවෙයි. මේ දිනවල පළාත් පාලන ආයතනවල අය වැය සඳහා ඡන්ද විමසීම් පවත්වනවා. ආණ්ඩුව දිගින් දිගටම ඒ අය වැය පරාජයට පත් වනවා. මේ දේවල් වෙනකොට රජය පළාත් සභා මැතිවරණය තියයිද කියලා අපට සැකයක් තිබෙනවා. අපි අභියෝග කරනවා, පුළුවන් නම් පළාත් සභා මැතිවරණය හැකි ඉක්මනින් තියන්න කියලා.

ඊළඟට, මාතර දිස්ත්‍රික්කය ගැන යම් අදහසක් කියන්න ඕනෑ. සාමාන්‍යයෙන් රජයක් පත් වුණාම කරන දේවල් ටිකක් තිබෙනවා. ඒවා තමයි, මහාමාර්ග, වාරිමාර්ග පද්ධති සම්බන්ධ කටයුතු සහ අනෙක් දේවල් ටික. ඒ ටිකට අමතරව අය වැය යෝජනා තුළ ගිය වර්ෂය සඳහා මාතර දිස්ත්‍රික්කය වෙනුවෙන් අලුතින් ඇතුළත් කර තිබුණේ එකම එක යෝජනාවක් විතරයි. ඒ තමයි, දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම. හැබැයි අවාසනාව තමයි, මේ රජයට තවම ඒක ආරම්භ කරන්න බැරි වුණු එක. ඊළඟට 2026 වර්ෂය සඳහා අලුත් යෝජනා කිහිපයක් තිබෙනවා. ඒකත් මාතර දිස්ත්‍රික්කයේ තිබෙන ලොකුම ගැටලුව වන ලවණ බාධකය සම්බන්ධයෙන් වන යෝජනාව. ලවණ බාධකය ගැන සොයා බලන්න විශේෂඥ කණ්ඩායමක් පත් කරලා තිබෙනවා. ඒ කණ්ඩායම ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කරන්න යම් මුදලක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, ප්‍රශ්නය මේකයි. පසුගිය අවුරුද්ද තුළ ඒ කටයුත්ත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කණ්ඩායමකට භාර දුන්නා. පස්සේ මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන කඹුරුපිටිය පැත්තේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමක් තිබුණා, ඒක රුහුණු විශ්වවිද්‍යාලයට දෙන්න කියලා. ඔය විධියට දෝලනය වෙමින් අවුරුද්දක් ගත වෙලා දැන් තමයි ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවට මේ කටයුත්ත භාර දීලා තිබෙන්නේ. කමක් නැහැ, පහු වෙලා හරි මේ කටයුත්ත ආරම්භ කිරීමට මුදලක් වෙන් කිරීම ගැන සතුටු වනවා. නමුත් මේක ගිය වර්ෂයේ අය වැයට ඇතුළත් කරලා තිබුණා නම් මේ වෙනකොට ක්‍රියාත්මක තත්ත්වයට ගෙනෙන්න තිබුණා. කෙසේ වුණත්, මාතර නගර සැලැස්මට ශක්‍යතා අධ්‍යයනයක් කරන්න කියලාත් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒකත් බොහොම හොඳ දෙයක්.

ගරු මංගල සමරවීර මැතිතුමා මීට පෙර "Greater Matara Development Plan" එක හදලා තිබෙනවා. මේ ආණ්ඩුවෙන් ශක්‍යතා අධ්‍යයනයට කියලා මුදල් වෙන් කළාට මේවා ක්‍රියාත්මක වෙනවාද කියලා පොඩි සැකයක් තිබෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි, ගරු ජනාධිපතිතුමාගේ ගම වන තඹුත්තේගම හා සම්බන්ධ කාරණය. එතුමාගේ ගියවර අය වැයේ තිබුණා, කෘෂි නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා ගබඩා සහිතව තඹුත්තේගම දුම්රිය පොළ සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා වාර්තාවක් හදනවා කියලා. මම හිතන්නේ ඒක තවමත් කෙරිලා නැහැ කියලායි. එතුමාගේ ගමට එහෙමනම් මාතරට කොහොම වෙයිද කියලා අපට සැකයක් තිබෙන නිසායි මා එහෙම කිව්වේ. නමුත් ශක්‍යතා අධ්‍යයනය කියන එක වැදගත් දෙයක්.

කෙසේ වුණත් තඹුත්තේගම කියද්දි මට යම් කාරණයක් මතක් වුණා. මේ රටේ ඉන්න ප්‍රකට කලාකරුවෙක් එදා තඹුත්තේගම පැවති ජනාධිපතිවරණ වේදිකාවේදී කිව්වා, "ගොවි දුක දන්නා තඹුත්තේගම රන්බණ්ඩා මාමාගේ පුතා ජනාධිපති කරමු" කියලා. දැන් රන්බණ්ඩා මාමාගේ පුතා ජනාධිපති වෙලා මොකක්ද කරන්නේ? කන්න දෙකයි ගෙවුණේ. වී ගොවියාටයි, ලූනු ගොවියාටයි, අල ගොවියාටයි, වට්ටක්කා ගොවියාටයි, උක් ගොවියාටයි එතුමාගේ වචනයෙන්ම කියනවා නම්, "ආයෙ ලොවෙත් නැතිවෙන්න" දීලා තිබෙන්නේ.

මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන කුඩා තේ වතු හිමියන් ගිය අය වැයේදීත් අමතක කරලා තිබුණා. ඒ වාගේම මේ අය වැයේදීත් අමතක කරලා තිබෙනවා. තේ කර්මාන්තය රැඳිලා තිබෙන්නේ මහා පරිමාණ ව්‍යාපාරිකයෝ නිසා නොවෙයි, කුඩා පරිමාණයේ ව්‍යාපාරිකයෝ නිසායි. ඔවුන් මේ රටට විශාල දායකත්වයක් ලබා දෙනවා. හැබැයි මේ අය වැයේදීත් ගිය අය වැයේ වාගේම කුඩා තේ වතු හිමියන් අමතක කරලා තිබෙනවා.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ අය වැයේදී ප්‍රධාන වශයෙන්ම කථා වෙනවා, වතු කම්කරුවන්ගේ දීමනාව වැඩි කිරීම පිළිබඳව. මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට, විශේෂයෙන්ම දෙනියාය, අකුරැස්ස, පස්ගොඩ කියන ප්‍රදේශවල අපේ සහෝදර දමිළ ජනතාව වෙනුවෙන් මේ යෝජනාව සම්බන්ධයෙන් යම් අදහසක් දක්වන්න මම කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මම ඉක්මනින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජනාධිපතිතුමාත් කිව්වා, මෙන්න මේ කාරණාව. වතු කම්කරුවෙක් මාසයකට දවස් 25ක් සේවයට ආවොත්, ඔහුට රුපියල් 10,000කින් මාසික දීමනාව වැඩි වෙනවා කියලා. මේ නිසා ජනාධිපතිතුමා දේවත්වයට පත් වෙනවා කියලාත් එක් මන්ත්‍රීවරයෙක් කිව්වා. ජනාධිපතිතුමා ඒ කාරණාව ඒ විධියටම කිව්වා. ජනාධිපතිතුමා එහෙම කිව්වාට 'දවස් 25ක්' කියන කොන්දේසිය මේ යෝජනාවට දැම්මොත්, ඒක කෙරෙන්නේ නැති කාරණාවක් වෙනවා. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. එහෙම නැතුව, මේ මුදල ලබා දීම සම්බන්ධයෙන් විපක්ෂයට

කිසිම ගැටලුවක් නැහැ. ඒ මිනිස්සුන්ට එක රුපියලක හරි දීමනාවක් වැඩිපුර දෙනවා නම් විපක්ෂය විධියට අපි කැමතියි. නමුත්, දවස් 25ක් කියන එක කවදාවත් සපුරන්න බැහැ. ඒක ප්‍රායෝගික නැහැ. වතුකරයේ ඉන්න ජනතාවගෙන් ඇහුවොත් කියාවි, ඒ දවස් 25 කියන කොන්දේසිය කිසිසේත්ම සපුරන්න බැහැ කියන එක. ඒ හාම්පුතුන් දවස් 25ක් වැඩ භාර දෙන්නේ නැහැ. හොඳම උදාහරණය ඉරිදා දවස. විශේෂයෙන්ම ඉරිදා දවසේ ඔවුන්ට නිවාඩු දෙනවා. ඒකට හේතුව තමයි ඉරිදා දවසේ වැඩ කළොත් ඔවුන්ට පඩිය වාගේ එකහමාරක් ගෙවන්න ඕනෑ. වතුවලත් ඉන්නවා, ස්ථිර කම්කරුවන් සහ ස්ථිර නොවන කම්කරුවන්. ස්ථිර කම්කරුවන්ට සඳුදා සහ සිකුරාදා වෙනකම් විතරයි වැඩ කරන්න තිබෙන්නේ. ඒ අය දලු කිලෝ 27ක් කඩාගෙන ආවාම කිලෝ 22කට cut එක දෙනවා. ඒ කිලෝ 22ට තමයි මේ වෙනකොට රුපියල් 1,350ක් ගෙවාගෙන යන්නේ. ඊට අමතරව සෙනසුරාදා, ඉරිදා ස්ථිර සේවකයන් විධියට නොවෙයි ඔවුන්ට කටයුතු කරන්න තිබෙන්නේ. ඔවුන්ට block ක්‍රමයට තමයි ගෙවන්න තිබෙන්නේ. ඔවුන් එදා දවසේ ගෙනෙන එළදාවෙන් සියයට 88කට විතරයි ගෙවීම් කරන්නේ. ඒකත් ගෙවන්නේ කිලෝ එකකට රුපියල් 60ක්, 65ක් වෙන්න. මෙතුමන්ලා කියනවා නම් දවස් 25ක් සපුරනවා කියලා, ඒකට හොඳම උදාහරණය තමයි මේ නොවැම්බර් මාසය. මේ මාසයේ ඉරිදා දින 5ක් තිබෙනවා; පෝයක් තිබෙනවා. දවස් 30න් දවස් 24යි වැඩ කරන්න තිබෙන්නේ. එතකොට දවස් 25ක් complete කරන්න බැරි වෙනවා. ඒ වාගේම අපි පෙබරවාරි මාසය ගත්තොත්, පෙබරවාරි මාසයට තිබෙන්නේ දවස් 28යි. ඒ දවස් 28න් ඉරිදා දින 4ක් එක්ක නිදහස් දවසයි, පෝය දවසයි සෙට් වුණාම ඒ මාසයේ වැඩ කරන්න තිබෙන්නේ දවස් 22ක වාගේ ප්‍රමාණයක්. මෙහිදී මේ දවස් 25 කියන කොන්දේසිය නැත්නම් වෙන ගැටලුවක් නැහැ. ඒක ප්‍රායෝගික නැහැ. මේ ආණ්ඩුව කියනවා නම් දවස් 25 කාරණාව,- *[බාධා කිරීමක්]* ඒක තමයි. ජනාධිපතිතුමාත්, තව මන්ත්‍රීවරයෙකුත් කියපු විධියට මේ දවස් 25ක කොන්දේසිය දැමීම තුළ මේ කටයුත්ත ප්‍රායෝගිකව කෙරෙන්නේ නැහැ. දවස් 25 කියන කොන්දේසිය නැතුව ඒ අහිංසක මිනිස්සුන්ගේ එකම ඉල්ලීම වෙන්නේ, දෛනිකව වැඩ කරන දීමනාව රුපියල් 1,750ක් කරන්න කියලායි. අපි ඒ සඳහා එක අතක් නොවෙයි, අත් දෙකම උස්සනවා. ඒ යෝජනාවට අපි සහයෝගය දැක්වුවත්, සමස්ත Budget එකට එකඟ වෙන්න හැකියාවක් නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි දොළහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.13]

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය රජය ඉදිරිපත් කර තිබෙන දෙවැනි අය වැය පිළිබඳව යම් අදහස් ප්‍රමාණයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

දවස් කිහිපයක් තිස්සේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයක් මේ අය වැය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළ අදහස් දැක්වූවා. මේ සාධනීය අය වැය ප්‍රකාශය තුළින් අපට දැනෙන දේ තමයි රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් වෙලා, ස්ථාවර වෙලා තිබෙනවා කියන එක. ඒ ශක්තිමත් ආර්ථිකය තුළින් ග්‍රාමීය මට්ටමේ ජනතාවට ප්‍රතිලාභ ලැබෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ අය වැය තුළ සකස් වෙමින් පවතිනවා. 2025 වසර වෙනුවෙන් අපි ඉදිරිපත් කරපු අය වැය සම්බන්ධයෙන්, ඒ ප්‍රගතිය සම්බන්ධයෙන් විවිධ අදහස් ප්‍රකාශ කරනවා.

නමුත් මේ ජුනි මාසයේ විතර අත්පත් කරගත්ත ප්‍රගතිය සම්බන්ධයෙන් තමයි මේ මොහොතේ ප්‍රකාශයට පත් කරන්නේ. අද සාකච්ඡා කරනකොට අපට දැනුණු දේ තමයි මේ මොහොත වෙනකොටත් සියයට 58 ඉක්මවා මූල්‍ය ප්‍රගතිය ඉදිරියට ගිහින් තිබෙනවා කියන එක. අපට විශ්වාසයක් තිබෙනවා, මේ මාස දෙක ගතවෙනකොට ඒ ප්‍රගතිය සියයට 70ට එහා තැනකට අරගෙන යන්න පුළුවන් වටපිටාවක් ගොඩ නැඟෙයි කියලා.

මේ අය වැය තුළ ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමට හැදෙන වැඩසටහන් තිබෙනවා. Clean Sri Lanka ව්‍යාපෘතිය, ඩිජිටල්කරණය වැනි ව්‍යාපෘති හරහා ගමට, බිමට සංවර්ධනය අරගෙන යන්නට, ග්‍රාමීය ජනතාවගේ දිළිඳු බව තුරන් කරන්නට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරන්න මූලික වටපිටාව ගොඩ නැඟිලා තිබෙනවා. උපාය මාර්ගික සැලැස්මක් සහිතව strategies හයක් යටතේ මේ අය වැය සකස් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි පැහැදිලිව ඉදිරිපත් කරලා තිබෙනවා. තිරසාර සැමට ප්‍රතිලාභ ලැබෙන ආර්ථිකයක් ගොඩ නැඟීම, ආර්ථික වර්ධනයක් ඇති කරගැනීම, අපනයන විවිධාංගීකරණය, ණය තිරසරභාවය, නිෂ්පාදන ආර්ථිකයක් ශක්තිමත්ව සැදීම, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සහ ඩිජිටල්කරණය කියන මූලික කාරණා හය යටතේ මේ අය වැය ක්‍රියාත්මක කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

මම මේ මොහොතේ තවත් වැදගත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න කැමතියි. මේ දවස්වල අය වැය සම්බන්ධයෙන් කථා කරනකොට එක්තරා පාර්ශ්වයක් පෙර පාසල් විෂය සම්බන්ධයෙන් යම් අදහස් ප්‍රමාණයක් ප්‍රකාශ කර තිබෙනවා. "සුනඛයන් ගැනත් කථා කරලා තිබෙනවා. හැබැයි, පෙර පාසල් ගුරුවරියන් ගැන, පෙර පාසල් විෂය සම්බන්ධයෙන් කිසිම දෙයක් මේ අය වැයේ ඇතුළේ කථා කරලා නැහැ" කියලා කියනවා මම දැක්කා. අපේ අනාගත පරම්පරාව ගොඩ නඟන්න, අනාගත සමාජය ගොඩ නඟන්න විශාල මෙහෙයක් කරන අපේ රටේ පෙර පාසල් ක්ෂේත්‍රයේ වැඩ කරන ආදරණීය පෙර පාසල් ගුරුවරියන් නොමඟ යවමින් එහෙම ප්‍රකාශයක් සිදු කරනවා අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පෙර පාසල් ගුරුවරියන් ගැන හිතුවේ මේ අය වැයෙන් නොවෙයි. මීට ඉස්සෙල්ලා ඉදිරිපත් කළ අය වැයෙන් තමයි අපි පෙර පාසල් ගුරුවරියන් ගැන හිතුවේ. අපි ගුරු අභිමානී දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 6,000ට වැඩි කළේ පසුගිය ජුනි මාසයේ ඉඳලායි. පෙර පාසල් දරුවන්ට ලබා දෙන කෑම වේලට වෙන් කළ රුපියල් 60ක මුදල, රුපියල් 100 දක්වා වැඩි කළේ පසුගිය අය වැයේ ඉඳලායි. අපි පෙර පාසල් ක්ෂේත්‍රය ගැන හිතන්න ගත්තේ මේ අය වැයෙන් නොවෙයි. මීට ඉස්සෙල්ලා ඉදිරිපත් කළ අය වැයේ ඉඳලා තමයි අපි ඒ ගැන හිතන්න පටන් ගත්තේ.

විපක්ෂය කියනවා, "අය වැය කථාව පැය හතරහමාරක් කළා, ඒක ටිකක් වැඩියි" කියලා. මේ තිබෙන ඔක්කොම ප්‍රතිපාදන ගැන කථා කරන්න ගියොත් දවසක් කථා කරන්න වෙනවා. විසර්ජන පනත් කෙටුම්පතින් විවිධ ක්ෂේත්‍ර සඳහා වෙන් කරලා තිබෙන

[ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශ මහතා]

මුදල් ගැන කථා කරන්න ගියොත්, පැය හතරහමාරෙන් ඉවර කරන්න බැහැ. හැබැයි, අපි ආණ්ඩුවක් විධියට පෙර පාසල් විෂය සම්බන්ධයෙන් වැඩි බරක් තියලා තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය එකතු වෙලා අපි පොරොන්දු වෙච්ච විධියට ජාතික පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් මේ රටට හදලා ඉවරයි. මේක ජාතියේ අවශ්‍යතාවක්. පූර්ව ළමාවිය සංවර්ධනය අතිශයින් වැදගත් විෂයයක්. ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ගොඩ නඟන්න මේ රටට අවශ්‍යතාවක් තිබුණා. අපි දන්නවා, දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ පෙර පාසල් විෂය පළාත් සභාවලට විමධ්‍යගත වෙලා තිබෙන බව. දැන් ඒක අවුල් ජාලයක් බවට පත් වෙලා තිබෙනවා. විවිධ විෂමතා තිබෙනවා. විෂය නිර්දේශවල ප්‍රශ්න තිබෙනවා. අපේ ගුරුවරියන්ගේ අධ්‍යාපන මට්ටම සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. ඩිප්ලෝමා ආයතන සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. මේ ප්‍රශ්න ටික නිරාකරණය කරන්න අවශ්‍ය මූලික පියවර අපි අරගෙන ඉවරයි. අපි මේ වනවිට ජාතික පෙර පාසල් සම්බන්ධ ප්‍රතිපත්තිය - National Policy on Preschool Education - හදලා ඉවරයි. අපි අමාත්‍යාංශය විධියට එකතු වෙලා, ජාතික අධ්‍යාපන ආයතනය විධියට එකතු වෙලා, මේ මාසයේ අග ඉඳලා - දෙසැම්බර් මාසයේ - පෙර පාසල් ගුරුවරියන් පුහුණු කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්නට කටයුතු කර තිබෙනවා.

ගුරුවරියන් පුහුණු කරන ඩිප්ලෝමා ආයතන සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා කියලා අපි දන්නවා. ඒ විෂය නිර්දේශය සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් තිබෙනවා. අපේ අමාත්‍යාංශයට සම්බන්ධ මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය මේ මොහොත වෙනකොට ඩිප්ලෝමා ප්‍රදානය කරන ආයතන සියල්ලම ලියාපදිංචි කරන්න කටයුතු කර තිබෙනවා. ආයතන 102ක් විතර මේ වනවිට ලියාපදිංචි වෙලා තිබෙනවා.

අපි ඒ සියල්ල නියාමනය කරමින්, එකම විෂය නිර්දේශයක් ඇතුළේ මේ ඩිප්ලෝමා ප්‍රදානය කරන්න සුදුසු තැනකට ඒ ඩිප්ලෝමා ආයතන ගන්න අවශ්‍ය වටපිටාව සකස් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මේ වෙලාවේ මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මොකද, පෙර පාසල් විෂය සම්බන්ධයෙන්, පෙර පාසල් ගුරුවරියන් නොමඟ යවමින්, ඔවුන්ව නොසලකා හරින බවට වූ විවිධ කථා බහ මේ දවස්වල මාධ්‍ය ඔස්සේ සංසරණය වන ආකාරය අපි දැක්කා. අපි මතක් කරන්න කැමැතියි, මේ පෙර පාසල් ප්‍රතිපත්තිය ඇතුළේ කාරණා හයක් සම්බන්ධයෙන් අපි මූලිකත්වය අරගෙන සාකච්ඡා කර තිබෙන බව. ඒ සම්බන්ධයෙන් මම පොඩි අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. එහි සඳහන් එක් කාරණාවක් වන, සියලු දරුවන්ට සමාන ප්‍රවේශයක් - equitable access to preschool education - කියන එක අතිශයින් වැදගත් කියලා අපි හිතනවා. ඒ වාගේම උසස් තත්ත්වයේ පෙර පාසල් අධ්‍යාපනයක් - high quality preschool education - මේ රටට අවශ්‍යයි, ප්‍රමිතිකරණය අවශ්‍යයි. Then, professional development and workforce standard for preschool teachers. අපි අමතක කරලා නැහැ, පෙර පාසල් ගුරුවරියෝ. ඔවුන්ගේ වෘත්තීය නිපුණත්වය වැඩි කරන්න, ඔවුන්ගේ කුසලතා දියුණු කරන්න විශාල මැදිහත්වීමක් කරන්න අවශ්‍ය වටපිටාව මේ ප්‍රතිපත්තිය ඇතුළේ ගොඩනැඟෙනවා. මෙවැනි කාරණා හයක් සම්බන්ධයෙන් අපි සාකච්ඡා කර තිබෙනවා. හයවැනි කාරණය තමයි, governance and financing කියන එක. රජය විධියට අපි ඉදිරියේදී බලාපොරොත්තු වනවා, පෙර පාසල් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා ඒකට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරමින්, පෙර පාසල් විෂය සම්බන්ධයෙන් රාජ්‍ය මැදිහත්වීමත් ඇතිව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනත් එකතු කර ගනිමින්, ප්‍රශස්ත මට්ටමකට ගෙන එන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්න.

ඊළඟට මම කථා කරන්න කැමැතියි, විශේෂයෙන්ම මේ අය වැය තුළ අපි සාකච්ඡා කරපු කාරණයක් සම්බන්ධයෙන්. ඒ තමයි, ආන්තීකරණයට ලක් වෙච්ච, සමාජ අසාධාරණයට ලක් වෙච්ච, රැකවරණය අහිමි වෙච්ච, භාරකාරත්වය සම්බන්ධව ප්‍රශ්න තිබෙන, ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ආයතනගත දරුවන් ගැන. මේ ගැන අපි ගියවර අය වැයේදීත් කථා කළා. ඒ සියලු දරුවන් වෙනුවෙන් රුපියල් 5,000 බැගින් දෙන්න අපි මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ සියලු දරුවන්ට රුපියල් 2,000ක් ඔවුන්ගේ ගිණුමට සහ රුපියල් 3,000ක මුදලක් ඒ ආයතනවල භාරකරුවන්ට මේ දරුවන් වෙනුවෙන් වියදම් කරන්න ලබා දෙන්න, රුපියල් මිලියන 1,000ක මුදලක් අපි ගිය අවුරුද්දේත් වෙන් කරලා තිබුණා.

අපි දන්නවා, අපේ රටේ මේ අත්හළ දරුවන්ගේ, සමාජ අසාධාරණයට පත් වෙච්ච දරුවන්ගේ, භාරකරුවන් රහිත දරුවන්ගේ රැකවරණ මධ්‍යස්ථාන ගත්තොත්, රජය මැදිහත් වන ආයතන 46ක්, ස්වේච්ඡා ආයතන මඟින් ක්‍රියාත්මක වන ආයතන 308ක් ඇතුළුව ආයතන 354ක් මේ රටේ තිබෙන බව. මේ මොහොත වන විට දරුවන් 9,246ක් පමණ වන විශාල ප්‍රමාණයක් මේ මධ්‍යස්ථානවලදී රැකවරණය ලබනවා. අපි ඔවුන්ව අමතක කළේ නැහැ. ඔවුන්ට අවශ්‍ය පහසුකම් සපයන්නට, මේ ආයතන වැඩි දියුණු කරන්නට Clean Sri Lanka ව්‍යාපෘතිය තුළත් අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. මේ ආයතන වැඩිදියුණු කරන්නට පළාත් සභා හරහාත් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් වෙමින් පවතිනවා. ගිය වසරේදී අපි යෝජනා කළා, ආයතනගතව සිට සමාජගත වෙච්ච, අවුරුදු 18 සම්පූර්ණ වෙච්ච, කිසිවෙකු නැති, පවුලක් නැති, රැකවරණයක් රහිත මේ දරුවන් වෙනුවෙන්, ඔවුන්ට නිවසක් තනා ගැනීම සඳහා රුපියල් මිලියනයක මුදලක් ලබා දෙන්න. ඊට අවශ්‍ය ප්‍රතිපාදන පසුගිය අය වැය තුළින් අපි වෙන් කර තිබෙනවා.

මේ දරුවන් ගැන සොයා බලන කොට අපි දැකපු ගැටලුව තමයි, ඔවුන්ට ඉඩමක් සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා කියන එක. කාත් කවුරුවත් නැත්නම්, ඉඩමක් සම්බන්ධ ගැටලුව ඔවුන්ට අනිවාර්යයෙන්ම පැන නඟිනවා. ඒ නිසා ඒ යෝජනාව අපි මේ අවුරුද්ද වෙනකොට වෙනස් කරලා තිබෙනවා. ඒ දරුවන්ට තමන්ටම කියලා ඉඩමක් මිලදී ගන්න, තමන්ගේම ඉඩමක් තිබෙනවා නම් නිවසක් හදන්න, තමන්ට නිවසක් තිබෙනවා නම්, ඒ නිවස අලුත්වැඩියා කරන්න, රුපියල් මිලියන දෙකක මුදලක් - ලක්ෂ 20ක්- දෙන්න අවශ්‍ය ප්‍රතිපාදන වශයෙන් අපි රුපියල් මිලියන 2,000ක මුදලක් මෙවර අය වැය හරහා වෙන් කරලා තිබෙනවා. ඒ විධියට, විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් මේ දරුවන් වෙනුවෙන්, මේ රටේ අනාගතය වෙනුවෙන් අපි වෙන් කර තිබෙනවා.

මේ මොහොතේදී කාල වේලාවත් අවසන් වෙලා තිබෙන නිසා තව එක කාරණයක් මතක් කරමින් මගේ කථාව අවසන් කරන්න කැමැතියි. මේ අය වැය පිළිබඳව විශ්ලේෂණය කරනකොට අපට පෙනෙනවා, අපි මේ රටේ කිසිම කොටසක් අතහැර නැහැ කියන එක. අනාථ වෙච්ච දරුවන්, භාරකාරත්වය අහිමි වෙච්ච දරුවන්, පෙර පාසල් දරුවන්, සමාජ අසාධාරණයට ලක් වෙච්ච දරුවන්, විවිධ දුෂ්කරතා සහිත අපේ ග්‍රාමීය දිළිඳු ජනතාව කියන මේ සියලුදෙනා සම්බන්ධයෙන්ම කථා කරපු, ඔවුන් සියලුදෙනා වෙනුවෙන්ම මැදිහත් වෙච්ච අය වැයක් තමයි මෙවර අපි ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ අනුව, කිසිවෙකු අත් නොහළ අය වැයක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ඉතිහාසයේ සිටි පාලකයින් මේ රටේ විවිධ කොටස්වලට සැලකුවේ විවිධාකාරයෙන්. ජාතිකත්වය අනුව මිනිස්සු වෙන් කරලා බෙදලා මේ රට පාලනය කළා. ඒ වාගේම ආගම අනුව, පළාත අනුව, විවිධ ජන කොටස් අනුව බෙදා වෙන්

කළා. හැබැයි, විශේෂයෙන්ම වතුකරයේ ජනතාව, මලෙයහම් ජනතාව කියන මේ සියලුදෙනා සම්බන්ධයෙන් මේ අය වැය තුළ අපි සාකච්ඡා කර තිබෙනවා. ඒ සියලු ප්‍රජාවන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදනත් අපි වෙන් කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன)
(The Hon. (Dr.) Namal Sudarshana)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට මේ මොහොතේදී අපේ ගුණදාස කපුගේ ශූරීන් ගායනා කරපු ගීතයක් මතක් වෙනවා. ඒ ගීතයේ අර්ථය එදාට වඩා අදට ගැළපෙනවා කියලා මම හිතනවා.

"මොනර මාලු උඩ හල්ලේ නොවෙද තියෙන්නේ
අපට මාලු අල කොළ දෝ අදත් කුඩම්මේ...

මේ රටේ සමහර ජන කොටස්වලට හැමදාමත් තිබුණේ කුඩම්මාගේ සැලකිලි.

එකම මව් රටට කවදත් අපි අම්මා කියන්නේ
සෙංකඩගල, මුල්ගිරිගල පැටව් එකම තුරුල්ලේ
වෙනස්කමක් හිතන්නෙපා හිතට දුකයි කුඩම්මේ...

පසුගිය කාලවල සිටි පාලකයින් මේ රට ප්‍රදේශ අනුව බෙදලා වෙන් කරලා පාලනය කළා. එක එක ජන කොටස්වලට විවිධාකාරයෙන් තමයි ඒ ප්‍රවේශ තිබුණේ. අද අපි ඒක වෙනස් කර තිබෙනවා.

අප්පා නැති ඇහේ කඳුළු කාගෙත් සීතලයිනේ
එහෙව් උන්ට හිත පිරෙන්ට අල කොළ දෝ බෙදන්නේ
ඉතින් කුඩම්මා කවදද අපට පුතා කියන්නේ..."

අපේ රටේ උතුර, දකුණ, නැඟෙනහිර ඇතුළු සියලු පළාත්වල ජීවත් වන සියලු ජාතිකයන්ට, සියලු සමාජ කොටස්වලට "පුතා" කියලා කථා කරන්න පුළුවන් අය වැයක්, එකම මවකගේ දරුවන් විධියට සලකන අය වැයක් විධියට අපි මේ අය වැය දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ගයාන් ජනක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 4.27]

**ගරු ගයාන් ජනක මහතා**
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2026 වර්ෂයට අදාළ අය වැය පිළිබඳ සාකච්ඡාව සිදු කෙරෙන මේ මොහොතේදී ඒ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම මුලින්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ඔබ අප කවුරුත් දන්නවා, 2022 අප්‍රේල් මාසයේ 12වැනි දා නිල වශයෙන්ම අපේ රට බංකොලොත් රටක් විධියට ප්‍රකාශයට පත් කළා කියලා. 2022 අප්‍රේල් මාසයේ 12වැනි දා අපේ රට නිල වශයෙන් බංකොලොත්භාවයට පත් කළේ කිසියම් නිශ්චිත සිද්ධියක ප්‍රතිඵලයක් විධියට නොවෙයි. වසර ගණනාවක් තිස්සේ අපේ රට තුළ ක්‍රියාත්මක වෙමින් ආ, පවත්වාගෙන ආ ආර්ථික model එක අසාර්ථකභාවයට පත් වෙලා තවදුරටත් මේ රටේ ආර්ථිකය ඉදිරියට පවත්වාගෙන යන්න බැරි අර්බුදයකට ඇවිල්ලා මේ රට බංකොලොත්භාවයට පත් වුණා. දශක ගණනාවක් තිස්සේ පැවති සාර්ව ආර්ථික අස්ථාවරභාවයන්, රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවන්, ව්‍යුහාත්මක අකාර්යක්ෂමතා වාගේම පාලනයේ තිබුණු දුර්වලතා හේතුවෙන් තමයි එවැනි ගමනක තර්කානුකූල අවසානය ලෙස අපේ රට බංකොලොත්භාවයට පත් වුණේ.

නිදහසින් පස්සේ අවුරුදු 76ක් මේ රට කරගෙන ඇවිල්ලා, මේ රට බංකොලොත් කරලා, ඒ බංකොලොත්භාවයේ පියවරු අද විපක්ෂයේ ඉඳලා රට කරගෙන යන්න ඕනෑ විධිය ගැන අපට ටියුෂන් දෙන්න හදනවා. Sorry! අපට, අපේ රජයට ඒ බංකොලොත් මාවත නොවෙයි අවශ්‍ය. ඒ සඳහා උපදෙස් නොවෙයි අවශ්‍ය. වර්තමාන ආණ්ඩුව මේ රට බංකොලොත්භාවයෙන් මුදාගෙන, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් කියන සංකල්පය මේ මාතෘ භූමියේ යථාර්ථයක් බවට පත් කිරීම කියන කාරණය මූලික කර ගත් දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා ඒ උපදෙස් වෙනුවට, අපි හදා ගත්, අපි උකහා ගත් හැම දෙයක් එක්කම හදා ගත් වැඩ පිළිවෙළක් තුළින් මේ රට ජයග්‍රහණය කරා ගෙන යන ගමනේදී අපේ පළමු අය වැය අවසන් කරලා දෙවැනි අය වැය ඉදිරිපත් කර තිබෙන වෙලාව තමයි මේ. එම නිසා අපි තව දුරටත් ඒ බංකොලොත්භාවයේ පියවරුන්ගෙන් මේ රට හදන්න අවශ්‍ය උපදෙස් නම් බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට ඉතා අඩුවෙන් තමයි කාලය ලැබී තිබෙන්නේ. මේ වන විට ඒ කාල වේලාව ගතවෙලා තිබුණත්, මට තව කරුණු කිහිපයක් කියන්න ඕනෑකම තිබෙනවා. දැන් ඔවුන් කියනවා, අපේ ප්‍රගතිය අසාර්ථකයි ලු. මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ 30 වෙනකොට අපේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ මුදල්වලින්ට සියයට 58ක් වියදම් කරලා තිබෙනවා. අපි අය වැයක් ඉදිරිපත් කරලා මාස 8කින් පස්සේ -වැඩ කරන්න තව මාස 2ක් තිබියදී- අපි සියයට 58ක ප්‍රගතියක් අත් පත් කරගෙන තිබෙනවා. මේ අය 2015 දී යහ පාලන ආණ්ඩුවට ඇවිල්ලා ආණ්ඩු කරන කාලයේ 2016 අවුරුද්ද කොහොමද ගෙවිලා තිබෙන්නේ? සම්පූර්ණ අවුරුද්දක් වැඩ කරලාත් ප්‍රාග්ධන මුදල්වලින් වියදම් කරලා තිබෙන්නේ සියයට 50.2යි. අවුරුද්දක් වැඩ කරලා සියයට 50.2ක ප්‍රගතියක් අත් පත් කර ගත්ත මේ විපක්ෂයේ කණ්ඩායම අද අපෙන් අහනවා, මූල්‍ය ප්‍රගතිය මොකක්ද, භෞතික ප්‍රගතිය මොකක්ද කියලා. Sorry! කනගාටුයි, අපි මාස 8ක් ඇතුළත සියයට 58ක වර්ධනයක් පෙන්නලා තිබෙනවා. ඉදිරි මාස දෙකේදී එය සියයට 80ට වඩා වැඩි කර ගන්න පුළුවන් කියන විශ්වාසයෙන් යුතුව අපි වැඩ කරමින් ඉන්නවා.

[ගරු ගයාන් ජනක මහතා]

ඒ විතරක් නොවෙයි, ඔබ අපි කවුරුත් දන්නවා, 2022 ආර්ථික අර්බුදය, ඒ බංකොලොත්භාවය අපේ රට දශකයකින් ආපස්සට අරගෙන ගියා. අපට දශකයක් අහිමි කළා. බංකොලොත්භාවයට කලින් පැවැති තත්ත්වයට, නැත්නම් 2019දී තිබුණු ආර්ථික තත්ත්වයට නැවත යන්න අඩුම තරමින් අපට අවුරුදු 10කවත් කාලයක් යාවි කියන එක තමයි අපි බලය ගන්නකොට පුරෝකථනය විධියට තිබුණේ. නමුත්, අපි ඉතාම සතුටින්, ඉතාම ආඩම්බරයෙන් කියනවා, අපි බලයට ඇවිල්ලා එක අවුරුද්දක් අවසන් කරනකොට ඒ අහිමි දශකයේ අහිමි වුණු දේවල් අත් පත් කර ගන්න අපේ ආණ්ඩුව සමත් වෙලා තිබෙන බව. අපි ඒ කාරණය ඉතා නිහතමානි ආඩම්බරයෙන් යුතුව කියන්න කැමැතියි. දශකයක් අහිමි වුණු දේවල් අපට එක අවුරුද්දකින් ආපසු ලබාගන්න පුළුවන්කම ලැබී තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒක තමයි සමත්කම කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දශක ගණනාවක් තිබුණු ඒ සාර්ව ආර්ථික අස්ථාවරභාවය, රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාව කියන සියල්ල මඟහරවා ගනිමින්, ඒවාට ඉතාම ස්ථිරසාර ලෙස විසඳුම් ලබා දෙමින් ශක්තිමත් පදනමක් මත මේ රටේ ආර්ථිකය ගොඩනඟලා, ඒ ශක්තිමත් පදනම මත සිටිමින් ආර්ථිකයේ වේගවත් පිම්මක් ඇති කරන්න අපි 2026 අවුරුද්දට අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ මඟින් අපි මධ්‍ය කාලීනව සියයට 7ක වර්ධනයක් බලාපොරොත්තු වෙනවා. අන්න ඒ සියයට 7ක වර්ධනය ඉලක්ක කරගෙන ඉදිරි වසර කිහිපය තුළ අපි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ඉදිරියට යන්න බලාපොරොත්තු වෙනවා. අපේ රට සියයට 7ක වර්ධනයක් සහිතව පවත්වාගෙන යන්නේ කොහොමද කියන එක තර්කානුකූල දත්ත මත පදනම්ව පුරෝකථන තුළ ඉදිමින්, ඒ සඳහා අවශ්‍ය විශ්වාසය ගොඩ නඟමින්, අපි මේ දක්වා අත් පත් කරගෙන තිබෙන වර්ධනය ඒ සඳහා පාවිච්චි කරමින්, ස්ථාවර ලෙස මේ රට ගොඩනඟමින් තිබෙන වෙලාවක් තමයි මේ වෙලාව. ඒ නිසා අපි හිතනවා, අපේ ආණ්ඩුවේ පළමුවැනි අවුරුද්දටත් වඩා හොඳින් මේ අය වැය තුළින් අපේ ඉලක්කවලට ඉතා වේගයෙන් යන්න පුළුවන්කම තිබෙනවා කියලා. අපි ඒ වර්ධනය අත්පත් කරගෙන තිබෙනවා විතරක් නොවෙයි, අපේ ජනතාවට සහන දෙන්නත් මේ කාලය තුළ කටයුතු කර තිබෙනවා. අපි රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කර තිබෙනවා. අපේ පළමුවැනි අය වැය තුළින් ඒක කළා. ඒ කටයුත්ත තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යන්න මෙවර අය වැයෙනුත් මුදල් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අස්වැසුම, මහපොළ වැනි ජනතාවට සෘජුවම සම්බන්ධ වෙන ගොඩක් සහනාධාර, සහන ලබා දෙන්න අපි මේ අය වැයෙන් කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද නොවැම්බර් මාසයේ 14වැනි දා. මීට අවුරුද්දකට කලින් හරියටම අද වාගේ දවසක පැවැති ඒ මහ මැතිවරණයේදී මේ රටේ ජනතාව අපට 2/3ක බලයක් දුන්නා, ඔවුන්ගේ සිහින, බලාපොරොත්තු මේ රට තුළ යථාර්ථයක් කර ගන්නට. අපට ඡන්දය දුන්, අප විශ්වාස කරපු, අපට 2/3ක බලයක් ලබා දුන් ඒ සියලුදෙනාගේ විශ්වාසය තවදුරටත් තහවුරු කරමින් මේ ගමන අපි ඉතාම විශ්වාසයෙන් යුතුව යනවා. විපක්ෂයේ අවලාදවලින් අපේ ගමන නවත්වන්න බැහැ, ඒ ජනතාවගේ විශ්වාසය කඩකරන්න බැහැ කියන කාරණයත් ප්‍රකාශ කරමින්, මේ කාලය ලබා දීම වෙනුවෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.36]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කථාව පටන් ගන්න කලින් මම සුබ පැතීමක් එක් කරන්න කැමැතියි, දශක 4කට වැඩි කාලයක් පාර්ලිමේන්තුව තුළ විශාල කාර්යභාරයක් ඉෂ්ට කළ පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන) විධියට කටයුතු කර අද විශ්‍රාම යන එම්.එම්.එම්. මබ්රූක් මහතාට. එතුමාට සුබ විශ්‍රාම දිවියක් ප්‍රාර්ථනා කරමින්, මම මේ අය වැය විවාදයට ප්‍රවිෂ්ට වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට මේ අය වැය ගැන සතුටු වෙන්න තිබුණා, මේ ඉදිරිපත් කරන්නේ ගිය අවුරුද්දේ නොවැම්බර් 14 වැනි දා -මීට වසරකට ඉස්සෙල්ලා- මේ රටේ 64ලක්ෂයක් වූ ඡන්ද දායකයන්ට ඉදිරිපත් කරපු -අර මහින්ද රාජපක්ෂ මැතිතුමා කියන බයි ජනතාව, ජෙබයියන් බවට පත් කරන්න ඉදිරිපත් කරපු- "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන මැතිවරණ පොරොන්දු පත්‍රය නම්. එහෙම නම් අපට මේ ගැන සෑහීමකට පත් වෙන්න තිබුණා. නමුත් 64ලක්ෂයකට පමණක් වගකියන කාරණාවක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ලක්ෂ 220ක් වුණු ජනතාව වෙනුවෙන් - මේ රටේ චංචල හා නිශ්චල දේපළත් එක්ක - ඉදිරි වසර තුළ මේ රට ආර්ථික සහ සමාජයීය වශයෙන් මෙහෙයවන්නේ කොයි දිශාවටද, අපි ලබා ගන්නා වූ ආර්ථික ප්‍රගතිය මොකක්ද කියන කරුණු අඩංගු ලියවිල්ල තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ.

දැන් මේ ලියවිල්ලට අපි මොකක්ද දෙන නම? "පොහොසක් රටක් - ලස්සන ජීවිතයක්" කියන එක අපට පිළිගන්න බැහැ. මේකට ගජබින්නාලංකාරය කියන්නද, සුරංගනා කථා මාලාවේ තව ඉදිරියක් කියන්නද, සිහින අළෙවි කරන තැනක් නැත්නම් සිහින මවා පෙන්වන ලියවිල්ලක් කියන්නද කියලා අපට තේරෙන්නේ නැහැ. මේ ලියවිල්ල අපට සතුටු වෙන්න පුළුවන් තැනකද තිබෙන්නේ? එදා ජනාධිපතිතුමා තවත් කාලය අරගෙන කියෙව්වා නම්, විපක්ෂය නන්නත්තාර වෙලා, විපක්ෂයට කරකියා ගන්න දෙයක් නැහැ, කියන්න දෙයක් නැහැ කියලා මිනිස්සුන්ට කියයි. ජනාධිපතිතුමා පැය 4 ½කට ආසන්න කාලයක් අරගෙන බොහොම හැඩ වැඩ දමලා එතුමාගේ ලස්සන කථා ශෛලිය අනුගමනය කරලා මේ රටේ ජනතාවට විවිධ කරුණු ඉදිරිපත් කළා. අපට මේ අය වැය ගැන සෑහීමකට පත් වෙන්න පුළුවන්ද? මේකේ ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. මේ තුළ යෝජනා 62ක් විතර තිබෙනවා. ඔබතුමන්ලාට විවේචන එන, අර්බුද මතු වෙලා තිබෙන ක්ෂේත්‍ර ගැන එතුමා යම් කිසි කථාවක් කරලා තිබෙනවා. හැබැයි, අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්ද, ඔබතුමන්ලා ගිය වතාවේත් මේ වාගේම කථාවක් කරලා, ඒ කටයුතු අවසන් කර තිබෙන තැන දැක්කාම? එදා වෙන් කළ මුදල්වලින් ඔබතුමන්ලා වියදම් කර තිබෙන ප්‍රමාණය දැක්කාම? ඒවාට අවධානය යොමු කර කටයුතු කර තිබෙන ආකාරය දැක්කාම? එහෙම බලද්දී, ඔබතුමන්ලා ලබන වසරට ඉදිරිපත් කර තිබෙන අය වැය තුළින් එම වසර අවසන් වනවිට අපට සෑහීමකට පත් විය හැකි ආකාරයට කටයුතු කරලා පෙන්වයිද? කථාව මිසක් ක්‍රියාවෙන් වැඩ පෙන්වන තත්ත්වයක්ද අපි දකින්නේ? ඒ නිසා අපි කියන්නේ මේකත් මේ රටේ ජනතාවට එතුමන්ලා මැතිවරණ කාලය තුළ ඉදිරිපත් කළා හා සමානවම ඉදිරිපත් කර තිබෙන තවත් ලේඛනයක් කියන එකයි. ඔබතුමන්ලාගේ වසරක පාලන කාලය අවසානයේ නොහැකියාව වසා ගැනීම සඳහා තවත් පොරොන්දු කන්දක්, තවත් බලාපොරොත්තු කන්දක් මේ හරහා මේ රටේ ජනතාවගේ හිස මත තබා තිබෙනවා කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

මම ඔබතුමන්ලාට කියන්න කැමැතියි, ඔබතුමන්ලා කථා කළ කාරණාත් එක්ක ඒ අදාළ ඉලක්කවලට යන්න කියලා. අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා කියපු කථාවක පොඩි කෑල්ලක් අල්ලා ගෙන, "භාණ්ඩාගාරය පිරී ඉතිරිලා, හරි ෂෝක්, ඒක මරු" වාගේ කථාවක් කියනවා. එක පැත්තකින් භාණ්ඩාගාරයේ ට්‍රිලියනයක් තිබෙනවා කියනවා. හැබැයි, අනෙක් පැත්තෙන් ට්‍රිලියනයකට වඩා ණය අරගෙන තිබෙනවා. ණය අරගෙන භාණ්ඩාගාරය පුරවලා තියාගෙන මොනවාද කරලා තිබෙන්නේ? භාණ්ඩාගාරයේ සල්ලි මේ විධියට පිරිලා තිබෙනවා නම් මොකටද ණය අරගෙන තිබෙන්නේ? ණය අරගෙන තිබෙන නිසා ට්‍රිලියනයකට වැඩි ප්‍රමාණයකින් ණය බර වැඩි වෙලා තිබෙනවා. වසරක කාල සීමාව තුළ ට්‍රිලියනකට එහා ගිය ප්‍රමාණයකින් ණය බර වැඩි කරගෙන අනෙක් පැත්තෙන් කයිවාරු ගහනවා භාණ්ඩාගාරය ට්‍රිලියනයකින් පිරිලා ඉතිරිලා තිබෙනවා කියලා. තමුන්නාන්සේලා දන්නවා අපේ රටේ උද්ධමනය කොච්චරද කියලා. බඩු ගහලා හැම බඩුවකම මිල ඉහළ ගිහිල්ලා. ගොවියාගේ නිෂ්පාදනය ඇරුණාම අනෙක් හැම භාණ්ඩයකම මිල ඉහළ ගිහිල්ලා. මේ වසරේ ඉතුරු කරගත්, පොදි බැඳගත්, මඩි තර කරගත් ට්‍රිලියනයක සල්ලි ලබන වසරේ සංවර්ධනය සඳහා වියදම් කරන කොට ළඟා කර ගත් ඉලක්කය කොච්චරද?

භෞතික වශයෙන් අද ලක්ෂ 100කින් ඉදි කළ හැකි ගොඩනැඟිල්ල ලබන වසරේ ලක්ෂ 100කින් හදලා ඉවර කරන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතනවාද? මහා මාර්ගයක කිලෝමීටරයක් හදන්න මේ අවුරුද්දේ වියදම් වෙච්ච මුදලින් ලබන අවුරුද්දේ ඒ ප්‍රමාණය හදලා ඉවර කරන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතනවාද? අද කයිවාරු ගහනවා, "අපේ භාණ්ඩාගාරය පිරිලා. අපි ට්‍රිලියනයකට එහා ගිය සල්ලි ඉතුරු කරලා තිබෙනවා" කියලා. ට්‍රිලියනයක් කිව්වාම අනුර දිසානායක මැතිතුමාට පුද්ගලිකව ගත්තොත් මහා සල්ලි කන්දරාවක් වෙන්න පුළුවන්. ඉල්ලන් කාගෙන ආපු කට්ටියගේ අද තිබෙන ආර්ථික වත්කම් දිහා බැලුවාම මේ ට්‍රිලියනය කියන එක මහා ලොකු ගණනක් වෙන්න පුළුවන්. කෝටි ලක්ෂයක් කියන්නේ මහා ලොකු ගණනක් වෙන්න පුළුවන්. හැබැයි, රටේ සමස්ත අය වැයත් එක්ක ගත්තාම ට්‍රිලියනයක් කියන්නේ බොහොම සොච්චම් ගණනක්. ඒක පෙන්වා ගෙන, ඒක තර කරගෙන ඉඳලා අය වැය එනකොට අපි ළඟ මෙච්චරක් තිබෙනවා කියලා කියන එකෙන් රටේ ජනතාවට මොන තරම් අසාධාරණයක්ද කරලා තිබෙන්නේ. අනෙක් පැත්තෙන් මූර්ත වටිනාකම කොච්චර අඩු වෙලා තිබෙනවාද? ඩොලරයට සාපේක්ෂව අපේ රුපියලේ අගය පහළ යනවා. ඒ සියල්ලම සිදු වෙන අතරේ මුදල තර කර ගත්තා කියලා කයිවාරු ගහනවා.

අනෙක් අතට, අද හැම කෙනෙක්ම එල්ලිලා හිටපු කාරණය තමයි, රෝහිණී කවිරත්න මැතිනිය ඊයේ ඉදිරිපත් කරපු ලියවිල්ල. එතුමියත් වතු කම්කරුවන් ඉන්න දිස්ත්‍රික්කයක මහජන නියෝජිතවරියක්. එතුමියට වුවමනා කළේ මේ රැවටිල්ල නතර කරන්න; ඒ කාරණාව නීත්‍යනුකූල කරන්න. රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ජනාධිපතිවරයා විධියට වතු කම්කරුවන්ට රුපියල් 2,000ක් දෙනවා කිව්වා. අද අනුර දිසානායක මැතිතුමා ඇවිල්ලාත් ඒ වාගේ කාරණයක් කියනවා. ඒකේ සැබවුණු කාරණයක් තිබෙනවා. අපේ ගලප්පත්ති මන්ත්‍රීතුමාත් ඒක කිව්වා. දින 25 ඉලක්කය සපුරා ගන්න දීලා බොරු රැවටිල්ලක් කරනවා. අනෙක් පැත්තෙන්, ඒක දෙනවා කිව්වත් නීත්‍යනුකූල රාමුවේ හිරවුණාම මොකක්ද කියන්නේ? අය වැය විවාද කාල සීමාව තුළ අහිංසක වතු කම්කරුවෝ රවට්ටලා, වුන් කරලා, රතිඤ්ඤා දම්මලා රවට්ටලා අවසානයේ ක්‍රියාත්මක කරන්න යනකොට කියනවා, "අනේ, වතු හාම්පුතුන් මේක දෙන්න අකැමැති වුණා. ඒ අය අධිකරණයේ නඩුවක් දැම්මා. අපි මේක යෝජනා කළා තමයි. භාණ්ඩාගාරයෙන් මේ සල්ලි නිදහස් කරන්න අකැමැතියි, මේකට නීත්‍යනුකූල රාමුවක් නැහැ. මේක අය වැය යෝජනාවක් විතරක් වූ පමණින් භාණ්ඩාගාරය මුදල් දෙන්නේ නැහැ" කියලා. ඒ ප්‍රකාශය ආවාම අනේ, අර වුන් වෙලා කිරි උතුරවපු, රතිඤ්ඤා දාපු අපේ වතු කම්කරුවෝ ටික ආපහු අනාථ වෙනවා.

ලොකු සිහින මාළිගාවක් මවනවා. සොච්චම් පඩියක් වැඩි වෙන්නේ. ඒ රුපියල් 200න් ඇති වැඩකුත් නැහැ. නමුත් ඒකෙන් හරි ඒ අයගේ ආර්ථිකයට දායකත්වයක්, ශක්තියක් ලැබෙන නිසා වුන් එකක් ලැබෙයි, මේ අය කියනකොට. හැබැයි, ඒක ක්‍රියාත්මක කරන්න මොකක්ද ඔබතුමන්ලාගේ සැලැස්ම? ඒ මුදල මාසිකව දෙන්න පුළුවන්ද? වතු හිමියන්ගේ payroll එක නැත්නම් දින මාක් කරන එකට රජයේ මුදල් වියදම් කරන්න පුළුවන්ද? ඔබතුමන්ලාට පුළුවන්ද වත්තේ හාම්පුතාගේ check-roll එක අරගෙන ඒ දිනවලට අනුව පඩි ගෙවන්න? ඒක කොහොමද කරන්නේ? ඔබතුමන්ලාගේ පැලවත්තේ අරමුදලේ සල්ලිවලින් නම් පුළුවන්. හැබැයි, භාණ්ඩාගාරයේ සල්ලිවලින් එහෙම කරන්න බැහැ. එහෙම කළොත් ඔබතුමන්ලා ආණ්ඩුව ගත්තාට පස්සේ නිලධාරින් හිරේ දැම්මා වාගේ හෙට භාණ්ඩාගාර ලේකම්තුමා ඇතුළු ඒ අදාළ නිලධාරි මහත්වරුන්ට, මේකට වග කියපු අයට හිරේ යන්න වෙයි. ඔබතුමන්ලා අත පිහදාගෙන ඉඳීවි, "අපි කිව්වා උඹලා හිරේ පලයල්ලා" කියලා. දැක්කා නේ, ආගමන හා විගමන එකේ නිලධාරි මහත්මයා විරාන් අලස් මැතිතුමා කියපු විධියට කටයුතු කරපු එකට හිරේ ලගින්න සිදු වුණා. ඒ මහත්වරු ඔබතුමන්ලාගේ ආරක්ෂාව තිබෙනකල් එළියේ ඉන්නවා. ඒ නිසා මේ වාගේ යෝජනාවක් කරලා වතු කම්කරුවා වුන් කරලා අවසානයේ අර නිලධාරින් අමාරුවේ දාන්න කටයුතු කරන්නේ නැතුව ඒක නීත්‍යනුකූලව කරන්න. ඒ පිළිබඳව විවාදයක්, කථිකාවක් ඇති වෙලා ඒක නීත්‍යනුකූල කළ හැකි පිළිවෙළක් හදන්නට තමයි එතුමිය උත්සාහ කළේ. ඒක අල්ලාගෙන වැළපෙන්න හදන්න එපා.

ඔබතුමන්ලා තාවකාලික වුන් අරගෙන උඩක් බිමක් දන්නේ නැතුව පාපිසි වාගේ, පොල් ලෙලි වාගේ ගහගෙන ඇවිල්ලා කථාවක් කිව්වාම අත්පුඩි ගහලා, වුන් වෙලා ගමට ගිහිල්ලා මේවා ප්‍රායෝගික ක්‍රියාත්මක කරන්න බැරි වුණාම මොකක්ද වෙන්නේ? මන්ත්‍රීතුමියක් වතු කම්කරුවන් නියෝජනය කරන පළාතක ඉඳන් මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ. එතුමිය නන්නත්තාර කරලා. එතුමිය උස්සලා පොළොවේ ගැහුවා වාගේ. ජනාධිපතිතුමා ඉන්න කොට එතුමියට වේදිකාවකට ගොඩවෙන්න දෙන්නේත් නැහැ. එතුමිය හංගලා තියාගෙන ඉන්නවා. ජනාධිපතිතුමා ගියාට පස්සේ වේදිකාවට ගන්නේ. එහෙම කොන් කරලා, වෙනස්කම් කරලා එතුමිය තවත් අමාරුවේ දාන්න හදනවා. "අපි රුපියල් 200ක් දෙනවා, 400ක් දෙනවා" කියලා කයිවාරු ගහලා, දෙන්න බැරි වෙලා හිර වෙලා, නන්නත්තාර වුණාට පස්සේ රෝහිණී කවිරත්න නඩුව දමපු නිසායි දෙන්න බැරි වුණේ කියන්න තමයි මේ හදන්නේ.

රෝහිණී කවිරත්න මැතිනියටත්, සජබයටත් ඕනෑකම තිබෙන්නේ, මේ රුපියල් 200 නොවෙයි, ඊට එහා ගිහිල්ලා රුපියල් 2,000ම සම්පූර්ණ වෙන වැටුපක් වතු කම්කරුවන්ට ලබා දෙන්නයි. මහා පරිමාණ වතු හිමියන්ගේ වතුවල විතරක් නොවෙයි, කම්කරුවන් වැඩ කරන්නේ. සුළු පරිමාණ වතුවල වැඩ කරන කම්කරුවන්ටත් ඒ මුදල ලැබෙන්න ඕනෑ. ඒකට ඔබතුමන්ලා සැලැස්මක්, වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවාද? මහා පරිමාණ වතු හිමියන්ට අපේ රටේ වත්කමක්, අපේ රටේ දේපළක්, රාජ්‍ය දේපළක් දීලා මුදල් උපයා ගන්න අවස්ථාව දීලා තිබෙනවා. ඒ කට්ටිය මෙතුවක් කාලයක් ඒ කම්කරුවන්ට ඒ අවස්ථාව දීලා නැහැ. ඒ කට්ටිය ඒක දෙන්නේ නැතුව නඩු දම දමා හැංගිලා පැනලා යනවා. හැබැයි, මහා පරිමාණ වතු හිමියන් වෙනුවෙන් එහෙම කළාට තේ නිෂ්පාදනයට

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

වැඩිම දායකත්වයක් දෙන කුඩා පරිමාණ වතු හිමියන්ට ඔබතුමන්ලා මොකක්ද ලබා දෙන සහනය? මේ වැටුප් වැඩි වීම තුළ ඔබතුමන්ලා කොහොමද, ඒ කම්කරුවන් ආරක්ෂා කරන්න කටයුතු කරලා තිබෙන්නේ? ඒ නිසා ඒ සඳහා නීත්‍යානුකූල රාමුවක් ලබා දීමට සහ ඒ කුඩා පරිමාණ වතු හිමියන්ගේ වතුවල වැඩ කරන කම්කරුවනුත් ආරක්ෂා කරන්න අපට වුවමනාව තිබෙනවා. ඒ අයට මේ රුපියල් 200ට එහා ගිය ගණනක් දෙන්න. ඒ අය රවට්ටලා, දින 25ක කාලය සම්පූර්ණ කළාම දෙනවාය කියලා කළ නොහැකි ඉලක්කයක් දීලා, රුපියල් 5,000ක් පෙන්වලා, සිහිනයක් මවලා තිබෙනවා. ඒක නතර කරන්නයි අපට වුවමනාව තිබෙන්නේ. අපට ඕනෑ, සැබැවින්ම ඒ වතු කම්කරුවන්ට විතරක් නොවෙයි, මේ රටේ සමස්ත කම්කරුවන්ට වාගේම ගොවීන්ට වැඩ පිළිවෙළක් හැදෙන ආර්ථිකයක්.

මේ සැරේ මොකක්ද කියා තිබෙන්නේ කෘෂිකර්මාන්තය ගැන? තරුණ ව්‍යවසායකයන් දිරි ගන්වන්න රුපියල් මිලියන 500ක් වෙන් කරනවා කියනවා. ගිය සැරේත් කිව්වා ඒකම. කොහේද තරුණ ව්‍යවසායකයෙක් එන්නේ කෘෂිකර්මාන්තයට?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඉන්න ව්‍යවසායකයෝ ටිකත්, ඉන්න ගොවියෝ ටිකත් අනාථ කරලා නන්නත්තාර කරලා තිබෙනවා. ගිය සැරේත් මම කථා කළා මේ වාගේම ඇවිල්ලා. පළමුවැනි සැරේම කිව්වා, ඔබතුමන්ලා වී මිලදී ගන්න කථා කරනකොට වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. නිකම් මිල නියම කළාට, සල්ලි වෙන් කළාට වී ටික මිලදී ගන්න බැහැ කියලා. අන්න ඒක අද තේරිලා තිබෙනවා, වසරකට පස්සේ. Dryers ටික හයි කරනවා ලු. දැන් dryers ටික හයි කරපු පමාවෙන් වී ටික -

මිල වැඩි කරන එක ගැන ආයෙත් කථාවක් නැහැ. දැන් ගිය අවුරුද්දේ දීපු මිලෙන්ම මේ අවුරුද්දේත් ෂේප් වෙලා යන්න ආණ්ඩුව try කරනවා. අද ගොවියාගේ පිරිවැය ඉහළ ගිහිල්ලා තිබෙනවා. ගිය සැරේ දීපු මිලෙන් මේ කන්නයේත් ගොවීන්ට සෑහීමට පත් වෙන්න දෙන්න ඔබතුමන්ලාට අපි ඉඩ දෙන්නේ නැහැ. මීට වඩා සාධාරණ මිලක් ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම මීට වඩා සාධාරණ විධියට වී මිලදී ගැනීමේ කටයුතු කරන්න ඕනෑ.

මේ සැරේ කථා කරලා dryers ටික හයි කළා නේ. අය වැය එනකොට බී ලූනු ගොවීන්ට එවයි, tapes ලබා දීම සඳහා මිලියන 500ක් වෙන් කළා කියලා. ඇයි? බී ලූනු ටික මනින්න දැන් tape එකක් එපා යැ. ඒ නිසා බී ලූනු ගොවීන්ට tapes ලබා දීම වෙනුවෙන් මිලියන 500ක් වෙන් කරනවා. ඒක ලබන අවුරුද්දේ අය වැයට එන්නේ. මොකද, මේ සැරේ ඒක දන්නේ නැහැ නේ. ලූනු ගෙඩිය මනින්න ඕනෑ. මනින්න ඕනෑ scale එක මොකක්ද කියන එක දැන් දන්නේ නැහැ. ඒ නිසා ලබන සැරේ අය වැයෙන් මෙතුමන්ලාට වෙන් කරන්න වෙනවා, බී ලූනු වගා කරන ගොවීන්ට tapes මිලදී ගැනීමට මිලියන 500ක්. මේකද, ආර්ථික ප්‍රතිපත්තිය? එක අවුරුද්දක් අනලා වනලා ගොවියා විනාශ කරලා, ඊළඟ අවුරුද්දේ බය වෙන්න එපා ලු, වැඩේ කරලා දෙනවා ලු. අවුරුද්දක් වුන් එකේ යන්න ආයෙත් ගොවියා රවටනවා. අල ගොවියාටත් ඒකමයි කළේ. බඩ ඉරිඟු ගොවියාටත් ඒකමයි කළේ. මේ රටේ සමස්ත ගොවියා, එළවලු ගොවියා ඇතුළු හැම ගොවියාම ප්‍රශ්නයකට මුහුණ පාලා සිටිනවා. හැම භාණ්ඩයකම මිල දවස ගණනේ ඉහළ යනවා. හැබැයි, මේ කට්ටියට හරි කැක්කුමක් තිබෙනවා. ගොවීන් ගැන කිඹුල් කඳුළු හෙළපු ආණ්ඩුවක්. අද ගොවීන් ගැන කිසිදු කැක්කුමක් නැතුව කටයුතු කරනවා. ගොවියාගේ භාණ්ඩ මිල ඉහළ යනකොට පාරිභෝගිකයා ගැන හරි කැක්කුමයි. ගොවි නායකයා මෙහේ පාර්ලිමේන්තුවේ ඉන්නවා, ෂෝක් එකට. ටයි කෝට් දමාගෙන ෂෝක් එකට ඉන්නවා. අනෙක් පැත්තෙන් කෘෂිකර්ම ඇමතිවරයා කියනවා, තවදුරටත් අපි වවාගෙන අපි කනවා කියන ප්‍රතිපත්තියේ නැහැ ලු. මේ, කෘෂිකර්ම ඇමතිවරයා කියන කථාවක්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මෙන්න කෘෂිකර්මාන්තයේ යෙදෙන සුවහසක් ජනතාවගේ බලාපොරොත්තු එක්ක ඉන්න ඇමතිවරයා කියන කථාව! අනෙක් පැත්තෙන්, මේ මහත්තුරු ගණනාවක් කියනවා, රට බංකොලොත්වීම ගැන. දිනය හොඳට මතකයි, රටේ බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කරපු. හැබැයි රට බංකොලොත්භාවයෙන් ගලවා ගත්ත දිනය මේ කට්ටිය කාටවත් මතක නැහැ. මේ කට්ටියට හුඟක් අයට මතක තිබෙන්නේ, අර බංකොලොත්භාවය ප්‍රකාශ කළ දිනය විතරයි. මේ අය ආවාට පස්සේ දැන් ආර්ථිකය ස්ථාවර වෙලා ලු. භාණ්ඩාගාරය පිරිලා ලු. හැබැයි අපි බංකොලොත්භාවයෙන් නිදහස් වෙච්ච දවසත් ඒ එක්කම කියන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
"අපි මේ රට භාර ගන්නකොට බංකොලොත්භාවයෙන් නිදහස් වෙච්ච රටක් භාර ගත්තේ. පෝලිම් නැති රටක් භාර ගත්තේ. ගෑස් ටැංකි පිපිරෙන්නේ නැති රටක් භාර ගත්තේ. ඖෂධ හිඟයකින් තොර රටක් භාර ගත්තේ" කියලා කට ඇරලා කියන්න පුළුවන්, ඉතිහාසය මතක තිබෙන කණ්ඩායමක් බවට පත් වෙන්න. උඩින් පහත් වෙච්ච පමාවෙන් මේ රටේ මිනිස්සු අන්දන්න කටයුතු නොකර, ජනතාවට වග කියන්න. මේ අහම්බෙන් හම්බ වෙච්ච අවස්ථාවේ රටේ ජනතාවට සහනයක් දෙන්න කටයුතු කරන්න. ඔය ඔක්කෝගේම ප්‍රතිඵලය බලන්න, ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, මේ අවුරුද්දේ ඉක්මනින්ම පළාත් සභා මැතිවරණය තියන්න කියලා. එතකොට ඔබතුමන්ලාගේ තැන මේ රටේ ජනතාව අවබෝධ කරලා දෙයි කියන කාරණය මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.49]

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2026 අය වැය ගැන වාද කරන අද විවාදය ඉතාම උච්ච අවස්ථාවකට පැමිණි මොහොතක මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අමතක වෙලාද, එහෙම නැත්නම් අමතක කරලාද, එහෙම නැත්නම් හිතා මතාම අමතක කරමින් අපට චෝදනා කරනවාද කියන එක පිළිබඳව අපි හිතන්න ඕනෑ.

දැනට දින දෙකකට කලින් විපක්ෂ නායකතුමා කිව්වා, වතු කම්කරුවන්ට පැමිණීමේ දෛනික දිරි දීමනාව විධියට රුපියල් 200 ලබා දීම නීති විරෝධියි කියලා. ඒ වාගේම මාතලේ මන්ත්‍රීතුමිය ඇතුළු ඒ හැමෝම උදේ සිට කිව්වා, ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරනවා කියලා. මීට මත්තෙන් කථා කරපු මන්ත්‍රීතුමාත් කිව්වා, ඒක නීති විරෝධියි කියලා. හැබැයි මේ වන කොට මාධ්‍ය හමුවක් තියලා විපක්ෂ නායකතුමා නැවත කියා තිබෙනවා, ඒක ගැටලුවක් නැහැ, නීත්‍යානුකූලයි කියලා. අපට මේක තේරෙන්නේ නැහැ. මොකද, විපක්ෂ නායකතුමා එක තැනක ඉඳගෙන මාධ්‍ය නිවේදන නිකුත් කරනවා; ඉස්සරහින් ඉඳගෙන ගෝලයෝ ටික තවත් දෙයක් කියනවා; විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ මාධ්‍ය ප්‍රකාශක කියනවා, "මේක නීති විරෝධීමයි" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට මත්තෙන් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, ගහගෙන ආපු පාපිසි, පොල් ලෙලි තමයි පාර්ලිමේන්තුවේ තිබෙන්නේ කියලා. එතුමාට අපි කියනවා, එහෙම ගහගෙන ආපු පාපිසි මේ පැත්තේ නැති බව. මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, කලාකරුවන්, විදුහල්පතිවරුන්, නීතිඥවරුන්, ඉංජිනේරුවන් වාගේ උගත්, බුද්ධිමත් කණ්ඩායමක් තමයි මේ 159දෙනා අතර ඉන්නේ. විපක්ෂය පැත්තේ ඇති, එහෙම ගහගෙන ආපු පොල් ලෙලි; ගහගෙන ආපු පාපිසි. හැබැයි, අපේ මේ ආණ්ඩු පක්ෂය ඇතුළේ එහෙම කවුරුවත් නැහැ කියන එක මම මතක් කර දෙන්න ඕනෑ. මොකද, අප වාගේ පිරිසක් පාර්ලිමේන්තුවට එයි කියලා මේ අය හිතුවේ නැහැ; අම්බිකා සාමිවෙල් සහෝදරිය පාර්ලිමේන්තුවට එයි කියලා මේ අය හිතුවේ නැහැ. මොකද, පාර්ලිමේන්තුවට මේ අයගේ පෙළැන්තියේ අප්පා ආවා, කුඩප්පා ආවා, පුතා ආවා, බාප්පා ආවා. එහෙම තමයි මේ අය පාර්ලිමේන්තුවට තෝරාගෙන තිබුණේ. නමුත්, අපේ මාලිමාව ආණ්ඩුවේ එහෙම නැහැ. මේක අප කාගේවත් බූදලයක් නොවෙයි.

විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අමතක වෙලා තිබෙනවා, තමන්ගේ ඉතිහාසය. පාර්ලිමේන්තුවේ තාත්තා හිටියා; තාත්තාගෙන් පුතාට දුන්නා; පුතාගෙන් බාප්පාට දුන්නා; බාප්පාගෙන් බාප්පාගේ පුතාට දීලා පසු ගිය ආණ්ඩු පරම්පරාවෙන් පරම්පරාවට අරගෙන ගිය ආණ්ඩු බවට පරිවර්තනය කරලායි තිබුණේ. ඒ තත්ත්වය වෙනස් කිරීම සඳහා මේ රටේ ජනතාව බුද්ධිමත් වෙලා උගත් බුද්ධිමත් කණ්ඩායමක් පාර්ලිමේන්තුවට එව්වා. ඒ එවපු කණ්ඩායම වෙච්ච මාලිමාව ආණ්ඩුවේ අප මේ රට වෙනස් කරලා, ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට, බලාපොරොත්තු, ඉලක්ක සම්පූර්ණ කරන්න පුළුවන් වෙච්ච අය වැයක් නිර්මාණය කරන්න සමත් වුණා කියන එක ඉතාම සතුටින් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

මේ අය වැය වෙනදා වාගේ එහෙන් මෙහෙන් ගහපු අය වැයක් නොවෙයි. විපක්ෂය නම් අදත් එහෙන් මෙහෙන් ගහනවා. නමුත්, ඔබතුමන්ලාට ජනතාව අනාගතයේදී උත්තර දෙයි. මොකද, ආර්ථික පදනම දෙදරා ගිය මොහොතක, දේශපාලන සංස්කෘතිය කුණු වෙලා, ඔද්දල් වෙලා, වැහැරිලා ගිය මොහොතක, සමාජයීය දෙදරීම බරපතළ, භයානක තත්ත්වයේ තිබුණු මොහොතක තමයි අපි පසුගිය මැතිවරණයෙන් ජයග්‍රහණය ලැබුවේ. ඒ ජයග්‍රහණය ලබලා, බලයට පත් වෙලා, මේ රටේ ස්ථාවර ආණ්ඩුවක් හදලා, රටේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන, රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන අය වැයක් අපි 2025 වසරට අදාළව මේ වසරේදීම ඉදිරිපත් කළා. ඊට වඩා ශක්තිමත් අය වැයක් අපි 2026 වසර සඳහා ඉතාම විද්‍යාත්මකව ඉදිරිපත් කර තිබෙනවා. මේක, මේ ක්‍රියාවලිය විපක්ෂයට දරා ගන්න බැහැ. අපි ඒක දන්නවා.

මීට මත්තෙන් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කියනවා මම දැක්කා, "ප්‍රජාශක්ති" ජාතික වැඩසටහන කියන්නේ දේශපාලනීකරණ ආයතනයක් කියලා. අපි කියනවා, නැහැ ඒක දේශපාලනික ආයතනයක් නොවෙයි, මේ රටේ ගැමි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන ගැමි ජනතාවගේ ඇත්ත වුවමනාව සොයා බලා, ඊට සරිලන ලෙස ආර්ථික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්මාණය කරපු වැඩ පිළිවෙළක් කියලා. අපි ඒ බව මේ මොහොතේ මතක් කරන්න ඕනෑ. මොකද, පසු ගිය වසර 76ක ඉතිහාසය තුළ මේ රටේ සංස්කෘතිය විනාශ කරන කොට, මේ රටේ ආර්ථිකය විනාශ කරන කොට, මේ රටේ ජනතාවගේ බදු මුදල් මංකොල්ල කනකොට ඊට විරුද්ධව පාරේ සටන් කළේ අපි; ඊට විරුද්ධව පෙනී සිටියේ අපි. රාජ්‍ය සේවකයා සූරා කනකොට ඒ රාජ්‍ය සේවකයා වෙනුවෙන් පෙනී සිටියේ අපි. ඒ නිසා තමයි අපේ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා 2026 අය වැය ඉතාම ශක්තිමත්, විනිවිදභාවයෙන් යුක්ත පදනමක් මත ඉදිමින් නිර්මාණය කළේ.

ඔබතුමන්ලාට විශේෂයෙන්ම කියන්න ඕනෑ දේ මේකයි. ප්‍රතිපත්තිමය තීන්දු මත ඉඳලා, දර්ශනයක් සහිතව ගොඩ නඟන ලද මෙම අය වැය සම්බන්ධයෙන් අප බලන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. රටක වටිනාම ක්ෂේත්‍රයක් තමයි අධ්‍යාපන ක්ෂේත්‍රය. 2026 අය වැයෙන් අධ්‍යාපනය වෙනුවෙන් අපි වෙන් කර තිබෙනවා, රුපියල් බිලියන 704ක්. ඊළඟ එක තමයි, රටේ ජනතාවගේ යහපත් සෞඛ්‍යය. ඒ වෙනුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වෙන් කර තිබෙනවා රුපියල් බිලියන 654ක්. ඊළඟට වැදගත්ම දේ තමයි, රටේ ජනතාවගේ අධ්‍යාපන ක්‍රියාවලිය ඇතුළු රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලිය සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන ප්‍රවාහන ක්ෂේත්‍රය. ඒ සඳහා රුපියල් බිලියන 456ක් වෙන් කර තිබෙනවා. මේ අනුව ගත්තාම, මේ රටේ සමස්ත ජනතාවගේ මූලික අයිතීන් ටික දිනා දීම සඳහා වන සංවර්ධිත අය වැයක් හැටියට තමයි අප 2026 අයවැය ඉදිරිපත් කරන්නේ. එම නිසා අපි විපක්ෂට කියන්න ඕනෑ, ඔය කෙඳිරි ගෑවාට, විවිධ දේවල් කියමින් අවලාද නැඟුවාට, තමුන්නාන්සේලාගේ බුද්ධියට කථා කරලා, තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියට කථා කරලා මෙම අය වැය නරකද, හොඳද කියන ප්‍රශ්නය අහන්න කියලා. මෙම අය වැය විවාදයේ මුල් අවධියේදීම, "මෙම අය වැය සාර්ථක අය වැයක්" කියන එක විපක්ෂයේ බුද්ධිමත් මන්ත්‍රීතුමෙක් තමන්ගේ හදවතින්ම කිව්වා. ඒ ඇත්ත යටපත් කිරීම සඳහා ඒ දේ නොතේරෙන පිරිසක් එකතු වෙලා විවිධ වූ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. මා රටේ ජනතාවට කියා සිටින්නේ, විපක්ෂයේ ස්වභාවය එය වන බවයි.

රටේ ජනතාව ගත්තු තීන්දුව අනුව රට ඉදිරියට ගෙන යෑම සඳහා ශක්තිමත් අය වැයක් අපි නිර්මාණය කර තිබෙනවා. තව මොහොතකින් ඔබට ලැබෙන අවස්ථාවේදී මෙම අය වැයට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මම මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.57]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ 2026 වසර සඳහා වන අය වැය දෙවන වර කියවීමේ විවාදයේදී කරුණු දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මම ඇත්තටම සතුටු වෙනවා. ඒ වාගේම, මේ අය වැය පිළිබඳවත් අපි බෙහෙවින් සතුටු වෙනවා

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අප මේ වසරේ පෙබරවාරි මාසයේ 2025 අය වැය ඉදිරිපත් කළ අවස්ථාවේදී, විපක්ෂය පැත්තෙන් විශාල විවේචනයක් ඉදිරිපත් කළා, අපේ එම අය වැයට විරුද්ධව. අඩුම ගණනේ අප කරපු වැටුප් වැඩි කිරීම ගැනවත් හරියට සමාජගත කර ගන්න අපට බැරි වුණා, ඒ වෙලාවේ. අතට පඩිය හම්බ වුණාටත් පසුව තමයි ජනතාව තේරුම් ගත්තේ, ඇත්තටම පඩි වැඩි වෙලා කියලා. අප ඉදිරිපත් කළ වැඩ පිළිවෙළ පිළිබඳව, අප දැමූ පදනම පිළිබඳව මීට මාස හයකට, හතකට කලින් විපක්ෂයට පුළුවන්කම ලැබුණා ලොකු සද්දයක් දාන්න. ඒ නිසාම සමහර වෘත්තීය අංශ පඩි වැඩි කරලා තිබියදීත් ස්ට්‍රයික් පවා කරන්න ගියා. නමුත්, මෙවර ඇත්තටම අපි දුටුවේ නැහැ විපක්ෂය පැත්තෙන් කුමන හෝ බරක් ඇති, කුමන හෝ තර්කානුකූලභාවයක් ඇති කථාවක්. සමහරු හීනමානය පිට කළා. මම හිතුවා, මට කලින් කථා කළ විපක්ෂයේ මන්ත්‍රීතුමා Windsor Palace එකේ ඉපදිච්ච කෙනෙක්ද කියලා. එතුමා මහජන නියෝජිතයන් හෑල්ලු කරමින් කථා කළා. මෙතැනට එන හැම මන්ත්‍රීවරයෙක්ම ඡන්දය දිනලා එන අය. ඇත්තටම ජනතාව ඉදිරියේ පාපිසි, බෝක්කු කටවල්, තැඹිලි කෝම්බ බවට පත් වුණේ තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායකයෝ නේ. ජනතාව විසින් කුණු බක්කියේ ඔබලා හොයා ගන්න නැතිව තිබෙන්නේ ඒගොල්ලෝ නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහජන මන්ත්‍රීවරයෙකුට එහෙම කියන්න තරම්, මේ කවුද? ජනාධිපති කෙනෙක්ද එහෙම කියන්නේ? ඒකෙන් කියන්නේ මොකක්ද? ඒ අය ළඟ හීනමානය උතුරලා තිබෙන බවයි. ඒ ගැන අපි ඇත්තටම කනගාටු වෙනවා.

අවුරුද්දක් ගියාට පස්සේත් අපි ඉතාම කනගාටු වෙනවා. අපි මාර්තු මාසයේදී පුදුම වුණා. අපි හිතුවා හොඳ දෙයක් කළාම හොඳයි කියන විපක්ෂයක් ඉදියි කියලා. අපි අවංකවම ඒ වෙලාවේ හිතුවේ එහෙම. නමුත් මාර්තු, අප්‍රේල්, මැයි වෙනකොට අපි තේරුම් ගත්තා එහෙම විපක්ෂයක් නැහැ, ඉන්නේ බොහොම පහළ වර්ගයේ, පරාජයේ වියරුව නිසා ප්‍රකෝපයෙන් දැවෙන, විශේෂයෙන් පෞද්ගලිකව අපහාස කරන විපක්ෂයක් කියලා. අපි මෙතැනදී කිසිම මන්ත්‍රීවරයකුට පෞද්ගලිකව අපහාස කරන්නේ නැහැ. මම හැම දාම කියනවා, මම ඡන්දයෙන් එන ඕනෑම මන්ත්‍රීවරයකුට ගරු කරනවා. මම අමාත්‍යාංශයට වෙනම කියලා තිබෙනවා මොන මන්ත්‍රීතුමා කිව්වත්, මන්ත්‍රීවරයෙක් නම් විශේෂත්වය දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අම්බිකා සහෝදරිය ගැන අපි ආඩම්බර වෙන්න ඕනෑ. මේ සමාජය, මේ රටේ මහ ජනතාව අම්බිකාලා වාගේ ඉතාම සාමාන්‍ය පන්තියේ ගැහැනු, -අම්මා කෙනෙකුත් නොවෙයි, ගැහැනියක් නේ- මේ සභාවට ගේන්න තරම් ශක්තිමත් වීම ගැන. මතක තියා ගන්න, ඔය ආකල්පයෙන් ගිහිල්ලා ඔබතුමන්ලා වඳ වෙනවා හැරෙන්න, -ජනාධිපතිතුමා කිව්වා වාගේ- වෙන මොකුත් වෙන්නේ නැහැ. ඉතිහාසයේ කුණු බක්කියට ගිහින් තිබෙන්නේ කවුද? ඔබතුමන්ලා නේ. කෝ, ඔබතුමන්ලාගේ පරණ කට්ටිය? ඒක තමයි ජනාධිපතිතුමා ඊයේ ඉල්මහ සමරුවේදී කිව්වේ ඔබතුමන්ලාගේ පක්ෂ ඔක්කෝම අද එකතු වෙලා තිබෙන්නේ මොකක් මතද? ගොඩක් දේවලට එකඟයි, සමහර ඒවාට එකඟ නැති වෙන්න පුළුවන්. එකතුවෙලා තිබෙන්නේ "හිටපුකම" විසින්. හිටපු, හිටපු, හිටපු; හිටපු ජනාධිපතිලා, හිටපු අගමැතිලා, හිටපු ඇමතිලා, හිටපු මන්ත්‍රීලා, හිටපු සභාපතිලා. දැන් හොරුත් එක්කයි, මහ බැංකු මංකොල්ලකාරයෝ එක්කයි, ස්ත්‍රී දූෂකයෝ එක්කයි, ඔක්කෝම එකතු වෙනවා. හිටපුකම විතරයි ඒකට එකම සමානතාව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කිසිසේත්ම මේ විපක්ෂයට තර්කානුකූලව දේවල් කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැබැයි අපි කනගාටු වෙනවා මිනිස්සුන්ට මෙච්චර පහළට යන්න පුළුවන්වීම ගැන.

දෙවෙනි කරුණ මේකයි. වතුකරයේ ජනතාවට, මලෛයහම් ජනතාවට වැටුප් වැඩි කිරීම ගැන ප්‍රධාන පක්ෂත් එක්ක විවිධ සන්ධාන ගහන කඳුකරයේ දෙමළ පක්ෂවල නායකයෝ පවා මොකක්ද කිව්වේ කියලා මම දැනගන්න කැමැතියි. එතුමන්ලා කියපු දේවල් වාර්තා වෙලා තිබෙනවා. මම ඒවා කියන්න කාලය නාස්ති කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට ඒ ගැන කියන්න ඕනෑත් නැහැ. හැබැයි මට හරි පැහැදිලියි, හත්පොළේ ගාගෙන තිබෙන්නේ කියලා. ඒ නිසා අපි විපක්ෂ නායකවරයාට කියනවා අල්ලස් කොමිසමේ දාපු පැමිණිල්ල පක්ෂයේ ස්ථාවරය නම්, එහෙමම කරගෙන යන්න, එහෙම නොවෙයි නම් බොරුවට statements දීලා වැඩක් නැහැ කියලා. අපට කමක් නැහැ ඒක තිබුණත් නැතත්. අපි පඩි වැඩි කරලා ඉවරයි. පුළුවන් නම් ඒක ඉල්ලා අස් කරගෙන පෙන්වන්න. අධමයි. මිනිස්සුන්ට මෙහෙම වෙන්න පුළුවන්ද? මහජන නියෝජිතයන්ට මෙහෙම වෙන්න පුළුවන්ද? මම ඒ ගැන ඊට වඩා කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි අද ඉතාම සතුටු වෙනවා සාධාරණ, බර සහිත අය වැයක් ඉදිරිපත් කිරීමට හැකිවීම ගැන. මම ඔබතුමන්ලාගේ පක්ෂයක ජ්‍යෙෂ්ඨයෙකුගෙන් ඇහුවා, - 2002-2003 කාලයේ මම හිතුවා එතුමා ටිකක් දැනුවත් මන්ත්‍රීවරයෙක් කියලා- අපේ අය වැයේ දකින ප්‍රධාන අඩු පාඩු කිහිපයක් කියන්න පුළුවන්ද කියලා. එතුමාත් සමඟ තව දෙතුන්දෙනෙකුත් හිටියා. එතුමා කිහිපයක් කිව්වා. Investmentsවලට තව බර තියන්න ඕනෑ, තව investments ගේන්න ඕනෑ කිව්වා. ඔව්, ඇත්ත. ප්‍රශ්නයක් නැහැ, ඒවා ගේන්න පුළුවන්. ඊට අමතරව මොකුත් විශේෂ දෙයක් කිව්වේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ අතිමහත් ජනතාව මේ පක්ෂයට ඡන්දය දීලා තිබෙනවා. සියලු ජනතාව අපෙන් ප්‍රතිලාභ බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව කරුණු කිහිපයක් කියන්න මම කැමැතියි. වෛරයෙන් පුපුරු ගහන, හීනමානයෙන් පෙළෙන, මහජන නියෝජිතයාට ගරු කරන්න දන්නේ නැති මිනිස්සු, මිනිස්සුන්ට ගරු කරන්නේ නැහැ කොහොමත්. ඒ වාගේ කණ්ඩායමක් එක්ක වාද කරන එකේ කිසිම තේරුමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන් ඕනෑම ආණ්ඩුවක් ජනාධිපතිවරයෙකුගේ පැත්තෙන් අය වැයක් ඉදිරිපත් කරන්නේ අවුරුද්දක කාලයකට වුණාට, ඒක ඉදිරිපත්

කරන්නේ යම්කිසි ආර්ථික දර්ශනයක් එක්ක, සමාජ දර්ශනයක් එක්ක. අපි බලන්න ඕනෑ මේ අය වැයේ අපි සෙට් කරලා තිබෙන trend එක මොකක්ද කියලා. මොකද, අය වැයක් කියන්නේ ආණ්ඩුවක යම්කිසි ක්‍රියාවලියක්. අපි අවුරුදු 5ක් ඉන්න ආණ්ඩුවක්. එතකොට ප්‍රමාණාත්මකව තමයි දේවල් එකතු වෙන්නේ. මොකක්ද අපි සෙට් කරලා තිබෙන trend එක? මේ අය වැයේ තිබෙන ඉතාම තර්කානුකූල පැති මොනවාද? පළමුවැනි එක තමයි, fiscal discipline. ගරු ජනාධිපතිතුමා ඒ ගැන ඉතාම පැහැදිලිව විස්තර කරලා කිව්වා. මම ඒවා නැවත කියන්න කාලය ගන්නේ නැහැ. අපි ඉතාම පැහැදිලිව රටේ මූල්‍ය නීතිය අනුව, ලෝකයේ පිළිගත් මූල්‍ය නීතිය අනුව, අපි කැමැති වුණත් නැතත් ලංකාව විවිධ ජාත්‍යන්තර සංවිධාන සමඟ අත්සන් කර තිබෙන ගිවිසුම් අනුව, ඒ වාගේම ඊළඟ අවුරුදු හතරේ අවශ්‍ය කරන තත්ත්වයට රටේ ආර්ථිකය නිර්මාණය කරන්න, රට සංවර්ධනය කිරීම ඉලක්ක කරගෙන අපේ fiscal discipline හරියට හදලා තිබෙනවා. ඒ පිළිබඳ කරුණු ඉතාම තර්කානුකූලව මට පසුව කියන්න පුළුවන්. අපි ඒක කරලා තිබෙනවා. අපි කිසිම දෙයක් ඉබාගාතේ, අතාර්කිකව කරලා නැහැ. හැම දෙයක්ම යම්කිසි දර්ශනයකට, ඉලක්කයකට, සැලැස්මකට තමයි කරලා තිබෙන්නේ. ඒ සැලැස්මට අනුව සමහර ක්‍රියාමාර්ග තවම අපට align කරගන්න බැරිවෙලා තිබෙන්න පුළුවන්. අපි සැලැස්මක් හදලා තිබෙනවා, ඒ සැලැස්ම දියත් කරලා තිබෙනවා. හැබැයි, ඒ සැලැස්මට එකතු කරගන්න බැරි වෙච්ච යම් යම් ක්ෂේත්‍ර, ආයතන, ව්‍යාපෘති තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, ත්‍රීවීලර් එකක් හරවන වේගයෙන් නැවක් හරවන්න බැහැ, රටක් හරවන්න බැහැ කියලා. අපි ඒකට අවශ්‍ය සැලැස්ම හදලා තිබෙනවා තර්කානුකූලව, ඒ විධියට.

ඊට පස්සේ බදු පදනම. අලුතින් බදු පනවන්නේ නැතිව අපට බදු එකතු කරන්න වෙනවා. ඒ සඳහා අපි බදු පදනම පුළුල් කර තිබෙනවා, ඉතාම තර්කානුකූලව. අපි දන්නවා බදු අවශ්‍යයි. ඒ වාගේම, බදු ගෙවන මනුස්සයා මතම බදු පටවන්නේ නැතිව බදු පදනම පුළුල් කරගත යුතුයි කියන එක පසුගිය කාලයේ පිළිගත් අදහසක්. ඒක අවුරුදු 20ක්, 30ක් තිස්සේ කරගන්න බැරි වෙච්ච දෙයක්. අපි ඒක කරන්න පටන් අරගෙන තිබෙනවා; තව කරන්න තිබෙනවා. ඒ trend එක සෙට් කර තිබෙනවා.

ඊට පස්සේ ඩිජිටල්කරණය. අපි අවුරුදු 25ක් පසුපසින් ඉන්නේ, digitalizationවලින්. අපිත් එක්ක හිටපු රටවල් අප පසුකර ගිහින් තිබෙනවා. මැලේසියාව වාගේ රටක් ගත්තොත්, ඒ අපි එක්ක හිටපු රටවල්. ඇත්තටම ඒ අපිත් එක්ක එකට නිදහස ලබා ගත් රටවල්. ඒගොල්ලන් අප පසුකර ගිහින් තිබෙන එක පැත්තක් තමයි, මේ digitalization. අපි හරි පැහැදිලිවම digitalizationවලට සෙට් කරලා තිබෙනවා. ඒකට අමාත්‍යාංශයක් හදලා තිබෙනවා විතරක් නොවෙයි, ඒ සම්බන්ධ කුඩා කුඩා ජයග්‍රහණ ලබා තිබෙනවා. අපි දැනටත් digitalization පටන් අරගෙන තිබෙනවා. ඔබතුමිය දන්නවා, LankaPayවලින්, GovPayවලින් අද බිලියන ගණන් transactions වෙන බව. අපි බස් එකේ යනකොට ටිකට් එකේ ඉතිරි සල්ලි දෙන්නේ නැති එක ලොකු ප්‍රශ්නයක්. ඒ වාගේ චූටි දෙයක්වත් කරගන්න බැරිව තිබුණේ. මේ මාසයේ 24වැනි දා උදේ සිට ඕනෑම bank card එකකින් බස් එකේ ටිකට් එක ගෙවන්න පුළුවන් ක්‍රමය පටන් ගන්නවා. ඊට පස්සේ කියයි, කොහේ හෝ ඈතම ගමක බස් එකේ ටිකට් එක ගෙවන්න bank card එක ගත්තේ නැහැ කියලා. එහෙම වෙන්න පුළුවන්. මොකද, ලංකාවේ කියමනක් තිබෙනවා නේ, "හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ" කියලා. පෙති දෙක එනකොට කියන්න පුළුවන්, trend එක මොකක්ද කියලා. අපි trend එක සෙට් කරලා තිබෙනවා. අපේ මැතිවරණ ප්‍රකාශනය ගැන අපටත් කියලා දෙන එක වටිනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන ඉලක්කම් අපට කියන එක වටිනවා. අපිත් ඒවා දෙස බලනවා. මම හැම දාම කියනවා, අපි ප්‍රතිපත්ති ප්‍රකාශනය ලියාගෙන තිබෙන්නේ අපටමයි. ඔබතුමන්ලා විවේචනය කළත්, නැතත් අපි ඒක ක්‍රියාත්මක කරනවා. එකම දේ හැටියට ඒකට උපාය මාර්ගික ඉවසීම - strategic patience - අවශ්‍යයි. අපට ඒ උපාය මාර්ගික ඉවසීම තිබෙනවා. අපි දන්නවා, රටේ නිලධාරි තන්ත්‍රයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් තවම කම්මැළියි කියලා. අපි දන්නවා, ඒගොල්ලන්ගෙන් සමහරු දූෂිතයි කියලා. අපි ඒගොල්ලන්ගෙන් පළිගන්න පටන් අරගෙන නැහැ. අපි දන්නවා, අපි යම්කිසි ක්‍රමයකට වැඩ කරගෙන යනකොට ඒගොල්ලන් වෙනස් වෙනවා කියලා.

අද අල, ලූනු පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒක සම්පූර්ණයෙන්ම විසඳන්න අවශ්‍ය ස්ථාවර සැලසුම් හදාගෙන යනවා. හැබැයි, තවම තැන් තැන්වල ඒ ප්‍රශ්නය තිබෙනවා. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා පසුගිය කන්නයේ බොහොම මහන්සි වුණා හාල් ගෙනෙන්න. හැබැයි, trend එක සෙට් කරලා තිබෙනවා; ක්‍රියාමාර්ගය දියත් කර තිබෙනවා. නමුත්, තවම සම්පූර්ණ වෙලා නැහැ. අපි - ඔබතුමන්ලා දන්නවා රටක් වෙනස් කරනකොට එක පැත්තකින් අනිවාර්යයෙන්ම ඒකට කාලයක් යන බව. අපේ රටේ මහාමාර්ග අමාත්‍යාංශයට අයිති pavements තිබෙනවා. ඒ pavementsවල මිනිස්සු කඩ දමාගෙන ඉන්නවා. ඒවා නීති විරෝධියි තමයි. ඒවා අපිළිවෙළයි. ඒවායින් මඟීන්ට කරදරයකුත් සිද්ධ වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් ඒවා ඔක්කෝම පැය 24න් අයින් කරන්න ඕනෑද? නැහැ, එහෙම කරන්න බැහැ. නගර සභාවට බලය තිබෙනවා, අනවශ්‍ය ඒවා අයින් කරන්න. නමුත්, අපි එහෙම කරන්නේ නැහැ. අපි දන්නවා අපේ රටේ අවිධිමත් - informal - ආර්ථිකයක් තිබෙනවා කියලා. ඒ අවිධිමත් ආර්ථිකයට ක්‍රමානුකූලව කර්මාන්ත ව්‍යාපාර අවස්ථා දෙමින් තමයි ඒක අයින් කරන්න ඕනෑ. ඒ නිසා අපිට උපාය මාර්ගික ඉවසීම තිබෙනවා. අපි නලියන්නේ නැහැ. දැන් මේගොල්ලන් හදනවා අපිව නලියවන්න. එහෙම වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඩිජිටල්කරණය ගැනත් කිව යුතුයි. ඩිජිටල්කරණය කියන එක අපි සෙට් කරලා තිබෙනවා. හැම දෙයක්ම තවම digitalize වෙලා නැහැ. නමුත්, මේ අවුරුද්ද - 2026 අවුරුද්ද - තුළදී විශාල වශයෙන් digitalization සඳහා යන්න අපි හිතනවා. ඒක තමයි අපේ තර්කානුකූල උපායමාර්ගික පියවර, ලංකාව ඉස්සරහට ගන්න.

ඊට පස්සේ හතරවෙනි එක මොකක්ද? නිෂ්පාදන ආර්ථිකය. ඔබතුමිය දන්නවා, නිෂ්පාදන ආර්ථිකය වෙනුවෙන් අතිවිශාල මුදලක් අපි වෙන් කරලා තිබෙනවා කියලා. දැන් සමහරු ඒක රුපියල් මිලියන 22න් බෙදලා කියනවා එක කර්මාන්තයකට මෙච්චරයි හම්බ වෙන්නේ කියලා. හැම කෙනාම කර්මාන්ත කරන්නේ නැහැ. ජනාධිපතිතුමාගේ කථාවේ ඉස්සෙල්ලාම කථා කළේ මොනවා ගැනද? කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගැන. ඒ වාගේම ආයෝජකයන් ගැන. ඒ නිසා අපි පැහැදිලිව කියන්න කැමතියි, අපේ මේ මුළු අය වැයේම තිබෙනවා ඉතාම උපායමාර්ගික, ඉතාම තර්කානුකූල කරුණු හතරක්. එකක් තමයි අපි fiscal discipline එක හරියට establish කරලා තිබෙනවා. ඒක ලෝකයෙන් අගය කරලා තිබෙනවා. ජාතික වශයෙන්, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ආර්ථික විද්‍යාඥයන් අගය කරලා තිබෙනවා. දෙවැනි එක තමයි බදු පදනම පුළුල් කිරීම. ඒක තමයි ලෝකයේ මධ්‍යම ආදායම් සහිත රටවල හා දියුණු රටවල තිබෙන තත්ත්වය. මොකද, වක්‍ර බදු ප්‍රමාණය අඩු කරලා සෘජු බදු ප්‍රමාණය වැඩි කරන්න පුළුවන් එකම විධියත් ඒකයි. ඊට පස්සේ ඩිජිටල්කරණය පටන් අරගෙන තිබෙනවා. නිෂ්පාදන ආර්ථිකයට අවශ්‍ය කරන කටයුතු කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ විධියට තමයි කොටස් වෙළෙඳ පොළ දෙගුණයක් වෙලා

[ගරු බිමල් රත්නායක මහතා]

තිබෙන්නේ. ඔබතුමිය දන්නවා, අපි කොටස් වෙළෙඳ පොළ තුළ කොටස් තිබෙන අය නොවෙයි කියලා. මහා පරිමාණ ධනවතුන් අපේ ව්‍යාපාරය තුළ ඉතාම අඩුයි. මම කියන්නේ මේ මන්ත්‍රී කණ්ඩායම තුළ. එළියේ ඇති ඕනෑ තරම් අපිට උදව් කරන අය. ඒ නිසා තර්කානුකූලව ගත්තොත්, ඒ ක්ෂේත්‍ර අනුව තමයි අපි අය වැය හදලා තිබෙන්නේ. අපි trend එක සෙට් කරලා තිබෙනවා. අපි යන දිශාව සැලසුම් කරලා තිබෙනවා. ඒ නිසා තමයි කියන්න ලොකු තර්කයක් නැත්තේ. ඒ නිසා තමයි අම්බිකා මන්ත්‍රීතුමිය අල්ලා ගන්නේ. ඒ නිසා තමයි වතුකරයේ අයට වැටුප් වැඩි කළාම ඒකත් එක්ක ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන් පෙළෙන්නේ. ඒ නිසා තමයි කිසිම පදනමක් නැති තර්කවල ගිලිලා ඉන්නේ.

අපි මේ අය වැයෙන් පෙන්නුවේ මොකක්ද? අය වැය කියන්නේ ආර්ථික සමාජ දර්ශනයක්. ඉලක්කම් ගොඩාක් නොවෙයි. අය වැය කියන්නේ මොකක්ද? අය වැය කියන්නේ අය වැය කථාව නොවෙයි. මම හිතන විධියට මට ඒක විශේෂයෙන්ම - හුඟාක් අය හිතාගෙන ඉන්නවා, අය වැය කියන්නේ ජනාධිපතිතුමා ඉදිරිපත් කරන කථාව කියලා. අය වැය කථාව නොවෙයි, අය වැය කියන්නේ. මුදල් අමාත්‍යාංශය මේ අවුරුද්දේ මැයි 31වන දා ඉඳලා විවිධ අමාත්‍යාංශවලින්, දෙපාර්තමේන්තුවලින් තොරතුරු අරගෙන, දිස්ත්‍රික්කවලින් තොරතුරු අරගෙන, ජනාධිතිතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ සභාපතිතුමන්ලාගෙන් අහලා, ඇමතිවරුන්ගෙන් අහලා සාකච්ඡා කරලා අපි සැලසුම් කළ රුපියල් බිලියන 1,400කට අදාළ ප්‍රාග්ධන ව්‍යාපෘති අතිවිශාල ප්‍රමාණයක් මේ පොතේ තිබෙනවා. මේවා දෙන්නේ dustbin දමන්න නොවෙයි. අඩුම ගණනේ මේක කියවන්න බැරි නම් කමක් නැහැ, ටිකක් මේක තේරුම් ගන්න. අය වැය කථාවෙන් ජනාධිපතිතුමා වෙන් කළේ මට මතක විධියට රුපියල් බිලියන 76ක්. මට මතක විධියට අය වැය කථාවේ අමතර යෝජනා තිබෙනවා රුපියල් බිලියන 76ක විතර. මෙතැන බිලියන 1,300 ගණනක යෝජනා තිබෙනවා. හුඟාක් අය හිතාගෙන ඉන්නවා, අය වැය කියලා කියන්නේ මේ එදා කියවපු දේ කියලා. නැහැ, මෙතැන තිබෙනවා පැය දහස් ගණනක දැනුමක්, පැය දහස් ගණනක මහන්සියක්. මේවා අරගෙන ඕනෑ, අය වැය විවේචනය කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමහර දෙනෙක් හිතාගෙන ඉන්නවා, ඔවුන් ගැන කිව්වේ නැහැ කියලා. වැටුප් වැඩි කිරීම ගැන තිබෙන්නේ වාක්‍ය තුනයි. හැබැයි, කොපමණ වැටුපක් වැඩි වෙනවාද? වැටුප් වැඩි කිරීම සඳහා රුපියල් බිලියන 110ක් වෙන් වෙනවා, මාස 8කට පස්සේ. රජයේ සේවකයන්ට වැටුප් වැඩි කිරීම සඳහා මාර්තු මාසයේ රුපියල් බිලියන 110ක් වෙන් කළා. ආයෙත් ලබන ජනවාරිවල වැටුප් වැඩි වෙනවා. වාක්‍ය තුනයි තිබෙන්නේ. රජයේ සේවකයන් ගැන කථා කරලා නැහැ කියලා කියන්න පුළුවන්; montessori teachersලා ගැන කථා කරලා නැහැ කියලා කියන්න පුළුවන්. ගිය සැරේ අය වැයෙන් වැටුප් වැඩි කළා. ඒ නිසා හැම කෙනා ගැනම අපි සැලසුමක් හදලා තිබෙනවා. රටේ නායකයා වශයෙන්, රටේ මුදල් ඇමතිවරයා වශයෙන් සහ පක්ෂයක් වශයෙන් අපි ඒ සැලසුම් ක්‍රියාත්මක කරනවා.

අපි මේ රටේ ඉස්සරහට කරන්නේ මොනවාද? අපෙන් අත් හැරිලා තිබෙන්නේ මොනවාද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අලුතින් වාහනයක් ගත්තත් ඒක පුරුදු වෙන්න මාසයක් දෙකක් යනවා කියලා ඔබතුමිය දන්නවා. ඒ වාගේම second gear එකේද pick up වෙන්නේ, third gear එකේද pick up වෙන්නේ කියලා තේරුම් ගන්න පොඩි කාලයක් ගත වෙනවා, කොච්චර හොඳ driver කෙනෙකුට වුණත්. අපි භාරගෙන තිබෙන්නේ රටක්. ඒ නිසා අපි රටේ trend එක සෙට් කරලා තිබෙනවා. ඒ මොකක්ද? රට ආර්ථිකමය වශයෙන් දියුණු කරන පැත්තට අදාළ කරන සියලු උපායමාර්ගික තර්කානුකූල පසුබිම දමලා තිබෙනවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ඒ නිසා තමයි එය අන්තර්ජාතික වශයෙනුත් හැමතැනින්ම ඇගයීමට ලක් වෙන්නේ. ඒ නිසා තමයි අපට විරුද්ධ දේශපාලන අදහස් දරන ප්‍රවීණයන්ට - වෛරයෙන් පුපුරු ගහන කට්ටිය නොවෙයි - අපට විරුද්ධව ලොකු තර්කයක් ගෙන එන්නට බැරිවෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අය වැයේ තිබෙන ආකර්ෂණීය දෙය මොකක්ද? දේශපාලනය කියන්නේ, ඉලක්කම්, ප්‍රස්තාර විතරක් නොවෙයි. දේශපාලනය තුළින් රටේ නායකයාගේ, ආණ්ඩු පක්ෂ කණ්ඩායමේ commitment එක පෙනෙන්න ඕනෑ. අපි කැපවෙන්නේ මොනවාටද? අපි බරක් තබලා කරන්නේ මොනවාද? ජනාධිපතිතුමාගේ කථාවේදීත් කියැවුණා, මේ මාස 10ක කාලය තුළ දූෂණ විරෝධී සටනට අපි උපරිම බරක් දමලා තිබෙනවා කියන එක. අපි ඒක අය වැයේදීත් සහතික කරලා තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම තිබෙනවා. අද ඒ කොමිසමට සල්ලි වෙන් වෙන්නේ - ඉබේම - පාර්ලිමේන්තුවෙන්. ඉතාම බලගතු පනතක් සම්මත වෙලා තිබෙනවා. දූෂණ විරෝධී ආයතන ඒ අනුව වැඩ කරනවා. අද අධිකරණයේ විනිශ්චයකාරතුමන්ලා කලින් තිබුණාට වඩා - සැහෙන දුරට - කොන්ද කෙළින් තබාගෙන වැඩ කරනවා. ඒ නිසා අද අපි අනුරාගිකව දූෂණ විරෝධී **කටයුත්තට** අත තබලා වැඩ කරගෙන යනවා. ඒ සම්බන්ධයෙන් ආනන්ද විජේපාල ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරින් සහ ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරින් අපි අගය කරන්න ඕනෑ. ඔවුන් උපරිම කැපවීමෙන් වැඩ කරනවා. ඒ වාගේම තමයි මත්ද්‍රව්‍යවලට එරෙහිව අපේ commitment එක. අපි ආණ්ඩු පක්ෂය ලෙස ඒ සම්බන්ධයෙන් උපරිමයෙන්ම මැදිහත් වෙනවා. අපට ඒවාට විශාල කාලයකුත් ගතවෙනවා, ශ්‍රමයකුත් අවශ්‍ය වෙනවා. ඒවාට සම්බන්ධ වෙනකොට අපේ අවධානය වෙනත් පැතිවලට යොමු වෙනවා. නමුත් ඒක අත්‍යවශ්‍යයි කියලා අපි හිතනවා.

ඒ වාගේම තමයි සමාජ සාධාරණත්වය සහ සුබසාධනයට කැපවීම. සමාජ සාධාරණත්වය කියන වචනය මේ අය වැයේ පළමු වචනයේ ඉඳලා අන්තිම වචනය දක්වාම සොයන්න පුළුවන්. අපි දන්නවා, අපේ රටේ මිනිස්සු තවම ආර්ථිකමය වශයෙන් සුඛිත මුදිත වෙලා නැහැ කියලා. ඒ නිසා අපි මේ අය වැයෙන් ඉතාම ආකර්ෂණීය විධියට, ඉතාම අනුරාගික විධියට මේ කටයුතුවලට යොමු වෙලා තිබෙනවා. සමහර දේවල් මුදල් වැයවෙන ඒවා නොවෙයි. දූෂණ විරෝධී සටනට ලොකු මුදලක් යන්නේ නැහැ. මත්ද්‍රව්‍ය පාලනයට ලොකු මුදලක් යන්නේ නැහැ. සමාජ සාධාරණත්වයට ලොකු මුදලක් යන්නේ නැහැ. අපි සතුටු වෙනවා, කඳුකරයේ දුප්පත් අම්මා තාත්තා වෙනුවෙන් රුපියල් 400ක් වැඩි කරන්න පුළුවන් වෙච්ච එක ගැන. ඒ වාගේම අපි දුක් වෙනවා, ඒක තව වැඩි කරන්න නොහැකි වීම ගැන. අපි ඒක තව වැඩි කරනවා, ඔබතුමන්ලා තව විරුද්ධ වෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තව නඩු දමන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි ඔට්ටසම් දරුවන්ගේ සිට සමාජයේ අත් හැරිච්ච හැම කෙනාම ගොඩ ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපේ හෘදය සාක්ෂිය තුළ ඒ ගැන බරක්

තිබෙනවා. ඒක පොත් පාඩම් කරලා ගත් බරක් නොවෙයි. ඒ වාගේම කලින් කථා කළ මන්ත්‍රීතුමා වාගේ අපි Windsor Castle එකේ ඉපදිච්ච අයත් නොවෙයි. ඒ නිසා අපට හීනමානයක් නැහැ. අපට රජවරු එක්ක ඇවිදින්න පුළුවන්, common touch එක නැති කර ගන්නේ නැතිව. අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා ඒ හීනමාන අයින් කරගන්න. ඇත්තටම අපට වෙලාවක් නැහැ. නැත්නම් social researches කරලා බලන්න ඕනෑ, කථා කරපු පුද්ගලයාගේ eliteness එක එන්නේ කොහෙන්ද කියලා. ඒකට මට වෙලාවක් නැහැ. නමුත් ඒවා තමයි කරලා පෙන්වන්න ඕනෑ. UKවල එහෙම තිබෙනවා. කථා කළාට පස්සේ social and political background එක ගැන හොයා බලනවා. අපි ඒ වාගේ වැඩවලට යන්නේ නැහැ, අපට ඊට වඩා වැඩ තිබෙන නිසා. මේ ටික තමයි මම මූලික වශයෙන්ම අය වැයේ සාරය හැටියට කියන්න හිටියේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි එක පැත්තකින් උපාය මාර්ගිකව අය වැයේ අත්‍යවශ්‍ය පැත්තට, ආර්ථිකය පැත්තට අදාළ පදනම දමලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, අපි දේශපාලනමය වශයෙන් අපේ කැපවීම ඉදිරිපත් කරලා තිබෙනවා.

ඊළඟට, fiscal discipline ගැනත් කරුණු ටිකක් කියන්න ඕනෑ නිසා, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම නම්, වෙලාව ඉවර නිසා ඒ ගැන කථා කරන්න පටන් ගන්න එක තේරුමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ආර්ථික ස්ථාවරභාවය ඇති කර තිබෙනවා. ඒ නිසා ආර්ථිකය හෙට වැටෙයි, අනිද්දා වැටෙයි කියලා කිසි කෙනෙකු ප්‍රශ්නයක් ඇති කරගන්න අවශ්‍ය නැහැ. ඒ නිසා තමයි මෙච්චර වාහන ප්‍රමාණයක් ගේන්නේ. වාහන ගෙනාපු ලැයිස්තුව බැලුවාම පෙනෙනවා, ඒ තුළ වෛද්‍යවරුන්, නීතිඥවරුන් ඇතුළු විවිධ වෘත්තිකයෝත් ඉන්නවා කියලා. ඒකෙන් කියන්නේ මොකක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? ඒගොල්ලන් ලංකාවෙන් යන්නේ නැහැ කියන එක. ඒගොල්ලන් වාහන ගෙන්වන්නේ තවදුරටත් ලංකාවේ ඉන්න. මම කියන්නේ මේකයි. අපට මහ ලොකු සාධකවලින්ම විතරක් නොවෙයි, උඩිනුත් බලලා ප්‍රශ්න තේරුම් ගන්න පුළුවන්, යටින් බලලාත් ප්‍රශ්න තේරුම් ගන්න පුළුවන්. Accident එකක් වුණාම මම ඒ accident එක හා සම්බන්ධ කරුණු පාඩම් කරනවා. ඒක පාඩම් කළාම තමයි තේරෙන්නේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබෙන අර්බුදය මොකක්ද කියලා. ඕනෑ නම් මට උඩින් බලලා ප්‍රතිපත්ති කියන්න පුළුවන්. නමුත්, අපි විෂය ඉගෙන ගන්නවා. අපේ ඕනෑම ඇමතිවරයෙක් එක්ක කථා කරලා ඒ ගැන අහලා බලන්න. අපි bat කරන්නේ විෂය ඉගෙනගෙන. එකම දේ, අපි දන්න දේවල් ඔක්කෝම කරන්න බැහැ. අපි ලංකාවේ තිබෙන යථාර්ථය ඇතුළේ කටයුතු කරන්න ඕනෑ.

දැන් රටේ දේශපාලන ස්ථාවරභාවය තිබෙනවා. ජනාධිපතිතුමා කිව්වා, ආණ්ඩුව වැටෙන්නේ නැහැ කියලා. ආණ්ඩුව වැටෙන්නේ නැහැ. පළාත් සභා මැතිවරණය තියන්න කිව්වොත්, තියනවා. ඉල්ලන්නකෝ, මොකක්ද වෙන්නේ බලන්න. සොරි වෙනවා; පරදිනවා, නැති වෙන්න. මතක තබාගන්න. විපක්ෂය එකතු වෙලා එන්නකෝ, වෙන වෙනම එන්නකෝ, උපරිම පරදිනවා.

අපි සමාජ ස්ථාවරභාවය ඇති කරලා තිබෙනවා; ඇති කරන්න මහන්සි වෙනවා. සමාජ ස්ථාවරභාවය වැඩිපුරම කැඩෙන්නේ ගැන්සිවලින්, කප්පම් කල්ලිවලින්. පිටකොටුවේ bus stand එක ළඟ ඉන්න මිනිස්සු පවා අද කියනවා, කප්පම් ගන්නේ නැහැ කියලා. ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, අපි මත්ද්‍රව්‍ය කල්ලි පාලනය කරගෙන යනවා කියලා. තව කරන්නත් තිබෙනවා. ඒ වාගේම නීතියට උඩින් ලංකාවේ ජාතියක් හිටියා, "ලොකු මිනිස්සු" කියලා. අද ඒ ඔක්කෝම ගාණට නීතිය යටට ගෙනැත් තිබෙනවා. තව ගේන්න එක්කෙනෙක්, දෙන්නෙක් ඉන්නවා. අපි සමාජ ස්ථාවරභාවය ඇති කරලා තිබෙනවා. ඒ වාගේම දැන් මොකක්ද කරන්න තිබෙන්නේ? මේ සමාජ ස්ථාවරභාවය පවුල් මට්ටමට ගේන්න ඕනෑ. පවුල ස්ථාවර කරන්න ඕනෑ. අපි දන්නවා, තවම ඒක හොඳට වෙලා නැහැ කියලා. දෙමව්පියන් තවම හිත හිතා ඉන්නවා, දරු පැටියාට හොඳ අධ්‍යාපනයක් දෙන්නේ කොහොමද, හොඳ රස්සාවක් දෙන්නේ කොහොමද කියලා. එම නිසා පවුලේ ස්ථාවරභාවය හදන්න ඕනෑ. ඊට පසුව ඒක පෞද්ගලික මට්ටමට - individual level එකට - ගේන්න ඕනෑ. අවුරුදු 18ක් වෙනකොට ඕනෑම කොල්ලෙකුට, කෙල්ලෙකුට තේරෙන්න ඕනෑ, try කළොත් ගොඩ යන්න පුළුවන් කියලා. අපි දැන් රට තුළ දේශපාලන ස්ථාවරභාවය, ආර්ථික ස්ථාවරභාවය, සමාජ ස්ථාවරභාවය හදලා තිබෙනවා. ඊළඟට අපි මේ අවුරුදු හතරේ වැඩ කරන්නේ මොකටද? පවුලේ සහ පුද්ගලයාගේ ස්ථාවරභාවය හදන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අවසාන වශයෙන් මම ඔබතුමන්ලාට මේ කාරණයත් කියනවා. අපට උපායමාර්ග ඉවසීම තිබෙනවා වාගේම ඕනෑම දේශපාලන මතයක් දරන නිලධාරින් සහ කණ්ඩායම් එක්ක වැඩ කරන්න පුළුවන් කියලා අපි පෙන්වා තිබෙනවා.

අපි අපේ පක්ෂය කළමනාකරණය කරනවා. ආණ්ඩු පක්ෂය ගත්තත්, පක්ෂයකින් තමයි පාලනය වෙන්නේ. ඒ නිසා පැලවත්ත, පැලවත්ත කියලා නහයෙන් අඬන්න දෙයක් නැහැ. පැලවත්තෙන් තමයි මේ පක්ෂය බිහි වෙලා තිබෙන්නේ. ඔයගොල්ලන්ගේ වාගේ ලොක්කන්ගේ ගෙවල්වල අපේ පක්ෂ නැහැ. ඔයගොල්ලන්ගේ වාගේ අපේ පක්ෂ ලොක්කන්ගේ බූදල් වෙලා නැහැ. ඔයගොල්ලන්ගේ වාගේ නෝනලා පක්ෂ පාලනය කරන්නේ නැහැ. ඔයගොල්ලන්ගේ සමහරු අඬනවා නේද, නෝනා පක්ෂය පාලනය කරනවා කියලා? *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා නොවෙයි නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අර, අපට ඇවිල්ලා කියන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සුජිත් සංජය මන්ත්‍රීතුමා ඒක ඉක්මනට කිව්වා. ඒක හොඳයි.

[ගරු බිමල් රත්නායක මහතා]

අපි ප්‍රජාතන්ත්‍රවාදී, ඉතාම පුළුල් දේශපාලන ව්‍යාපාරයක් හදලා තිබෙනවා. එතැනින් අපි රටට අදාළ කරන මූලික ප්‍රතිපත්ති සකස් කරනවා. ඒ වාගේම සාමාජිකයෝ විධියට අපව විනයගරුක කරනවා, අපේ පක්ෂය අපට මඟ පෙන්වනවා. හැබැයි, ඒ පක්ෂයේ තිබෙන සාරය අරගෙන අපි රට පාලනය කරද්දී, රට පාලනය කරන්න අවශ්‍ය වෙනත් මූලික නීති රීති, මූලික උපාය, උපක්‍රම ආදියත් පාවිච්චි කරනවා. ජනාධිපතිතුමා රටේත් නායකයා, පක්ෂයේත් නායකයා. පක්ෂය පාලනය කරන්න තිබෙන්නේ සම්මත වුණු නීති රීති, අපේ collective leadership. හැබැයි, රට පාලනය කරද්දී ඒකට වෙනම ඒවා තිබෙනවා. එම නිසා අපට පුළුවන් වෙලා තිබෙනවා, විවිධ දේශපාලන අදහස් දරන විවිධ නිලධාරීන්, විවිධ පුද්ගලයන් එක්ක වැඩ කරන්න. අපි කාගෙන්වත් පළිගෙන නැහැ.

අවසාන වශයෙන් අපේ රටේ ජනතාවට මම මේ කාරණය කියන්න මම කැමැතියි. ඡන්දය දුන් සහ නොදුන් ජනතාවටයි මා මෙය කියන්නේ. අපි ඉතාම ගරුත්වයෙන් යුතුව ඔබට කියන්න කැමැතියි, අපි මේ මාතෘ භූමිය ආර්ථික, දේශපාලන, සමාජයීය වශයෙන් ස්ථාවර කර තිබෙන බව. ඊළඟ අවුරුදු හතරේදී අපි මේ පදනම මත ලංකාව ඉතාම ඉහළ ආර්ථික, සමාජ, දේශපාලන මට්ටමකට ගෙනෙනවා. අන්න ඒ විශ්වාසයත් එක්ක එකතු වෙන්න කියලා ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමා විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.25]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. විශේෂයෙන්ම ජාතික ජන බලවේග ආණ්ඩුවේ - ජනතා විමුක්ති පෙරමුණු ආණ්ඩුවේ - දෙවන අය වැය පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මුලින්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කලින් කථා කරපු සභානායකතුමා පැලවත්ත පිළිබඳ කථාවක් කිව්වා, ඒ වාගේම ආණ්ඩුව වැටෙන කථාවකුත් කිව්වා. අපි නම් කිව්වේ නැහැ, මේ ආණ්ඩුව හෙට වැටෙයි, අනිද්දා වැටෙයි කියලා. නමුත් එතුමා හිතාගෙන ඉන්නවාද දන්නේ නැහැ, ආණ්ඩුව හෙට වැටෙයි, අනිද්දා වැටෙයි කියලා. *[බාධා කිරීම්]* අපි නම් කිව්වේ නැහැ. පාර්ලිමේන්තුවේ ආසන 159ක් තිබෙන ආණ්ඩුවක් ගැන කවුරු හරි එහෙම හිතුවාට, අපට එහෙම හිතන්න වුවමනාවක් නැහැ. මට හිතෙන විධියට සභානායකතුමාගේ ඔළුව ඇතුළේ තිබෙනවා, කොයි වෙලාවේ හරි මේ ආණ්ඩුව වැටෙයි කියලා, ඒ හින්දා එතුමා ඇවිල්ලා මතුරනවා, "මේ ආණ්ඩුව වැටෙයි, මේ ආණ්ඩුව වැටෙයි" කියලා. නමුත් එහෙම එකක් නැහැ.

ඊළඟට එතුමා කිව්වා, පැලවත්තේ කථාව. අපි මෙච්චර කල් හිතාගෙන හිටියා, මේ රට පාලනය කරන්නේ කැබිනට් මණ්ඩලය කියලා. දැන් එතකොට සභානායකතුමා පිළිගන්නවා, පැලවත්තෙන් තමයි රට පාලනය වෙන්නේ කියලා. අපි හිතනවා, මේ රටේ ජනාධිපතිතුමා ඉන්නේ ජනාධිපති ලේකම් කාර්යාලයේ කියලා. ඒ වාගේම කැබිනට් මණ්ඩලයක් තිබෙනවා. කැබිනට් මණ්ඩලයයි, ජනාධිපතිතුමායි තමයි රට පාලනය කරන්නේ. පැලවත්තේ තිබෙන්නේ පක්ෂ කාර්යාලය. හැමෝටම පක්ෂ කාර්යාල තිබෙනවා. ඒ පක්ෂවල තීන්දු ගන්න පුළුවන්, පක්ෂ කාර්යාලයේදී. ඒක ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ, රටේ පාලනයට පැලවත්ත පක්ෂ කාර්යාලය සහභාගි වෙනවාද කියන එක. එතැනදී තමයි මෙහෙම කියන්නේ. ඒක ගැන තමයි හැම කෙනාම දොස් කියන්නේ, පැලවත්තේ ඉඳන් orders දෙනවා කියලා. දැන් කොළඹ නගර සභාව බැලුවත්, කොළඹ නගර සභාවේ නගරාධිපතිතුමියගේ කාර්යාලය ඇතුළේ පැලවත්තෙන් එක් කෙනෙක් දාලා වාඩි කරවලා තිබෙනවා. ඒක එහෙම නැහැයි කියන්න. ඒ පුද්ගලයා තමයි නගරාධිපතිතුමියට කියන්නේ මොකක්ද කරන්න ඕනෑ කියලා. ඒක තමයි මේ "පැලවත්ත පාලනය" කියන්නේ. එහෙම නැතුව වෙන මොකක්වත් නොවෙයි. ඔබතුමන්ලාගේ පක්ෂය ගැන ඔබතුමන්ලා පැලවත්තේදී තීන්දු කළත්, වෙනත් කොහේදී හෝ තීන්දු කළත් අපට ගැටලුවක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාව බැලුවාම අපට පෙනෙනවා, එතුමා ජනාධිපතිවරණයේදී කරපු කථාවක් වාගේ තමයි කථා කළේ කියලා. එතුමාගේ කථා නිසා එතුමාට ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන්න පුළුවන් වුණු බව අපි දැක්කා. ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණයේදීත් තුනෙන් දෙකක බලයක් ගන්න පුළුවන් වුණා. නමුත් අපි දැක්කා, ප්‍රාදේශීය සභා මැතිවරණයට එනකොට තමුන්නාසේලාට ලබා දීපු ඡන්ද ලක්ෂ 23ක් අඩු වෙලා ගිය බව. නමුත් ජනාධිපතිතුමාගේ කථා තිබුණා, එතුමා රට වටේම ගියා. මේ අය වැයේදීත් ජනාධිපතිතුමා ඇවිල්ලා දීර්ඝ කථාවක් කළා, අපි ඔක්කෝම අහගෙන හිටියා. මේ අය වැය සම්බන්ධව විපක්ෂය හැටියට අපි යම් යම් යෝජනා ඉදිරිපත් කරනවා. අය වැයේ අපි දකින වැරදි කියනවා. ඒවා පිළිගන්නවාද, නැද්ද කියන එක තමුන්නාන්සේලාගේ වැඩක්. විපක්ෂය හැටියට අපේ කාර්යභාරය තමුන්නාන්සේලාගේ අය වැයේ අඩුපාඩු, වැරදි තිබෙනවා නම් ඒවා පෙන්වා දෙන එක.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආණ්ඩුවේ ඉන්න උදවිය දිගටම කථා කළේ රාජ්‍ය ආදායම වැඩි කර ගත්ත එක ගැන. නමුත් මේ රාජ්‍ය ආදායම වැඩි කර ගත්තේ කොහොමද කියන එක පැහැදිලි කරන්නේ නැහැ නේ. අපි දැක්කා, රාජ්‍ය ආදායම වැඩි කර ගන්න 2023දී රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මේ රටේ තිබුණු සියලු බඩු භාණ්ඩවලට VAT එක ගහපු බව. ඒ යටතේ සියයට 15 තිබුණු VAT එක සියයට 18ට ගෙනාවා. ඊළඟට, එතුමා සමාජ ආරක්ෂණ බද්ද කියලා සියයට 2.5ක් වැඩි කළා. ඒ නිසා බදු ආදායම වැඩි වෙලා 2023දීත් රාජ්‍ය ආදායම වැඩි වුණා; 2024දීත් රාජ්‍ය ආදායම වැඩි වුණා; 2025දීත් රාජ්‍ය ආදායම වැඩි වුණා. එදා තමුන්නාන්සේලා කිව්වා, බදු ගෙවන්න එපා කියලා. මට මතකයි, අපේ හඳුන්නෙත්ති ඇමතිතුමා ඒ කාලයේ විපක්ෂයේ ඉන්නකොට press conference එකක් තියලා කිව්වා, "බදු ගෙවන්න එපා" කියලා. හැබැයි, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා දාපු බදු ප්‍රමාණය තමුන්නාන්සේලා 2025 අය වැයටත් ගෙනැල්ලා කිසිම වෙනසක් නොකර තමයි මේ රාජ්‍ය ආදායම වැඩි කරලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හාල් කිලෝ එකට රුපියල් 65ක බද්දක් ගැහුවා. ඒ, කිසිම ආණ්ඩුවක් කරපු නැති දෙයක්. හාල්වලට රුපියල් 65ක බද්දක් ගහලා තමුන්නාන්සේලා ඒකෙන් රුපියල් මිලියන 9,000ක් බදු ආදායම හැටියට එකතු කර ගත්තා. මේ, එහෙම

ආණ්ඩුවක්! හාල් කිලෝ එකකට රුපියල් 65ක බද්දක්! ඊළඟට, ලූනුවලටත් බදු ගැහුවා, රුපියල් 40 ගාණේ. අපේ රටේ කවදාවත් ලූනු ආනයනය කරලා නැහැ. ලූනුවලටත් රුපියල් 40 ගණනේ බදු ගහලා රුපියල් මිලියන 5,000ක් බදු ආදායමට එකතු කළා. රුපියල් 120ට දෙන්න පුළුවන් ලූනු කිලෝ එක රුපියල් 340ට අරගෙන ගියා. ලේමක් ගැහුවා. ලූනු මාෆියා එකට ඕනෑ විධියට ලූනු වෙළෙඳ පොළ හසුරුවන්න ඉඩ දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟට, වාහනවල බද්ද සියයට 200 ඉඳන් සියයට 400, 500 වෙනකම් වැඩි කළා. වාහන බද්ද වැඩි කරලා අද කියනවා, රේගුවේ ආදායම රුපියල් බිලියනයයි කියලා. ඔව්, රේගුවේ ආදායම රුපියල් බිලියනයයි. ඒ බිලියනයෙන් සියයට 70කට වැඩිය තිබෙන්නේ වාහන ගෙන්වීමේදී ලැබුණු බදු ආදායම. කෝ, රුපියල් ලක්ෂ 12 Vitz එක? රුපියල් ලක්ෂ 14ට Vitz එකක් දෙනවා කිව්වා නේ.

දැන් ජපානයේ Vitz එක හදන්නේත් නැහැ, ඇමතිතුමා Vitz එකක් දෙනවා කිව්වාට පස්සේ. ඊළඟට එක ඇමතිවරයෙක් ඇඬුවා. එතුමා හරි කනගාටුවෙන් ඇඬුවේ. "මේ ඔක්කෝටම වාහන දෙන්න ඕනෑ, මට හරි දුකයි, මට විතරයි වාහනයක් තියාගන්න බැරි" කියලා එතුමා ඇඬුවා. එතුමා දැන් ඒ ගැන කථාවක්වත් නැහැ. දැන් මිල කීයද? රුපියල් ලක්ෂ 25ට ගිය ඇල්ටෝ එක දැන් ලක්ෂ 75කට යන්නේ. ත්‍රීවීලර් එක රුපියල් ලක්ෂ 20 පැනලා. ජනාධිපතිතුමා කිව්වා, ජපන් මෝටර්සයිකලයක් දෙනවා කියලා. ජපන් මෝටර්සයිකලයක් තියා දැන් ඉන්දියන් මෝටර්සයිකලයක්වත් ගන්න බැහැ. පුටු බයිසිකලයක් ගන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙන්න මේවා තමයි කිව්වේ. එදා හාල් කිලෝවකට රුපියල් 65ක බදු ගහනකොට ඔබතුමන්ලා මොකක්ද කිව්වේ? ඔබතුමන්ලා බදු ගහන එකට විරුද්ධව කිව්වා,"මේ, ප්‍රභූ පෙළැන්තිය පාලනය කරන්නේ. දුප්පත් ජනතාව ගැන කිසිම හැඟීමක් නැහැ" කියලා. තමුන්නාන්සේලා රුපියල් 65ක බදු ගැහුවා, හාල් කිලෝවකට. එතකොට තමුන්නාන්සේලා නිර්ප්‍රභූද? ගරු ඇමතිතුමනි, මම නම් කියන්නේ නිර්ප්‍රභූ නොවෙයි, තමුන්නාන්සේලා "නිව්ප්‍රභූ". අලුත් ප්‍රභූ පන්තියක්; "නිව්ප්‍රභූ" හරිද? ඔක්කෝම දේවල් භුක්ති විඳිනවා නේ. ආරක්ෂාව එපා කියපු ජනාධිපතිතුමා දැන් ආරක්ෂාව වැඩි කරගෙන තිබෙනවා. අගමැතිතුමිය ඉස්සෙල්ලා කිව්වා, පොලිස්කාරයෝ දෙන්නෙක් ඇති කියලා. දැන් එතුමියට ඔක්කෝම ආරක්ෂාව තිබෙනවා. දැන් මොනවාද නැත්තේ? දැන් වාහනත් දෙනවා. ඉස්සෙල්ලා කිව්වා, කන්න බත් පැකට් එක පාර්ලිමේන්තුවට අරගෙන එනවා කියලා. දැන් බත් පැකට් එක අරගෙන එන්නේ නැහැ නේ. මුලදී කිව්වා, කෝච්චියේ එනවා කියලා; බස් එකේ එනවා කිව්වා. දැන් එහෙම නැහැ නේ. ප්‍රභූවරු විඳින දේවල් හැම එකක්ම දැන් තමුන්නාන්සේලාත් විඳිනවා. ඔයගොල්ලෝ දැන් නිව්ප්‍රභූ! -අලුත් ප්‍රභූ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනාධිපතිතුමා පොරොන්දු කීපයක් දුන්නා. එතුමා අය වැයට කලින් ජනාධිපතිවරණයේදී ගොඩක් දේවල් වාචිකව කිව්වා. අත්‍යවශ්‍ය භාණ්ඩ මිල අඩු කරනවා කිව්වා, VAT එක අයින් කරනවා කිව්වා, පාසල් උපකරණවල VAT එක අයින් කරනවා කිව්වා, විදුලි බිල තුනෙන් එකක් අඩු කරනවා කිව්වා, ඩීසල්, පෙට්‍රල්වල අනවශ්‍ය බදු අයින් කරලා අඩු කරලා දෙනවා කිව්වා. ඒවා මේ අය වැයේ තිබෙනවාද? ගිය අය වැයේ තිබෙනවාද? ඇයි පාසල් උපකරණවල VAT එක අයින් කරන්න බැරි? තමුන්නාන්සේලා ජනතාව ගැන, සාධාරණත්වය ගැන කථා කරනවා නම්, ජනතාවගේ දුක ගැන කථා කරනවා නම් දරුවන්ගේ පාසල් උපකරණවලට ගහන VAT එක ඇයි අයින් කරන්නේ නැත්තේ? ඒවා අයින් කරන්නේ නැහැ නේ. ඒවා අත්‍යවශ්‍ය භාණ්ඩ. අද වෙනකොට දරිද්‍රතාව වැඩි වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඇති-නැති පරතරය වැඩි වෙලා තිබෙනවා. අද වෙනකොට ක්‍රය ශක්තිය අඩු වෙලා තිබෙනවා. අද ජනතාවගෙන් විශාල පිරිසක් එක වේලක් කාලා ඊළඟ වේල බඩගින්නේ තමයි ඉන්නේ.

ඒ වාගේම තමුන්නාන්සේලා අල ගොවියායි, ලූනු ගොවියායි නන්නත්තාර කළා. ඒ අයට ලොකු පොරොන්දු දුන්නා. ඒ අය වෙනුවෙන් ලොකු දේවල් කරනවා කිව්වා. අන්තිමට මොකද වුණේ? මේ පාර අල ගොවියායි, ලූනු ගොවියායි නන්නත්තාර වුණා. හැම ආණ්ඩුවකදීම අල, ලූනු ගලවනකොට ප්‍රශ්නයක් ආවා. හැම ආණ්ඩුවක්ම මැදිහත් වෙලා ඒවා මිලදීගත්තා. නමුත් තමුන්නාන්සේලා ඒවා මිලදී ගත්තේ නැහැ. තමුන්නාන්සේලා අල ගොවියායි, ලූනු ගොවියායි නන්නත්තාර කරලා, ගිහිල්ලා ජාවාරම්කාරයාත් එක්ක හිටගත්තා.

**ගරු නිතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දැන් හිනාවෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
දැන් මොකද කියන්නේ? දැන් අපේ ලාල් කාන්ත ඇමතිතුමා කියනවා, ලබන අවුරුද්දේ ඒකට උත්තරයක් දෙන්නම් කියලා, නේද?

**ගරු නිතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගණන් වැඩියි දැන් බඩුවල.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ලාල් කාන්ත ඇමතිතුමාට නම් යථාර්ථය ටිකක් තේරෙනවා. ඒ හින්දා එතුමා කථා කරන සමහර දේවල්වලට අපිත් එකඟයි. මොකද, එතුමා යථාර්ථවාදීව කථා කරලා කියනවා, "මේ අවුරුද්දේ මොකුත් කරන්න බැහැ. ඒක ඇත්ත. කාලය ගියා. ලබන අවුරුද්දේ බලමු" කියලා. ගරු ඇමතිතුමනි, අපි බලමු, ලබන අවුරුද්දේ ඔබතුමා කරන්න යන දේවල්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙවර අය වැය යෝජනා ටික අරගෙන බැලුවාම යෝජනා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගිය අවුරුද්දේ තිබුණු යෝජනාත් තිබෙනවා, මේ අවුරුද්දේ. එතකොට, පරණ වයින් ටිකම තමයි ජේවීපී බෝතල්වලට දමලා මේ ගෙනැල්ලා තිබෙන්නේ. මේ අලුත් වයින් නොවෙයි, පරණ වයින්.

**ගරු නිතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
රනිල්ගේ වයින්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
රනිල් වික්‍රමසිංහ ගෙනාපු අර "යළි පුබුදුමු ශ්‍රී ලංකා" වැඩසටහන තමයි මේ ගෙනැල්ලා තිබෙන්නේ. වෙන මොකවත් නැහැ. ඒක තේරුම් ගන්න. IMF එකේ වැඩසටහනත් එක්ක අද ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. අපි ඒක දන්නවා. IMF එකට යන්න කියලා අපි කිව්වා. තමුන්නාන්සේලා එදා IMF එක එපා කිව්වා. තමුන්නාන්සේලා එදා විපක්ෂයේ ඉන්නකොට විකල්ප ආර්ථික වැඩසටහන් තිබෙනවා කිව්වා. IMF එක පිළිගන්නේ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

නැහැයි කිව්වා. දැන් IMF එකත් එක්ක ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. IMF එකේ අවසාන වාරිකය 2027 මාර්තු මාසයෙන් අවසන් වෙනවා. ඊළඟට මොකක්ද කරන්නේ? ඊළඟට යන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද? ඒ වැඩ පිළිවෙළ ගැන කථා කරනවාද? එහෙම කථා කරලාවත් නැහැ, එහෙම වැඩ පිළිවෙළක් ගැන හිතලාවත් නැහැ. අපේ අපනයන ආදායම වැඩි කරගන්න පුළුවන් යෝජනා, අපේ රටට ආයෝජකයන් ගෙන්වාගන්න පුළුවන් යෝජනා, ශ්‍රම වෙළෙඳ පොළ ශක්තිමත් කිරීමට යෝජනා නැහැ.

ආයෝජකයන්ගේ ශ්‍රම සහභාගිත්වය, තරගකාරිත්වය ගැන කිසිම අවධානයක් නැහැ. අපනයන ආදායම වැඩි කරගන්න යෝජනා නැහැ. වෙළඳ හා ආයෝජන ගිවිසුම් ගැන කිසිම කථාවක් නැහැ. එහෙම නම් කොහොමද ආයෝජකයන් එන්නේ? තමුන්නාන්සේලා ඉන්දියාවත් එක්ක ගිවිසුම් අත්සන් කළා; ඒවා එළියට දැම්මේ නැහැ. ඇමෙරිකාවත් එක්ක ගිවිසුම් අත්සන් කළා; එළියට දැම්මේ නැහැ. තමුන්නාන්සේලා චීනයත් එක්ක ගිවිසුම් අත්සන් කළා. ඒ ගිවිසුම් ඔක්කොම හංගාගෙන ඉන්නවා, එකක්වත් එළියට දමන්නේ නැහැ. අපි දන්නේ නැහැ ඇයි එළියට දමන්නේ නැත්තේ කියලා. අපි දන්නේ නැහැ ඇයි ඒවා හංගාගෙන ඉන්නේ කියලා. ඉස්සර, ඒ කාලයේ ආණ්ඩු ඒවා අත්සන් කරලා එළියට දැම්මේ නැත්නම් තමුන්නාන්සේලා හැමදාම හවස 4.00ට ලිප්ටන් වට රවුමේ හිටගෙන ඉන්නවා. එහෙම නැත්නම් කොටුව දුම්රිය පොළ ඉස්සරහ හිටගෙන ඉන්නවා. දැන් ඒවා නැහැ. දැන් ඒවා අත්සන් කරලා තමුන්නාන්සේලා filesවලට දාලා හංගාගෙන ඉන්නවා, එළියට දෙන්නේ නැහැ.

තවත් බදු වැඩි කරලා තිබෙනවා. 2026දී VAT සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දේ සීමාව රුපියල් මිලියන 60 ඉඳන් රුපියල් මිලියන 36 දක්වා අඩු කරලා තිබෙනවා. මොකද ඒ? ඒක රුපියල් මිලියන 60 ඉඳන් රුපියල් මිලියන 36 දක්වා අඩු කළේ ඇයි? මේ රටේ ඉන්න මධ්‍යම පරිමාණ වෙළඳ ව්‍යාපාරිකයන්ටත්, සුළු වෙළඳ ව්‍යාපාරිකයන්ටත් ෂොට් එක දෙන්නයි යන්නේ. ඇයි ඒ? ගජ මිතුරු ආර්ථිකය හදන්න. ගජ මිතුරු ආර්ථිකය හදන්න! ජනාධිපතිතුමා කියනවා නේ ගජ මිතුරු ආර්ථිකයක් නැහැ කියලා. මොකද නැත්තේ? ඉෂාර නානායක්කාරට දුන්නා, මත්පැන් බලපත්‍රය. ධම්මික පෙරේරාට දුන්නා, මන්නාරමේ සුළං විදුලි බලාගාරය හදන්න. දැන් ගමේ ඉන්න සුළු ව්‍යාපාරිකයා නැති කරලා මහා පරිමාණ supermarket chain එකට තව ඉඩකඩ හදලා දෙනවා, "ඉඳා, උඹලා මේ ටික හම්බ කර ගනින්" කියලා. ඒකයි මේ කරන්නේ. ඒකයි රුපියල් මිලියන 36ට ඒක ගෙනාවේ.

තමුන්නාන්සේලා කම්කරු පන්තිය ගැන කථා කරනවා, ගොවි ජනතාව ගැන කථා කරනවා, සාමාන්‍ය ජනතාව ගැන කථා කරනවා. පාසල් ළමුන්ට දෙන අර වවුචරය හැරුණාම, මේ රටේ සාමාන්‍ය ව්‍යාපාරිකයා වෙනුවෙන් ක්‍රියාත්මක කරපු එක දෙයක් මේ අය වැයෙන් පෙන්වන්න? එක දෙයක් පෙන්වන්න? එකක්වත් නැහැ. ලාල් කාන්ත ඇමතිතුමා කියන විධියට ඔක්කොම ඉන්නේ සුපිරි ගණයේ අය. ඒ සුපිරි ගණයේ ව්‍යාපාරිකයන් ටිකක් අද ජනාධිපතිතුමාගේ වටේ ඉන්නවා. අන්න ඒ අය වෙනුවෙන් තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ආයෝජන ගැන කථා කරනවා. මා ළඟ තිබෙනවා, "2025 Sri Lanka Investment Climate Statement" කියලා ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව නිකුත් කර තිබෙන ලියවිල්ලක්. ඒ ලියවිල්ල මම **සභාගත***කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ ලියවිල්ලේ එක තැනක මෙහෙම කාරණයක් තිබෙනවා, I quote:

> "The NPP's commitment to the country's $ 3 billion, four-year (2023-2027) Extended Fund Facility IMF programme reassured investors, but many remain wary given the NPP leadership's historically anti-Western, Marxist-influenced ideology."

මොකක්ද ඒගොල්ලන් කියන්නේ? ඒගොල්ලන් කියනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව බටහිර විරෝධියි. මාක්ස්වාදී මතවාදයක්, නායකත්වයක් තිබෙන නිසා මේ ආයෝජන පිළිබඳව යම් ගැටලු මතු වෙලා තිබෙනවා කියලා. මම දන්නේ නැහැ ආණ්ඩුව මේ ලියවිල්ල බැලුවාද කියලා. අපි නම් දැක්කේ නැහැ, මෙකට උත්තර දෙනවා. මේ ලියවිල්ලේ කරුණු 10ක් විතර තිබෙනවා. මේ කරුණු 10හි වැදගත් කරුණුවලින් කිහිපයක් මම කියන්නම්. ඒගොල්ලන් එක කරුණක් විධියට කියනවා, විදේශ ආයෝජන සඳහා එක ප්‍රතිපත්තියක් නැහැ කියලා. දෙවැනි පිටුවේ පළවෙනි කාරණයෙන් කියනවා, විදේශ ආයෝජන සඳහා එක ප්‍රතිපත්තියක් නැහැ කියලා. ඊළඟට කියනවා, one-stop shopඑකට ගියාම අවසර ගන්න හැම තැනකම රස්තියාදු වෙන්න ඕනෑ කියලා. ඒකට දීර්ඝ කාලයක් යනවා කියා තිබෙනවා. දෙවැනි කාරණය හැටියට කියනවා, විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත නොකිරීම නිසාම ආයෝජකයන්ට ලාභදායී මිලකට විදුලිය ගන්න බැරි වෙලා තිබෙනවා කියලා. ඊළඟට කියනවා, කලින් ආණ්ඩුව ආර්ථික පරිවර්තන පනතක් ගෙනාවා, BoI වෙනුවට ඒක ක්‍රියාත්මක කරන්න හැදුවා, නමුත් තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා ඒ ආර්ථික පරිවර්තන පනත ක්‍රියාත්මක කරන්නේ නැහැ, තවම BoI එක යටතේ යන්නේ කියලා. ඒ වාගේම ඒගොල්ලන් කියනවා, බදු වලට එක ප්‍රතිපත්තියක් නැහැ කියලා. ඉන්දියාවට එක බදු ක්‍රමයක්, චීනයට එක බදු ක්‍රමයක් සහිත විවිධාකාර ප්‍රතිපත්ති තිබෙන හින්දා ආයෝජකයන්ට විවිධ පණිවුඩ තමුන්නාන්සේලා ලබා දෙනවා කියලා. ඊළඟට, 2025 අය වැය යෝජනාවලදී සේවා අපනයන සහ විදේශීය සමාගම්වලට සියයට 15ක බදු සහනයක් දුන්නා කියලාත් කියනවා. නමුත් Port City එකට දීලා තිබෙන බදු සහනයත් එක්ක බලනකොට මේකේ විශාල පරතරයක් තිබෙනවා කියලා මේ වාර්තාවේ කියා තිබෙනවා. ඒගොල්ලන් පෙන්වා දෙනවා, මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන නිසා අද මේ රටට ආයෝජකයන් එන්නේ නැහැ කියලා.

ආයෝජකයන් ගෙන්වා ගැනීමට ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා ඒගොල්ලන් අහනවා. දැන් තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය කියන්න ඕනෑ. මොකද, මේ වාර්තාවේ කියන විධියටම තමුන්නාන්සේලා මාක්ස්වාදය පිළිගන්න, මාක්ස්වාදී අදහස් සහිත නායකත්වයක් තිබෙන පක්ෂයක්. විවෘත ආර්ථිකය පිළිගන්නේ නැහැ කියලා කිව්වා. දැන් තමුන්නාන්සේලා තෝරාගෙන කියන්න ඕනෑ. මොකක්ද කියන්න ඕනෑ? තමුන්නාන්සේලා තවදුරටත් World Bank එක, IMF එක එක්ක දිගටම යනවාද, එහෙම නැත්නම් තමුන්නාන්සේලා අර මාක්ස්වාදී අදහස් එක්ක තවදුරටත් ඉන්නවාද, නැද්ද කියන එක ලෝකයේ ආයෝජකයන්ට කිව්වොත් තමයි ඔවුන් එන්නේ. මොකද, මේක වාමාංශික ආණ්ඩුවක් කියන අදහස ඒගොල්ලන් කියලා තිබෙනවා, ඇමෙරිකාවේ වාර්තාව මත. ඒ නිසා තමුන්නාන්සේලා කියන්න ඕනෑ. මොකක්ද තමුන්නාන්සේලා කියන්න ඕනෑ? තමුන්නාන්සේලා කියන්න ඕනෑ එක්කෝ යන්නේ, කොයි පාරේද කියන එක. ඉස්සර පෙළපාළි යනකොට තමුන්නාන්සේලා කිව්වා, "අපි යන්නේ කොයි පාරේද? මාක්ස්, ලෙනින් ගිය පාරේ" කියලා. දැන් තමුන්නාන්සේලා කියන්න ඕනෑ, යන්නේ කොයි පාරේද, ට්‍රම්ප්, මෝදි ගිය පාරේද, නැද්ද කියලා. දැන් ඒක කියන්න ඕනෑ. ඒක කිව්වොත් තමයි ආයෝජකයන් එන්නේ. එහෙම නැතිව හොරෙන් චීනයට

ගිහිල්ලා, චීනයේ workshop එකක ඉඳලා මෙතැනට ඇවිත් කියනවා, "චීනයේ model එක හදන්න ඕනෑ, චීන model එක හදන්න අවුරුදු 15ක් ගතවෙනවා" කියලා. ඒ කථා කිව්වාම ආයෝජකයන් එන්නේ නැහැ. ඒක පැහැදිලිව කියන්න.

ඒ වාගේම තමුන්නාන්සේලා ඇත්ත කියන්න ඕනෑ. තවත් බොරු කියන්න නම් එපා. මොකද, බොරුවෙන් මේක කරන්න බැහැ. බොරු කියලා, කියලා තවදුරටත් මේක යන්නේ නැහැ. දැන් උපරිම මට්ටමට ඇවිත් තිබෙන්නේ. මීට එහා මේ රටට ආයෝජකයන් ගේනවා නම් තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රතිපත්තිය වන මාක්ස්වාදය අතහැරියාද, නැත්නම් වාමාංශික දේශපාලනය අතහැරියාද, නැත්නම් "මගේ ඇහේ තිබෙන වම් ඇස, වම් අත, වම් කකුල හැරෙන්න වෙන වමක් මම දන්නේ නැහැ" කියලා තමුන්නාන්සේලා කියන්න ඕනෑ. එහෙම කිව්වොත් තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටට ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ. මොකද, මේක විහිළුවක් නොවෙයි. යන්න පුළුවන් උපරිම දුර ඇවිත් තිබෙන්නේ. මීට එහා ඔයගොල්ලන්ගේ ආර්ථික model එක මොකක්ද කියලා ලෝකයට කියන්න ඕනෑ. එක පැත්තකින්, පක්ෂයේ ලේකම්තුමා චීනයේ workshop එකකට ගිහිල්ලා සති ගණන් ඉඳලා මෙහාට ඇවිත් කියනවා, "චීනයේ model එක අපි හදාරනවා, අවුරුදු 15ක් ගතවෙනවා ඒ model එක ගේන්න" කියලා. එහෙම කිව්වාම ආයෝජකයන් එන්නේ නැහැ. ඒක මතක තියාගන්න. මොකක්ද යන පාර කියලා තෝරාගන්න. ඔයගොල්ලන් යන පාර කියන්න. ඒ පාර කියන්නේ නැතිව නම් මේ රටට ඉදිරියට යන්න බැහැ කියන එක මතක තියාගන්න. ඒ model එක පැහැදිලි කරන්න. මොකක්ද ඉදිරි model එක? තමුන්නාන්සේලා මේ රටේ විවෘත ආර්ථිකයත් එක්ක, මේ යන programme එකත් එක්ක යනවාද, එහෙම නැත්නම් තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්නකොට කථා කරපු මාක්ස්වාදයේ, ලෙනින්වාදයේ ඒ programme එක කරපින්නාගෙන යනවාද? ඒ දෙකෙන් එක මාවතක් තෝරාගන්න. තවදුරටත් ඩබල් ගේම් ගහන්න බැහැ. ඊ දනියෙල්, දවල් මීගෙල් චරිත රඟපාන්න එපා. ඇත්ත කථා කරන්න කියලා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියනවා. තමුන්නාන්සේලාව බලයට ගේන්න කටයුතු කරපු මේ රටේ විශාල සමාජ තීරු අද වෙනකොට තමුන්නාන්සේලාගෙන් ඈත් වෙලා තිබෙනවා. ගොවි ජනතාව තමුන්නාන්සේලාව බලයට ගේනකොට කිව්වා, "ගොවීන්ට සලකනවා, සහල් මාෆියාව නැති කරනවා" කියලා. අන්තිමට තමුන්නාන්සේලා ගිහින් ඩඩ්ලිත් එක්ක හිටගත්තා. සහල් මාෆියාව තවම තිබෙනවා.

ඊළඟට, අල ලූනු ගොවීන්ට සලකනවා කිව්වා. අන්තිමට ගිහින් ජාවාරම්කරුවන් එක්ක හිටගත්තා. ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව නැති කරනවා කිව්වා. ඒක කරගන්න බැරි වෙලා තිබෙනවා. මධ්‍යම පන්තියේ සුළු ව්‍යාපාරිකයන්ට සහන දෙනවා කියලා කිව්වා. නමුත්, මේ අය වැය තුළ කිසිම සහනයක් දෙන්න බැහැ. අන්තිම වාහන සිහිනයත් ඇති කරලා තමුන්නාන්සේලා ඒ සිහිනයත් බිඳ දැම්මා. ඊළඟට, උපාධිධාරීන්ට රැකියා දෙනවා කිව්වා. දැන් ජනාධිපතිතුමා කියනවා, ඔක්කොම උපාධිධාරීන් ගෙදර ගිහින් පාඩම් කරලා විභාග පාස් කරලා එන්න කියලා. තමුන්නාන්සේලාට මේ රටේ ඡන්දය දීපු විශාල සමාජ තීරු තරහා කරගෙන ඉන්නේ. ඒක මතක තියාගන්න. ඒක හොඳට හිතට ගන්න. ඒ සමාජ තීරු තරහා කරගත්ත නිසා තමයි පළාත් පාලන මැතිවරණයේදී ඡන්ද ලක්ෂ 23ක් අහිමි වුණේ කියන එක මතක තියාගන්න.

දැන් තමුන්නාන්සේලා මන්ත්‍රීවරු 159දෙනාත් තරහා කරගෙන ඉන්නේ. ඇයි දන්නවාද? ඒ 159දෙනාගේ පඩි ටික ගන්න නිසා. දැන් ඒගොල්ලනුත් තරහා වෙලා ඉන්නේ. අද ඡන්දය දෙයි. නමුත් අපට ඇහෙනවා නේ, එළියේ කථා කරන දේවල්. ඒ 159දෙනාත් තරහා කරගෙන ඉන්නේ. ඒගොල්ලන් කොයි වෙලාවේ අනෙක් පැත්තට හැරෙයිද දන්නේ නැහැ. මොකද, ඒගොල්ලන්ගේ පඩි ටිකත් යනවා නේ පැලවත්තේ account එකට. පැලවත්තේ account එකට ඒගොල්ලන්ගේ පඩිය යන නිසා තමයි ඒගොල්ලන් මේ පිටුපසින් ඉඳගෙන කෙඳිරි ගගා ඉන්නේ. කෙඳිරි ගගා ඉන්නවා. අපට ඇහෙනවා නේ; එහෙන් මෙහෙන් යනකොට අපට ඇහෙනවා. ඒ නිසා හොඳට පරිස්සමින් ඉන්න. නැත්නම් ඒකටත් වැඩේ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,

2026 අවුරුද්දේ තමුන්නාන්සේලා මේ රටේ ඉන්න දුප්පත් ජනතාවගේ දරිද්‍රතාව වැඩි කරන්න බදු පිට බදු ගහලා තිබෙනවා.

ඒ බදු ගැහීම නිසා අපේ රටේ සමාජ තීරුවල ඇති නැති පරතරය වැඩි වෙලා තිබෙනවා, දරිද්‍රතාව වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා 2026 අවුරුද්දේ ජනතාව පාරට එන එක තමුන්නාන්සේලාට නවත්වන්න බැහැ. ඒ ජනතාවත් එක්ක එකතු වෙලා, සමගි ජන බලවේගය ඒකට නායකත්වය දෙන බව ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SPEAKER took the Chair.*

[අ.භා. 5.45]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුවේ දෙවැනි අය වැය ලේඛනය දෙවන වර කියැවීමේ විවාදයේ අවසන් දිනයේ, අවසාන කරුණු දැක්වීමේදී අදහස් දැක්වීමට ප්‍රථමයෙන්, මේ අය වැය පිළිබඳ ප්‍රවේශයක් ගන්න මා කැමැතියි. අපි කවුරුත් දන්නවා,

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ජාතික ජන බලවේගය දේශපාලන බලයෙන් ආණ්ඩුවක් පිහිටුවූයේ පළමුවැනි වතාවට බව. කලින් විවිධ ආණ්ඩු දශක ගණනාවක් ආණ්ඩු කරලා, ඔවුන්ගේ භාවිතයන් පිළිබඳව, ඔවුන්ට නිදන්ගත වෙච්ච ක්‍රමවේද තිබුණා. ඒ අනුව ඔවුන් හිතනවා, ඕනෑම ආණ්ඩුවක් ආවාම ඔවුන්ගේ ක්‍රමවේදයට තමයි ඒ ආණ්ඩු යන්න ඕනෑ, ඔවුන්ගේ නිර්වචන තමයි, මේ දේශපාලනයේ තිබෙන්න ඕනෑ නිර්වචන කියලා. විශේෂයෙන්ම ආණ්ඩුකරණය පිළිබඳ ඔවුන්ගේ නිර්වචනයක් තිබුණා. ඔවුන් මහජනතාවගෙන් බලය අරගෙන ඇවිල්ලා, මහජනතාවට වඩා උඩින් ඉන්න, වරප්‍රසාද ගන්න, නීතියට උඩින් ඉන්න ජන කොටසක් විධියට හැසිරීම ඔවුන් සමාජගත කරගෙන තිබුණු නිසා, අදටත් විපක්ෂයේ ඉඳගෙන අන්න ඒ කාර්යභාරය කරන්න උත්සාහ කරනවා. ඒ කාර්යභාරය කරන්න ඔබතුමන්ලාට පහසු වෙනවා, අපිත් ඒ ගොඩට දැම්මොත්, අපිත් ඒ විධියට වැඩ කළොත්. නමුත්, අපේ ප්‍රවේශය, අපේ දර්ශනය, දැක්ම ඒක නොවෙයි. අපේ දර්ශනය මහජනතාවත් එක්ක එකට පාලනය කිරීම. අන්න එතැන ඔබතුමන්ලා පටලවා ගත්ත තැනක්.

ඊළඟට, අය වැය ලේඛනය පිළිබඳ මේ විවාදයේදී කියන්න ඕනෑ, ඔබට අනුව අය වැයක් කියලා කියන්නේ, යම් වර්ෂයකට රාජ්‍ය ආදායම රාජ්‍ය මූල්‍ය වියදම් ක්ෂේත්‍රවලට මුදල් වෙන් කර ගැනීමේ කටයුත්තත්, ඒ මුදල් වෙන් කළාට පස්සේ වියදම් කර ගන්නේ කොහොමද කියන කටයුත්තත් පමණයි කියන එක. ඒ නිසා තමයි අතීතයේදී ඔබතුමන්ලාගේ අය වැය ලේඛනවල තිබුණේ, ඒ ඒ අමාත්‍යාංශවලට ප්‍රතිපාදන වෙන් කර ගන්න පොර බැදීම, රණ්ඩු කිරීම, අය වැයෙන් පස්සේ අමාත්‍යාංශ අතර ගැටුම් ඇතිවීම. අන්න එහෙම ඉතිහාසයක් තමයි තිබුණේ. ඒ නිසා ඔබතුමන්ලා අපේ අය වැය දිහාත් ඒ විධියට බලලා, කොහේටද වෙන් කරලා නැත්තේ, අඩුද, නැද්ද, මොනවා හරි ප්‍රශ්න තිබෙනවාද ආදී වශයෙන් විවිධ ප්‍රශ්න නිර්මාණය කරන්න උත්සාහ ගන්නවා. හැබැයි, අපි මේ අවස්ථාවේදී අය වැය සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා, ඒ මුදල් වියදම් කරන්නේ දර්ශනයකට අනුව, දැක්මකට අනුව, මේ අය වැය කථාවේ 5වැනි පිටුවේ සඳහන් අපේ උපාය මාර්ගික අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහායි. ඒ අනුව අරගෙන බැලුවාම, මේ වියදම් සියල්ලක්ම ස්ථානගත වෙලා තිබෙන්නේ, ඒ අරමුණු ඉෂ්ට කර ගන්න. ඔබතුමන්ලාගේ භාවිතය තිබුණේ, අභිමතය පරිදි වියදම් කිරීම - discretionary expenses. අපි වියදම් කරන්නේ අභිමතය පරිදි නොවෙයි. මූල්‍ය විනය පරිදි, ඒ වාගේම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත පරිදි, පාරදෘශ්‍යභාවය, වගවීම මේ සියලු කාරණා ඉෂ්ට සිද්ධ කර ගනිමින් තමයි, අපි මේ කටයුත්ත කරන්නේ. අන්න ඒ නිසා ඔබතුමන්ලාට බැරිව යනවා, මේ අය වැය පිළිබඳ හොඳ විවාදයක් ඇති කර ගන්න. ඒ නිසා කුමක් හෝ සංඛ්‍යාවක, දෙකක එල්ලීම තමයි මෙතැන තිබෙන්නේ. ඒ නිසා මම නැවතත් ඔබතුමන්ලාට යෝජනා කරනවා, මේ අය වැය විශ්ලේෂණය කරන්න කියලා. ජනතාවටත් යෝජනා කරනවා, මේ අය වැය කොතෙක්දුරට අපට දුන්නු අරමුණත් එක්ක ගැටගැහිලාද කියා බලන්න කියලා.

ගරු කථානායකතුමනි, මොකක්ද අපේ අරමුණ? පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදන මේ සමාජ පරිවර්තනය. අපි ඔක්කොටම හොඳ ජීවිතයක් ඕනෑ, යහපත් සමාජයක් ඕනෑ, ඒ සමාජ පරිවර්තනය සඳහා අපි ගමන් ගන්නා මාර්ගය පියවරෙන් පියවර අදට වඩා වැඩි පියවරක්, සාධනීය පියවරක්, ඉහළට ඔසවා තබන පියවරක් පිළිබිඹු කරන අය වැයක් තමයි මේ තිබෙන්නේ. ඒකට අවුරුද්දකට මුදල් වෙන් කිරීම දැක්කොත්, ඔබතුමන්ලා අමාරුවේ වැටෙනවා. ඒකට අපිට කරන්න දෙයක් නැහැ. අපි අපේ ගමන යනවා. පළමුවැනි අය වැයේදී අපි රට නිසි පරිදි ස්ථායීකරණය කර ගත්තා. ඒ ස්ථායීකරණයට අපට හැම පැත්තකින්ම ප්‍රශංසා ලැබිලා තිබෙනවා. සෑම ජන කොටසකින්ම, ව්‍යාපාරික ප්‍රජාව, ආයෝජකයෝ, ජාත්‍යන්තර සංවිධාන, ඒ රාජ්‍ය තාන්ත්‍රිකභාවය හැම තැනකින්ම තිබෙනවා. ඒ නිසා මේ දෙවැනි අය වැයේ අභියෝගය තමයි, ඒ අරමුණත් එක්ක රටට ප්‍රමාණාත්මක ආයෝජන කැන්දා ගෙන තිරසර, මධ්‍ය කාලීන ආර්ථික වර්ධනයක් අත්පත් කර ගන්නේ කොහොමද කියන එක. රට සංවර්ධන දිශාවට ගෙන යන සියයට 7 ඉක්මවන ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමේ දිශාවට ගමන් කිරීම තමයි දෙවැනි කාරණය.

ඊළඟට, මේ අය වැය විවාදය තුළ මතු වෙච්ච අවශේෂ කාරණාවලට අවධානය යොමු කරලා ඒවායෙන් කාරණයක් දෙකක් ගැන කියන්න මා කැමැතියි. එකක් තමයි, විපක්ෂය විවිධ දර්ශනයන් පිළිබඳව කියපු කථා. විපක්ෂයේ ඉන්න කණ්ඩායම් මේ විවිධ වූ දර්ශන, මතවාද පිළිබඳව තමන් ඉගෙන ගත්තු හැටියට, තමන් පත පොතින් දැකපු හැටියට, තමන්ට උගන්වපු හැටියට, තමන් අවබෝධ කර ගත්තු හැටියට විවිධ දේවල් කියනවා, මාක්ස්වාදය, ධනවාදය, කොමියුනිස්ට්වාදය, සමාජවාදය ආදි විවිධ වාද පිළිබඳව. අපි කැමැතියි, විවිධ වාද පිළිබඳව වාද කරන්න, දර්ශන පිළිබඳව වාද කරන්න. හැබැයි, මම යෝජනා කරනවා, ඉස්සෙල්ලාම විපක්ෂයේ ඔබතුමන්ලා මේ සමාජවාදය, ධනවාදය ආදි විවිධ වාද මොනවාද කියලා හරියට අධ්‍යයනය කරලා එන්න කියලා. මේ කියන කතන්දරවලින් තේරෙනවා, ඔබ කිසිදු වාදයක් ගැන දන්නේ නැහැ කියලා. ඔබතුමන්ලා කැමැති නම් ඒ දර්ශනයන් පිළිබඳව සාකච්ඡා කරන්නත් වෙනම වැඩමුළුවක් පැවැත්වීමට යෝජනා කරන්නත් අපට පුළුවන්.

ගරු කථානායකතුමනි, අය වැය සාරාංශයට එන්න කලින් විපක්ෂය නඟපු චෝදනා කීපයකට පිළිතුරු දෙන්න ඕනෑ. විපක්ෂය චෝදනා ගණනාවක් ඉදිරිපත් කරනවා. ඒ චෝදනා අතරින් කිහිපයකට පමණක් පිළිතුරු දෙන්න මම කැමැතියි. එකක් තමයි, මා කලිනුත් කිව්වා වාගේ අය වැයේ හරය, ගුණාත්මකභාවය දකින්න බැරි වුණාම අවශේෂ කාරණාවල එල්ලෙන එක. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කියා සිටියා, "මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ අණ පනත් හදන්න, මේ ආණ්ඩුව අණ පනත් වැඩිය හදලා නැහැ, අණ පනත් 22යි හදලා තිබෙන්නේ" කියලා. ඔව්, අණ පනත් හදන්න තමයි පාර්ලිමේන්තුව තිබෙන්නේ. හැබැයි, කොච්චර අණ පනත් හැදුවාද, නැද්ද කියන සංඛ්‍යාවෙන් එහි ගුණත්වය, එහි කාර්යභාරය, ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය මනින්න බැහැ. හදන අණ පනත්වල ගුණත්වය මොකක්ද, ඒවායෙන් අරමුණු කර ගන්නේ මොනවාද ආදි කාරණා තමයි වැදගත් වෙන්නේ. ඒ වාගේම, ඒ මන්ත්‍රීතුමා වැරැදි කරුණු සහ නොමඟ යවනසුලු කරුණු සමාජයට ඉදිරිපත් කළා. ඒවායෙන් කීපයක් මා කියන්නම්. ඒ මන්ත්‍රීවරයා කිව්වා, අපි පොරොන්දු වුණු අණ පනත් 11ක් ඉදිරිපත් කර නැහැ කියලා. ඒ වාගේම කිව්වා, මේ ආණ්ඩුව ගෙවුණු වසර තුළ ගෙනාවේ පසුගිය කාලයේ ගෙනාපු අඩුම අණ පනත් ප්‍රමාණයයි කියලා; ඒ සංඛ්‍යාව 22යි කියලා. හැබැයි, එතුමා හිතාමතා නොකියා හිටියා හෝ එතුමාට අමතක වෙලා හෝ තිබෙනවා කාරණයක්. 2015 වසරේ අණ පනත් 16යි සම්මත කරලා තිබෙන්නේ. 2020දී අණ පනත් 7යි සම්මත කරලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා හරි. හැබැයි, ඔබතුමා කියපු එකේ මේවා අත් හැරලායි කිව්වේ. මේ විස්තරත් අරගෙන ඇවිත් කියන්න. එහෙම නම්, හරියට බැලුවාම ඒ අණ පනත් ගැන කියමින් අපට පහර ගැහුවාට ඒවා ගැන සංඛ්‍යාත්මකව සංසන්දනය කළත් අපි දැනට අණ පනත් 22ක් සම්මත කර තිබෙනවා. ඒ වාගේම, මේ දෙසැම්බර් වන කොට තවත් පනත් කෙටුම්පත් 14ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න යෝජනා කර තිබෙනවා; තවත් අලුත් ඒවා 10ක් ගෙන එනවා. ඒවා අතර තීරණාත්මක පනත් කෙටුම්පත් ද තිබෙනවා. අපේ

අරමුණු කරා යන්න අවශ්‍ය වන, තීරණාත්මක ආයෝජන කැන්දන, ව්‍යාපාරික පරිසරය සැකසීමට අවශ්‍ය කරන පනත් කෙටුම්පත් කිහිපයක් තිබෙනවා. මම ඒවායෙන් එකක් දෙකක් කියන්නම්. එකක් තමයි, රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ පනත් කෙටුම්පත. රාජ්‍ය ව්‍යවසායන් මේ ආර්ථිකයට ගළපා ගන්නේ කොහොමද කියන කාරණය ඒ පනත් කෙටුම්පතේ කියැවෙනවා. ඒක ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. ඒ වාගේම, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන පනත් කෙටුම්පතක් ඉදිරියේදී පාර්ලිමේන්තුවට එනවා. ඒ වාගේම, ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරිය පිළිබඳ පනත් කෙටුම්පත ඉදිරියේදී පාර්ලිමේන්තුවට එනවා. අපි කවුරුත් දන්නවා, මේ අවස්ථාවේදී මූල්‍ය ක්ෂේත්‍රය ඇතුළේ විවිධ වූ ගැටලු තිබෙන බව. ඒවාටත් උත්තර මේ පනත් කෙටුම්පත් තුළ තිබෙනවා. ඒ වාගේම, මුදල් විශුද්ධිකරණය - money laundering - වැළැක්වීම පිළිබඳ අණ පනත් ද ගෙන එනවා. ඒ අණ පනත් එනකොට මුදල් විශුද්ධිකරණයට සම්බන්ධ වන අය, මුදල් විශුද්ධිකරණය කරන්න බලාපොරොත්තුවෙන් ඉන්න අයට ගැටලු එන්නත් පුළුවන්. ඒ අණ පනත් ද ඉදිරියේදී ගෙන එනවා. ඒ වාගේම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම අත්හිටුවීම - suspension of terrorist financing - හා සම්බන්ධ පනත් කෙටුම්පතක් එන්න ඉඩ තිබෙනවා. ඒ වාගේම, financial transactions සම්බන්ධවත් අවධානය යොමු කරනවා. මම මේ දේවල් ඉදිරිපත් කරන්නේ විපක්ෂය මේ සමාජයට වැරැදි කරුණු ඉදිරිපත් කිරීමක් කළ නිසායි. ඉදිරිපත් කරපු අණ පනත් අතින් ගත්තත් අපි හරි දේ කර තිබෙනවා.

ඊළඟට, අයවැය කාර්යාලය පිළිබඳව අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා සඳහන් කළ කාරණය ගැනත් කියන්න ඕනෑ. මම ඒක නිවැරැදි කළ යුතු වෙනවා. එතුමා සඳහන් කළා, ඒ කාර්යාලය පවත්වාගෙන යන්න රුපියල් බිලියන 8ක් වාගේ ප්‍රමාණයක් තමයි දීලා තිබෙන්නේ කියලා; ඒ වාගේම පුනරාවර්තන වියදම් - Recurrent Expenditure - රුපියල් බිලියන 3ක් වාගේ ප්‍රමාණයක්ය කියලා. 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනතේ -අවශ්‍ය නම් මම මේ පනත සභාගත කරන්නම් - 37 (1) වගන්තිය යටතේ ඉතා පැහැදිලිව කියා තිබෙනවා. "...එම මුදල් වර්ෂය සම්බන්ධයෙන් වූ වියදම් ඇස්තමේන්තු කෙටුම්පත රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය" කියලා. එය අනුමත කිරීමේ බලය තිබෙන්නේ, එය හොඳද, නැද්ද, එයට තවත් එකතු කරන්න ඕනෑ නම් එය කළ යුතු වන්නේ දෙවැනි වගන්තියේ සහ තුන්වැනි වගන්තියේ සඳහන්ව තිබෙන ආකාරයටයි. ඒ කමිටුව විසින් ඉදිරිපත් කරලා එව්වා නම් කිසිම විධියකට කපලා නැහැ. නමුත්, මෙතැනදී අදහසක් ආවා, ඒ වියදම් කපලා කියලා. නමුත්, එහෙම කපලා නැහැ. තවදුරටත් අපි සලකා බලමු, මොකක් හරි අතපසුවීමකින් හෝ තව වියදම් අවශ්‍ය නම්. මොකද, ඒ කාර්යාලය හොඳින් පවත්වාගෙන යන්න ඕනෑ. තිබෙන ඉඩ කඩ ඇතුළේ වියදම් එකතු කරන්න පුළුවන් ද කියලා බලමු. ඉදිරි කමිටු වාර අවස්ථාවකදී අපි ඒකට එකතු කිරීමක් කර ගනිමු.

ඊළඟට, තවත් විවේචනයක් එල්ල කරනවා, අපේ ආණ්ඩුව යටතේ ප්‍රාග්ධන මුදල් වියදම් කිරීම ප්‍රමාණාත්මකව කරලා නැහැ කියලා; එම ප්‍රතිශතය අඩුයි කියලා. මොකද, ඒක තමයි රාජ්‍ය ආයෝජනය.

"දැන් කීයද, දැන් කීයද" කියලා විපක්ෂය ඒ ප්‍රතිශතය ගැන විටින් විට අහනවා. ඒ නිසාම මම දත්ත, සංඛ්‍යාලේඛන ටිකක් ගෙනාවා. සැප්තැම්බර් මාසය අවසානය, ඔක්තෝබර් මාසය අවසානය වන කොට අපේ ප්‍රතිශතය කීයද කියලා බලනවාට වඩා හොඳ වෙන්නේ, සම්පූර්ණ වර්ෂයේම වියදම් ටික කළාට පස්සේ සංසන්දනය කරන එකයි. සංසන්දනය කරන්න ඕනෑ, සංසන්දනය කළ යුතු ඒවායි. මාස 10ක වියදම අවුරුද්දක වියදමත් එක්ක සංසන්දනය කරන්න බැහැ. එම නිසා මම 2019 ඉඳලා දත්ත කිහිපයක් ගත්තා, ඔක්තෝබර් මාසය සහ සැප්තැම්බර් මාසය වන කොට තිබුණු තත්ත්වයන්ට අදාළව. 2019 වර්ෂය හැර 2020, 2021, 2022, 2023, 2024 කියන සෑම වර්ෂයකම සැප්තැම්බර් මාසයේදී ප්‍රගතිය වෙලා තිබෙන්නේ උපරිමය සියයට 32.2යි. හැබැයි 2025දී, අප ප්‍රායෝගික ප්‍රශ්න ගණනාවක් හමුවේ වැඩ කරද්දීත් ප්‍රතිශෝධිත ප්‍රාග්ධන වියදම තුළ අපි දැනට සියයට 45.3ක් වියදම් කර තිබෙනවා. එහෙම නම්, ඔබතුමන්ලා ඒ කාරණය ගැන කලබල වෙන්න එපා. අපි අවුරුද්ද අවසාන වෙද්දී ඒ වියදම් ගැන කියන්නම්. ඔක්තෝබර් මාසයට අදාළ දත්ත ගෙන බැලුවත් ඒ තත්ත්වය එහෙමමයි. 2019 ඉඳලා ගත්තාම වැඩිම ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය වාර්තා කරලා තිබෙන්නේ, අපි. එය, සියයට 58යි. එම නිසා ඔබතුමන්ලා වැරැදි තොරතුරු සමාජගත කරන්න එපා.

ඔබතුමන්ලා කරපු විධිය ගැනත් කියන්නම්. ඔබතුමන්ලා හරියාකාරව ඒ මුදල් වියදම් කළා වාගෙයි අද අපේ කාර්යක්ෂමතාව ගැන කථා කරන්නේ. මම ඒ කාරණයටත් එන්නම්. 2015-2019 ආණ්ඩුව කාලයේ 2016 වර්ෂයේ ප්‍රාග්ධන වියදම සඳහා වෙන් කරන ලද රුපියල් බිලියන 1,182න් වියදම් කරලා තිබෙන්නේ සියයට 50.3යි. ඒ කියන්නේ භාගයයි. භාගයක් පමණක් වියදම් කරන්න සමත් වෙලා තමයි විපක්ෂය 2025 වර්ෂය පිළිබඳව අද තර්ක කරන්නේ.

ඊළඟට, මෙම වැය ශීර්ෂ දිහා බලලා තවත් යෝජනාවක් කළා, ජනාධිපති වැය ශීර්ෂයට වැඩිපුර වෙන් කරලා කියලා. ඒකත් වැරැදි අර්ථකථනයක්. 2024, 2025, 2026 වර්ෂ සංසන්දනය කරලා බැලුවාම ජනාධිපති වැය ශීර්ෂයට අපි ඉතාම නිවැරැදි විධියට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ යටතේ වැඩිපුර මුදලක් වෙන් කරලා තිබෙන්නේ Clean Sri Lanka වැඩසටහනටත්, ගිය වර්ෂයේ වැටුප් වැඩි කිරීමටත්, ඒ වාගේම පර්යේෂණ කටයුතු සඳහාත් තමයි. ඔවුන් සංසන්දනය කරලා කියනවා, 2024 වසරේ වෙන් කළේ ඊට වඩා අඩු ප්‍රමාණයක් කියලා. ඇත්තටම 2024 රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව යටතේ වෙන් කරගෙන තිබුණු මුදල් ප්‍රමාණය කීයද? පරිපූරක ඇස්තමේන්තු හරහා තවත් රුපියල් බිලියන 40ක් දක්වා වෙන් කරගෙන තිබෙනවා. හැබැයි, අපේ පාලනය යටතේ වන මාස තුනකුත් එතැනට සම්බන්ධ වෙනවා. ඒ මාස තුනේ වියදම් කළමනාකරණයේ ප්‍රතිඵලයක් විධියට, ඔබතුමන්ලා එසේ වෙන් කර ගත් රුපියල් බිලියන 40 අපි රුපියල් බිලියන 25කට ගෙන ආවා. නමුත්, ඔබතුමන්ලා 2024දී වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරගෙන තිබුණා. එහෙම නම්, ඉතා වැරැදි දත්තයක් තමයි ඔබතුමන්ලා සමාජගත කළේ. Discretionary expenses විධියට පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගත් ඒවාත් ඒ වියදම් ඇතුළේ තිබෙනවා.

වතු කම්කරුවන්ගේ වැටුප සම්බන්ධයෙන් ද විපක්ෂය විවිධ වූ මත පළ කළා. ඒ පිළිබඳව වැඩි දුර වාද විවාද කරන්න ඕනෑ නැහැ කියලා මම හිතනවා. වතු කම්කරුවෝ ඉතාම දුෂ්කර කොන්දේසි යටතේ වැඩ කරන්නේ. වැටුප අතින් විතරක් නොවෙයි, ඔවුන්ගේ සමාජමය, සෞඛ්‍යමය ආදි හැම පැත්තකින්ම යටට ගිහිල්ලායි තිබෙන්නේ. හැබැයි, අපි මොකක්ද කළේ? වතු හාම්පුතුන්, ඒ වාගේම වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් විධියට, අවසානයේ ජනාධිපතිතුමාගේ සෘජු මැදිහත්වීම මත අපි වඩාත් හොඳ විධියට යම් ප්‍රායෝගික විසඳුමක් ගෙන ආවා. ඒ අනුව ඔවුනුත් යම් බරක් දැරුවා; අපිත් යම් බරක් දැරුවා. හැබැයි ඔබතුමන්ලා කියනවා, ඒ රුපියල් 200 ගෙවන්න බැහැ කියලා. ඔබතුමන්ලා ඒ ගැන ප්‍රශ්න කරනවා. අපි ඔබෙන් සරල ප්‍රශ්නයයි අහන්නේ. ආණ්ඩුවෙන් රුපියල් 200ක් සහ අදාළ කොම්පැනියෙන් රුපියල් 200ක් දාලා රුපියල් 400ක වැටුප් වැඩි කිරීමට ඔබ විරුද්ධද, නැද්ද? එහෙම නැත්නම්, එයට පක්ෂද,

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

විපක්ෂද? ඒ කාරණය පමණක් කියන්න. ඒ හොඳටම ඇති. ඒ වාගේම, විපක්ෂය ඒ සම්බන්ධයෙන් තවත් වැරදි තොරතුරක් සමාජගත කරනවා, වතු කම්කරුවා දින 25ක් වැඩ කරන්න ඕනෑ කියලා. එහෙම එකක් කොතැනකවත් සඳහන් කරලා නැහැ. සාමාන්‍යයෙන් නිසි තර්කයක් නැති වුණාම බොරු තර්කයක් හදන්න හරිම ලෙහෙසියි. එතකොට බිල්ලෙක් මවනවා. අපි මොකක්ද කිව්වේ? දෛනිකව වැඩි කරපු ඒ රුපියල් 400 හේතුවෙන්, කම්කරුවෙකු දින 25ක් වැඩ කළොත් ඔහුගේ වැටුප රුපියල් 10,000කින් වැඩි වෙනවා. ඔහු වැඩ කරන්නේ එක දවසයි නම් වැඩි වෙන්නේ රුපියල් 400යි. ඒක දිරි දීමනාවක් විධියටයි ලබා දෙන්නේ. එම නිසා අසත්‍ය තොරතුරු සමාජගත කරන්න එපා කියන ඉල්ලීමත් මම මේ මොහොතේදී කරන්න කැමැතියි.

මම දැන් අය වැය කථාවට එන්නම්. මේ අය වැය සාරාංශය පිළිබඳව අපි අවබෝධයක් ලබා ගන්නට ඕනෑ. මේ අය වැයේදී අපි මොකක්ද කරන්නේ? මේ අය වැයේදී ඉතාම පැහැදිලිව අපි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හරියටම කරනවා. ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනය රුපියල් බිලියන 34,500යි. එයින් සියයට 13ක් ප්‍රාථමික වියදම්. අන්න ඒ ප්‍රාථමික වියදම්වලට අමතරව පොලිය විධියට රුපියල් බිලියන 2,617ක් ගෙවන්න වෙනවා. ඒ අනුව රුපියල් බිලියන 7,102ක අය වැය පරතරයක් ඇති වෙනවා. ඒ රුපියල් බිලියන 7,102ක අය වැය පරතරයට අමතරව ණය වාරික ප්‍රාග්ධන කොටස හැටියට රුපියල් බිලියන 1,878ක් ගෙවන්න වෙනවා. ඒ වාගේම, බැඳුම්කර සහ මහා භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත අගයයි, ඇත්තටම අප ලබා ගත් අගයයි අතර වෙනස ගළපන්න වෙනවා. ඒ සඳහා රුපියල් බිලියන 105යි. ඒ සියල්ලේම එකතුව තමයි ණය ගැනීමේ අවශ්‍යතාව විධියට රුපියල් බිලියන 3,740ක් වෙන්නේ. අපි ණය ගැනීමේ අවශ්‍යතාව ගිය වර්ෂයට සාපේක්ෂව පහළට ගෙනැල්ලා තිබෙනවා; අය වැය පරතරය පහළට ගෙනැල්ලා තිබෙනවා. රාජ්‍ය මූල්‍ය discipline අනුව වගවීමේ වැඩ කටයුත්තේදී විශේෂයෙන් සලකා බලන නිර්ණායකයක් තමයි, අය වැය පරතරය කළමනාකරණය කිරීම සහ රාජ්‍ය ණය ගැනීමේ සීමාව කළමනාකරණය කිරීම.

අපි ඒ දෙකෙන්ම පසුගිය වර්ෂයට සාපේක්ෂව හොඳ ප්‍රගතියක් පෙන්නුම් කර තිබෙනවා. අපිට මේ ප්‍රවණතාව නිසියාකාරයෙන් ඉදිරියට අරගෙන යන්න පුළුවන්. අපිට ලබා දුන් බලය අනුව අපි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සිදු කරනවා කියන කාරණයත් අපි පැහැදිලි කරන්න ඕනෑ.

ඒ වාගේම තව අභියෝගයක් තිබෙනවා. අපි පිළිගන්නවා. අපිට තිබෙන වියදම් සීමාව ඇතුළේ ඒ අභියෝගවලට මුහුණ දෙන්න අපට අවශ්‍ය කරනවා, ආදායම්. ඒ නිසා අපිට ආදායම්පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය - revenue-based fiscal consolidation - කියන සංකල්පය ඉතාම වැදගත්. අපි ඒ සඳහා මැදිහත් වුණා. අපි අලුතින් බදු පනවා හෝ මිනිස්සුන්ගේ බෙල්ල හිර කරලා බදු අය කර ගත්තා නොවෙයි. අපි කළේ තිබුණු බදු ක්‍රමවේදය තුළ පුළුවන් තරම් උපරිම ආකාරයට බදු කාර්යක්ෂමතාව වැඩි කිරීම, බදු ගෙවීමේ අනුකූලතාව වැඩි කිරීම සහ ඒ සඳහා තාක්ෂණය කැඳවීමයි. මෙන්න මේ ආකාරයට බදු එකතු කර ගැනීමේ බදු දැල පුළුල් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් විධියට තමයි අපට පුළුවන් වුණේ රාජ්‍ය ආදයම වැඩි කරගන්න. මම සන්තෝෂයෙන් කියන්න කැමැතියි, ශ්‍රී ලංකා රේගුව ඔවුන්ට ලබා දුන් වාර්ෂික අභියෝග වුණු රුපියල් බිලියන 2,115ක ආදායම් එකතු කර ගැනීමේ ඉලක්කය මේ වෙනකොටත් ඔවුන් අත්පත් කර ගෙන අවසානයි කියන කාරණය.

අපිට තිබෙන අභියෝගය මොකක්ද? මෙන්න මේ ලැබෙන ආදායමින් අපි කොහොමද, වියදම් කළමනාකරණය කරන්නේ? ප්‍රාථමික වියදම් සහ පොලිය ගත්තාම, ප්‍රාථමික වියදම බිලියන 2,285යි. අන්න ඒ ප්‍රාථමික වියදම් ඇතුළේ රාජ්‍ය සේවක පඩිනඩි සඳහා බිලියන 1,464කුත්, විශ්‍රාම වැටුප් වෙනුවෙන් බිලියන 510කුත් තිබෙනවා. පොලිය සඳහා බිලියන 2,617ක් තිබෙනවා. ඒ කියන්නේ, අපි එකතු කර ගන්නා ආදායමින් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් පොලිය සඳහා ගෙවන්න සිද්ධ වෙනවා. ඒක අපි සැලසුම් කළ ආර්ථික කටයුත්තක් නොවෙයි. ඒ තමයි දැනටමත් අරගෙන තිබෙන ණයවල, ණය බර. ඒ ණය පිළිබඳව වෙනම විවේචනයකට එන්න පුළුවන්. හැබැයි, අපි තේරුම් ගත යුතු යථාර්ථය තමයි, අපි මේ මූල්‍ය විනය පවත්වා ගෙන යන්නේ ලැබෙන ආදායමින් කියන කාරණය. රුපියල් 100ක ආදායම ලබනකොට, රුපියල් 50ක් පොලියට ගෙවන්න වෙනවා. අවසාන වශයෙන් ගත්තාම, රුපියල් 100ක ආදායමක් එකතු කරනකොට, පඩිනඩි ගෙවන්නත්, පොලිය ගෙවන්නත් රුපියල් 85.7ක් වැය වෙනවා. එහෙම නම් ඉතුරු වියදම් කළමනාකරණය කිරීමට නම් අපට ඉතුරු වන්නේ 14යි. අපි ඒක නිවැරදිව කළමනාකරණය කරනවා. අවශ්‍ය පරිදි ණය ගැනීම් කරනවා, ව්‍යාපෘති සඳහා. ඒ අනුව තමයි අපේ මේ මූල්‍ය discipline එක ඉදිරියට පෙන්වමින් තිබෙන්නේ.

ඊළඟට, ආදායම් යෝජනා පිළිබඳවත් පොඩ්ඩක් කථා කරන්නට අවශ්‍යයි. ආදායම් යෝජනා පිළිබඳව සාකච්ඡා කරන්න ඕනෑ. මම කලින් කිව්වා වාගේ අතීතයේ අපේ රට තුළ ඉදිරිපත් කළේ මැජික් පෙට්ටියක් වාගේ අය වැය ලේඛන. මිනිස්සු හුරු කර තිබුණේ එවැනි ක්‍රමයකට. "ලබන අවුරුද්දට අපි කවුරුවත් දන්නේ නැති මොකක් හරි එකක් එනවා. ඒ මොනවාද?" කියා බලන්නයි මිනිස්සු හුරු කර තිබුණේ. ඒ අනුව ඔවුන් බලපු ප්‍රධාන ක්ෂේත්‍ර 2ක් තිබුණා. අපිට කියක්ද හම්බ වෙන්නේ කියලා දීමනා සහ සහනාධාර ගැන ඒ අය ගොඩක් බැලුවා. අනෙක් පැත්තෙන් මිනිස්සු කල්පනා කළා, බදු කීයක් ගහයිද, බදු වැඩි කරන්නේ මොනවාටද කියලා.

අපි දන්නවා, ඉස්සර සිගරට් හංගනවා, මත්පැන් හංගනවා, විවිධ බඩු හංගනවා අය වැයට කලින්. එසේ අනවශ්‍ය බදු ගැසීම තුළ පෙන්නුම් කළේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක, සැලසුම්කරණයක නිසි ස්ථාවරත්වයක් ඇත්තේ නැහැ කියන එකයි. මේ අය වැයේදී බදු පිළිබඳව වැඩි විවාදයක් ගෙනෙන්න බැරි වුණේ, පළමු අවුරුද්දේම ස්ථාවරත්වයට එන්න අපට පුළුවන්කම ලැබුණු නිසායි. එතැනදී යම් යම් බදු සංශෝධන කළා, බදු පදනම පුළුල් කරන්න. හැබැයි, අපි මෙතැන් සිට ඉදිරියට යනකොට අදාළ බදු සංශෝධන සිදු වෙනවා නම්, බදු අලුතින් එකතු වෙනවා නම්, ඒවා සිදු කරන්නේ බදු මූලධර්ම පදනම් කරගෙන සාධාරණත්වය, සරල බව හා පහසුවෙන් ඒවා ගෙවීමේ හැකියාවත් සහිතවයි.

ඒ වාගේම ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා ලෙස ආදායම් බදු පදනම ඉදිරිපත් කළා, 25:75ක් ලෙස තිබෙන සෘජු හා වක්‍ර බදු අනුපාතය අපි 40:60 දක්වා ගෙනෙනවා කියලා. එයට අවශ්‍ය ක්‍රමවේදයත් අපි ඉදිරියේදී ගෙනෙනවා. ඒකට අවශ්‍ය පදනමත් මේ අය වැය තුළ අන්තර්ගත කර තිබෙනවා. ඒකට තිබෙන එක පදනමක් තමයි, කොහොමද අපි වක්‍ර බදු ප්‍රමාණය වැඩි කර ගන්නේ කියන එක. ඒකට තිබෙන එක ක්‍රමයක් තමයි VAT එක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් ලබා දෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)

(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මට තව විනාඩි 10ක් විතර ලබා දෙන්න පුළුවන්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපි ස්ථාවර නියෝග අනුව අවසර ගත්තා. ඒ අනුව ගරු අනිල් ජයන්ත මැතිතුමාට තව විනාඩි 8ක කාලයක් ලබා දෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

බොහොම ස්තුතියි.

මම සඳහන් කරමින් සිටියේ බදු ප්‍රතිපත්තිය ගැනයි. ව්‍යාපාරිකයාගේ දෘෂ්ටිකෝණයෙන් ගත්තාම, අතීතයේදී ඔවුන් කිසියම් දෙයක් අලුතින් සැලසුම් කළේ නැහැ, බයෙන් සිටියා අය වැයෙන් බදු අනුපාත එහාට මෙහාට කරාවි කියලා.

මේ අය වැය එහෙම අනවශ්‍ය surprises එකක්වත් නැති අය වැයක් බවට අපි පත් කළා. කවුරු හෝ අරක්කු, සිගරැට්, බඩු මුට්ටු හංගාගෙන හිටියා නම් ඒක ඒ අයගේ ගැටලුවක්. අපි අය වැයෙන් මේ පිළිබඳව ඉඟියක් දෙනවා. අපි ඉදිරියේදී වක්‍ර බදු ප්‍රමාණය අඩු කර ගැනීම සිදු කිරීමේදී ඉතා වැදගත් වෙනවා, අගය එකතු කිරීම මත බදු ක්‍රමය; VAT එක. VAT එකේ දැනට තිබෙන ප්‍රතිශතය සාපේක්ෂව වැඩියි. නමුත් ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය කළමනාකරයේදී අපි ඒක පහළට ගෙනෙන්න කලින් ඍජු ආදායම් බදු වැඩි කිරීමේ අඩිතාලම දාලා ක්‍රමිකව අපි එතැනට එනවා. ඒ ගැන කලබල වෙන්න එපා.

ඒ වාගේම මේ VAT එක සම්බන්ධව වැරැදි මතයක් විශේෂයෙන්ම විපක්ෂය සමාජගත කරන්න උත්සාහ කරනවා. ඔවුන් මොකක්ද කියන්නේ? මේ VAT එක ව්‍යාපාරිකයන්ට ගහනවා, සිල්ලර කඩයක් කරන කෙනාට ගහනවා, පොඩි කඩයක් කරන කෙනාගෙන් අය කරගන්න යනවා, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වැටෙනවා කියලා කියනවා. එක්කෝ, ඔබතුමන්ලා VAT එක ගැන දන්නේ නැහැ. එහෙම නැත්නම් හිතාමතාම නොමඟ යවනවා.

VAT එක කිසිම ව්‍යාපාරිකයෙකු ගෙවන්නේ නැහැ. කිසිම ව්‍යාපාරිකයෙකු දරන්නේ නැහැ. බදු බර - tax incidence එක - තිබෙන්නේ පාරිභෝගිකයා ළඟ. කලින් තිබුණු පිරිවැටුම් බදු - Turnover Tax - තමයි ව්‍යාපාරිකයන්ට පනවන්නේ. ව්‍යාපාරිකයා තීන්දුව ගන්නවා, ඒක පාරිභෝගිකයාට දානවාද, මිලට දානවාද කියලා. එවැනි විවිධ වූ ව්‍යාකූලත්වයන් තිබුණා. අවසානයේදී වෙළඳ පොළේ මිල ගණනුත් වැඩි වෙනවා. කවුරුත් දන්නේ නැහැ, cascading effect එකක් තිබෙනවා කියලා. එකෙන් එක පන්න පන්නා යනවා. හැබැයි, VAT එක එහෙම නැහැ. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා, අපට තිබෙන VAT එක ඇතුළේ. ඒ VAT එක හරියටම ක්‍රියාත්මක වෙලා පාරිභෝගිකයාගෙන් අය කරන්නේ යම් ප්‍රතිශතයක්ද, මේ ව්‍යාපාරිකයන්, වටිනාකම් එකතු කරන අය යම්කිසි භාණ්ඩයක් නිෂ්පාදනය කරන කොට -ඒක උපකරණයක් වෙන්න පුළුවන්. මොකක් හෝ කාරණයක් වෙන්න පුළුවන්- අමුද්‍රව්‍යයේ සිට අවසාන පාරිභෝගකයා දක්වා වටිනාකම් එකතු වෙමින් යන අවස්ථාවලදී ඒ ව්‍යාපාරිකයා ලියාපදිංචි වෙලා ඔහුට අදාළ කොටස එකතු කර දීමේ ක්‍රමයට තමයි VAT එක කියලා කියන්නේ. ඒ නිසා එය හරියටම කරන්න නම් සියලුදෙනා VAT යන්ත්‍රණයට ගෙන එන්නට ඕනෑ; මේ ජාලයට එන්නට ඕනෑ. අපට තිබෙන තත්ත්වය අනුව තවම තාක්ෂණය නැහැ. වෙළඳාමක් කරන කොට අපට ඉතාම සුළු පරිමාණයේ වෙළෙන්දෙක් මේ ජාලයට ගෙනෙන්න බැහැ. පිට රටවලට ගියාම දකිනවා ඇති, පාරේ බඩු විකුණන කෙනා QR code එකෙන් බඩු විකුණුවාම ඔහුගේ වෙළඳාම ඒ ආදායම් දෙපාර්තමේන්තුවට සම්බන්ධ වෙන බව. අන්න තාක්ෂණය. ඒ නිසා තමයි අපි මේ අය වැය අරමුණු ඇතුළේ විශේෂ අය වැය අරමුණක් විධියට ඩිජිටල්කරණය ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි ඒ තැනට පියවරෙන් පියවර යනවා. ඩිජිටල්කරණය හරහා e-invoicing ක්‍රමය - point of sales system එක - ආවාට පස්සේ, ඒ සියලු දෙනා VAT යන්ත්‍රණයට ආවාට පස්සේ අපට VAT එක අඩු කර ගැනීමේ හැකියාවක් තිබෙනවා.

මේ අවස්ථාවේදී ඇත්තටම registered කෙනෙකුගෙන් - ලියාපදිංචි කෙනෙකුගෙන් - විතරයි බදු එකතු කරලා ආණ්ඩුවට දෙන්න ඕනෑ කියන ක්‍රමයේදී වෙළඳ පොළේ ව්‍යාකූලත්වයක් හැදෙනවා. යම් ව්‍යාපාරිකයෙක් ඉන්නවා, යම් නිෂ්පාදකයෙක් ඉන්නවා, අතරමැද භාණ්ඩ සපයන කෙනෙක් ඉන්නවා, ඔහු VAT එකට ලියාපදිංචි වෙලා නැහැ. එහෙම නම් ඔහුට වගකීමක් නැහැ, බඩු විකුණන කොට අදාළ පාරිභෝගිකයාගෙන් -තමන්ගේ ගනුදෙනුකරුවන්ගෙන්- VAT එකතු කරලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවන්න. හැබැයි, ඔහුට එහෙම බලයක් නැති වුණාට ඔහු ලියාපදිංචි පුද්ගලයෙකු නොවුණාට, ඔහු බඩු මිලදී ගන්න කොට සියයට 18ක VAT එක ගෙවනවා. ඒක ඔහුගේ වියදමක් බවට පත් වෙනවා. අත්තටම ඔහු VAT ක්‍රමය ඇතුළේ නැති නිසා තමයි ඔහුට අතිරේකව සියයට 18ක් දරන්න සිදු වෙන්නේ. ඒක හොඳට තේරුම් ගන්න. ව්‍යාපාරික මහත්වරු කලබල වෙන්න එපා. ඔබ දැනටමත් නිෂ්පාදනයක් කරන කොට ඔබ ලියාපදිංචි නැත්නම් ඔබගේ මිලදී ගැනීම්වලට ඔබ සියයට 18ක් ගෙවනවා. එහෙම ගෙව්වාම ඒක ඔබේ වියදමට යනවා. ඔබ ඒ වියදමත් එක්ක කොහොමද ගනුදෙනු කරන්නේ? ඒ වියදම එක්ක සෙල්ලම් කරන්න තිබෙන ආකාර දෙකයි. එක ක්‍රමයක් තමයි පාරිභෝගිකයාගේ පැත්තට මාරු කරන එක. පාරිභෝගිකයාගේ පැත්තට මාරු කළාට ඒ එන බදු ප්‍රමාණය අපට සම්බන්ධ වෙන්නේ නැහැ. දෙවැනි ක්‍රමය තමයි, ඔබේ ලාභ අනුපාතයත් එක්ක ගනුදෙනු කරගන්න සිදු වෙන එක. ඒක වෙළඳ පොළ තරගකාරිත්වය, කාර්යක්ෂමතාව පිළිබඳ කාරණයේදී හොඳ එකක් නොවෙයි.

ඔහු register වුණොත් - VAT-registered පුද්ගලයෙකු බවට පත් වුණොත් - මොකක්ද වෙන්නේ? ඔහුට අදාළ සියයට 18 එකතු කරලා ඔහු ගෙවපු එක අඩු කරන්න පුළුවන්. ඒක තමයි වඩාත් හොඳ ක්‍රමය. ඒ නිසා අපි මේ උත්සාහ කරමින් ඉන්නේ, එවැනි ක්‍රමවේදයක් සඳහා පියවරෙන් පියවර යන්න. වාහන සම්බන්ධයෙනුත් මේ ප්‍රශ්නයම මතු කළා. අපි එතැනදීත් කළේ, තිබුණු ව්‍යාකූලත්වය අයින් කරලා නිසි පරිදි ඒ බද්ද එකතු කරන්න කටයුතු කරලා දුන්නු එකයි.

ඊළඟට අය වැය අරමුණු වෙනුවෙන් කොච්චර දුරට මේ මුදල් වියදම් කරලා තිබෙනවාද කියන එක ඉතාම වැදගත්. අපි අධ්‍යයනය කරන්න ඕනෑ, තිරසර ආර්ථිකයක් සැමදෙනාම එකතු කරගත් ආර්ථිකයක් වෙනුවෙන් සියයට 7කට වැඩි ආර්ථික වෘද්ධියක් මධ්‍යකාලීනව ලබා ගන්න යන්න ඕනෑ කරන ගමන පිළිබඳව.

ආයෝජන කැඳවා ගැනීම සඳහා මොනවාද අපට අවශ්‍ය කරන්නේ? ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ මුදල් වෙන් කිරීම් එකින් එක අරගෙන බැලුවාම අපට පෙනෙන ප්‍රධානම එකක් තමයි, අවශ්‍ය යටිතල පහසුකම් සකස් දෙන එක. මහාමාර්ග පද්ධතිය දියුණු කරන්න, ඒ වාගේම railways, ඒ වාගේම ග්‍රාමීය මාර්ග පද්ධතිය, පාලම් බෝක්කු සෑදීම යන වියදම් සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. මොකද, ආර්ථිකය වර්ධනය වෙනකොට භාණ්ඩ ප්‍රවාහනයට, ශ්‍රමය ප්‍රවාහනය කිරීමට ඉතාම වැදගත්, එකකට

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

එකක් සම්බන්ධ වුණු - connected - ජාලගත මාර්ග පද්ධතියක් තිබීම අවශ්‍ය වෙනවා. ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම බලශක්තිය තීරණාත්මකයි, නිෂ්පාදන පිරිවැය පහළට ගෙන එන්න, ව්‍යාපාර කටයුතු දියුණු කරන්න. ඒ නිසා බලශක්ති අමාත්‍යාංශය යටතේත් වැඩ කටයුතු ගණනාවක් කරනවා. බලශක්තිය නිෂ්පාදනය කළාට වැඩක් වෙන්නේ නැහැ, ජනනය කළාට විතරක් වැඩක් වෙන්නේ නැහැ, කුමක් සඳහාද එය ආයෝජනය කරන්නේ කියලා බලන්න ඕනෑ. ඒ ආයෝජනය කිරීමේ කාර්යයේදී අපි ක්ෂේත්‍ර ගණනාවක් සඳහා: ප්‍රවාහනය විද්‍යුත්කරණය - electrification of transportation - කියන කාරණය සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම data centres: ඩිජිටල්කරණය සඳහා නව අවස්ථා හොයලා තිබෙනවා. ඒ වාගේම විදුලි බලය ජනනය කිරීම පිළිබඳවත් අපි නව හැකියාවන්, අවශ්‍යතාවන් පිළිබඳව සොයමින් තිබෙනවා. ඒ වාගේම දත්ත විධියට ගත්තොත්, මේ කියන අරමුණු ඇතුළේ තිබෙන ප්‍රධාන ව්‍යාපෘති මොනවාද? අධිවේගී මාර්ග සහ ප්‍රවාහනය සම්බන්ධයෙන් ගත්තාම රුපියල් බිලියන 284ක් වෙන් කරලා තිබෙනවා. විවිධ වූ ව්‍යාපෘති ඒ අතරේ තිබෙනවා. Central Expressway එක අත්හැර දමලා - අපේ සමහර ප්‍රාග්ධන වියදම් අපට කරන්න පමා වුණේ, ඒවායේ තිබිච්ච ව්‍යාකූලතාවන් නිසා. ඒ ගිවිසුම්වල තිබිච්ච ගැටලු නිසා අපට යම් වැඩිපුර කාලයක් ගන්න සිද්ධ වුණා.

ඒ වාගේම ඒ ගිවිසුම්වල තිබිච්ච වැරදි නිසා අපට වැඩිපුර බිලියන ගණන් ගෙවන්න සිද්ධ වුණා. මන්ත්‍රීතුමියක් ප්‍රශ්නයක් මතු කළා, රුපියල් 200ක් කම්කරුවාට ගෙවන එක ගැන. "අම්මෝ! මහජන මුදල් අවභාවිත කරන්න එපා, බදු මුදල්" කිව්වා. හැබැයි ඔබතුමන්ලා හදපු ගිවිසුම්වල තිබිච්ච වැරදි නිසා, ඒ ගිවිසුම මූල්‍යනය කරන කෙනා හොයා ගන්නේ නැතුව 2016 ඉඳලා 2020 වෙනකල් addendums ගෙනැල්ලා, අවුරුද්දෙන් අවුරුද්ද ඩොලරයට රුපියල් 135 ගණනේ ඒ වියදම් පරිවර්තනය කිරීමේ වැරැද්ද නිසා - ඒක නීතිය - රුපියල් බිලියන 20කට වඩා වැඩිපුර ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. අන්න ඒවායි ප්‍රශ්න කළ යුතු වන්නේ. අන්න ඒ වැරදි අඩුපාඩුත් හදාගෙන, නතර වෙලා තිබිච්ච ව්‍යාපෘති, - විශේෂයෙන්ම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ දෙවැනි අදියරේ ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති ගණනාවකුත් - වෙනුවෙන් රුපියල් බිලියන 284ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම නාගරික සංවර්ධනය, ඉදිකිරීම්, නිවාස කෙරෙහි අපි අවධානය යොමු කළොත්, ඒවාත් නිෂ්පාදන ආර්ථිකයක ඉදිරියට යන ගමන් මාර්ගයට වැදගත් වෙනවා. ඒ වැඩ කටයුත්තටත් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ක්ෂේත්‍ර ගණනාවක වෙන් කිරීම් ඉතාම වැදගත් වෙනවා.

තවත් එක් වැදගත් කාරණයක් පිළිබඳව මම සඳහන් කරන්න ඕනෑ. නිෂ්පාදන ආර්ථිකයට මේ සියලු කරුණු කාරණා එනකොට ප්‍රධාන බාධකයක් විධියට අපි නිරන්තරයෙන් යෝජනා කරන්නේ, අවශ්‍ය මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් මුදල් නැහැ කියන එකයි. හැබැයි, මේ අය වැයෙන් අපේ රාජ්‍ය බැංකු පද්ධතියේ, පෞද්ගලික බැංකු පද්ධතියේ තිබෙන විවිධ වූ මූල්‍යන යෝජනාවලට අමතරව රජය මැදිහත් වෙච්ච, ආණ්ඩුව මැදිහත් වෙච්ච විවිධ වූ මූල්‍යන ව්‍යාපෘති සඳහා, පොලී සහනාධාර ලබා දීම සඳහා, ක්ෂේත්‍රගත, ඉලක්කගත ක්ෂේත්‍ර සඳහා රුපියල් බිලියන 80කට වැඩි මූල්‍යන ප්‍රමාණයක් වෙන් කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ කරුණු කාරණා සියල්ල සැලකිල්ලට භාජන කළාම, මේ අය වැයේ ප්‍රධාන අරමුණුවලට අනුගතව මේ වියදම් වෙලා තිබෙන ප්‍රමාණය හරියට බැලුවාම, මේ අය වැය මේ රට නිවැරදි දිශාවට ගෙන යන, අපි බලාපොරොත්තු වෙච්ච "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" සඳහා වූ මාවත අත්පත් කර ගැනීමට හැකි අය වැයක් කියලා අපට පෙනෙනවා. ඒ නිසා මේ අය වැයට ඔබතුමන්ලා සියලුදෙනාගේම සහයෝගය, ඔබේ ඡන්දය ලබා දෙන්න කියා යෝජනා කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2026, දෙවන වර කියවීම, සභාව එකඟද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, බෙදීමක් අවශ්‍යයි.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2026 දෙවන වර කියවීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින්නේ නම් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවකු නොමැති බවයි පෙනී යන්නේ.

මගේ වම් අත පැත්තේ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු කථානායකතුමනි, රජයේ වතු අයත් අයතන 3ක් තිබෙනවා, RPCs 22ක් තිබෙනවා, කුඩා තේ වතු හිමියන් ඉන්නවා. ඒ හැම තැනකම වැඩ කරන වතු කම්කරු ජනතාවට රුපියල් 1,750ක් ලබා දෙනවා කියලා ජනාධිපතිතුමා දුන් පොරොන්දුව දෙමළ ප්‍රගතිශීලී සන්ධානය හැටියට අපි සතුටින් පිළිගන්නවා. Sir, I do not want to go into the internalities and the cost structure of the wage. It is the responsibility of the Government. ඒ නිසා TPA එක නියෝජනය කරන අපි තුන්දෙනාම -මමත්, පලනි දිගම්බරම් මන්ත්‍රීතුමාත්, රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමාත්- vote in favour of the Second Reading.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

වතු කම්කරු ජනතාවගේ පඩි වැඩි කරපු නිසා ඔබතුමන්ලාට සහයෝගය දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා තවත් සිටිනවාද?

කිසිවකු නොමැති බවයි පෙනී යන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 158; විරුද්ධව 42; වැළකී සිටි 8 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 158; எதிராக 42; விலகியிருந்தோர் 8.*

*According to Electronic Voting, Parliament divided: Ayes 158; Noes 42; Abstain 8.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekarn | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 012. Chrishantha Abeysena | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Susil Ranasinghe | Yes |
| G 025. Nihal Galappaththi | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 027. Namal Karunaratne | Yes |
| G 028. Wasantha Piyathissa | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 032. Rathna Gamage | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 035. Eranga Gunasekara | Yes |
| G 036. Upali Samarasingha | Yes |
| G 037. T.B. Sarath | Yes |
| G 038. Nalin Hewage | Yes |
| G 039. Prasanna Gunasena | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Sundaralingam Pradeep | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |

[ගරු කථානායකතුමා]

| | |
|---|---|
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 055. Arkam Ilyas | Yes |
| G 056. Aravinda Senarath | Yes |
| G 057. Dinindu Saman | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Ashoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 065. R.M. Gamini Rathnayake | Yes |
| G 066. Manjula Suraweera Arachchi | Yes |
| G 067. K. Ilankumaran | Yes |
| G 068. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 069. Ajith Agalakada | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 071. Roshan Akmeemana | Yes |
| G 072. U. P. Abeywickrama | Yes |
| G 074. M.K.M. Aslam | Yes |
| G 075. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 076. Oshani Umanga | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 078. Upul Kithsiri | Yes |
| G 079. Wasantha Pushpa Kumara | Yes |
| G 080. Chaminda Lalith Kumara | Yes |
| G 081. Sarath Kumara | Yes |
| G 082. Nilanthi Kottahachchi | Yes |
| G 083. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 084. Lasith Bhashana Gamage | Yes |
| G 085. Thilanka U. Gamage | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 087. Ajantha Gammeddage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 089. Jagath Gunawardana | Yes |
| G 090. Aboobucker Athambawa | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 092. Thushari Jayasingha | Yes |
| G 093. T.K. Jayasundara | Yes |
| G 094. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 095. Rajeevan Jeyachandramoorthy | Yes |
| G 096. Sellaththamby Thilaganathan | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Anushka Thilakarathne | Yes |
| G 099. Chandana Thennakoon | Yes |
| G 100. Thanura Dissanayake | Yes |
| G 101. Dharmapriya Dissanayake | Yes |
| G 102. Sujeewa Dissanayake | Yes |
| G 103. Susantha Dodawatta | Yes |
| G 104. Susantha Kumara Nawarathna | Yes |
| G 105. Sena Nanayakkara | Yes |
| G 106. Aruna Panagoda | Yes |
| G 107. Nimal Palihena | Yes |
| G 108. Nishantha Perera | Yes |
| G 109. Stepni Fernando | Yes |
| G 110. Kanthasamy Prabu | Yes |
| G 111. Lal Premanath | Yes |
| G 112. Nanda Bandara | Yes |
| G 113. Padmasiri Bandara | Yes |
| G 114. Ravindra Bandara | Yes |
| G 115. Sudath Balagalla | Yes |
| G 116. Sri Bavanandarajah | Yes |
| O 003. Palani Thigambaram | Yes |
| O 004. Rishad Bathinudeen | No |
| O 006. R.M.Ranjith Madduma Bandara | No |
| O 007. Gayantha Karunathilleka | No |
| O 008. Sajith Premadasa | No |
| O 009. Ravi Karunanayake | No |
| O 011. Namal Rajapaksha | No |
| O 012. Jeevan Thondaman | Yes |
| O 014. Amirthanathan Adaikkalanathan | No |
| O 015. G.G. Ponnambalam | No |
| O 016. Ramanathan Archchuna | No |
| O 017. M.A.M. Thahir | No |
| O 018. Dilith Jayaweera | No |
| O 019. Sivagnanam Shritharan | Abstain |
| O 020. Shanakiyan Rajaputhran Rasamanickam | Abstain |
| O 021. Dayasiri Jayasekara | No |
| O 022. Harsha de Silva | No |
| O 023. Ajith P. Perera | No |
| O 024. Sujeewa Senasinghe | No |
| O 026. Dilip Wedaarachchi | No |
| O 027. J. C. Alawathuwala | No |
| O 028. Nalin Bandara Jayamaha | No |
| O 029. Hector Appuhamy | No |
| O 030. Hesha Withanage | No |
| O 031. Kavinda Heshan Jayawardhana | No |
| O 032. Sujith Sanjaya Perera | No |
| O 033. S.M. Marikkar | No |
| O 034. Imran Maharoof | No |
| O 035. Harshana Rajakaruna | No |
| O 037. Faizer Musthafa | No |
| O 038. Rohitha Abeygunawardhana | No |
| O 039. Kaveenthiran Kodeeswaran | Abstain |
| O 040. Gnanamuththu Srineshan | Abstain |
| O 041. Chaminda Wijesiri | No |
| O 042. Mujibur Rahman | No |
| O 043. Waruna Liyanage | No |
| O 044. Kins Nelson | No |
| O 045. Rohana Bandara | No |
| O 046. W.H.M. Dharmasena | No |
| O 048. B. Ariyawansha | No |
| O 049. Chamindranee Kiriella | No |
| O 050. Chathura Galappaththi | No |
| O 051. Chithral Fernando | No |
| O 052. Amila Prasad | No |
| O 053. Anuradha Jayaratne | No |
| O 055. D.V. Chanaka | No |
| O 059. Kathiravelu Shanmugam Kugathasan | Abstain |
| O 060. Thurairasa Ravikaran | Abstain |
| O 062. Jagath Vithana | No |
| O 063. Ismail Muththu Mohamed | No |
| O 065. E. M. Basnayaka | Yes |
| O 066. Wijesiri Basnayake | Yes |
| O 067. S. Sandaruwan Madarasinghe | Yes |
| O 068. Prageeth Madhuranga | Yes |

| | |
|---|---|
| O 069. Jagath Manuwarna | Yes |
| O 070. Ruwan Mapalagama | Yes |
| O 071. Nandana Millagala | Yes |
| O 072. Riyas Farook | Yes |
| O 079. Elayathamby Srinath | Abstain |
| O 080. Pathmanathan Sathiyalingam | Abstain |
| O 081. Danushka Ranganath | Yes |
| O 082. Sanjeewa Ranasingha | Yes |
| O 083. Sunil Rathnasiri | Yes |
| O 084. Manjula Sugath Rathnayaka | Yes |
| O 085. A.M.M.M. Rathwaththe | Yes |
| O 086. Manoj Rajapaksha | Yes |
| O 087. Sunil Rajapaksha | Yes |
| O 088. Hasara Liyanage | Yes |
| O 089. Deepthi Wasalage | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 091. R. G. Wijerathna | Yes |
| O 092. Nishantha Samaraweera | Yes |
| O 093. Priyantha Wijerathna | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Darmapriya Wijesinghe | Yes |
| O 096. Hiruni Wijesinghe | Yes |
| O 098. Fasmin Sharif | Yes |
| O 099. Thilina Samarakoon | Yes |
| O 100. Ambika Samivel | Yes |
| O 101. Dewananda Suraweera | Yes |
| O 102. Chandana Sooriyaarachchi | Yes |
| O 103. G.D. Sooriyabandara | Yes |
| O 104. Kitnan Selvaraj | Yes |
| O 105. Janaka Senarathna | Yes |
| O 106. Chandima Hettiaratchi | Yes |
| O 107. Champika Hettiarachchi | Yes |
| O 108. Dinesh Hemantha | Yes |
| O 109. Geetha Herath | Yes |
| O 110. Bhagya Sri Herath | Yes |
| O 111. Muhammad Faizal | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 114. Sunil Biyanwila | Yes |
| O 115. Samantha Ranasingha | Yes |

Electronic Voting Results:

**Participants:**

| | |
|---|---|
| Present | 208 |

**Votes:**

| | |
|---|---|
| Yes | 158 |
| No | 42 |
| Abstain | 8 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 158යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 160යි.

විද්‍යුත් ඡන්ද විමසීම අනුව විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 42යි.

ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 8යි.

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2026 දෙවන වර කියවීම වැඩි ඡන්ද 118කින් සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන්, "විසර්ජන පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාරක සභාව කවදාද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

2025 නොවැම්බර් 15වන සෙනසුරාදා.

***පනත් කෙටුම්පත, අංක 57 දරන ස්ථාවර නියෝගය යටතේ, 2025 නොවැම්බර් 15වන සෙනසුරාදා පවත්වන පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී.***

*சட்டமூலம், நிலைக்கட்டளை இல. 57இன்படி, 2025 நவம்பர் 15, சனிக்கிழமை நடைபெறவிருக்கும் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது.*

*Bill committed to a Committee of the whole Parliament under Standing Order No. 57 for Saturday, 15th November, 2025.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ. භා. 6.00 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.28ට, 2025 නොවැම්බර් 13 වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 15 වන සෙනසුරාදා පූ. භා. 9.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி. ப. 6.00 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி, பி. ப. 6.28க்கு, பாராளுமன்றம் அதனது 2025 நவம்பர் 13ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 15, சனிக்கிழமை மு.ப. 9.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.00 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.28 p.m. until 9.00 a.m. on Saturday, 15th November, 2025, pursuant to the Resolution of Parliament of 13th November, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.